

# අංගුත්තර නිකාය

# ගාථා සන්නය

# අඞ්ගුත්තර නිකාය ගාථා සන්නය.


සාසනවංසාලඞ්කාර කවිධජ විනයාචරිය

**වැලිගම ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක**

මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගෙන්

ශාස්ත්‍රාගම උගත්

අම්බලම්ගොඩ සුනන්දාරාම මහා විහාරාධිපති

**ගෞරවාර්හ ආචාර්ය්‍ය සොභිත මහාස්ථවිර**

ස්වාමිපාදයන්වහන්සේගේ

ශිෂ්‍යවූ

සථොකත විහාරවාසී

**විලේගොඩ ධම්මානන්ද ස්වාමීන්වහන්සේ**

විසින් කරණලදී.


---


අම්බලම්ගොඩ

ඒ. බී. ඩී. ඇස්. සිරිවර්ධන විසින්

අච්චුගස්වා ප්‍රසිද්ධකරණලදී.

---

2452.

# Anguttara Nikaya Gatha Sannaya.

## A Paraphrase

TO

## The Gathas of the Anguttara Nikaya

BY


WILEGODA DHAMMÁNANDA
BHIKKHU

A PUPIL OF

THE VEN'BLE SOBHITA

*The Incumbent of Sunandárámaya*

AMBALANGODA.


---


PRINTED AND PUBLISHED
BY

**A. B. D. S. Siriwardene**

*Ambalangoda.*

---

1908.

# PREFACE.

THE Pāli Canon of the Buddhist Church consists of three great collections or Pitakas, the Vinaya, the Sutta and the Abhidharma.

The Anguttara Nikāya is one of the five divisions of the Sutta Pitaka. It has eleven Nipātas (chapters) which contain nine thousand five hundred and fifty seven Suttas. The teachings contained in these suttas have been tersely expressed in gāthās (stanzas) which render the study of the Anguttara Nikāya a laborious task.

It is beyond the scope of human intelligence to acquire an accurate and perfect knowledge of the Dharma of the Great Teacher. Anubuddha Anandasthavira has made mention of this fact in the following words:—"*Náná naya nipuna manékajjhásaya samutthánan atthabbyanjana sampannan vividha pátiháriyan dhammattha désaná pativèdha gambhiran sabba sattánan saka saka bhásánurúpato sòta patha mâgacchantan tassa bhagavato vacanan sabbappakáréna kosamattho vinnatun.*"

However, it being evident that a paraphrase to the gathas of the Anguttara Nikāya will make its study comparatively easy, I have here attempted to give to the students of religion a literal paraphrase of the gathas, which I have spared no pains to make as clear as possible.

In revising the text of this work, I have consulted several locally written copies of the Anguttara Nikāya as well as the copy printed in Roman characters by the Pāli Text Society of London, and I have thus succeeded in removing mistakes which had crept in in the hands of ignorant copyists.

I have to mention here gratefully that this paraphrase has been written by the aid of the religious instruction I have received from my revered teacher, the VEN'BLE SOBHITA, the Incumbent of the Sunandārāmaya, Ambalangoda, himself a

pupil of late Ven'ble Sāsanavansālaṅkāra Kavidhaja Vinayācariya Weligama Sri Sumangala Nāyaka Mahā Thero.

My thanks are due to the Rev. Beruwala Siriniwāsa, Pulinatalārāmaya, Kalutara, for the valuable assistance rendered by him in the preparation of this work.

I hope that my efforts will be of use to beginners, and I even hope that they may not be quite without use to the public in general.

I am quite sensible that there may be errors in this work, for which I crave the indulgence of the learned reader.

*Wilegoda Dhammānanda Bhikkhu.*

15th (Esala) July $\frac{2452}{1908}$

Sunandārāmaya
Ambalangoda.

# සංඥාපනය.

ශ්‍රී සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජයන්වහන්සේ විසින් සුදේශිත පර්‍ය්‍යාප්ති සඞ්ඛ්‍යාත පිටකත්‍රය අතුරෙහි සූත්‍ර පිටකයට අයත් අර්ථයෙන් හා ධර්මයෙන්ද ගැඹුරුවූ දීඝ නිකායාදි නිකාය පස අතුරෙන් **අඞ්ගුත්තරාගම නම් එක් නිකායෙක්වේ.**

ඒ වනාහි එකක නිපාතයේ පටන් නිපාත එකොළොසෙකි, සූත්‍ර වශයෙන් චිත්ත පරියාදාන සූත්‍රය ආදිකොට නව දහස් පන්සිය සත් පණස් සූත්‍රකෙණෙක් වෙති, එහි ගාථා ධර්මයෝ බොහෝසෙයින් අප සම්‍යක් සම්බුද්ධ සර්වඥයන් වහන්සේ විසින් විස්තරනයින් දෙශනාකර වදාළාවූ ධර්මය නැවත සංක්ෂෙපනයින් දෙශිත දෙශනා විලාසයක් හෙයින්ද අතිශය දුරවබොධවෙත්.

සකලඥෙය මණ්ඩලය තත්වූ පරිද්දෙන් දත්තාවූ ශ්‍රී සුගත තථාගතයන් වහන්සේගේ ප්‍රවර ධර්මය සර්වප්‍රකාරයෙන් දැනගැනීමට කිසිවෙක් සමර්ථනොවේ, "**නානානය නිපුණමනෙකජ්ඣාසය සමුට්ඨානං අත්ථබ්‍යඤ්ජන සම්පන්නං විවිධ පාටිහාරියං ධම්මත්ථදෙසනා පටිවෙධගම්භීරං සබ්බසත්තානං සකසක භාසානුරූපතො සොතපථමාගච්ඡන්තං තස්ස භගවතො වචනං සබ්බප්පකාරෙන කොසමත්ථොවිඤ්ඤාතුං**" යනුද අනුබුද්ධ ආනන්ද මහා ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් දක්වනලදී.

එසේදවුවත් යථොක්ත නිකාය භාවිතාකරණ ආධුනික යන්ට අනායාසයෙන් එහි ගාථාවන්ගේ අර්ථාවබොධයට පදාර්ථ ව්‍යාඛ්‍යානයක් ඇතිවීනම් ඒ මහත් ප්‍රයොජනයයි කල්පනා කොට එහි ගාථාවන්ගේ ලෙඛක දොෂවලින් ආකුලව තිබුනු තැන්ද අඞ්ගුත්තර නිකාය පුස්කොල පොත් කීපයකටද ඉංග්‍රීසි අක්ෂරයෙන් ලන්ඩන්නුවර මුද්‍රිත අඞ්ගුත්තර නිකායටද සම කොට බලා පරිශොධනය කරගෙණ තදර්ථ කථාදිය ඇසුරු කිරීමෙන් හා කළුතර පුලිනතලාරාමාධිපතිව වැඩ විසූ

විමජ්ජන ශෙඛරායමාණවූ ශාසන වංශාලඞ්කාර කවිධජ විනයා චරිය වැලිගම ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක මහා ස්ථවිර ස්වාමි පාදයන්වහන්සේගෙන් ශබ්ද ශාස්ත්‍රාගම උගත් අප ආචාර්‍ය්‍යොත්තමවූ අම්බලම්ගොඩ සුනන්දාරාමාධිපති යොගිනාභිධාන ස්ථවිරපාදයන් වහන්සේගේ මනා උපදෙශද ඇතිව මහත් පරිශ්‍රමයෙන් මෙම පදාර්ථ ව්‍යාඛ්‍යානය සම්පාදනය කෙළෙමි.

මෙම ව්‍යාඛ්‍යානය සම්පාදනය කිරීමේදී පූර්වොක්ත පූජ්‍යාචාර්‍ය්‍ය වැලිගම ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක මහා ස්ථවිර ස්වාමි පාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ කළුතර පුලිනතලාරාමවාසි උගත් බේරුවල සිරිනිවාස ස්වාමින් වහන්සේගෙන්ද ආධාර ලැබුණු බව සතුති සහිතව මෙහි සඳහන්කරමි.

මෙම පදාර්ථ ව්‍යාඛ්‍යානය විශෙෂ වශයෙන් අඞ්ගුත්තර නිකාය භාවිතා කරන්නාවූ ශාසනාවචර ආධුනිකයන්ටද සාමාන්‍ය වශයෙන් සම්බුද්ධ ධර්‍ම්ම විජානනයෙහි අභිලාෂීවූ සෞගත ජනතාවටද අත්‍යන්තොපකාර වේමය, මෙහි අපගේ ප්‍රමාදයෙන් ජනිත යම් දොෂස්ථාන විද්‍යමානවීනම් ප්‍රශස්ත පණ්ඩිතයෝ සමාධිය භජනයකරමින් ඒ ශොධනය කෙරෙත්වා.

විලේගොඩ, ධම්මානන්ද භික්ෂු.

ශ්‍රී බුද්ධ වර්ෂ 2452 ඇසළ
මසපුර පසළොස්වක් දින
අම්බලම්ගොඩ සුනන්දාරාම
මහා විහාරයේදීය.

# අඞ්ගුත්තර නිකාය ගාථා සන්නය.

# ANGUTTARA NIKĀYA GĀTHĀ SANNAYA.

# ANGUTTARA NIKĀYA GĀTHĀ SANNAYA.

වීරො විසාරද මතී බල ඤෙය්‍ය සින්ධු
පාරං ගතො පරහිතො කරුණා පපුණ්ණො,
සත්තාන මග්ග සුඛදං තිභවෙක නාථං
නත්වාන තං දසබලං ජිත පඤ්ච මාරං.

අඞ්ගුත්තරාගම සමාගත සුත්තගාථා
ව්‍යාඛ්‍යං කරොම්හ පදත්ථ නිදස්සනෙන,
ආධුනිකාන මනසො හි මුදා වහන්තා
ඛන්තිං භජන්තු කවයො නිජභාසයා හං.

WILEGODA DHAMMĀNANDA BHIKKHU,
*Sunandârâma Mahâ Vihâraya,*
*Ambalangoda.*

# අඞ්ගුත්තර නිකාය ගාථා සන්නය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

1 සෙඛො අසෙඛොච ඉමස්මිං ලොකෙ,
ආහුණෙය්‍යා යජමානානං හොන්ති.
තෙ උජ්ජුභූතා කායෙන වාචාය උද චෙතසා,
ඛෙත්තං තං යජමානානං එත්ථ දින්නං මහප්ඵලන්ති.

**"දුකනිපාතො සමත්තො."**

—o—

2 නිහීයති පුරිසො නිහීනසෙවී නචහායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙට්ඨ මුපනමං උදෙති ඛිප්පං තස්මා අත්තනො උත්තරිං භජෙථ.

3 නිහීයති පුරිසො නිහීනසෙවී නචහායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙට්ඨ මුපනමං උදෙති ඛිප්පං තස්මා අත්තනො උත්තරිං භජෙථ.

---

1 ඉමස්මිං ලොකෙ, මේ ලොකයෙහි; යජමානානං, දන්දෙන්නාවුන්ට; සෙඛො, (සෝවාන්පුද්ගලයා ආදිකොට ඇති සත් මැදැරුම්වූ) ශෛක්‍ෂතෙමේද; (සිල්වත් පෘථක්ජනයාද සෝවාන් පුද්ගලයාගෙන්ම මෙහි සංගෘහිතයි) අසෙඛොච, අශෛක්‍ෂ හෙවත් ක්‍ෂීණාශ්‍රවතෙමේද; ආහුණෙය්‍යා හොන්ති, දක්‍ෂිණාහියෝවෙත්; තෙ, ඒ දක්‍ෂිණාහියෝ තුමූ; කායෙන, කයින්ද; වචාය, වචනයෙන්ද; උද, නැවත; චෙතසා, සිතින්ද; උජ්ජුභූතා, (කායවඞ්කාදි රහිත හෙයින්) ඍජුවූවෝය; යජමානානං, දන්දෙන්නාවුන්ට; තං ඛෙත්තං, ඒ ක්‍ෂෙත්‍රය (නොහොත් වස්තුපිහිටුවීමෙන් කුසල්හටගන්නා ස්ථානය) වෙයි; එත්ථ, එහි; දින්නං, දෙනලද දානය; මහප්ඵලං, මහත්ඵලවෙයි,

4 නචෙව භොගා තථාරූපා නචපසංසන්ති තුබ්බනී,
උභයත්ථ කලිග්ගාහො අජ්ඣස්ස හාවිතබුද්ධියො.

5 අථාපරායං අක්ඛාතො එකචක්ඛුව පුග්ගලො,
ධම්මා ධම්මෙන සංසට්ඨො භොගානිපරියෙසති.

6 ථෙය්‍යෙන කූටකම්මෙන මුසාවාදෙන චූභයං.
කුසලොහොති සංඝාතුං කාමභොගීච මානවො;
ඉතොසො නිරයං ගන්ත්වා එකචක්ඛු විහඤ්ඤති.

---

2. 3 නිහීයසෙවී, හීනයන් සෙවනයකරන්නාවූ; පුරිසො, පුරුෂතෙම; නිහීයති, හීනවේ; තුල්‍යසෙවී, සමානයන් සෙවනයකරන්නාවූ පුරුෂතෙම; කදාචි, කිසිකලෙකත්; නචහායෙථ, නොපිරිහෙන්නේය; සෙට්ඨං, ශ්‍රේෂ්ඨපුද්ගලයාට; උපනමං, නැමියනැනැත්තේ; ඛිප්පං, වහා; උදෙති, වැඩෙයි; තස්මා, එහෙයින්; අත්තනො, තමාට; උත්තරිං, උත්තමයකු; භජෙථ, භජනයකරන්නේය.

4 තථාරූපා, එබඳුවූ; භොගා, භොගයෝ (සම්පත්): නචෙව, නොමඇතිවේත්; පුසංසන්තිච, ඛුසල්ද; නතුබ්බනී, නොතොකෙරේ; හාවිතබුද්ධියො, නැසුනාවූ ඇස්ඇති; අජ්ඣස්ස, අන්ධයාගේ; උභයත්ථ, මෙලොව පරලොව දෙකෙහි; කලිග්ගාහො, අපරාධග්‍රහණයමේ; හෙවත් පරාජයගැන්මවේ.

5 අථාපරං, නැවතද; එකචක්ඛුව; එක්ඇසක් ඇත්තේයයි; අක්ඛාතො, කියනලදී; අයං පුග්ගලො, මේ පුද්ගලතෙම; ධම්මාධම්මෙන.(දශකුශල කර්මපථ)ධර්මයෙන්ද,(දශඅකුශල කර්මපථ)අධර්මයෙන්ද; සංසට්ඨො, මිශ්‍රවූයේ; භොගානි, භොගයන්: පරියෙසති, සොයයි.

6 ථෙය්‍යෙන, සොරකම්න්ද කූටකම්මෙන, කූටකර්මයෙන්ද; මුසාවාදෙනච; මුසාවාදයෙන්ද: (ථෙය්‍යාදිය අතුරෙහි දෙකකින් භොගයන් සොයයි කෙසේද සොරකමින් හා කූටකර්මයෙන්ද සොරකමින් හාමුසාවාදයෙන්ද කූටකර්මයෙන් හා මුසාවාදයෙන්දයන) උභයං, දෙකින්;(සොයයි)සංඝාතුං, භොගයන්රැස්කරන්ට; කාමභොගීචමානවො, කාමසැපවිඳීම්ඇත්තාවූසත්ත්වතෙම; කුසලොහොති, දක්ෂවේ; සො එකචක්ඛු, එක්ඇසක්ඇති (පුරුෂතෙම): ඉතො, මෙලොවයෙන්; නිරයංගන්ත්වා, නරකයටගොස්: විහඤ්ඤති, විශෙෂයෙන් නසියි.

7 ද්විචක්ඛු පන අක්ඛාතො සෙට්ඨො පුරිස පුග්ගලො,
ධම්මලද්ධෙහි භොගෙහි උට්ඨානාධිගතං ධනං.

8 දදාති සෙට්ඨසංකප්පො අබ්‍යග්ගමනසො නරො,
උපෙති භද්දකං ඨානං යත්ථගන්ත්වා න සොචති.

9 අන්ධඤ්ච එකචක්ඛුඤ්ච ආරකාපරිවජ්ජයෙ,
ද්විචක්ඛුං පන සෙවෙථ සෙට්ඨංපුරිස පුග්ගලංති.

10 අවකුජ්ජපඤ්ඤො පුරිසො දුම්මෙධො අවිචක්ඛණො,
අභික්ඛණම්පි චෙ හොති ගන්තා භික්ඛූන සන්තිකෙ.

11 ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
උග්ගහෙතුං න සක්කොති පඤ්ඤාහිස්ස න විජ්ජති.

---

7. 8. ද්විචක්ඛුපන, ඇස් දෙකක් ඇති තැනැත්තේ වනාහි; සෙට්ඨොපුරිසපුග්ගලො, ශ්‍රෙෂ්ඨපුද්ගලයයි; අක්ඛාතො, කියනලද්දේය; ධම්මලද්ධෙහි භොගෙහි, දැහැමින්ලත් භොගයන් කරණකොටගෙන; උට්ඨානාධිගතං ධනං, වීය්‍ර්‍යයෙන් පැමිණි ධනය; සෙට්ඨසංකප්පො, ශ්‍රෙෂ්ඨසංකල්පනාඇති; නරො, මනුෂ්‍යතෙම; අබ්‍යග්ගමනසො, ශඞ්කාරහිත සිත්ඇත්තේ; දදාති, දෙයි; යත්ථ, යම්තැනෙක්හි; ගන්ත්වා, ගොස්; නසොචති, සොකනොකරේද (එතැනට); භද්දකං, ශ්‍රෙෂ්ඨවූ; ඨානං, දෙව්ස්ථානට; උපෙති, පැමිණෙයි;

9 අන්ධඤ්ච, අන්ධයාද; එකචක්ඛුඤ්ච, එක්ඇසක් ඇත්තාද; ආරකා, දුරින්; පරිවජ්ජයෙ, දුරුකරන්නේය; ද්විචක්ඛුංපන, දෙඇස්ඇති; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ; පුරිසපුග්ගලං, පුරුෂයා; සෙවෙථ, සෙවනය් කරන්නේය.

10 අවිචක්ඛණො, විචක්ෂණ බුද්ධිරහිතවූ; දුම්මෙධො, අඥානවූ; අවකුජ්ජපඤ්ඤො පුරිසො, අධොමුඛ ප්‍රඥාඇති පුරුෂතෙම; චෙ, ඉදින්; අභික්ඛණම්පි, නිතරද; භික්ඛූනසන්තිකෙ, භික්ෂූන්ගේ සමීපයෙහි; ගන්තාහොති; යනසුළුවේද.

11 තාදිසො, එබඳුවූ පුරුෂතෙම; කථාය, ධර්මකථාවගේ; ආදිං, ආරම්භයද; මජ්ඣඤ්ච, මැදද; පරියොසානඤ්ච, අවසානයද; උග්ගහෙතුං, ඉගෙනගන්ට; නසක්කොති, නොහැක්කේ; අස්ස, මොහට; පඤ්ඤාහි, ප්‍රඥාතොම්වනාහි; නවිජ්ජති, නොමඇත්තේය.

12 උච්ඡඩගපඤ්ඤො පුරිසො සෙය්‍යො එතෙන වුච්චති,
අභික්ඛණමපි චෙ හොති ගන්තා භික්ඛුන සන්තිකෙ.

13 ආදිං කථාය මජ්ඣඤ්ච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නො ආසනෙ තස්මිං උග්ගහෙත්වාන ඛ්‍යඤ්ජනං;
ධාරෙති සො න පජානාති ගහිතම්පිස්ස මුස්සති.

14 පුථුපඤ්ඤො ච පුරිසො සෙය්‍යො එතෙහි වුච්චති,
අභික්ඛණමපි චෙ හොති ගන්තා භික්ඛුනසන්තිකෙ.

15 ආදිං කථාය මජ්ඣංච පරියොසානඤ්ච තාදිසො,
නිසින්නො ආසනෙ තස්මිං උග්ගහෙත්වාන ඛ්‍යඤ්ජනං.

16 ධාරෙති සෙට්ඨසංකප්පො අව්‍යග්ගමානසො නරො,
ධම්මානුධම්ම පටිපන්නො දුක්ඛස්සන්තං කරෙසියාති.

පුග්ගලවග්ගො තතියො.

---

12 උච්ඡඩගපඤ්ඤො, පුරිසො, ඇකයටබඳු නුවණැති පුරුෂතෙම; එතෙන, මොහුටවඩා; සෙය්‍යොති, ශ්‍රෙෂ්ඨයයි; වුච්චති, කියනුලැබේ; චෙ, ඉදින්; භික්ඛුනසන්තිකෙ, භික්ෂූන්සමීපයට; අභික්ඛණමපි, නිතරද; ගන්තාහොති, යනසුලුවේද.

13 තාදිසො, එබඳු පුරුෂතෙම; කථාය, ධර්මකථාවගේ; ආදිං, ආරම්භයද; මජ්ඣඤ්ච, මධ්‍යයද; පරියොසානංච, අවසානයද; තස්මිං ආසනෙ, ඒ ආසනයෙහි; නිසින්නො, උන්නේ; ඛ්‍යඤ්ජනං, ඛ්‍යංජනය; උග්ගහෙත්වාන, ඉගෙණ; ධූටසීතො, ආසනයෙන් නැගීසිටියේ; නපජානාති, නොදනියි; අස්ස, මොහුවිසින්; ගහිතං, ඉගෙණගත්තාලද්ද; මුස්සති, මුලාවේ.

14 පුථුපඤ්ඤොච, විශාල ප්‍රඥාඇති; පුරිසො, පුරුෂතෙම; එතෙහි, මොවුන්ටවඩා; සෙය්‍යොති, ශ්‍රෙෂ්ඨයයි; වුච්චති, කියනුලැබේ; චෙ, ඉදින්; අභික්ඛණමපි, නිතරද; භික්ඛුනසන්තිකෙ, භික්ෂූන්සමීපයට; ගන්තාහොති, යනසුලුවේද.

15. 16. තාදිසො, එබඳු පුරුෂතෙම; කථාය, ධර්මකථාවගේ; ආදිං, ආරම්භයද; මජ්ඣඤ්ච, මධ්‍යයද; පරියොසානඤ්ච, අවසානයද; තස්මිං ආසනෙ, ඒආසනයෙහි; නිසින්නො, උන්නේ; ඛ්‍යඤ්ජනං, ඛ්‍යඤ්ජනය; උග්ගහෙත්වාන, ඉගෙණ; ධාරෙති, දරයි; සෙට්ඨසංකප්පො,

17 බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා;
තස්මාහි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො.

18 අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන න්හාපනෙන පාදානං ධොවනෙන ච.

19 තාය නං පාරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති.

20 සඞ්ඛාය ලොකස්මිං පරොපරානි යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො අතාරි සො ජාතිජරන්ති බ්‍රූමීති.

---

ශ්‍රෙෂ්ඨකල්පනාඇති; අවඃගගමනසො, විචිකිච්ඡාරහිත සිත්ඇති; නරො, මනුෂ්‍යතෙම; ධම්මානුධම්ම පටිපන්නො, ධර්‍මඅනුධර්‍මයට (හෙවත් නවලොකොත්තර ධර්‍මයටඅනුධර්‍මවූ ශීලයසම්ගපූර්‍වභාග ප්‍රතිපදාවට) පිළිපන්නේ; දුක්ඛස්සන්තංකරෙ, දුක්කෙලවර කරන්නෙක්; සියා, වන්නේය.

17 මාතාපිතරො, මවුපියෝ; බ්‍රහ්මාති, බ්‍රහ්මයායයිද; පුබ්බාචරියාති, පූර්‍වාචාර්‍ය්‍යයෝයයිද; වුච්චරෙ, කියනුලැබෙත්; පුත්තානං, පුත්‍රයන්ගේ; ආහුනෙය්‍යාච, ආහුනෙය්‍යයෝද වෙත් (හෙවත් සත්කාරයට සුදුස්සෝදවෙති); පජාය, පුත්‍රප්‍රජාවට; අනුකම්පකා, අනුකම්පාකරන්නාහුවෙත්; තස්මාහි, එහෙයින් වනාහි; නෙ, ඔවුන්ට; පණ්ඩිතො, පණ්ඩිතතෙම; නමස්සෙය්‍ය, නමස්කාර කරන්නේය; අථ, නැවත; සක්කරෙය්‍ය, සත්කාරකරන්නේය.

18 19. අන්නෙන, ආහාරයෙන්ද; අථ, නැවත; පානෙන, පානයෙන්ද; වත්ථෙන, වස්ත්‍රයෙන්ද; සයනෙනච, සයනයෙන්ද; උච්ඡාදනෙන, ඇඟඉලීමෙන්ද; න්හාපනෙන, නැවීමෙන්ද; පාදානං ධොවනෙනච, පාසේදවීමෙන්ද; මාතාපිතූසු, මවුපියන්කෙරෙහි; තායපාරිචරියාය, ඒ පාරිචරියාවෙන්; හෙවත් මනා සෙවනයෙන්; පණ්ඩිතා, පණ්ඩිතයෝතුමූ; ඉධෙව, මේලොකයෙහිද; නං, ඔහුට; පසංසන්ති, ප්‍රසංශාකෙරෙත්; පෙච්ච, පරලොවෙහි; සග්ගෙ, ස්වර්‍ගයෙහිද; මොදති, (දිව්‍යසම්පත්තියෙන්) සතුටුවේ.

20 ලොකස්මිං, ලොකයෙහි; පරොපරානි, පරආත්මභාව ස්ව ආත්මභාවයන්; සඞ්ඛාය, ඥාණයෙන්දැන; ලොකෙ, ලොක

21 පහානං කාමසඤ්ඤානං දොමනස්සාන චූභයං;
ථිනස්ස ච පනූදනං කුක්කුච්චානං නිවාරණං.

22 උපෙක්ඛාසතිසංසුද්ධං ධම්මතක්කපුරෙජවං.
අඤ්ඤාවිමොක්ඛං පබ්‍රෑමි අවිජ්ජාය පභෙදනං.

23 ලොභජං දොසජං චෙව මොහජං වාපි විද්දසු,
යං තෙනාපි පකතං කම්මං අප්පං වා යදි වා බහුං;
ඉධෙව තං වෙදනීයං වත්ථුං අඤ්ඤං න විජ්ජති.

24 තස්මා ලොභඤ්ච දොසඤ්ච මොහජඤ්චාපි විද්දසු,
විජ්ජං උප්පාදයං භික්ඛු සබ්බා දුග්ගතියො ජහෙති.

---

යෙහි; කුන්මි, ක්ෂීණාශ්‍රවයන්හි; යස්ස, (රහත්වූ) යම්කෙනෙකුගේ; ඉංජිතං, (රාග ද්වේෂ මෝහ මාන දෘෂ්ටි යන ක්ලේශ දුශ්චරිතාදීන්ගෙන්) කම්පා වීම්ක්; නත්ථි, නැත්තේද; සන්තො, (ක්ලේශයන් සංසිඳවූ හෙයින්) ශාන්තවූ; විධූමො, (කායදුශ්චරිතාදි) දුම්රහිතවූ; අනීඝො, දුක් නැත්තාවූ; නිරාසො, තෘෂ්ණාරහිතවූ; සො, හෙතෙම; ජාතිජරං, ජාතිය හා ජරාව (මෙහි ව්‍යාධියහා මරණයත් ගැනිතමැයි) අතාරි, එතරකළේ යයි; බ්‍රෑමි, කියමි.

21. 22 කාමසඤ්ඤානං, කාමසංඥාවන්ගේද; (පංචකාමගුණයෙහි ලොභ සහගතවූ සිත්සමග උපදනා සංඥාවන්ගේද) දොමනස්සානඤ්ච (චෛතසිකවූ) දොම්නස්හුගේද; (යන) උභයං, දෙදෙනාගේ; පහානං, දුරුකිරීමද; ථිනස්ස, (චිත්තයාගේ සැඟවීමවූ; ලීනභාවයයි කියනලද) ථිනයාගේ; පනූදනංච, දුරුකිරීමද; කුක්කුච්චානං, කුකස්හුගේ; නිවාරණං, වැළැක්වීමද; උපෙක්ඛාසතිසංසුද්ධං, (චතුර්ථධ්‍යානඵලයෙහි උපන්නාවූ) උපෙක්ෂාවන් හා ස්මෘතියෙන් අතිශයින් පිරිසිදුවූ; ධම්මතක්කපුරෙජවං, සම්‍යක් සංකල්පනාව පෙරටුව ගමන්කිරීමද; අවිජ්ජාය පභෙදනං, අවිද්‍යාවගේ බිඳීමද; අඤ්ඤාවිමොක්ඛං, අඤ්ඤාසඞ්ඛ්‍යාත පයාවසානයෙහි උපදනා විමොක්ෂය හෙවත් අර්හත් ඵලයයි පබ්‍රෑමි, කියමි.

23. 24. අවිද්දසු, අඥාන බාලතෙම, ලොභජං, ලොභයෙන් උපදනාවූද; දොසජං, ද්වේෂයෙන් උපදනාවූද; මොහජංවාපි, මොහයෙන් උපදනාවූද; යං, කම්මං යම් කර්මයක් (කායාදියෙන්) තෙන, ඒ අඥ බාලයාවිසින්; පකතං, කරණලද්දවූ; අප්පංවා, ස්වල්පවූ හෝ; යදි, ඉදින්; බහුංවා, බොහෝවූ හෝ; තංකම්මං, ඒ කර්මය (එම බාලයාවිසින්); ඉධෙව

25 සබ්බදා වෙ සුඛං සෙති බ්‍රාහ්මණොපරිනිබ්බුතො,
යො න ලිම්පති කාමෙසු සීතිභූතො නිරූපධි.

26 සබ්බා ආසත්තියො ඡෙත්වා විනෙය්‍ය හදයෙ දරං,
උපසන්තො සුඛං සෙති සන්තිං පප්පුය්‍ය චෙතසො,ති.

27 චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාර පරියන්තො අයසා පටි කුජ්ජිතො.

---

මේ ආත්මයෙහිම; වෙදනීයං, විඳයුතුය; වත්ථුං අඤ්ඤං න විජ්ජති, (ඒ කර්මයාගේ විපාකදීම පිණිස) අන්‍යවූ වස්තුවක් නැත්තේය (අනෙකකුවකින් කරණලද කර්මය අනිකකුගේ ආත්මභාවයෙහි විපාකනොදෙයි) තස්මා, එහෙයින්; විද්දසු, නුවණැත්තාවූ පණ්ඩිතතෙම; ලොභංච, ලොභයෙන් උපන්නාවූද; දොසංච, ද්වෙෂයෙන් උපන්නාවූද; මොහජංචාපි, මොහයෙන් උපන්නාවූද (කර්මය නොකෙරෙයි) භික්ඛු, (ඒ) භික්ෂූතෙම; විජ්ජං උප්පාදයං (අර්හත්මාර්ග) විද්‍යාව උපදවන්නේ; සබ්බා දුග්ගතියො ජහෙ, සියලු දුර්ගතීන් හරනේය.

25 යො, යමෙක්තෙම; කාමෙසු, (වස්තුකාම ක්ලෙශ) කාමයන්හි; න ලිම්පති, (තෘෂ්ණාදෘෂ්ටි ලෙපයෙන්) ආලේප නොවේද; සීතිභූතො, (අභ්‍යන්තරයෙහි තැවීම කරන්නාවූ ක්ලෙශ රහිත හෙයින්) සිසිල්වූයේද; නිරූපධි, (ක්ලෙශොපධීන්ගේ අභාවයෙන්) උපධිරහිතවූයේද; පරිනිබ්බුතො, (ක්ලෙශ පරිනිර්වාණයෙන්) පිරිනිවියේද; බ්‍රාහ්මණො, (බැහැර කරණලද පව් ඇති ඒ ක්ෂීණාශ්‍රව) බ්‍රාහ්මණතෙම; වෙ, ඒකාන්තයෙන්; සබ්බදා, සියලුකල්හි; සුඛං සෙති, සැපසේ සයනය කෙරෙයි.

26 සබ්බා ආසත්තියො, (රූපාදි අරමුණුවල විශේෂයෙන් ඇලුනුහෙයින් ආසත්තියයි කියනලද) සියලු තෘෂ්ණාවන්, ඡෙත්වා, සිඳ; හදයෙ දරං, හෘදය ඇසුරුකලාවූ පීඩාව; විනෙය්‍ය, හික්මවා (සංසිඳුවා); උපසන්තො, සංසිඳුනේ; චෙතසො, චිත්තයාගේ; (ශාන්තහොත් සිතින්) සන්තිං, ශාන්තියට; (හෙවත් ක්ලෙශනිර්වාණයට) පප්පුය්‍ය, පැමිණ; සුඛං, සැපසේ; සෙති, සයනයකෙරෙයි.

27 චතුක්කණ්ණො, කොන්සතරක් ඇත්තේය; චතුද්වාරො, දොරසතරක් ඇත්තේය; භාගසො, කොටස්වශයෙන්; විභත්තො, බෙදනලද්දේය; මිතො, කොටස් වශයෙන් පමණ කරණලද්දේය;

28 තසස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා,
සමනතා යොජනසතං ඵරිත්වා තිටඨති සබබදා, ති.

29 චොදිතා දෙවදූතෙහි යෙ පමජජනති මානවා,
තෙ දීඝරතතං සොචනති හීනකායූපගා නරා.

30 යෙ ච ඛො දෙවදූතෙහි සනතා සපපුරිසා ඉධ,
චොදිතා නපපමජජනති අරියධමෙම කුදාචනං.

31 උපාදානෙ භයංදිසවා ජාතිමරණ සමභවෙ,
අනුපාදා විමුචචනති ජාතිමරණසඞඛයෙ.

---

අයොපාකාර පරියනෙතා, යපවුරකින් පරික්ෂිප්තය; අයසා, යපින් කින්; පටිකුජ්ජිතො, වැසුනේය.

28 තසස, ඒ අවීචිමහානරකයාගේ; භූමි, භූමිතොමෝ; අයොමයා, අයොමයවත්නීය; ජලිතා, ජ්වලිතවිය; තෙජසායුතා, තෙජසින් යුක්තය; සබබදා, සියලුකල්හි; සමනතා, හාත්පස; යොජනසතං, යොදුන්සියයක්; ඵරිත්වා, පැතිර; තිටඨති, සිටියි,

29 දෙවදූතෙහි, දෙවදූතයන්විසින්; චොදිතා, චොදනාකරණ ලද; යෙමානවා, යම්මනුෂ්‍යකෙනෙක්; පමජජනති, ප්‍රමාදවෙද්ද; හීනකායූපගා, ලාමක ශරීරයටපැමිණියාවූ; තෙ නරා, ඒ මනුෂ්‍යයෝ; දීඝරතතං, බොහෝකාලයක්මුලුල්ලෙහි; සොචනති, සොකකෙරෙත්.

30 ඉධ, මේලොකයෙහි; සනතා, ශාන්තවූ; යෙචඛොසපපුරිසා, යම් සත්පුරුෂකෙනෙක් වනාහි; දෙවදූතෙහි, දෙවදූතයන්විසින්; චොදිතා, චොදනාකරණලද්දාහු; අරියධමෙම, ආය්‍ය්‍යධර්මයෙහි; කුදාචනං, කිසිකලකත්; නපපමජජනති, ප්‍රමාදනොවෙත්ද.

31 ජාතිමරණසමභවෙ, ජාතිමරණයන්ටකාරණාවූ; උපාදානෙ, තෘෂ්ණාදෘෂ්ටිග්‍රහණයෙහි(නොහොත් තදින් අල්වාගැණීමෙහි)භයං දිසවා, භයදැක; (ඒමනුෂ්‍යයෝ) ජාතිමරණසඞඛයෙ, ඉපදීම් මැරීම් ක්ෂයකිරීමයයිකියනලද නිර්වාණයෙහි; අනුපාදා, උපාදානරහිතව; විමුචචනති,මිදෙත්,

32 තෙ ඛො ප්පමත්තා සුඛිතා දිට්ඨ ධම්මාභිනිබ්බුතා,
සබ්බ වෙර භයාතීතා සබ්බං දුක්ඛං උපච්චගුං,ති.

33 චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමී,
පාටිහාර්ය පක්ඛඤ්ච අට්ඨඞ්ග සුසමාගතං;
උපොසථං උපවසෙය්‍ය යොපස්ස මාදිසො නරො,ති.

34 චාතුද්දසිං පඤ්චදසිං -පෙ- යොපස්ස මාදිසො නරො,ති.

35 චාතුද්දසිං පඤ්චදසිං -පෙ- යොපස්ස මාදිසො නරො,ති.

36 චාතුද්දසිං පඤ්චදසිං -පෙ- යොපස්ස මාදිසො නරො,ති.

37 ව්‍යාධි ධම්මා ජරා ධම්මා අථො මරණ ධම්මිනො,
යථා ධම්මා තථා සන්තා ජිගුච්ඡන්ති පුථුජ්ජනා.

---

32 සුඛිතා, සුවපත්වූ; දිට්ඨධම්මාභිනිබ්බුතා, ඉහාත්මභාවයෙහි (සකලක්ලෙශයන් නිවීමෙන්) මනාවනිවීගියාවූ; සබ්බවෙරභයාතීතා, සියලු වෛර භය ඉක්මෙව්වාවූ; අප්පමත්තා, අප්‍රමාදවූ; තෙ ඛො, ඒ සත්පුරුෂයෝවනාහු; සබ්බංදුක්ඛං, සියලු සසරදුක්; උපච්චගුං; ඉක්මෙව්වාහුමවත්.

33. 34. 35. 36. යොපිනරො, යම් මනුෂ්‍යයෙක් තෙම; මාදිසො අස්ස, මා සේවන්නේද; (නොහොත් මාවිසින් පැමිණෙනලද සම්පත්තියට පැමිණෙන්ට කැමතිවන්නේද; (ඒමනුෂ්‍යතෙම) චාතුද්දසිං, තුදුස්වක්දිනයෙහිද; පඤ්චදසිං,පසළොස්වක්දිනයෙහිද; යාව පක්ඛස්ස අට්ඨමී,පක්ෂයසම්බන්ධවූ; යම් අටවක්දිනයෙක් ඇද්ද එදිනෙහිද; පාටිහාරිය පක්ඛඤ්ච,* ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂයෙහිද; අට්ඨඞ්ග සුසමාගතං, අටගුණ අභින්‍යුක්තවූ; උපොසථං, උපොසථයෙහි; උපවසෙය්‍ය, වාසයකරන්නේය,

37 ව්‍යාධිධම්මා, ව්‍යාධිස්වභාවකොට ඇත්තාවූද; ජරාධම්මා, ජරාව ස්වභාවකොට ඇත්තාවූද; අථා, නැවත; මරණධම්මිනො,

---

* ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂයනම් වසතුලතෙමස නිබද්ධඋපොසථය,ඒනොහැක්කාහට පවාරණදෙක අතුරෙහි, එක්මසක් නිබද්ධ උපොසථය, එද නොහැක්කාහට ප්‍රථමපවාරණය පටන් එක් අඩමසෙක්වෙයි,

38 අහඤ්චෙතං ජිගුච්ඡෙය්‍යං එවං ධම්මෙසු පාණිසු,
න මෙතං පතිරූපස්ස මම එවං විහාරිනො.

39 සොහං එවං විහරන්තො ඤත්වා ධම්මං නිරූපධිං,
ආරොග්‍යෙ යොබ්බනස්මිංච ජීවිතස්මිංච යෙමදා.

40 සබ්බෙ මදෙ අභිභොස්මි නෙක්ඛම්මෙ දට්ඨුඛෙමතං,*
තස්සමෙ අහු උස්සාහො නිබ්බාණං අභිපස්සතො.

41 නාහං භබ්බො එතරහි කාමානි පතිසෙවිතුං,
අනිවත්ති භවිස්සාමි බ්‍රහ්මචරිය පරායනො,ති.

---

මරණසභාවකොට ඇත්තාවූද; පුථුජ්ජනා, පෘථක්ජනයෝතුමූ; යථාධම්මා, (ව්‍යාධිආදියෙන්) යථාසභාව ඇත්තාහුද; තථාසන්තා, එසේවූවාහුම; (නොගෙහාත් නොවැළකුනු ව්‍යාධිසභා ඇත්තාහුම අන්පුගලක්) ජිගුච්ඡන්ති, පිළිකුල්කෙරෙත්,

38 අහංචෙතං, ඉදින් මම වනාහී; එවංධම්මෙසු, මෙසේ සභාව ඇත්තාවූ: පාණිසු, ප්‍රාණීන්කෙරෙහි; ජිගුච්ඡෙය්‍යං, පිළිකුල්කරන්නෙම්ද; එවං, මෙසේ; විහාරිනො, වාසයකරන්නාවූ; මම, මට; එතං, මේ පිළිකුල්කිරීම; න පතිරූපංඅස්ස, සුදුසු නොවන්නේය·

39. 40. සො අහං, ඒ මම; එවං විහරන්තො, මෙසේ(අනිකෙකුම පිළිකුල්කරමින්) වාසයකරන්නෙම්; නිරූපධිං ධම්මං. සර්වොපධිරහිත නිර්වාණධර්මය; ඤත්වා, දැන; ආරොග්‍යෙ, නිරොගීබැව්හිද; යොබ්බනස්මිඤ්ච, යෞවනයෙහිද; ජීවිතස්මිං, ජීවිතයෙහිද; යෙමදා, යම්මදකෙනෙක් ඇද්ද; සබ්බමදෙ,(ඒ)සියලු මදයන්; අභිභොස්මි, මැඩපැවැත්වූයෙමි; නෙක්ඛම්මෙ, නෛෂ්ක්‍රම්‍යයයි කියනලද නිර්වාණයෙහි; ඛෙමතං, ක්ෂෙමභාවය; දට්ඨු, දැක; නිබ්බාණං, නිර්වාණය; අභිපස්සතො, මනාකොට දක්නාවූ; තස්සමෙ, ඒ මාගේ; උස්සාහො, උත්සාහය; අහු, වූයේය.

41 අහං, මම; එතරහි, දැන්; කාමානි, කාමයන්; පතිසෙවිතුං, සෙවනයකරන්නට; න භබ්බො, භව්‍යයෙක් නොවෙමි; බ්‍රහ්මචරිය පරායනො, (මාර්ග)බ්‍රහ්මචර්‍ය්‍යාව පිහිටකොට ඇත්තේ; අනිවත්ති භවිස්සාමි, (ප්‍රව්‍රජ්‍යාවෙන් හා සර්වඥතාඥානය කෙරෙන්ද)නොපසුබස්නා වීර්‍ය්‍යඇතිවන්නෙමි.

---

* "නෙක්ඛම්මං දට්ඨුඛෙමතො" තිපි පාඨො.

42 නත්ථි ලොකෙ රහො නාම පාපකම්මං පකුබ්බතො,
අත්තා තෙ පුරිස ජානාති සච්චං වා යදි වා මුසා.

43 කල්‍යාණං වත භො සක්ඛි අත්තානං අතිමඤ්ඤසි,
යො සන්තං අත්තනි පාපං අත්තානං පරිගූහසි.

44 පස්සන්ති දෙවා ච තථාගතා ච ලොකස්මිං බාලං විසමං චරන්තං,
තස්මා හි අත්තාධිපකො සතො චරෙ ලොකාධිපො ච නිපකො ච ඣායී;
ධම්මාධිපො ච අනුධම්මචාරී න හීයති සච්චපරක්කමො මුනි.

45 පසය්හ මාරං අභිභුය්‍ය අන්තකං යො ච ඵුසී ජාතික්ඛයං පධානවා,
ස තාදිසො ලොකවිදූ සුමෙධො සබ්බෙසු ධම්මෙසු අතම්මයො මුනි, ති.

දෙවදූතවග්ගො චතුත්ථො.

---

42 ලොකෙ, ලොකයෙහි; පාපකම්මං, පාපකර්මය; පකුබ්බතො, කරන්නාහට; රහොනාම, රහසක් නම්; නත්ථි, නැත්තේය; පුරිස, පුරුෂය; සච්චං වා, සත්‍යයහෝ; යදි, ඉදින්; මුසා වා, බොරුවහෝ; තෙ, තාගේ; අත්තා, චිත්තයතෙම; ජානාති, දනියි.

43 භො, පින්වත; වත, ඒකාන්තයෙන්; කල්‍යාණං, යහපත; සක්ඛි, සාක්ෂිවේ; අත්තානං, තමා; අතිමඤ්ඤසි, ඉක්මවා සිතන්නෙහිද; යො, යමෙක්තෙම; අත්තනි, තමාකෙරෙහි; සන්තං, ඇත්තාවූ; පාපං, පාපය; අත්තානං, තමන්ට; පරිගූහසි, සඟවන්නෙහිද.

44 ලොකස්මිං, ලොකයෙහි; විසමංචරන්තං, විසමව හැසිරෙන්නාවූ; බාලං, බාලයා; දෙවාච, දෙවියෝද; තථාගතාච, තථාගතයෝද; (නොහොත් සබ්බයෝද) පස්සන්ති, දකිත්; තස්මාහි, එහෙයින්; චනාහි, අත්තාධිපකො, තමා අධිපතිකොට ඇත්තේද; සතො, සිහිඇත්තේද; ලොකාධිපො, ලොකය ශ්‍රෙෂ්ඨකොට ඇත්තේද; නිපකොච, ප්‍රඥඇත්තේද; ඣායී, ධ්‍යානඇත්තේද; ධම්මාධිපොච, ධර්මය ජ්‍යෙෂ්ඨකොට ඇත්තේද; අනුධම්මචාරී, ධර්මය අනුව හැසිරෙනසුලුවූද; චරෙ, හැසිරෙන්නේද; සච්චපරක්කමො, (ඒ)සත්‍යවීර්‍ය්‍යය ඇති; මුනි, තපස්වීතෙම; නහීයති, නොපිරිහෙයි.

45 සො, යමෙක්තෙම; මාරං, මාරයා; පසය්හ, බලාත්කාරයෙන් යටහත්කොට; අන්තකං, මාරයා; අභිභුය්‍ය, මැඩ; පධානවා වීර්‍ය්‍යඇත්තේ; ජාතික්ඛයං, ජාතික්ෂයකරන්නාවූ අභිනිවය; ඵුසීච, සපයී

46 දස්සන කාමො සිලවතං සද්ධම්මං සොතු මිච්ඡති,
විනෙය්‍ය මච්ඡෙරමලං සවෙ සද්ධොති වුච්චති.

47 සබ්භි දානං උපඤ්ඤත්තං අහිංසා සංඤ්ඤමො දමො,
මාතාපිතු උපට්ඨානං සන්තානං බ්‍රහ්ම චාරියං.

48 සතං එතානි ඨානානි යානි සෙවෙථ පණ්ඩිතො,
අරියො දස්සන සම්පන්නො සලොකං භජතෙ සිවන්ති.

49 යථාපි පබ්බතො සෙලො අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
තංරුක්ඛා උපනිස්සාය වඩ්ඪන්තෙ තෙවනස්පති.

---

කාලේද; තාදිසො, එබඳුවූ; ලොකවිදූ, ලොකත්‍රයදන්නාවූ; සුමෙධො, මහාප්‍රඥාඇත්තාවූ; සබ්බසුධම්මෙසු, සියලුධර්‍මයන්හි; අනම්මයො, තෘෂ්ණාරහිතවූ; සොමුනි, ඒ(ක්ෂීණාශ්‍රව) මුනිතෙම, (නොපිරිහෙයි සෙයි).

46 සීලවතං, ශීලවන්තයන්; දස්සනකාමො, දකිනුකැමතිවේද; සද්ධම්මං, සද්ධර්‍මය; සොතුං, අසන්ට; ඉච්ඡති, කැමතිවේද; මච්ඡෙර මලං, මසුරුමල; විනෙය්‍ය, දුරුකරන්නේද; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; සද්ධොති, ශ්‍රද්ධාඇත්තේයයි; වුච්චති, කියනුලැබේ.

47 දානං, දානයද; අහිංසා, හිංසානොකිරීමද; සඤ්ඤමො, ශීල සංයමයද; දමො, ඉන්ද්‍රියදමනයද; සන්තානං, (උත්තමාජීවයෙන්) ශාන්තවූ; බ්‍රහ්මචාරිතං, ශ්‍රෙෂ්ඨචාරිත්‍රයෙන්; මාතාපිතු උපට්ඨානං, මව්පියන්ට උපස්ථානකිරීමද; සබ්භි,සත්පුරුෂයන්විසින්; උපඤ්ඤත්තං, පණවනලද්දේය; (නොහොත් පසස්නාලද්දේය)

48 සතං, සත්පුරුෂයන්ගේ; යානිඑතානි ඨානානි, යම්මේකාරණයෝවෙත්ද; (ඒ මේ කාරණයන්) පණ්ඩිතො, පණ්ඩිතතෙම; සෙවෙථ, සෙවනයකරන්නේය; අරියො, (මේ තුන්කාරණයන් කිරීම් වශයෙන්)ආර්‍ය්‍යවූ; දස්සනසම්පන්නො, දර්‍ශනයෙන්යුක්තවූ; සො, ඒ පුරුෂතෙම; සිවං ලොකං, නිර්භීතවූ දෙව්ලොව; භජතෙ, භජනය කෙරේ; හෙවත් දෙව්ලොවයෙයි.

49 අරඤ්ඤස්මිං, අගාමකස්ථානවූ; බ්‍රහාවනෙ, මහාවනයෙහි;

50 තථෙව සීල සම්පන්නං සද්ධං කුලපතිං ඉධ,
උපනිස්සාය වඩ්ඪන්ති පුත්ත දාරා ච බන්ධවා;
අමච්චා ඤාතිසඞ්ඝා ච යෙ චස්ස අනුජීවිනො.

51 තස්සෙස සීලවතො සීලං චාගං සුචරිතානි ච,
පස්සමානා නු කුබ්බන්ති යෙ භවන්ති විචක්ඛණා,

52 ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගති ගාමිනං,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනො,ති.

"මූලවග්ගො පඤ්චමො."

—o—

පඨමො පණ්ණාසකො සමත්තො.

---

සෙලොපබ්බතො, ශෛලපර්වතයක්වේද; තං උපනිස්සාය, ඒ පර්වතය ආශ්‍රයකොට; එතෙ වනස්පතීරුක්ඛා, මේ වනස්පතී වෘක්ෂයෝ; යථාපි වඩ්ඪන්ති, යම්සේ වැඩෙද්ද.

50 තථෙව, එපරිද්දෙන්ම; ඉධ, මේලොකයෙහි; සීලසම්පන්නං, ශීලයෙන් යුක්තවූ; සද්ධං, ශ්‍රද්ධාඇති; කුලපතිං, කුලශ්‍රෙෂ්ඨයා; උපනිස්සාය, ආශ්‍රයකොට; පුත්තදාරාච, අඹුදරුවෝද; බන්ධවා, නෑයෝද; අමච්චා, අමාත්‍යයෝද; ඤාතිසඞ්ඝාච ඥාතිසමූහයෝද; අස්ස, මොහුගේ; යෙඅනුජීවිනො, අනුව ජීවත්වන්නාවූ යම්කෙනෙක් ඇද්ද, (ඔහුද) වඩ්ඪන්ති, වැඩෙත්.

51 යෙවිචක්ඛණා, යම් නුවණැත්තාහු; භවන්ති, වෙත්ද; තෙ, ඔහු; සීලවතො, ශීලවන්තවූ; අස්ස, මොහුගේ; සීලං, ශීලයද; චාගං, ත්‍යාගයද; සුචරිතානිච, සුචරිතයන්ද; පස්සමානා, බලන්නාහු; අනුකුබ්බන්ති, අනුවහැසිරෙත්.

52 ඉධ, මේලොකයෙහි; සුගතිගාමිනං මග්ගං, සුගතියට යන්නාවූ මාර්ගයවූ; ධම්මං, කුශලධර්මයෙහි; චරිත්වාන, හැසිර; කාමකාමිනො, කාමය කැමතිවූවාහු; නන්දිනො, සතුටුසිත්ඇත්තාහු; දෙවලොකස්මිං, දිව්‍යලොකයෙහි; මොදන්ති, සතුටුවෙත්.

53 උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා.
එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි.

54 යොධ කායෙන සඤ්ඤමො වාචාය උද චෙතසා,
තං තස්ස පෙතස්ස සුඛාය හොති යං ජීවමානො පකරොති පුඤ්ඤං.

55 ආදිත්තස්මිං අගාරස්මිං යං නීහරති භාජනං,
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

56 එවමාදීපිතො ලොකො ජරාය මරණෙන ච,
නීහරෙථෙව දානෙන දින්නං හොති සුනීහතං.

---

53 ජීවිතං, ජීවිතෙන්ද්‍රිය; උපනීයති, හකුලුවනුලැබේ; නොහොත් ජාතිය විසින් ජරාවටද, ජරාව විසින් ව්‍යාධියටද, ව්‍යාධිය විසින් මරණයටද, මරණය විසින් නැවත ඉපදීමටද, එළඹවනුලැබේ. ආයු, ආයුෂය; අප්පං, ස්වල්පය; ජරූපනීතස්ස, ජරාවට පමුණුවනලද්දහුට; තාණා, රක්ෂස්ථානයෝ; න සන්ති, විද්‍යමාන නොවෙත්; මරණෙ, මරණයෙහිලා; එතං භයං, මේ භය; පෙක්ඛමානො, දක්නේ; සුඛාවහානි, සැපඑළවන්නාවූ; පුඤ්ඤානි, පින්; කයිරාථ, කරන්නේය.

54 ඉධ, මේලොකයෙහි; ජීවමානො, ජීවත්වන්නේ; කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද; උද, නැවත; චෙතසා, සිතින්ද; යො සංයමො, යම්හික්මීමක් වේද; යං පුඤ්ඤං, යම් කුශලයක්; පකරොති, කෙරේද; තං, එපින; පෙතස්ස, පරලොවගියාවූ; තස්ස, ඕහට; සුඛත්ථාය, සැපපිණිස; හොති, වේ.

55 අගාරස්මිං, ගෙය; ආදිත්තස්මිං, ගිනිඇවිලුනුකල්හි; යං භාජනං, යම්භාණ්ඩයක්; නීහරති, (එසින්) මැත්කෙරේද; තං, ඒභාණ්ඩය; තස්ස, ඕහට; අත්ථාය, ප්‍රයොජනපිණිස; හොති, වේද; යං, යම් භාණ්ඩයක්; තත්ථ, එහි; ඩය්හති, දනුලැබේද; (ඒ භාණ්ඩය) නොව, ප්‍රයොජනපිණිස නොවේද.

56 එවං, මෙසේ; ලොකො, ලොවැසිතෙම; ජරාය, ජරාව විසින්ද; මරණෙනච, මරණයවිසින්ද; ආදීපිතො, දල්වනලද්දේද; දානෙන, දීමකරණකොටගෙන; නීහරෙථෙව, මැත්කරගන්නේමය; දින්නං, දෙනලද්ද; සුනීහතං හොති, මනාකොට මැත්කරගන්නාලද්දේවේ.

57 යොධ කායෙන සඤ්ඤමො වාචාය උද චෙතසා,
තං තස්ස පෙතස්ස සුඛාය හොති යඤ්ජීවමානො පකරොති
පුඤ්ඤං,ති,

58 ඉති කණ්හාසු සෙතාසු රොහිණීසු හරීසුවා,
කම්මාසාසු සරූපාසු ගොසු පාරෙවතාසුවා.

59 යාසු කාසුච එතාසු දන්තො ජායති පුඞ්ගවො,
ධොරය්හො බලසම්පන්නො කල්‍යාණජවනික්කමො.

60 තමෙව භාරෙ යුඤ්ජන්ති නාස්ස වණ්ණං පරික්ඛරෙ,
එවමෙව මනුස්සෙසු යස්මිං කස්මිංචි ජාතියෙ.

61 ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ
යාසු කාසුච එතාසු දන්තො ජායති සුබ්බතො.

---

57. (54 වෙනි අඞ්කය බලනු.)

58. 59. ඉති, මෙසේ; කණ්හාසු, කළුවූහෝ; සෙතාසු, සුදුවූහෝ; රොහිණීසු, රතුවූහෝ; හරීසුවා, පලාවන්වූහෝ; කම්මාසාසු, ලප ස්වරූපවූහෝ; සරූපාසු, තමන්ගේ වස්සන්හා සමාන ස්වරූපවූහෝ; පාරෙවතාසුවා, පරවීයන්ගේ පැහැවූහෝ; යාසු කාසුච එතාසු, මේ යම්කිසි; ගොසු, දෙනුන්කෙරෙහි; දන්තො, දැමුයාවූ; ධොරය්හො, ධුරය ඉසිලීමට සමර්ථවූ; බලසම්පන්නො, බලයෙන්යුක්තවූ; කල්‍යාණජවනික්කමො, යහපත් සැපුම්වේගයෙන් යන්නාවූ; පුඞ්ගවො, වෘෂභයෙක්; ජායති, උපදිද.

60 61. තමෙව, ඒ වෘෂභයාම; භාරෙ, බරෙහි; යුඤ්ජන්ති, යෙදත්; අස්ස, මොහුගේ; වණ්ණං, ශරීරවර්ණය; නපරික්ඛරෙ, පරීක්ෂා නොකෙරෙත්; (ධුරයඋසුලන කාර්යම පරීක්ෂාකෙරෙත්) එවමෙව, මෙපරිද්දෙන්ම; මනුස්සෙසු, මනුෂ්‍යයන්කෙරෙහි; යස්මිං කස්මිංචි ජාතියෙ, යම්කිසි කුලොත්පත්තියක්හි; ඛත්තියෙ, ක්ෂත්‍රිය කුලයෙහිද; බ්‍රාහ්මණෙ, බ්‍රාහ්මණකුලයෙහිද; වෙස්සෙ, වෛශ්‍ය කුලයෙහිද; සුද්දෙ, ශුද්‍රකුලයෙහිද; චණ්ඩාලපුක්කුසෙ, චණ්ඩාලකුලයෙහා පුක්කුස කුලයෙහිද; (යන) යාසු කාසුච එතාසු, (ක්ෂත්‍රියාදි ප්‍රභෙදඇති) මේ කිසියම් ජාතිඇත්තීන්කෙරෙහි; දන්තො, දමිතවූ; සුබ්බතො, මනාවූ ව්‍රතඇත්තෙක්; ජායති, උපදිද.

62 ධමමටඨො සීල සමපනෙනා සචචවාදී හිරිමනො,
පහීණ ජාති මරණො බ්‍රහමචරියසස කෙවලී.

63 පනන භාරො විසංයුතෙතා කත කිචෙචා අනාසවො,
පාරගූ සබබ ධමමානං අනුපාදාය නිබබුතො.

64 තසමිඤෙඤව විරජෙ ඛෙතෙත විපුලා හොති දකඛිණා,
බාලාව අවිජානනතා දුමෙමධා අසසුතාවිනො.

65 බහිදධා දදනති දානානි නහි සනෙත උපාසරෙ,
යෙච සනෙත උපාසෙනති සපපඤෙඤ ධීර සමමතෙ.

---

62.63. ධම්මට්ඨො, (හෙතෙම) ධර්මයෙහි පිහිටියේද; සීලසම්පන්නො, ශීලයෙන් යුක්තවූයේද; සච්චවාදී, සත්‍යවාදීවූයේද; හිරිමනො, ලජ්ජා ඇත්තේද; පහීණජාතිමරණො, ප්‍රහීණකළාවූ ජාතිය හා මරණය ඇත්තේද; බ්‍රහ්මචරියස්සකෙවලී, බ්‍රහ්මචර්‍ය්‍යාව සම්බන්ධවූ සියල්ලෙන් යුක්තවූයේද; හෙවත් සම්පූර්ණ බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේද; පන්නභාරො, බහාතබනලද ස්කන්ධ ක්ලේශාදිවූ බර ඇත්තේද; විසංයුත්තො, සංසාරයෙන් වෙන්වූයේද; කතකිච්චො, චතුර්විධමාර්ගයෙන් කරණලද කෘත්‍ය ඇත්තේද; අනාසවො, කාමාදි ආශ්‍රව රහිතවූයේද; සබ්බධම්මානං, (පඤ්චස්කන්ධ ද්වාදශායතන අෂ්ටාදශධාතු යන) සියලු ධර්මයන්ගේ; පාරගූ, එතරට පැමිණියේද; අනුපාදාය, උපාදානරහිතව; නිබ්බුතො, (ක්ලේශ සන්තාප දුරුකිරීමෙන්) නිවුනේවේද.

64. 65. විරජෙ, (රාගද්වේෂාදි) රජස් රහිතවූ; තස්මිඤ්ඤෙව ඛෙත්තෙ, ඒ ක්ෂෙත්‍රයෙහිම; දක්ඛිණා, දක්ෂිණාශතාමෝ; විපුලා හොති, මහත් වේ; අවිජානන්තා, (මනාක්ෂෙත්‍රය) නොදන්නාවූ; දුම්මෙධා, ප්‍රඥාරහිතවූ; අස්සුතාවිනො, (ක්ෂෙත්‍රය පිළිබඳ විනිශ්චය) නොඇසූවාවූ; බාලාව, බාලජනයෝද; දානානි, දානයන්; බහිද්ධා (මේශාසනයෙන්) පිට; දදන්ති, දෙත්; සන්තෙ, ශාන්තවූ; බුදු පසේබුදු රහතුන් කරා නහි උපාසරෙ, නොඑළඹෙත්; ධීරසම්මතෙ, පණ්ඩිතයන් විසින් සම්මතකරණලද හොහොත් සම්භාවනාකරණලද; සප්පඤ්ඤෙ, ප්‍රඥාසහිතවූ; සන්තෙ, ශාන්තයන්කරා; යෙ, යම්කෙනෙක්; උපාසෙන්ති, එළඹෙත්ද.

66 සද්ධා ච තෙසං සුගතෙ මූලජාතා පතිට්ඨිතා,
දෙවලොකඤ්ච තෙ යන්ති කුලෙ වා ඉධ ජායරෙ;
අනුපුබ්බෙන නිබ්බානං අධිගච්ඡන්ති පණ්ඩිතා,ති.

67 අනුච්චාවචසීලස්ස නිපකස්ස ච ඣායිනො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං.

68 තං වෙ තමොනුදං ධීරං තෙවිජ්ජං මච්චුහායිනං,
හිතං දෙවමනුස්සානං ආහු සබ්බප්පහායිනං.

69 තීහි විජ්ජාහි සම්පන්නං අසම්මූළ්හවිහාරිනං,
බුද්ධං අන්තිමසාරීරං තං නමස්සන්ති ගොතමං.

---

66 තෙසං, ඔවුන්ගේ; සද්ධා ච, ශ්‍රද්ධාවද; සුගතෙ, නිරවද්‍යගමන් ඇතිහෙයින් සුගත නම්වූ බුදුන්කෙරෙහි; මූලජාතා, හටගත් මුල් ඇත්තීය; පතිට්ඨිතා, මනා පිහිටීම් ඇත්තීය; තෙ, ඔහුතුමූ; දෙවලොකඤ්ච, දිව්‍යලොකයටද; යන්ති, යෙත්; ඉධ, මේලොකයෙහි; කුලෙ වා, ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදි පූජ්‍යකුලයෙක්හි හෝ; ජායරෙ, උපදිත්; පණ්ඩිතා, පණ්ඩිතයෝතුමූ; (ශීලසමාධිප්‍රඥාගුණයන්පුරා) අනුපුබ්බෙන, පිළිවෙළින්; නිබ්බානං, නිර්වාණය; අධිගච්ඡන්ති, අවබොධ කෙරෙත්.

67. 68. අනුච්චාවචසීලස්ස, (එකාන්තයෙන්වැඩුනුහෙයින්) අභිශුද්ධයයි කියනලද ආජීවශීලයැති; නිපකස්ස ච, ප්‍රඥාවත්වූද; ඣායිනො, (ආලම්බනොපනිධ්‍යානලක්‍ෂණොපනිධ්‍යාන සංඛ්‍යාත ද්විප්‍රකාරධ්‍යානයෙන්) ධ්‍යායීවූද; යස්ස, යමක්හුගේ; චිත්තං, සිත; වසීභූතං, වශගවූයේද; එකග්ගං, (එකහෙයින්) එකාග්‍රවූයේද; සුසමාහිතං, (අරමුණෙහි) මනාකොට පිහිටියේද; තමොනුදං, මොහාන්ධකාරය දුරුකළාවූ; ධීරං, ධෛර්‍ය්‍යයෙන්යුක්තවූ; මච්චුහායිනං, මාරයා දුරුකළාවූ; දෙවමනුස්සානං, දෙවිමිනිසුන්ට; හිතං, හිතවූ; සබ්බප්පහායිනං, සියලුපාපධර්‍මයන් දුරුකළාවූ; තං, ඔහු; වෙ, එකාන්තයෙන්; තෙවිජ්ජං, (පූර්වෙනිවාසානුස්මෘතිඥානාදිවූ) ත්‍රිවිද්‍යාවෙන්යුක්තයයි; ආහු, කීයෝය.

69 තීහිවිජ්ජාහිසම්පන්නං, කීයනලද ත්‍රිවිද්‍යාවෙන්යුක්තවූ; අසම්මූළ්හවිහාරිනං, මුළානුවූ විහරණ ඇති; අන්තිමසාරීරං, පශ්චිමශරීරය දැරූවාවූ; බුද්ධං, චතුස්සත්‍යාවබොධය කළාවූ; ගොතමං, ගෞතමගොත්‍රඇති;

70 පුබ්බෙ නිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සතී,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනී.

71 එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිතලාපනං,ති.

72 යො සීලබ්බතසම්පන්නො පහිතත්තො සමාහිතො,
චිත්තං යස්ස වසීභූතං එකග්ගං සුසමාහිතං.

---

තං, ඒ සම්බුද්ධයා; නමස්සන්ති, (බුද්ධශ්‍රාවකයෝ) නමස්කාර කෙරෙත්; නොහොත් තංගොතමං, ඒ ගෞතමශ්‍රාවකයා; නමස්සන්ති, (දිව්‍යමනුෂ්‍යයෝ) නමස්කාර කෙරෙත්.

70. 71. යො, යමෙක්තෙම්; පුබ්බෙනිවාසං, පෙරවිසූ; කඳපිළිවෙළ වේදී, (පහළකොට) දනීද; සග්ගාපායඤ්ච, (සව්සිව්දැරුම්වූ) ස්වර්ගයහා (සිව්වැදෑරුම්) අපායද; පස්සති, (දිවැසින්) දකීද; අථො, නැවත; ජාතික්ඛයංපත්තො, ඉපදීම ක්‍ෂයකරන් නාවූ අර්හත්ඵලයට පැමිණියේද; අභිඤ්ඤා, (විශිෂ්ටඥානයෙන් දතයුතු ධර්මයන්) විශෙෂයෙන් දැන; වොසිතො, (කටයුතු අවසානකිරීමෙන්) නිෂ්ඨාවට පැමිණියේද; මුනි, (ඒ) ක්‍ෂීණාශ්‍රව මුනිතෙම්; එතාහි තීහි විජ්ජාහි, (යටකියනලද පූර්වේනිවාසඥානාදිවූ) මේත්‍රිවිද්‍යාව කාරණකොටගෙන; තෙවිජ්ජො, ත්‍රිවිද්‍යාවී ඇති; බ්‍රාහ්මණොහොති, බ්‍රාහ්මණවෙයි; අහං, මම; තං; ඔහු; තෙවිජ්ජං, ත්‍රිවිද්‍යාවෙන්යුක්තයයි; වදාමි, කියමි; ලපිතලාපනං, කීයනලද වචනමාත්‍රයක් ඇති; අඤ්ඤං, අනිකකු; න, ත්‍රිවිද්‍යාවෙන්යුක්තයයි නොකියමි. (තමන් ප්‍රත්‍යක්‍ෂවශයෙන් දැන අනුන්ටද ත්‍රිවිද්‍යාව කියන්නක්හුම තෙවිජ්ජකයයි වදාරම්සිසෙයි.)

72 යො, යමෙක්තෙම්; සීලබ්බතසම්පන්නො, ශීලව්‍රතයෙන්යුක්තද; පහිතත්තො, හරිනලද ආත්මාශ්‍රය ඇත්තේද; සමාහිතො, මනාවපිහිටියේද; යස්ස, යමෙකුගේ; චිත්තං, සිත; වසීභූතං, වශගවූයේද; එකග්ගං, (එකෙයින්) එකාග්‍රවූයේද; සුසමාහිතං, මනාකොට පිහිටියේද.

73 පුබ්බෙ නිවාසං යො වෙදී සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤා වොසිතො මුනී.

74 එතාහි තීහි විජ්ජාහි තෙවිජ්ජො හොති බ්‍රාහ්මණො,
තමහං වදාමි තෙවිජ්ජං නාඤ්ඤං ලපිත ලාපනං,ති.

"බ්‍රාහ්මණවග්ගො පඨමො"

—o—

75 යෙ විරුද්ධා සල්ලපන්ති විනිවිට්ඨා සමුස්සිතා,
අනරියගුණමාසජ්ජ අඤ්ඤමඤ්ඤවිවරෙසිනො.

76 දුබ්භාසිතං වික්ඛලිතං සම්පමොහං පරාජයං,
අඤ්ඤමඤ්ඤස්සාභිනන්දන්ති තදරියො කථනාචරෙ.

77 සචෙ චස්ස කථාකාමො කාලමඤ්ඤාය පණ්ඩිතො,
ධම්මට්ඨපටිසංයුත්තා යා අරියචරිතා කථා,

---

73. 74. (70. 71. වෙනි අඩකබලනු.)

75 විරුද්ධා, (ක්‍රොධයෙන්) විරුද්ධවූ; විනිවිට්ඨා, නිශ්චයටනො පැමිණි නියාඇති; සමුස්සිතා, මානයෙන් උස්වූ සිත්ඇති; අඤ්ඤමඤ්ඤ විවරෙසිනො, ඔවුනොවුන්ගේ සිදුරුසොයන්නාවූ; යෙ, යම් කෙනෙක්; අනරියගුණං, අනාර්‍ය්‍යගුණයට; ආසජ්ජ, පැමිණ; සල්ලපන්ති, කථාකෙරෙත්ද.

76 අඤ්ඤමඤ්ඤස්ස ඔවුනොවුන්ගේ; දුබ්භාසිතං, නපුරුතෙපුලුමටද; වික්ඛලිතං, ස්වල්පමාත්‍රමුඛදෝෂයටද; සම්පමොහං, ස්වල්පමාත්‍ර මුඛදෝෂයෙන්වූ මුළාවටද; පරාජයං, පරාජයටද; හෙවත් පැරදීමටද අභිනන්දන්ති, සතුටුවෙත්ද; අරියො, ආර්‍ය්‍යතම; තංකථං, ඒ කථාවෙනි; න ආචරෙ, නොහැසිරෙන්නේය.

77 සචෙ, ඉදින්; පණ්ඩිතො, පණ්ඩිතතෙම; කාලමඤ්ඤාය, කල් දැන; කථාකාමොඅස්ස, කථාකරනු කැමතිවන්නේද; ධම්මට්ඨපටිසංයුත්තා, ධර්මාජීවයෙන් ප්‍රතිසංයුක්තවූ; අරියංචරිතා, ආර්‍ය්‍යචරිතවූ; යාකථා, යම්කථාවක්ඇත්තීද.

78 තං කථං කථයෙ ධීරො අවිරුද්ධො අනුස්සිතො,
අනුපාදින්නෙන මනසා අපලාසො අසාහසො.

79 අනුසූයායමානො සො සම්මදඤ්ඤාය භාසති,
සුභාසිතං අනුමොදෙය්‍ය දුබ්භට්ඨෙ නාපසාදයෙ.

80 උපාරම්භං න සික්ඛෙය්‍ය ඛලිතඤ්ච න ගාහයෙ,
නාභිහරෙ නාභිමද්දෙ න වාචං පයුතං භණෙ.

81 අඤ්ඤාතත්ථං පසාදත්ථං සතං වෙ හොති මන්තනා,
එවං ඛො අරියා මන්තෙන්ති එසා අරියාන මන්තනා;
එතදඤ්ඤාය මෙධාවී න සමුස්සෙය්‍ය මන්තයෙ,ති.

---

78 අවිරුද්ධො, (ක්‍රොධයෙන්) විරුද්ධනුවූ; අනුස්සිතො, මානයෙන් උසස්කොට නොගන්නලද සිත්ඇති; ධීරො, පණ්ඩිතතෙම; අනුපාදින්නෙන, සංසිඳුනුහෙයින් උපාදාන රහිතවූ; මනසා, සිතින්; අපලාසො, යුගග්‍රාහරහිතව; අසාහසො, (රාගාදීන්ගේ වශයෙන්) දරුණුනොව; තං කථං, ඒ කථාව; කථයෙ, කථනයකරන්නේය.

79 සො, සෙතෙම; අනුසූයායමානො, ඊර්ෂ්‍යානොකරන්නේ; සම්මා, මනාකොට; අඤ්ඤාය, දැන; භාසති, කියයි; සුභාසිතං, මනාකොට කියනලද වචනය; අනුමොදෙය්‍ය, අනුමොදන්වන්නේය; දුබ්භට්ඨෙ, නපුරුකොට කියනලද කථාවෙහි; න අපසාදයෙ, නොකලකිරෙන්නේය.

80 උපාරම්භං, (කාරණොත්තරීයලක්ෂණ) උපාරම්භයෙහි; න සික්ඛෙය්‍ය, නොහික්මෙන්නේය; ඛලිතංච, සාලපමාත්‍ර මුඛදොෂයද; න ගාහයෙ, නොගන්නේය; නාභිහරෙ, (ඔබිමොබින් සූත්‍රඑළඹවා) නොමතුරුවන්නේය; නාභිමද්දෙ, (ඇතැම්තරුණු දක්වා) නොමඩින්නේය; පයුතං වාචං, සත්‍යාලීක ප්‍රතිසංයුක්ත වචනය; න භාසයෙ, නොකියන්නේය.

81 වෙ, ඒකාන්තයෙන්; සතං, සත්පුරුෂයන්ගේ; මන්තනා, කථාතොමෝ; අඤ්ඤාතත්ථං, දැනගැණීම පිණිසද; පසාදත්ථං, පැහැදීම ඉපදවීම පිණිසද; හොති, වේ; අරියා, ආර්‍යයෝ; එවං ඛො, මෙසේවනාහි; මන්තෙන්ති, කථාකෙරෙත්; එසා, මේතොමෝ; අරියානං, ආර්‍යයන්ගේ; මන්තනා, කථාවන්නීය; මෙධාවී, පණ්ඩිතතෙම;

82 පාණං න හානෙ න ච දින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

83 මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ මඤ්චෙ ඡමායංව සයෙථ සන්ථතෙ,
එතංහි අට්ඨඞ්ගිකමාහුපොසථං බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

84 චන්දො ච සුරියො ච උභො සුදස්සනා ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා නභෙ පභාසන්ති දිසාවිරොචනා.

---

එතං, මේ ආජීනවස්ථ; අක්ඛයය, දුව; නසමුපෙස්සය, මාතලෙයන් උඩඟුනොව; මන්නාරය, කථාකරන්නේය.

82 පාණං න හානෙ, ප්‍රාණඝාතය නොකරන්නේය; අදින්නං, නොදෙනලද අන්‍යන්සන්තක වස්තුව; න ච ආදියෙ, නොගන්නේය; මුසා න භාසෙ, බොරු නොකියන්නේය; මජ්ජපො, මද්‍යපානය කරන්නෙක් න ච සියා, නොවන්නේය; මෙථුනා, අසද්ධර්මයයි කියනලද; අබ්‍රහ්මචරියා, අශ්‍රෂ්ඨචර්‍යාවෙන්; විරමෙය්‍ය, වලකින්නේය; රත්තිං, (උපොසථයෙහි වාසයකරන්නේ) රාත්‍රිභොජනයද; විකාල භොජනං, (දහවල්) විකාල භොජනයද; න භුඤ්ජෙය්‍ය, අනුභව නොකරන්නේය.

83 මාලං, මල්මාලා; න ධාරෙ, නොදරන්නේය; න ච ගන්ධමාචරෙ, සුවඳ ආඝ්‍රාණය නොකරන්නේය; මඤ්චෙ, (මීටිරියන්පමණ පාඇති කැප) ඇඳෙහි හෝ; ඡමායං වා (සුණුපිරියම්කරණලද) භූමියෙහි හෝ; සන්ථතෙ, (තෘණපත්‍රපලාලාදිය අතුටකරණලද) සංස්තරණයෙහි හෝ; සයෙථ, සයනයකරන්නේය; එතංහි උපොසථං, මේ උපොසථසීලය වනාහි; අට්ඨඞ්ගිකං, අංග අටකින් යුක්තයයි; ආහු, කියත්; දුක්ඛන්තගුනා, දුක් කෙළවරකිරීමට පැමිණියාවූ; බුද්ධෙන, බුදුන් විසින්; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය.

84 සුදස්සනා, මනා දක්කුම්ඇති; තමොනුදා, අඳුරු දුරුකරන්නාවූ; චන්දො ච, චන්ද්‍රයාද; සුරියො ච, සූර්‍ය්‍යයාද; (යන) උභො, දෙදෙන; යාවතා, යම්තාක්; ඔභාසයං, බබුළුවන්නාහු; අනුපරියන්ති,

85 එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං මුත්තාමණී වෙළුරියංච භද්දකං,
සිඞ්ගීසුවණ්ණං අථවාපි කඤ්චනං යං ජාතරූපං හටකන්තිවුච්චති.

86 අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස කලම්පි තෙ නානුභවන්ති සොළසිං,
චන්දප්පභා තාරගණාව සබ්බෙ තස්මාහි නාරීච නරොච සීලවා,

87 අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං,
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

මහාවග්ගො දුතියො,

---

හැසිරෙත්ද; අන්තලික්ඛගා, අහසෙහිගමන්කරන්නාවූ; තෙපභා, ඒ චන්ද්‍රසූර්‍ය්‍යදෙදෙනා; දිසා, සියලුදිසාවන්හි; විරොචනා, විශෙෂයෙන් බබලන්නාහු; නභෙ, අහසෙහි; පභාසන්ති, ආලොකය පතුරුවද්ද.

85 එතස්මිං අන්තරෙ, මේ අතුරෙහි; මුත්තා, (සාමුද්‍රිකාදී අටවැදෑරුම්) මුතුද; මණී, (ඉන්ද්‍රනීලාදී) මාණික්‍යද; භද්දකං, සොඳුරුවූ; වෙළුරියංච, වෛරෑමිණිද; සිඞ්ගීසුවණ්ණං, (ගවශෘඞ්ග සදෘශව උපන් හෙයින්) සිඞ්ගීනම් සවර්ණයද; අථවාපි, නොහොත්; කඤ්චනං, පර්වතයෙහි ජාතසවර්ණද; (යන) යංධනං, යම්ධනයෙක්; විජ්ජති, ඇත්තේද; ජාතරූපං, ශාස්තෘවර්ණසවර්ණයයි කියාද; හටකං, කුහුඹුවන් විසින් මැත්කරණලදහෙයින්) හටකයයි කියාද; යං, යම්සවර්ණයෙක්; වුච්චති, කියනුලැබේද,

86. 87. තෙ, ඒ මුක්තාමාණික්‍යාදීහු; අට්ඨඞ්ගුපෙතස්ස, අෂ්ටාඞ්ගයෙන්යුක්තවූ; උපොසථස්ස, උපොසථයාගේ; සොළසිං, සොළොස්වෙනිවූ; කලම්පි, කලාවට හෙවත් භාගයට; නානුභවන්ති, නොපැමිණෙත්; චන්දප්පභා, චන්ද්‍රරශ්මියට; සබ්බතාරගණාව, සියලු තාරකා සමූහයමෙන්; තස්මාහි, එහෙයින්වනාහි; සීලවා, ශීලවත්තාවූ; නාරීච, ස්ත්‍රීතොමෝද; නරොච, පුරුෂතෙමේද; අට්ඨඞ්ගුපෙතං, අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ; උපොසථං, උපොසථයෙහි; උපවස්ස, වාසයකොට; සුඛුද්‍රයානි, සුඛවිපාකඇත්තාවූ; පුඤ්ඤානි, (අන්නදානාදී) කුසල්ද; කත්වාන, කොට; අනින්දිතා, කිසිවකුහු විසින්; නින්දා නොකරණලද්දාහු; සග්ගංඨානං, ස්වර්ගස්ථානයට; උපෙන්ති, පැමිණෙත්.—කිසිවකුහුවිසින් නින්දානොකරණලදුව දෙව්ලොව උපදිතියි සේයි,

88 න පුප්ඵගන්ධො පටිවාත මෙති න චන්දනං තගර මල්ලිකාවා,
සතංච ගන්ධො පටිවාත මෙති සබ්බාදිසා සප්පුරිසො පවාති.

## ආනන්දවග්ගො තතියො.

—o—

89 සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානු සාරිනො,
ඛයස්මිං පඨමං ඤාණං තතො අඤ්ඤා අනන්තරා.

90 තතො අඤ්ඤා විමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො,
අකුප්පා මෙ විමුත්තීති භව සංයොජනක්ඛයෙ,ති.

91 අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤඤ්ච විරියවා,
ඨාමවා ධිතිමා ඣායී සතො ගුත්තින්ද්‍රියො චරෙ.

---

88 පුප්ඵගන්ධො, (සපු දුනුකේ ආදි) පුෂ්පසුගන්ධයතෙම; පටිවාතං, උඩුසුලඟට; නඑති, නොපැමිණෙන්නේය; චන්දනං සඳුනෙහි සුවඳද; තගරමල්ලිකාවා, තුවරලාගෙයහි හා බෝලිද්දෙයෙහි සුවඳද; න, උඩුසුළඟට නොයෙන්නේය: සතංචගන්ධො, (බුද්ධ පසේබුදු සව්වන් යන) සත්පුරුෂයන්ගේ ශීලාදි ගුණසුගන්ධය; පටිවාතං, උඩුසුලඟට; එති, පැමිණෙන්නේය; සප්පුරිසො, සත්පුරුෂතෙම; සබ්බා දිසා, සියලු දිසාවින්; (ශීලසුගන්ධයෙන්) පවාති, හමයි හෙවත් පතුරුවයි.

89. 90. උජුමග්ගානු සාරිනො, (සෘජුමාර්ගයයි කියනලබන්නාවූ) ආර්‍ය්‍යමාර්ගය අනුව හැසිරෙන්නාවූ; සික්ඛමානස්ස, හික්මෙන්නාවූ; සෙඛස්ස, ශෛක්ෂයාගේ; පඨමං, පළමුව; ඛයස්මිංඤාණං, ක්ලේශක්ෂයකරන්නාවූ මාර්ගඥානයඋපදී; තතොඅනන්තරා, ඊටඅනතුරුව හෙවත් සතරවෙනි මාර්ගයෙන්පසු; අඤ්ඤා, අර්හත්ඵලය උපදී; තතො, නැවත; වෙ, ඒකාන්තයෙන්; මෙ, මාගේ; විමුත්ති, විමුක්තිතොමෝ; භවසංයොජනක්ඛයෙ,භවසංයොජනයන් ක්ෂයකිරීමෙහි; අකුප්පා, කොප්‍යනොවන්නීය; තාදිනො, ලාභාදීයෙහි අකම්ප්‍යවූ; අඤ්ඤාවිමුත්තස්ස, අර්හත්ඵල විමුක්තියෙන් මිදුනාහුගේ; ඤාණං හොති, ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ ඤාණයවේ.

91 අධිශීලං, අධිසීලයද; අධිචිත්තං, අධිචිත්තයද; අධිපඤ්ඤඤ්ච,අධිප්‍රඥාවද;(යන ත්‍රිවිධ ශික්ෂාවෙහි)විරියවා,(කායිකචෛතසික)

92 යථා පුරෙ තථා පච්ඡා යථා පච්ඡා තථා පුරෙ,
යථා අධො තථා උද්ධං යථා උද්ධං තථා අධො.

93 යථා දිවා තථා රත්තිං යථා රත්තිං තථා දිවා,
අභිභුය්‍ය දිසා සබ්බා අප්පමාණ සමාධිනා.

94 තං මාහු සෙක්ඛං පටිපදං අථො සංසුද්ධචාරණං,
තං මාහු ලොකෙ සම්බුද්ධං වීරං පටිපදන්තගුං.

---

වීර්ය්‍යඇත්තේ; ථාමවා, බලඇත්තේ; ධිතිමා, ධෛර්ය්‍යඇත්තේ; ඣානී(ආලම්බනොපනිජ්ඣාන ලක්ඛණූපනිජ්ඣාන වශයෙන් විප්‍රකාර ධ්‍යානයෙන්) ධ්‍යානීවූයේ; සතො, සිහිඇත්තේ; ගුත්තින්ද්‍රියො, රක්ෂිතලද ඉඳුරන්ඇත්තේ; චරෙ, හැසිරෙන්නේය.

92 යථාපුරෙ, පළමුයම්සේ(ශික්ෂාත්‍රයෙහි හික්මේ)ද: තථාපච්ඡා, පසුවත් එසේම හික්මෙයි; යථාපච්ඡා, පසුව යම්සේ(ශික්ෂාත්‍රයෙහි හික්මේ)ද; තථාපුරෙ, පළමුත්එසේම හික්මෙයි; යථාඅධො, යම්සේ (යටකය අශුභවශයෙන් දකී)ද; තථාඋද්ධං, උඩකයත් එසේමසපශ්‍යීකෙරෙයි; යථාඋද්ධං, උඩකය යම්සේ (අශුභවශයෙන් දකී)ද; තථාඅධො, යටකයත් එසේමසපශ්‍යීකෙරෙයි.

93 යථාදිවා, යම්සේදහවල්(ශික්ෂාත්‍රයෙහි හික්මේද: තථාරත්තිං, රාත්‍රියෙහිත් එසේම හික්මෙයි; යථාරත්තිං,රාත්‍රියෙහි යම්සේ(ශික්ෂාත්‍රයෙහි හික්මේ)ද; තථාදිවා, දහවල්හිත් එසේම හික්මෙයි; අප්පමාණසමාධිනා, අර්හත්මාර්ගී සමාධියෙන්; සබ්බාදිසා, සියලුදිශාවන්; අභිභුය්‍ය, අභිභවනයකොට; හෙවත් මැඩ හැසිරෙන්නේය.

94 තං, ඔහු; සෙක්ඛං, ශික්ෂමානවූ; හෙවත් කටයුතු සහිතවූ; පටිපදං, ප්‍රතිපදාඇත්තේයයි; ආහු, කියත්; අථො, නැවත; සංසුද්ධචාරණං, පිරිසිදුසිල්ඇත්තේයයිද කියත්; තං, ඔහු; ලොකෙ, මේලොකයෙහි; වීරං, වීර්ය්‍යයෙන්යුක්තවූ; පටිපදන්තගුං, ප්‍රතිපදාවගේ අවසානයට පැමිණියාවූ; සම්බුද්ධං, චතුස්සත්‍යාවබොධයකළහෙයින්; සම්බුද්ධයයි; ආහු, කියත්.

95 විඤ්ඤාණස්ස නිරොධෙන තණ්හක්ඛය විමුත්තිනො
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො හොති චෙතසො,ති.

---

සමණවග්ගො චතුත්ථො. ලොණඵලවග්ගො පඤ්චමො.

---

මහාපණ්ණාසකො සමත්තො දුතියො,

---

"සම්බොධිවග්ගො පඨමො."

—o—

96 කායසුචිං වචීසුචිං චෙතොසුචිං අනාසවං.
සුචිං සොචෙය්‍ය සම්පන්නං ආහු නින්හාත පාපකං,ති.

97 කායමුනිං වචීමුනිං චෙතොමුනිං අනාසවං,
මුනිං මොනෙය්‍ය සම්පන්නං ආහු සබ්බ පපහායිනං,ති,

අපායිකාවග්ගො දුතියො.

---

95 තණ්හක්ඛයවිමුත්තිනො, තෘෂ්ණාක්ෂය විමුක්ති සංඛ්‍යාත අර්හත්ඵල විමුක්තියෙන් යුක්තවූවහුගේ; විඤ්ඤාණස්ස නිරොධෙන, අන්තිම විඥානයාගේ නිරුද්ධයෙන්; පජ්ජොතස්ස, ප්‍රදීපයාගේ; නිබ්බානංඉව, නිවීමමෙන්; චෙතසො, චිත්තයාගේ; විමොක්ඛො හොති, විශේෂයෙන් මිදීමවේ; (ක්ෂීණාශ්‍රවයාගේ අවසාන විඥානය නිරුද්ධවීමෙන් පහනනිවීමමෙන් සිතමිදීමවෙයි, ගියතැන නොපෙනෙසියි )

96 අනාසවං, ආශ්‍රවරහිතවූ; කායසුචිං, කායද්වාරයෙහි ශුචියද; හෙවත් කයින් පිරිසිදුබවද; වචීසුචිං, වාග්ද්වාරයෙහි ශුචියද; චෙතොසුචිං, මනොද්වාරයෙහි ශුචියද; නින්හාතපාපකං, ධොවනය කරණලද පාපමලඇති; සුචිං, ඒ ශුචිය; සොචෙය්‍යසම්පන්නං, ශුචිත්වයෙන් යුක්තයයි; ආහු, කියත්.

97 අනාසවං, ආශ්‍රවරහිතවූ; කායමුනිං, කායද්වාරයෙහි ඥානයෙන්යුක්තද නොහොත් කයින් පිරිසිදුබවද; වචීමුනිං, වාග්ද්වාරයෙහි පිරිසිදුබවද; චෙතොමුනිං, මනොද්වාරයෙහි පිරිසිදුබවද; සබ්බප්පහායිනං, සියල්ල පහකළාවූ; මුනිං, (ඒ) උත්තමභාවය; මොනෙය්‍යසම්පන්නං, මුනිත්වයෙන් යුක්තයයි; ආහු, කියත්.

98 නාහං භගවතො දස්සනස්ස තිත්ති මජ්ඣගා කුදාචනං,
සඞ්ඝස්ස උපට්ඨානස්ස සද්ධම්ම සවණස්සච.

99 අධි සීලෙ සික්ඛමානො සද්ධම්ම සවණෙ රතො,
තිණ්ණං ධම්මාන මතිත්තො හත්ථකො අවිහං ගතො,ති.

100 අගුත්තං චක්ඛු සොතස්මිං ඉන්ද්‍රියෙසු අසංවුතං,
මක්ඛිකා අනුපතිස්සන්ති සඞ්කප්පා රාගනිස්සිතා.

101 කටුවිය කතො භික්ඛු ආමගන්ධෙ අවස්සුතො,
ආරකා හොති නිබ්බාණා විඝාතස්සෙව භාගවා.

---

98 අහං, මම; කුදාචනං, කිසිකලෙක; භගවතො, බුදුන්; දස්සනස්ස, චක්‍ෂුර්විඥානයෙන් දැකීම්සම්බන්ධවද; සඞ්ඝස්ස, සඞ්ඝයාට; උපට්ඨානස්ස,(සිව්පසයෙන්) උපස්ථානකිරීම සම්බන්ධවද; සද්ධම්මසවණස්සච, සද්ධර්මශ්‍රවණයක්ර්ම සම්බන්ධවද; තිත්තිං, තෘප්තියට(නොහොත් නැවත්මට;)නඅජ්ඣගා, නොපැමිණියෙමි.

99 අධිසීලෙ, අධිශීලයෙහි හෙවත් දශශීලයෙහි; සික්ඛමානො, හික්මෙන්නාවූ; සද්ධම්මසවණෙරතො, සද්ධර්මශ්‍රවණයෙහි ඇලුනාවූ; තිණ්ණංධම්මානං, කියනලද කරුණුතුනසම්බන්ධව; අතිත්තො, තෘප්තිරහිතවූ; හත්ථකො, හත්ථකනම්වූ; (මම)අවිහංගතො, අවිහබ්‍රහ්ම ලොකයටගියෙමි;(හෙවත් අවිහබ්‍රහ්මලොකයෙහි උපන්නේවීමි.)

100 චක්ඛුසොතස්මිං, චක්‍ෂුයෙහිහා ශ්‍රොත්‍රයෙහි; අගුත්තං, රැකීමක් නැත්තාවූ; ඉන්ද්‍රියෙසු, ෂඩින්ද්‍රියයන්කෙරෙහි; අසංවුතං, සංවර නුවූ (පුද්ගලයා) රාගනිස්සිතා, රාගය ඇසුරුකළාවූ; සඞ්කප්පා, විතර්ක නැමති; මක්ඛිකා, මැස්සෝ; අනුපතිස්සන්ති, නැගිටළුනු බඳින්.

101 ආමගන්ධෙ, (ක්‍රොධසංඛ්‍යාත) ආමගන්ධයෙහි; අවස්සුතො, තෙත්වූ; කටුවියකතො. ඉඳුල්කරණලද්දවූ; භික්ඛු, භික්ෂුතෙම; නිබ්බාණා, නිර්වාණයෙන්; ආරකාහොති, දුරෙහිවේ; විඝාතස්සෙව, දුකටම; භාගවා, කොටස්කාරයෙක්වේ.

102 ගාමෙ වා යදි වාරඤ්ඤෙ අලද්ධා සම මත්තනො,
පරෙති බාලො දුම්මෙධො මක්ඛිකාහි පුරක්ඛතො,

103 යෙ ච සීලෙන සම්පන්නා පඤ්ඤාය උපසමෙ රතා,
උපසන්තා සුඛං සෙන්ති නාසයිත්වාන මක්ඛිකා,ති.

හරණ්ඩුමග්ගො තතියො

---

“ඝොධාජීවවග්ගො චතුත්ථො.”

—0—

104 සුනක්ඛත්තං සුමඞ්ගලං සුප්පභාතං සුහුට්ඨිතං,
සුඛණො සුමුහුත්තො ච සුයිට්ඨං බ්‍රහ්මචාරිසු.

105 පදක්ඛිණං කායකම්මං වාචාකම්මං පදක්ඛිණං,
පදක්ඛිණං මනොකම්මං පණිධි තෙ පදක්ඛිණා;
පදක්ඛිණානි කත්වාන ලභන්තත්ථෙ පදක්ඛිණෙ.

---

102 දුම්මෙධො, අඥනවූ; බාලො, බාලතෙම; ගාමෙ වා, ගමෙහි හෝ; යදි වා, නොහොත්; අරඤ්ඤෙ, වනයෙහිහෝ; අත්තනො සමං, තමාට සමානඑකෙක්; අලද්ධා, නොලැබ; මක්ඛිකාහි,මැස්සන් විසින්; පුරක්ඛතො, පිරිවරණලද්දේ; පරෙති, යෙයි.

103 යෙ ච, යම්කෙණෙක්; සීලෙන, ශීලයෙන්; සම්පන්නා, යුක්තවූවාහුද; පඤ්ඤාය, ප්‍රඥවෙන්; උපසමෙ රතා, සංසිඳීමෙහි ඇළුණාහුද;(ඔහුතුමූ)මක්ඛිකා, කෙලශ නැමති මැස්සන්; නාසයිත්වාන, නසා; සුඛං, සැපයේ; සෙන්ති, සයනයකරත්.

104 සුනක්ඛත්තං, (යම්දිනයෙක්හි සුචරිතධර්ම් තුන පුරණලද් දුහුද එදින) මනා නක්ෂත්‍රයොගයෙක; සුමඞ්ගලං, කරණලද යහපත් මඞ්ගල්‍යයෙක; සුප්පභාතං, මනාඅලුයමෙක; සුහුට්ඨිතං (සයනයෙන්)මනානැඟිසිටීමෙක; සුඛණො,මනාක්ෂණයෙක; සුමුහුත්තොච, මනාමොහොතෙක*; බ්‍රහ්මචාරිසු, බ්‍රහ්මචාරීන්කෙරෙහි; සුයිට්ඨං, මනාපිදීමෙක.

105 කායකම්මං, (එදින ඔහුවිසින් කරණලද්දවූ) කායකර්මය;

---

* අසුරු දසයක් පමණ කාලය ක්ෂණයෙක්වේ. ක්ෂණදශයක් ලයෙක්වේ, ලයදශයක් ක්ෂණලයෙක්වේ ක්ෂණලය දශයක් මොහොතෙක්වේ. මොහොත දසයක් ක්ෂණමුහුර්තයක්වේ.

106 තෙ අත්ථලද්ධා සුඛිතා විරූළ්හා බුද්ධසාසනෙ,
අරොගා සුඛිතා හොථ සහ සබ්බෙහි ඤාතිභී,ති.

"මඞ්ගලවග්ගො පඤ්චමො."

බුද්ධපණ්ණාසකො සමත්තො තතියො.

# තිකනිපාතො සමත්තො.

107 සීලං සමාධි පඤ්ඤාච විමුත්තිච අනුත්තරා,
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා.

108 ඉති බුද්ධො අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං,
දුක්ඛස්සන්තකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො.

---

පදක්ඛිණං, වැඩි කායකර්මයෙක; වාචාකම්මං, වාක්කර්ම; පදක්ඛිණං, වැඩි කර්මයෙක; මනොකම්මං, මනොකර්මය; පදක්ඛිණං, වැඩි කර්මයෙක; යෙ, යම් කෙනෙක්තුමූ; පනිධී, එදවස යම් සම්ප්‍රාර්ථනාවක් තබත්ද; ඒ ප්‍රාර්ථනාවෝ; පදක්ඛිණා, වැඩීමත් යුක්තාවෝත්; පදක්ඛිණානි, වැඩීමත් යුක්තවූ; කායකර්මාදිය; කත්වාන, කොට; පදක්ඛිණෙ, අත්ථෙ, වෘද්ධීන්; ලභන්ති, ලබත්ද.

106 අත්ථලද්ධා, අභිවෘද්ධලද්දවූ; සුඛිතා, සුවඇත්තාවූ; තෙ, ඔහුතුමූ; බුද්ධසාසනෙ, බුද්ධශාසනයෙහි; විරූළ්හා, වැඩුනාහුවෙති; සහ සබ්බෙහිඤාතිභි, සියලුනෑයන්සමග; අරොගා, නිරොගිවූවාහු; සුඛිතාහොථ, සැපඇත්තාහුවෙව්.

107 සීලං, ශීලයද; සමාධි, සමාධියද; පඤ්ඤාච, ප්‍රඥාවද; අනුත්තරා, ලොකොත්තරවූ; විමුත්තිච, මිදීමයයිකියනලද අර්හත්ඵලයද යන; ඉමෙධම්මා, මේධර්මයෝ; යසස්සිනා, යශස්ඇත්තාවූ; ගොතමෙන, ගෞතමයන්විසින්, අනුබුද්ධා, අවබොධකරනලද්දාහුය.

108 ඉති, මෙසේ; බුද්ධො, සර්වඥතම; අභිඤ්ඤාය, විශිෂ්ටඥානයෙන් මනාකොටදැන; භික්ඛුනං, භික්ෂූන්ට; ධම්මං; ධර්මය; අක්ඛාසි, දෙශනාකළේය; දුක්ඛස්සන්තකරො, සසරදුක් කෙළවරකළාවූ; චක්ඛුමා, (පඤ්චචක්ෂුසංඛ්‍යාත ඥානයෙන්) චක්ෂුමත්වූ; සත්ථා, ශාස්තෘතෙමේ; පරිනිබ්බුතො, (ක්ලෙශපරිනිර්වාණයෙන්) නිවුනේය.

109 චුතා පතනති පතිතා ගිද්ධාච පුනරාගතා,
කත කිච්චං රතං රම්මං සුඛෙනාන්වාගතං සුඛං.

110 යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති,

111 අප්පමත්තො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

112 සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසතිපඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී නිරයමුපෙති වාචං මනඤ්ච පණිධාය පාපකං,ති.

---

109 චුතා, (යම්කෙනෙක්) චුතවූවාහුද; (ඔහුතුමූ) පතන්ති, ගෙත්; පතිතා, (යම්කෙනෙක්) පතිතවූවාහුද; (ඔව්හු චුතවෙත්) ගිද්ධාච, රාගයෙන් ඇලුනාහුද; පුනරාගතා, නැවත; (ජාතියටද ජරාවටද ව්‍යාධියටද මරණයටද) ආවාහුය; කත කිච්චං, (සතරමගින්) කළ කෘත්‍යයද; රතංරම්මං, ඇලියයුතු ගුණරාශියෙහි ඇලීමද; සුඛෙන, සැපයෙන්; සුඛං, සැපය; අන්වාගතං, පැමිණීමදවේ. (මිනිස්සුවයෙන් දිව්‍යසුවයටද දිව්‍යසුවයෙන් විදසුන්සුවයටද විදසුන් සුවයෙන් මගසුවයටද මගසුවයෙන් පලසුවයටද පලසුවයෙන් නිවන්සුවයටද පැමිණෙස්සි.)

110 යො, යමෙක්තෙම; නින්දියං, නින්දාකටයුත්තාහට; පසංසති, ප්‍රශංසා කෙරේද; පසංසියො, ප්‍රශංසාකටයුතුවූ; යො, යමෙක්වේද; තං වා, ඔහට හෝ; නින්දති, නින්දා කෙරේද; සො, හෙතෙම; මුඛෙන; මුඛයෙන්; කලිං, පාපය; විචිනාති, රැස්කෙරෙයි; තෙන කලිනා, ඒ පාපය කරණකොටගෙන; සුඛං, සැප; න වින්දති, නොලබයි (හෙවත් නොවිඳියි.)

111 අක්ඛෙසු, දූකෙළියෙහි; යො ධනපරාජයො, යම් ධනපරාජයෙක්වේද. අයංකලි, මේ අපරාධය; හෙවත් පාපය; අප්පමත්තො, ස්වල්පමාත්‍රයෙක; යො, යමෙක්; සුගතෙසු; මනාගතිඇති බුදුපසේ බුදුසව්වන් කෙරෙහි; මනං පදොසයෙ, සිත දූෂ්‍යකෙරේද; අත්තනාපි සහාපි, තමන්සමග; සබ්බස්සාපි, සියලුදනයපැරදීමටද වඩා; අයමෙව කලි, මේපාපයම; මහන්තතරො, අතිශයින් මහත්වේ.

112 වාචං, වචනයද; මනඤ්ච, සිතද; පාපකං, ලාමකකොට; පණිධාය, පිහිටුවා; අරියගරහී, ආර්‍ය්‍යයන්ට ගැරහීකරන්නාවූ පුද්ගල

113 මාතරි පිතරි චාපි යො මිච්ඡා පටිපජ්ජති,
තථාගතෙම සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ;
බහුංච සො පසවති අපුඤ්ඤං තාදිසො නරො.

114 තාය අධම්ම චරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධෙව නං ගරහන්ති පෙච්චාපායංච ගච්ඡති.

115 මාතරි පිතරි චාපි යො සම්මා පටිපජ්ජති,
තථාගතෙ ච සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ;
බහුංච සො පසවති පුඤ්ඤමපි තාදිසො නරො.

116 තාය ධම්ම චරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති.

---

තෙම; යං නිරයං, යම් නරකයකට; උපෙති, පැමිණේද; (ඒ නරකයෙහි) නිරබ්බුදානං, නිරර්බුද සම්බන්ධිවූ. නොහොත් නිරර්බුදගණනින්; සහස්සානං සතං, ලක්ෂයක්ද; ඡත්තිංසති, නිරබ්බුදසතිසෙක්ද; පඤ්චච අබ්බුදානි, අබ්බුදපසෙක්ද; (ආයුප්‍රමාණයවේ.)

113 යො, යමෙක්තෙම; මාතරි, මව්කෙරෙහිද; පිතරිචාපි, පියාකෙරෙහිද; තථාගතෙ, තථාගතවූ; සම්බුද්ධෙච, බුදුන්කෙරෙහිද; අථවා, නොහොත්; තස්සසාවකෙ, උන්වහන්සේගේ ශ්‍රාවකයාකෙරෙහිද; මිච්ඡාපටිපජ්ජති, වරදවාපිළිපදීද; සො, ඒමනුෂ්‍යතෙම; බහුංචඅපුඤ්ඤං, බොහෝඅකුශල්ද; පසවති, රැස්කෙරෙයි.

114 මාතාපිතුසු, මව්පියන්කෙරෙහි; තායඅධම්මචරියාය, ඒ (මිථ්‍යාප්‍රතිපත්තිසංඛ්‍යාත) අධර්මචර්‍ය්‍යාවෙන්; පණ්ඩිතා, පණ්ඩිතයෝතුමූ; නං, ඕහට; ඉධෙව, මේලොකයෙහිම; ගරහන්ති, ගර්හාකෙරෙත්; තාදිසොනරො, එබඳුවූ මනුෂ්‍යතෙම; පෙච්ච, පරලෙව්හි; අපායංච, අපායටද; ගච්ඡති, යේ.

115 යො, යමෙක්තෙම; මාතරි, මව්කෙරෙහිද; පිතරි, පියාකෙරෙහිද; තථාගතෙ, තථාගතවූ; සම්බුද්ධෙච, සම්‍යක්සම්බුදුන්කෙරෙහිද; අථවා, නොහොත්; තස්සසාවකෙ, උන්වහන්සේගේශ්‍රාවකයාකෙරෙහිද; සම්මා, මනාකොට; පටිපජ්ජති, පිළිපදීද; සො, ඒ මනුෂ්‍යතෙම; බහුංචපුඤ්ඤමපි, බොහෝකුශල්ද; පසවති, රැස්කෙරේ.

116 මාතාපිතුසු, මව්පියන්කෙරෙහි; තායධම්මචරියාය, ඒ(මනා පිළිපැදීමය කියනලද) ධර්මචර්‍ය්‍යාව කරණකොටගෙන; පණ්ඩිතා,

117 යෙකෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අවීත රාගා ඉධ කාම භොගිනො,
පුනප්පුනං ජාති ජරූප ගාමිනො
තණ්හාධි පන්නා අනුසොත ගාමිනො.

118 තස්මාහි ධීරො ඉධුපට්ඨිතා සති
කාමෙච පාපෙච අසෙවමානො,
සහාපි දුක්ඛෙන ජහෙය්‍ය කාමෙ
පටිසොත ගාමිති තමාහු පුග්ගලං.

119 යො වෙ කිලෙසානි සහං පහාය
පරිපුණ්ණසෙඛො අපරිහාන ධම්මො,
චෙතො වසිප්පත්තො සමාහිතින්ද්‍රියො
සවෙ ඨිතත්තොති නරො පවුච්චති.

---

පණ්ඩිතයෝතුමු; තං, ඔහට, ඉධෙව, මෙලොකයෙහිම; පසංස න්ති, ප්‍රශංසාකෙරෙත්; තාදිසොනරො, එබඳුවූමිනිස්‍සතෙම; පෙච්ච, පරලෙව්හි; සග්ගෙව, ස්වර්ගයෙහිද; මොදනි, සතුටුවේ.

117 ඉධ, මෙලොකයෙහි; කාමෙසු, (වස්තුකාමක්ලෙශ) කාමය න්හි; අසඤ්ඤතා, නොහික්මුණාවූ; අවීතරාගා, පහනොකළාවූරා ගයඇති; කාමභොගිනො, කාමයන් අනුභවකරන්නාවූ; තණ්හාධි පන්නා, තෘෂ්ණාවෙන් මඩයාලද(නොහොත් තෘෂ්ණාවට බැසගත් තාවූ;)පුනප්පුනං, නැවතනැවත; ජාතිජරූපගාමිනො, ජාතිජරාව්‍යා ධිමරණයන් ග්‍රහණයකරණසුලුවූ; යෙකෙචිජනා, යම්කිසිජනයෝ; (වෙත්ද ඔව්හු) අනුසොතගාමිනො, අනුස්‍රොතගාමීහු (හෙවත් ක්ලෙ ශස්‍රොතය අනුවයන්නාහු)වෙති.

118 තස්මාහි, එහෙයින්; ඉධ, මේලොකයෙහි; උපට්ඨිතාසති, එළඹසිටි සිහිඇති; ධීරො, පණ්ඩිතතෙම; කාමෙච, කාමයන්ද; පා පෙච, පාපයන්ද; අසෙවමානො, සෙවනයනොකරන්නේ; සහාපි දුක්ඛෙන, දුක්සහිතව; කාමෙ, කාමයන්; ජහෙය්‍ය, හරින්නේද; තංපුග්ගලං, ඒ පුද්ගලයා; පටිසොතගාමීති, ප්‍රතිස්‍රොතගාමියයි;(හෙ වත් ස්‍රොතයඅනුවනොයන පුද්ගලයායයි;)ආහු, කීවාහුය.

119 යො, යමෙක්තෙම; වෙ, එකාන්තයෙන්; කිලෙසානිසහං, ක්ලෙශ් විධාවත්; පහාය, හැර; පරිපුණ්ණසෙඛො, සම්පූර්ණශික්ෂා

120 පරොවරා යසස සමෙචච ධමමා විධූපිතා අතථගතා න සනති,
සවෙදගූ වුසිත බ්‍රහමචරියො ලොකනතගූ පාරගතොති
වුචචතී,ති.

121 අපපසසුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො,
උභයෙනනං ගරහනති සීලතොච සුතෙනච.

122 අපපසසුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො,
සීලතො නං පසංසනති නාසස සමපජජතෙ සුතං,

123 බහුසසුතොපි චෙ හොති සීලෙසු අසමාහිතො,
සීලතො නං ගරහනති තසස සමපජජතෙ සුතං,

---

ඇත්තේද; අපරිහානධම්මො, පරිහානි නොවන ස්වභාව ඇත්තේද; චෙතොවසිප්පත්තො, සිත වශගතබවට පැමිණියේද; සමාහිතින්ද්‍රියො, මනාකොට පිහිටුවනලද ඉන්ද්‍රියයන් ඇත්තේද; සො නරො, ඒ මනුෂ්‍යතෙම; චෙ, ඒකාන්තයෙන්; ඛීනතෙජාති, [illegible] සවභාවඇති අනාගාමීපුද්ගලයයි; පවුච්චති, කියනුලැබේ.

120 යස්ස, යමකුහුගේ; පරොවරා, උතුම්ලාමකවූ; ධම්මා, ධර්මයෝ; සමෙච්ච, නුවණින් දැන; විධූපිතා, තවාලූ අද්දුද; අත්ථගතා, අස්තංගතවූවාහුද; න සන්ති, නැත්තාහුද; සො, ඒ පුද්ගලතෙම; වෙදගූ, වෙදයට ගියාවූ; වුසිතබ්‍රහ්මචරියො, වැසූ බ්‍රහ්මචර්‍යය ඇත්තාවූ; ලොකන්තගූ ත්‍රිවිධලොකයාගේ කෙළවරට ගියාවූ; යො, ඒ නිර්වාණයට ගියාවූ; පාරගතොති, පාරගතයයි; වුච්චති, කියනුලැබේ.

121 චෙ, ඉදින්; අප්පස්සුතොපි හොති, ආගමධර්මය පුහුණු නොකල බැවින් අල්පශ්‍රැතවේද; සීලෙසු, ශීලයන්හි; අසමාහිතො, නොපිහිටියේවේද; සීලතොච, සීලකොටසයෙන්ද; සුතෙනච, ශ්‍රැතකොටසයෙන්ද; (යන) උභයෙන, දෙකින්; නං, ඔහුට; ගරහන්ති, (දුශ්ශීලය අල්පශ්‍රැතයයි කියමින්) ගර්හාකෙරෙත්.

122 චෙ, ඉදින්; අප්පස්සුතොපි, අල්පශ්‍රැතවේද; සීලෙසු, ශීලයන්හි; සුසමාහිතො, මනාවපිහිටියේවේද; නං, ඔහුට; සීලතො, සීලකොටසයෙන්; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; අස්ස, මොහුට; සුතං, ශ්‍රැතය; නසම්පජ්ජතෙ, (ශ්‍රැතකෘත්‍යය නොකලහෙයින්) සිද්ධනොවේ.

123 චෙ, ඉදින්; බහුස්සුතොපි හොති, ආගමධර්මය (පුහුණුකල බැවින්) බහුශ්‍රැතවේද; සීලෙසු, ශීලයන්හි; අසමාහිතො, නොපිහිටියේ

124 බහුස්සුතොපි චෙ හොති සීලෙසු සුසමාහිතො,
උභයෙන නං පසංසන්ති සීලතොච සුතෙනච,

125 බහුස්සුතං ධම්මධරං සප්පඤ්ඤං බුද්ධ සාවකං,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති;
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො,ති,

126 යො හොති බ්‍යත්තොච විසාරදොච
බහුස්සුතො ධම්මධරොච හොති,
ධම්මස්ස හොති අනුධම්මචාරී
සතාදිසො වුච්චති සඞ්ඝසොභනොති.

---

වේද; නං, ඕහට; සීලතො, සීලකොට්ඨාසයෙන්; ගරහන්ති, ගර්හා කෙරෙත්; තස්ස, ඕහට; සුතං, ශ්‍රැතය; සම්පජ්ජතෙ, (ශ්‍රැතකෘත්‍යය කළහෙයින්) සිද්ධවේ.

124 එව, ඉදින්; බහුස්සුතොපිහොති, (ආගමධර්ම පුහුණුකළ බැවින්) බහුශ්‍රැතවේද; සීලෙසු, ශීලයන්හි; සුසමාහිතො, මනාවපිහිටියේද; නං, ඕහට; සීලතොච, සීලකොට්ඨාසයෙන්ද; සුතෙනච, ශ්‍රැතකොට්ඨාසයෙන්ද; (යන) උභයෙන, දෙකොටසින්; පසංසන්ති, ප්‍රශංසා කෙරෙත්.

125 බහුස්සුතං, බහුශ්‍රැතවූ; ධම්මධරං, (ශ්‍රැතධර්මයන්ට ආධාරවූ හෙයින්) ධර්මධරවූ; සප්පඤ්ඤං, මහා ප්‍රඥාඇත්තාවූ; බුද්ධසාවකං, බුද්ධශ්‍රාවකවූ; තං, ඕහට; ජම්බොනදස්ස, ජාතිසුවර්ණයකගේ; නෙක්ඛං ඉව, නිෂ්කයක් (හෙවත් පඤ්චසුවර්ණප්‍රමාණවූ සුවර්ණඝටිකාවක්) මෙන්; කො, කවරෙක්; නින්දිතුං, නින්දාකරන්ට; අරහති, සුදුසුවේද; (නොවේ) දෙවාපි, දෙවියෝද; නං, ඕහට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; බ්‍රහ්මුනාපි, බ්‍රහ්මයාවිසින්ද; පසංසිතො, ප්‍රශංසාකරණලද්දේය.

126 යො, යමෙක්තෙම; බ්‍යත්තොච හොති, ව්‍යක්තවේද; විසාරදොච, විසාරදද හෙවත් නිස්සාරද්‍යවූ සොම්නස් සහගත ඥානයෙන් යුක්තවේද; බහුස්සුතො, බහුශ්‍රැතවේද; ධම්මධරොච, ශ්‍රැත ධර්මයන්ට ආධාරවේද; ධම්මස්ස, නවලොකොත්තර ධර්මයට; අනුධම්මචාරීහොති, අනුවපවත්නාවූ ධර්මයෙහි හැසිරෙන්නේවේද; තාදිසො,

127 භික්ඛු ච සීලසම්පන්නො භික්ඛුනී ච බහුස්සුතා,
උපාසකො ච යො සද්ධො යා ච සද්ධා උපාසිකා;
එතෙ ඛො සංඝං සොභෙන්ති එතෙ හි සංඝසොභනා,ති.

128 යෙ කෙචි මෙ වාද පථා පුථුස්සිතා
සන්තිස්සිතා සමණ බ්‍රාහ්මණා ච,
තථාගතං පත්වා න තෙ භවන්ති
විසාරදං වාද පථාති වත්තිනං.

129 යො ධම්ම චක්කං අභිභුය්‍ය කෙවලං
පවත්තයී සබ්බ භූතානු කම්පී,
තං තාදිසං දෙව මනුස්ස සෙට්ඨං
සත්තා නමස්සන්ති භවස්ස පාරගුං,ති.

---

එබඳුවූ; සො, හෙතෙම; සංඝසොභනොති, සංඝයා හොබවන්නේ යයි; වුච්චති, කියනුලැබේ.

127 සීලසම්පන්නො, ශීලයෙන් යුක්තවූ; භික්ඛු ච, භික්ෂුතෙමේද; බහුස්සුතා, බහුශ්‍රැතවූ; භික්ඛුනී ච, භික්ෂුණීයද; සද්ධො, ශ්‍රද්ධා ඇති; යො ච උපාසකො, යම් උපාසකයෙක් වේද; සද්ධා, ශ්‍රද්ධා ඇති; යා ච උපාසිකා, යම් උපාසිකාවක් වන්නීද; එතෙ ඛො, මොහුවනාහි; සංඝං, සංඝයා; සොභෙන්ති, හොබවිත්; එතෙ හි, මොහුවනාහි; සංඝසොභනාති, සංඝයා හොබවන්නෝවෙත් යයි (කියනුලැබෙත්.)

128 පුථුස්සිතා, බොහො කරුණු පිළිබඳවූ; නොහොත් බොහෝ බවට පැමිණියාවූ; යෙ කෙචි මෙ වාදපථා, යම් මේ වාදයෝ වෙත්ද; සමණබ්‍රාහ්මණා, ශ්‍රමණබ්‍රාහ්මණයෝ; සන්තිස්සිතා, යම් වාදයක් ඇසුරුකළෝද; තෙ, ඒ වාදයෝ; වාදපථාතිවත්තිනං, වාදපථය ඉක්මැව්වාවූ; විසාරදං, විසාරදවූ; තථාගතං පත්වා, තථාගතයන් කරා පැමිණ; න භවන්ති, නොවැඩෙත් හෙවත් විනාශවෙත්.

129 සබ්බභූතානුකම්පී, සියලු සත්වයන් කෙරෙහි අනුකම්පා ඇත්තාවූ; කෙවලී, සියලුගුණයෙන් යුක්තවූ; යො, යමෙක්තෙම; කෙවලං, සියල්ල; අභිභුය්‍ය, මැඩ; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තයී, පැවැත්වූසේක්ද; භවස්ස, භවයාගේ; පාරගුං, පරතෙරට පැමිණියාවූ;

130 තණ්හා දුතියො පුරිසො දීඝ මද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

131 එවමාදීනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං,
වීත තණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ,ති.

132 කාම යොගෙන සංයුත්තා භව යොගෙන චූභයං,
දිට්ඨි යොගෙන සංයුත්තා අවිජ්ජාය පුරක්ඛතා;
සත්තා ගච්ඡන්ති සංසාරං ජාති මරණ ගාමිනො.

---

දෙවමනුස්සසෙට්ඨං, දෙවිමිනිසුන්ට ශ්‍රෙෂ්ඨවූ; තාදිසං, එබඳුවූ; තං, උන්වහන්සේට; සත්තා; සත්වයෝ; නමස්සන්ති, නමස්කාර කෙරෙත්.

130 තණ්හාදුතියො, (අනමතග්‍ර සංසාරවෘත්තයෙහි සැරිසරන්නාවූ සත්වයා හුදකලාව නොව තෘෂ්ණාව දෙවැන්නෙක් කොට ලැබ සැරිසරණබැවින්) තෘෂ්ණාව දෙවෙනිකොටඇති; පුරිසො, පුරුෂතෙම; දීඝමද්ධානං, දීර්ඝකාලයක් මුළුල්ලෙහි; සංසරං, සසරසැරිසරන්නේ; ඉත්ථභාවං, මේ ආත්මභාවයද; අඤ්ඤථාභාවං, අනාගතාත්මභාවයද; නොහොත් මෙබඳු අතීත් අත්බැවහා මෙබඳුනූවූ අතීත් අත්බැවීඇති; සංසාරං, සංසාරය; (ස්කන්ධධාතු ආයතනයන්ගේ පිළිවෙල) නාතිවත්තති, නොඉක්මවයි.

131 තණ්හං, තෘෂ්ණාව; දුක්ඛස්ස සම්භවං, දුක්හටගැන්මෙක් (දුකටකාරණයයි;) එවං, මෙසේ; ආදීනවං, (අතීතානාගත වර්තමාන ස්කන්ධයන්හි) ආදීනවය; ඤත්වා, දැන; වීත තණ්හා, තෘෂ්ණාරහිතවූ; අනාදනො, (තෘෂ්ණාදිවශයෙන්) ගැණීම රහිතවූ; සතො, සිහිඇති; භික්ඛු, ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම; පරිබ්බජෙ, වාසයකරන්නේය.

132 කාමයොගෙන, (රූපාදි පඤ්චකාම ගුණික රාගයයි කියනලද) කාමයොගයෙන්ද; භවයොගෙනච, (රූපාරූප භවයන්හි ඡන්දරාගයයි කියනලද) භවයොගයෙන්ද නොහොත්; ශාස්වතදෘෂ්ටි සහගත රාගයෙන්ද යන; උභයං, යොගද්වයෙන්, සංයුත්තා, යුක්තවූ; දිට්ඨියොගෙන, දෙසැටදෘෂ්ටියයි කියනලද දෘෂ්ටියොගයෙන්; සංයුත්තා, යුක්තවූ; අවිජ්ජාය (චතුස්සත්‍යයන්හි නොදැනීමයයි කියනලද) අවිද්‍යාවවිසින්; පුරක්ඛතා, පිරිවරණලද්දාවූ; ජාතිමරණගාමිනො, ජාතියටගා මරණයට යන්නාවූ, සත්තා, සත්වයෝ; සංසාරං සසරට; ගච්ඡන්ති, යෙත්.

133 යෙ ච කාමෙ පරිඤ්ඤාය භවයොගඤ්ච සබ්බසො,
දිට්ඨියොගං සමූහච්ච අවිජ්ජං ච විරාජයං;
සබ්බයොගවිසංයුත්තා තෙ වෙ යොගාතිගා මුනී,ති.

භාණ්ඩගාමි වග්ගො පඨමො.

——0:——

134 චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං;
යො විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං.

135 කුම්මග්ගං පටිපන්නොසො මොහනෙය්‍යෙසු මුච්ඡිතො,
අභබ්බො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං.

136 යො චරං වා තිට්ඨං වා නිසින්නො උදවා සයං
විතක්කං සමයිත්වාන විතක්කූපසමෙ රතො;
භබ්බො සො තාදිසො භික්ඛු ඵුට්ඨුං සම්බොධිමුත්තමං,ති.

---

133 යෙ, යම්කෙනෙක්; කාමෙ, කාමයන්; පරිඤ්ඤාය, විශෙෂයෙන් දැන; භවයොගඤ්ච, භවයොගයද; සබ්බසො, සර්වප්‍රකාරයෙන් (දැන) දිට්ඨියොගං, දෘෂ්ටියොගය; සමූහච්ච, නසා; අවිජ්ජංච, අවිද්‍යාවද; විරාජයං, දුරුකරන්නේ නොහොත් දුරුකොට; සබ්බයොගවිසංයුත්තා, කාමාදි සියලුයොගයන්ගෙන් වෙන්වූ; තෙ, ඔහුතුමූ; වෙ, ඒකාන්තයෙන්; යොගාතිගා, කාමයොගාදිය ඉක්මවූවාවූ; මුනීති, ක්ෂීණාශ්‍රව මුනිහුයයි (කියනලැබෙත්.)

134, 135. යො, යමෙක්තෙම; චරංවා, හැසිරෙන්නේහෝ; යදි, ඉදින්; තිට්ඨංවා, සිටින්නේහෝ; නිසින්නො, උන්නේහෝ; උදවා, නොහොත්; සයං, සයනයකරන්නේහෝ; ගෙහනිස්සිතං, කෙලෙස් ඇසුරුකළාවූ; පාපකං, පවිටුවූ; විතක්කං, විතර්කයක්; විතක්කෙති, කල්පනාකෙරේද. මොහනෙය්‍යෙසු, මොහය උපදවන්නාවූ (අරමුණුවල) මුච්ඡිතො, මුළාවූ; කුම්මග්ගං, නින්දිතමාර්ගයට; පටිපන්නො, පිළිපන්නාවූ; තාදිසො, එබඳුවූ; සො භික්ඛු, ඒභික්ෂුතෙම; උත්තමං, උතුම්වූ; සම්බොධිං, අර්හත්ඵලසඞ්ඛ්‍යාත උත්තමඥානය; ඵුට්ඨුං, ස්පර්ශකරන්ට; අභබ්බො, අභව්‍යවේ (හෙවත් අසමර්ථවේ.)

136 යො, යමෙක්තෙම; චරංවා, හැසිරෙන්නේහෝ; තිට්ඨංවා,

137 යතං චරෙ යතං තිට්ඨෙ යතං අච්ඡෙ යතං සයෙ;
යතං සම්මිඤ්ජයෙ භික්ඛු යතමෙව නං පසාරයෙ.

138 උද්ධං තිරියං අපාචීනං යාවතා ජගතො ගති;
සමවෙක්ඛිතා ච ධම්මානං ඛන්ධානං උදයබ්බයං

139 චෙතො සමථ සාමීචිං සික්ඛමානං සදා සතං,
සතතං පහිතත්තොති ආහු භික්ඛුං තථා විධං,ති.

---

සිටින්නේහෝ; නිසින්නො, උන්නේහෝ; උදවා, නොහොත්; සයං, සැතපෙන්නේහෝ; විතක්කං, විතර්කය; සමයිත්වාන, සංසිඳුවා; විතක්කූපසමෙරතො, විතර්ක සංසිඳුවීමෙහි ඇලුනාවූ; තාදිසො, එබඳුවූ; සො භික්ඛු, ඒ භික්ෂුතෙම; උත්තමං, උතුම්වූ; සම්බොධිං, අර්හත්ඥානය; ඵුසිතුං, ස්පර්ශකරන්නට; භබ්බො, භව්‍යවේ. (හෙවත්සමර්ථවේ)

137 භික්ඛු, භික්ෂුතෙම; යතං, (යම්සේ හැසිරෙන්නේ සංයතවේද එපරිද්දෙන්) සංයතවූයේ; චරෙ, හැසිරෙන්නේය; යතං, සංයතවූයේ තිට්ඨෙ, සිටින්නේය; යතං, සංයතවූයේ; අච්ඡෙ, ඉන්නේය; යතං, සංයතවූයේ; සයෙ, සැතපෙන්නේය; යතං, සංයතවූයේ; සම්මිඤ්ජයෙ, (හස්තපාදාදිඅඞ්ගප්‍රත්‍යඞ්ගයන්) හකුළුවන්නේය; නං, (යම් අඟපසඟක් දිගුකරන්නේනම්) ඒ අඟපසඟය; යතං එව, සංයතකොටම; පසාරයෙ, දිගුකරන්නේය.

138 ජගතො, ලෝකයාගේ; ගති, ඉපදීම; යාවතා, යම්තාක්ද; උද්ධං, උඩද; තිරියං, මැදද; අපාචීනං, යටද; (එතාක් සියලු ලෝකයෙහි) ඛන්ධානං ධම්මානං, (අත්තාදිප්‍රභෙදඇති) ස්කන්ධධර්මයන්ගේ; උදයබ්බයං, උදයව්‍යය; හෙවත් පහලවීම නැසීම; සමවෙක්ඛිතා, (සමපණ්ස්ලක්ෂණයෙන්) මනාකොට දක්නේය.

139 සදා, හැමකල්හි; සතං, සිහිඇත්තාවූ; චෙතොසමථසාමීචිං; චිත්තසමථයට සුදුසුවූ ප්‍රතිපදාව; සික්ඛමානං, පිළිපදනාවූ; නොහොත් පුරන්නාවූ; තථාවිධං, එබඳුවූ; භික්ඛුං, භික්ෂුව; සතතං, නිරන්තරයෙන්; පහිතත්තොති, (නිර්වාණයට) යවනලදසිත් ඇත්තේයයි; ආහු, කියත්

140 සම්මප්පධානා මාරධෙය්‍යාභිභූතා
තෙ අසිතා ජාතිමරණභයස්ස පාරගූ;
තෙ තුසිතා ජෙත්වාන මාරං සවාහනං
තෙ අනෙජා සබ්බං නමුචිබලං උපාතිවත්තා
තෙ සුඛිතා,ති.

141 සංවරො ච පහාණඤ්ච භාවනා අනුරක්ඛණා,
එතෙ පධානා චත්තාරො දෙසිතා'දිච්චබන්ධුනා;
යෙහි භික්ඛු ඉධාතාපී ඛයං දුක්ඛස්ස පාපුණෙ,ති.

142 රාහුග්ගං අත්තභාවීනං ඉන්ධාතා කාමභොගිනං,
මාරො ආධිපතෙය්‍යානං ඉද්ධියා යසසා ජලං.

---

140 සම්මප්පධානා, සම්‍යක් වීය්‍ය්‍යීඇති; (සම්පූර්ණ වීය්‍ය්‍යීඇති) මාරධෙය්‍යාභිභූතා, (ත්‍රෛභූමකසඞ්ඛ්‍යාත) මාරධෙය්‍යය; මැඩපැත් තුවාවූ (භවත් ඉක්මවා සිටියාවූ;) තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ; අසිතා, (තෘෂ්ණාදෘෂ්ටි) ඇසුරුනොකලාහු වෙති; ජාතිමරණභයස්ස, ජාතිය හා මරණය පිළිබඳව උපදනාවූ භීතියගේ; පාරගූ, පරතෙරට ගියාවූ; තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ; තුසිතා, සන්තුෂ්ටවූවාහුවෙති; සවාහනං, සේනාසහිතවූ; මාරං, මාරයා; ජෙත්වාන, ජයගෙන; තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ;) අනෙජා, තෘෂ්ණාරහිතවූවාහුවෙත්; සබ්බං නමුචිබලං, සියලු මාරබලය; උපාතිවත්තා, ඉක්මෙව්වාවූ; තෙ, ඒ (ක්ෂීණාශ්‍රවයෝ;) සුඛිතා, (ලෝකොත්තරවූ සැපයෙන්) සැපඇත්තාහුවෙති.

141 සංවරොච, (චක්ෂුරාදි ෂඩෙන්ද්‍රියයන් සංවරණයකරන්නා හට උපදනාවූ) සංවරවීය්‍ය්‍යීයද; පහාණඤ්ච, (කාමවිතර්කාදිය දුරුකරන්නාහට උපදනාවූ) ප්‍රහාණවීය්‍ය්‍යීයද; භාවනා, (බොධ්‍යාඞ්ගයන් වඩන්නාහට උපදනාවූ) භාවනාවීය්‍ය්‍යීයද; අනුරක්ඛණා, (සමාධිනිමිත්ත රක්නාහට උපදනාවූ) අනුරක්ෂණවීය්‍ය්‍යීයද; (යන) එතෙ චත්තාරො පධානා, මේසතර වීය්‍ය්‍යීයෝ; ආදිච්චබන්ධුනා, සූය්‍ය්‍යීවංශවූ; බුදුන්විසින්; දෙසිතා, දෙශනාකරණලද්දාහුය; ඉධ, මේ ශාසනයෙහි; යෙහි, යම් වීය්‍ය්‍යීයකින්; ආතාපී, කෙලෙස්තවන වීය්‍ය්‍යීඇත්තාවූ; භික්ඛු, භික්ෂුතෙම; දුක්ඛස්සඛයං, දුඃඛක්ෂයකර්ම සඞ්ඛ්‍යාත අර්හත්ඵලයට; පාපුණෙ, පැමිණෙන්නේද; (ඒ මේ සතරවීය්‍ය්‍යීයෙනි)

142 අත්තභාවීනං, ආත්මභාවය ඇත්තවුන් අතුරෙන්; රාහු,

143 උද්ධං තිරියං අපාචිනං යාවතා ජගතො ගතී,
සදෙවකස්ස ලොකස්ස බුද්ධො අග්ගං පවුච්චති,ති

144 රූප සොඛුම්මතං ඤත්වා වෙදනානංච සම්භවං,
සඤ්ඤා යතො සමුදෙති අත්ථං ගච්ඡති යත්ථච.

145 සංඛාරෙ පරතො ඤත්වා දුක්ඛතො නොච අත්තතො,
සචෙ සම්මද්දසො භික්ඛු සන්තො සන්තිපදෙ රතො;
ධාරෙති අන්තිමං දෙහං ජෙත්වා මාරං සවාහනං,ති.

146 ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාලපක්ඛෙව චන්දිමා,ති.

---

රාහුඅසුරේන්ද්‍රතෙම්; අග්ගං, අග්‍රය; කාමභොගීනං, කාම්භොගීන් අතුරෙන්; මන්ධාතා, මන්ධාතුරජතෙම්; (අග්‍රය) ආධිපතෙය්‍යානං, අධිපතිභාවය ඇත්තවුන්අතුරෙන්; ඉද්ධියා, (දිව්‍යසම්පත්තියට සමවූ) සෘද්ධියෙන්ද; යසසා, පරිවාරසඞ්ඛ්‍යාත යශසින්ද; ජලං, බබලන්නාවූ මාරො, මාරතෙම්; (අග්‍රය.)

143 උද්ධං, උඩද; තිරියං, මැදද; අපාචිනං, යටද; ජගතො ලොකයාගේ; ගති, නිෂ්පත්තිය; යාවතා, යම්තාක්ද; (ඒතාක්)සදෙවකස්ස, දෙවියන්සහිතවූ; ලොකස්ස, ලොකයාට; බුද්ධො, සර්වඥතෙම්; අග්ගං, (ලෞකිකලොකොත්තරගුණයෙන්)අග්‍රයයි පවුච්චති, කියනුලැබේ.

144. 145. රූප සොඛුම්මතං, රූපස්කන්ධයාගේ; සුඛුමබවද; වෙදනානං, වෙදනාස්කන්ධයාගේ; සම්භවංච; හටගැන්මද; ඤත්වා, දැන; යතො, යම්හෙයකින්; සඤ්ඤා, සංඥස්කන්ධය; සමුදෙති, හටගනීද;යත්ථච, යම්තැනෙක්හි; අත්ථංගච්ඡති, නිරුද්ධවේද; (ඒද දැන) සඞ්ඛාරෙ, සංස්කාරයන්; පරතො,අනිත්‍යතාවයෙන් හා නැසෙන, ස්වභාවහෙයින් පරවශයෙන්ද; දුක්ඛතො, දුක්වශයෙන්ද; නොචඅත්තතො,අනාත්මවශයෙන්ද;ඤත්වා, දැන; චෙ, ඒකාන්තයෙන්;සම්මද්දසො, සම්‍යක් දෘෂ්ටි ඇති; සන්තො, ශාන්තවූ; සන්තිපදෙරතො, නිර්වාණපදයෙහි ඇලුනාවූ; සොභික්ඛු, ඒ භික්ෂූතෙම්; සවාහනං, සෙනාසහිතවූ මාරං, මාරයා; ජෙත්වා, ජයගෙන; අන්තිමංදෙහං, පශ්චිම ශරීරය; ධාරෙති, දරයි.

146 යො, යමෙක්තෙම්; ඡන්දා, ඡන්දයෙන්ද; දොසා, ද්වෙෂයෙන්ද; භයා, භයින්ද; මොහා, මොහයෙන්ද ධම්මං, ධර්මය; අතිවත්තති,

147 ඡන්‍ද දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
ආපූරති තස්ස යසො සුක්ක පක්ඛෙව චන්‍දිමා,ති,

148 ඡන්‍ද දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්‍දිමා,ති.

149 ඡන්‍ද දොසා භයා මොහා යො ධම්මං නාති වත්තති,
ආපූරති තස්ස යසො සුක්කපක්ඛෙව චන්‍දිමා,ති.

150 යෙකෙචි කාමෙසු අසඤ්ඤතා ජනා
අධම්මිකා හොන්ති අධම්ම ගාරවා,
ඡන්‍දාච දොසාච භයාච ගාමිනො,
පරිසක්කසා වොච පමෙතස වුච්චති,
එවංහි වුත්තං සමණෙන ජානතා,ති.

---

ඉක්මවාද; තස්ස, ඔහුගේ; යසො, යශස; කාලපක්ඛ, කෘෂ්ණ පක්ෂයෙහි; චන්‍දිමා ඉව, චන්‍ද්‍රයාමෙන්; නිහීයති, පිරිහෙයි.

147 යො, යමෙක්තෙම; ඡන්‍ද, ඡන්‍දයෙන්ද; දොසා, ද්වේෂයෙන්ද; භයා, භයින්ද; මොහා, මොහයෙන්ද; ධම්මං, ධර්‍මය; න අතිවත්තති, නොඉක්මවාද; තස්ස, ඔහුගේ; යසො, යශස, සුක්කපක්ඛ, ශුක්ලපක්ෂයෙහි; චන්‍දිමාඉව, චන්‍ද්‍රයාමෙන්; ආපූරති, පිරෙයි.

148. 149, (146. 147. වෙනි අඞ්ක බලනු.)

150 කාමෙසු, වස්තුකාම ක්ලේශකාමයන්හි; අසඤ්ඤතා, නොහික්මුනාවූ; යෙකෙචි ජනා, යම්කිසිජනයෝ තුමූ; අධම්මගාරවා, අධර්මයෙහි ගෞරව ඇත්තාහු; අධම්මිකා හොන්ති, අධර්මයෙහි යෙදුනාහුවෙත්ද; (ඒ ජනයෝ) ඡන්‍දාච, ඡන්‍දයෙන්ද; දොසාච, ද්වේෂයෙන්ද; භයාච, භයින්ද; ගාමිනො, අගතිගාමීහුවෙත්; එසොපන, මේනම්වනාහි, පරිසක්කසාවොති, පිරිස්පිළිබඳ කසළකැයි; වුච්චති, කියනුලැබේ; ජානතා, දත්තාවූ; සමණෙන, බුද්ධශ්‍රමණයා විසින්; එවංහි, මෙසේවනාහි; වුත්තං, වදාරණලදී.

151 තස්මා හි තෙ සප්පුරිසා පසංසියා
ධම්මට්ඨිතා යෙ න කරොන්ති පාපකං
න ඡන්ද දොසා න භයාච ගාමිනො
පරිසාය මණ්ඩා ච පනෙස වුච්චති
එවං හි වුත්තං සමණෙන ජානතා,ති.

චර වග්ගො දුතියො.

———o———

152 යෙ ච අබ්භතීතා සම්බුද්ධා යෙ ච බුද්ධා අනාගතා,
යො චෙතරහි සම්බුද්ධො බහුන්නං සොක නාසනො.

153 සබ්බෙ සද්ධම්ම ගරුනො විහංසු විහරන්ති ච,
අථාපි විහරිස්සන්ති එසා බුද්ධාන ධම්මතා.

154 තස්මා හි අත්තකාමෙන මහත්ත මභිකංඛතා,
සද්ධම්මො ගරු කාතබ්බො සරං බුද්ධාන සාසනං,ති.

---

151 ධම්මට්ඨිතා, ධර්මයෙහි පිහිටියාවූ; යෙ, යම් සත්පුරුෂකෙනෙක්; පාපකං,පාපයක්; න කරොන්ති,නොකෙරෙත්ද; න ඡන්දදොසා,ඡන්දයෙන්හා ද්වේෂයෙන් අගතිගාමීහු නොවෙත්ද; න භයාචගාමිනො, භයින් අගතිගාමීහු නොවෙත්ද; තස්මා හි,එහෙයින්ම වනාහි; තෙ සප්පුරිසා,ඒ සත්පුරුෂයෝ; පසංසියා, ප්‍රශංසා කටයුත්තාහුය; එසො පන, මේ තෙම වනාහි; පරිසායමණ්ඩාච,පිරිස සැරසීමත්යයිද;වුච්චති, කියනුලැබේ; ජානතා, දත්තාවූ; සමණෙන, බුද්ධශ්‍රමණයා විසින් ; එවංහී, මෙසේ වනාහි; වුත්තං,වදාරණලදී.

152 යෙච සම්බුද්ධා, යම් සම්‍යක් සම්බුද්ධකෙනෙක්; අබ්භතීතා, අතීතවූද; යෙචබුද්ධා, යම් සම්‍යක් සම්බුද්ධකෙනෙක්; අනාගතා අනාගතවූද; එතරහි, දැන්; බහුන්නං, බොහෝ ජනයන්ගේ; සොක නාසනො, සොක විනාශකරන්නාවූ; යොච සම්බුද්ධො, සම්‍යක්සම් බුද්ධවූ යමෙක්වේද.

153 සබ්බෙ, (ඒ) සියලු බුදුවරයෝ(ම); සද්ධම්මගරුනො,සද්ධර්ම ගරුකරන්නාහු විහංසු, වාසය කළාහුය; විහරන්තිච, දැනුදු වාසය කෙරෙත්ය; අථාපි, නැවතද; විහරිස්සන්ති, මතුද වාසයකරන්නාහුය; එසා, මේතොමෝ; බුද්ධානං, බුදුවරයන්ගේ; ධම්මතා, ධර්මතාවක; ස්වභාවය.

154 තස්මාහි (යම් හෙයකින් සියලු බුදුවරයෝ සද්ධර්ම ගරුක) එහෙයින්; මහත්තමභිකංඛතා, ගුණයෙන් මහත්බව කැමැත්තාවූ

155 යො උද්ධතෙන චිත්තෙන සම්ඵඤ්ච බහු භාසති,
අසමාහිතසංකප්පො අසද්ධම්මරතො මගො;
ආරා සො ථාවරෙය්‍යම්හා පාපදිට්ඨි අනාදරො.

156 යො ච සීලෙන සම්පන්නො සුතවා පටිභානවා,
සඤ්ඤතො ධීර ධම්මෙසු පඤ්ඤායත්ථං විපස්සති;
පාරගූ සබ්බධම්මානං අඛිලො පටිභානවා

157 පහීණජාති මරණො බ්‍රහ්මචරියස්ස කෙවලී,
තමහං වදාමි ථෙරොති යස්ස නො සන්ති ආසවා;
ආසවානං ඛයා භික්ඛු සො ථෙරොති පවුච්චතී,ති.

---

නාවූ; අභිනාමෙන්ත, ඤාණී පරාණී නැමැත්තාහු විසින්; බුද්ධානං, බුදුවරයන්ගේ; සාසනං, අනුශාසනාව; වරං, සිහිකරමින්; සද්ධම්මං, සද්ධර්මය; ගරුකාතබ්බො, ගරුකටයුත්තේය.

155 යො, යමෙක්තෙම; උද්ධතෙන, නොසංසිඳුනාවූ; චිත්තෙන, සිතින්; සම්ඵඤ්ච, ප්‍රලාපකථාවද; බහුං යති, බොහෝකොටම බණීද: අසමාහිත සංකප්පො, මනාව නොපිහිටියාවූ සංකල්පනා ඇත්ද; අසද්ධම්මරතො, අසද්ධර්මයෙහි ඇලුනාවූ; මගො, මෘගයකුසෙ; පාපදිට්ඨි, ලාමක දෘෂ්ටි ඇති; අනාදරො, ආදර රහිතවූ යො, හෙතෙම; ථාවරෙය්‍යම්හා, ස්ථිරභාවයෙන්; ආරා, දුරෙහිවේ.

156 යො, යමෙක්තෙම; සීලෙන සම්පන්නො, ශීලයෙන් යුක්තද; සුතවා, ඇසූපිරූ තැන් ඇත්තේද; පටිභානවා, විචිත්‍රකාරණඥාන යෙන් යුක්තද; ධීරධම්මෙසු, ධීරධර්මයන්හි; සඤ්ඤතො, මනාව යුක්ත වූයේද: පඤ්ඤාය, ප්‍රඥාවෙන්; අත්ථං, අර්ථය; විපස්සති, විශේෂයෙන් දකීද; හෙවත් විදර්ශනාසහිත මාර්ගප්‍රඥාවෙන් චතුස්සත්‍යයන්ගේ අර්ථය විශේෂද දකීද; අඛිලො, රාගඛිලාදිය නැත්තේද; පටිභානවා, විචිත්‍රකාරවූ ප්‍රඥායෙන් යුක්තද (ඒ භික්ෂුතෙම) සබ්බධම්මානං, සියලු ස්කන්ධාදි ධර්මයන්ගේ; පාරගූ, එතරට ගියේවේ.

157 යස්ස, යම්කුගේ; බ්‍රහ්මචරියස්ස කෙවලී, සම්පූර්ණ බ්‍රහ්මචර්යාව ඇත්තේද; පහීණජාතිමරණො, ප්‍රහීණවූ ජාතිය හා මරණය ඇත්තේද; ආසවා, කාමාදි ආශ්‍රවයෝ; නොසන්ති, නැත්තාහුද; අහං, මම; තං, ඔහු; ථෙරොති, ස්ථවිරයයි; වදාමි, කියමි; ආසවානං ඛයා, කාමාදි ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන්; සොභික්ඛු, ඒ භික්ෂුතෙම; ථෙරොති, ස්ථවිරයයි පවුච්චති, කියනුලැබේ.

158 සබ්බ ලොකං අභිඤ්ඤාය සබ්බ ලොකෙ යථා තථං,
සබ්බ ලොක විසංයුත්තො සබ්බ ලොකෙ අනූපයො.

159 සවෙ සබ්බාභිභූ ධීරො සබ්බ ගන්ථප්පමොචනො,
ඵුට්ඨස්ස පරමා සන්ති නිබ්බාණං අකුතොභයං.

160 එස ඛීණාසවො බුද්ධො අනීඝො ඡින්න සංසයො,
සබ්බ කම්මක්ඛයං පත්තො විමුත්තො උපධි සංඛයෙ.

161 එස සො භගවා බුද්ධො එස සීහො අනුත්තරො,
සදෙව කස්ස ලොකස්ස බ්‍රහ්ම චක්කං පවත්තයි.

---

158. 159 සබ්බලොකං, ත්‍රෛධාතුක ලොකසන්නිවාසය; අභිඤ්ඤාය, දැන; සබ්බ ලොකෙ, ත්‍රෛධාතුකවූ(ඒ)ලොකසන්නිවාසයෙහි; (දතයුතු යම්කිසිවක් ඇද්ද ඒ සියල්ලම) යථාතථං, තත්වූපරිද්දෙන්(අවිපරීතකොට දැන)සබ්බලොකවිසංයුත්තො,(කාමයොගාදිවූ සතර යොගයන් පහකිරීම කාරණකොටගෙන) සියලු ලොකයන් වෙන්වූ; සබ්බලොකෙ අනූපයො, සියලු ලොකයෙහි තෘෂ්ණාදෘෂ්ටි ග්‍රහණය රහිතවූ සබ්බාභිභූ රූපාදි සියලු අරමුණු මැඩපැවැත්වූ; සොධීරො, ඒ පණ්ඩිතයාතම; වෙ, ඒකාන්තයෙන්; සබ්බගන්ථප්පමොචනො, සියලු කෙලශග්‍රන්ථමුදුසිටියේය; පරමාසන්ති, උතුම්වූ නිර්වාණය; ඵුට්ඨස්ස,* ඥානස්පර්ශයෙන්; (ඔහුවිසින්) ස්පර්ශකරනලද්දේය; නිබ්බාණං, නිර්වාණය; අකුතොභයං, ඒ කිසියෙකිවිසි නොවන් භයරහිතවේයි.

160 අනීඝො, දුක්රහිතවූ; ඡින්නසංසයො, සිඳිනලද සැකඇති; සබ්බකම්මක්ඛයං, සියලුකර්මක්ෂයට; පත්තො, පැමිණියාවූ එසො ඛීණාසවො බුද්ධො, මේ ක්ෂීණාශ්‍රව බුද්ධතෙම; උපධිසංඛයෙ, උපධි ක්ෂයකිරීමයයි කියනලද නිර්වාණයෙහි; විමුත්තො, තදාරම්මණ ඵල විමුක්තියෙන් විමුක්තවූයේය භවත් මිදුනේය.

161 සොඑසො භගවා, ඒ මේ භාග්‍යවත්තෙම; බුද්ධො, සර්වඥය; එසො, මේතෙම; අනුත්තරො සීහො, (උපද්‍රවයන් සහනාපීමයෙන් හා ක්ලේශයන් නැසීම් අර්ථයෙන්) නිරුත්තර සිංහය; සදෙවකස්ස ලොකස්ස, දෙවියන් සහිත ලොකයාට; බ්‍රහ්මචක්කං, ශ්‍රෙෂ්ඨචක්‍රය; පවත්තයි, පැවැත්තූසේක.

---

* “ඵුට්ඨස්ස,, යනු කරණාර්ථයෙහි ෂෂ්ඨි යි.

162 ඉති දෙව මනුස්සාච යෙ බුද්ධං සරණං ගතා,
සඞ්ගම්ම තං නමස්සන්ති මහන්තං වීතසාරදං.

163 දන්තො දමයතං සෙට්ඨො සන්තො සමයතං ඉසි,
මුත්තො මොචයතං අග්ගො තිණ්ණො තාරයතං වරො.

164 ඉති හෙතං නමස්සන්ති මහන්තං වීතසාරදං.
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලො,ති.

165 යං කිඤ්චි දිට්ඨංව සුතං මුතංවා
අජ්ඣොසිතං සච්චමුතං පරෙසං,
න තෙසු තාදී සය සංවුතෙසු
සච්චං මුසාවාපි පරං දහෙය්‍ය.

---

162 ඉති, මෙසේ (බුදුගුණදැන) යෙදෙවමනුස්සාච, යම් දෙවිමිනිස්කෙනෙක්; බුඩං, බුදුන්; සරණං ගතා, සරණගියාහුද (එදිමිනුෂ්‍යයෝ)මහන්තං, මහත්වූ; වීතසාරදං, වීතසාරදවූ (පහවූ සංසාර භයඇති)සං, උන්වහන්සේ කරා; සඞ්ගම්ම, මනාකොට පැමිණ; නමස්සන්ති, නමස්කාරකෙරෙත්.

63 ඉසි, බුඩ්සෘෂිතෙම; දන්තො, දැමුනේය; දමයතං, දමනාවූන් අතුරෙන්: සෙට්ඨො, ශ්‍රෙෂ්ඨය; සන්තො, ශාන්තය; සමයතං, ශාන්තවූවන් අතුරෙන් (ශ්‍රෙෂ්ඨය) මුත්තො, මිදුනේය; මොචයතං, මිදුනාවූන් අතුරෙන්; අග්ගො, අග්‍රය; තිණ්ණො, එතරවූයේය; තාරයතං, එතරවූවන් අතුරෙන්; වරො, උතුම්ය.

164 ඉතිහි, මෙසේ වනාහි; මහන්තං, මහත්වූ; වීතසාරදං, වීතසාරදවූ: එතං, මුන්වහන්සේට; නමස්සන්ති, (දිව්‍යමනුෂ්‍යාදීහු) නමස්කාරකෙරෙත්; සදෙවකස්මිං ලොකස්මිං, දෙවියන් සහිත ලොකයෙහි; තෙ, උන්වහන්සේට; පටිපුග්ගලො, ප්‍රතිපුද්ගලයෙක් (සමානපුද්ගලයෙක්) නත්ථි, නැත්තේය.

165 පරෙසං, අනුන්ගේ (ඇදහීමෙන්); සච්චමුතං, සත්‍යයයිදන්නා; යංකිඤ්චි දිට්ඨංවා, යම්කිසි රූපායතනයක් හෝ; සුතංවා, ශබ්දායතනයක් හෝ; මුතංවා, පැමිණගතයුතුහෙයින් ගන්ධරසස්පර්ශායතනයක් හෝ; අජ්ඣොසිතං, තිබටාකොට ගන්නාලද්දේවේද; තෙසු සයසංවුතෙසු, (තෙ මෙම සිකිමකොටගන්නාලද ග්‍රහණඇති) ඒදෘෂ්ටිකනිකයන්*

---

* "දෘෂ්ටිගතිකයො" වනාහි සවයංසංවෘතයෝයයි කියනලැබෙත්,

166. එතං ච සල්ලං පටිගච්ච දිස්වා
අජ්ඣොසිතා යත්ථ පජා විසත්තා,
ජානාමි පස්සාමි තථෙව එතං
අජ්ඣොසිතං නත්ථි තථාගතානං.

167. සංවරත්ථං පහාණත්ථං බ්‍රහ්මචරියං අනීතිහං,
අදෙසයී සො භගවා නිබ්බාණොගධ ගාමිනං.

168. එසමග්ගො මහන්තෙහි අනුයාතො මහෙසිහි,
යෙ ච තං පටිපජ්ජන්ති යථා බුද්ධෙන දෙසිතං;
දුක්ඛස්සන්තං කරිස්සන්ති සත්ථු සාසන කාරිනො,ති:

---

අතුමෙරහි තාදී, ලාභාලාභාදියෙහි එක සදෘශවූ තථාගතතෙම; සච්චං මුසාවාපි,(ඒ දෘෂ්ටිගතිකයන්ගේ එකදෙවචනයක් මෙම සත්‍යය අන්‍ය සිස්සයි මෙසේ) සත්‍යය හෝ මුසාවහෝ; පරං, උතුම්කොට; නදළ්හෙය්‍ය, නොඅදහන්නේය.

166 එතං ච සල්ලං, මේ දෘෂ්ටිනමැති හුල්ද; පටිගච්ච, පළමු කොට; (බොධිදෘමූලයෙහිදී) දිස්වා, දැක; යත්ථ, යම්තැනක; පජා, ප්‍රජාව; විසත්තා, ඇලුනීද; අජ්ඣොසිතා, ගිල නිමවාගත්තීද; එතං, මේ දෘෂ්ටිසල්‍යය; තථෙව, (යම්පරිද්දකින් ප්‍රජාව විසින් ගන්නාලද්දේද) එපරිද්දෙන් (මමද) ජානාමි, දනිමි; පස්සාමි, දකිමි; තථාගතානං, තථාගතයන්ගේ; අජ්ඣොසිතං, තෘෂ්ණා මානදෘෂ්ටිවශයෙන් නිශ්‍රාකොට ගැන්මෙක්; නත්ථි, නැත්තේය.

167 සො භගවා, ඒ භාග්‍යවත්තෙම; සංවරත්ථං, සංවරපණීය් රැකීම පිණිස; පහාණත්ථං, ප්‍රහාණතුණෙන් දුරුකිරීම පිණිස; අනීතිහං, තෘෂ්ණා උපකෙලශරහිතවූ; නොහොත් ශඞ්කා රහිතවූ; නිබ්බාණොගධ ගාමිනං, නිවණතුල පවත්නාවූ; (නිවන් අරමුණු කොට නිවණතුල පවතිසිසේයි) බ්‍රහ්මචරියං, මාර්ග බ්‍රහ්මචර්‍යයව; අදෙසයී, දෙශනාකළසේක.

168 එසමග්ගො, මේ මාර්ගයතෙම; මහෙසිහි, මහර්ෂිවූ; මහන්තෙහි, මහාපුරුෂයන් විසින්; අනුයාතො, දන්නාලද්දේය; යෙච, යම් කෙනෙක්; තං, ඒ මාර්ගයෙහි; බුද්ධෙන, බුදුන්විසින්; යථාදෙසිතං, දෙශනාකරණලද පරිද්දෙන්; පටිපජ්ජන්ති, පිළිපදිද්ද; සත්ථුසාසනකාරිනො, ශාස්තෘශාසනය කරන්නාවූ; (ඔහුතුමූ) දුක්ඛස්ස අන්තං කරිස්සන්ති, දුක්ඛනිවාරණය කරන්නාහුය.

169 කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා;
න තෙ ධම්මෙ විරූහන්ති සම්මා සම්බුද්ධ දෙසිතෙ.

170 නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා.
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මා සම්බුද්ධ දෙසිතෙ,ති.

171 අනවජ්ජෙන තුට්ඨස්ස අප්පෙන සුලභෙන ච,
න සෙනාසන මාරබ්භ චීවරං පාන භොජනං;
විඝාතො හොති චිත්තස්ස දිසා න පටිහඤ්ඤති.

172 යෙ චස්ස ධම්මා අක්ඛාතා සාමඤ්ඤස්සානුලොමිකා,
අධිග්ගහීතා තුට්ඨස්ස අප්පමත්තස්ස භික්ඛුනො,ති.

---

169 කුහා, කුහකයෝද; හෙවත් ජනයන් විස්මපත් කරන්නාහුද; ථද්ධා, ක්‍රොධයෙන් හා මානයෙන්; දැඩිසිත් ඇත්තාහුද; ලපා, ප්‍රත්‍යය පිණිස ජනයන් පොළඹවන්නාහුද; සිඞ්ගී ශෘඞ්ගසදෘශවූ ප්‍රකට කෙලෙසඇත්තෝද; උන්නලා, උස්වූ මානනළඇත්තාහුද; අසමාහිතා, සිතෙහි එකඟබව පමණකුදු නැත්තාහුද, (යම්) තෙ, ඔහු තුමූ; සම්මාසම්බුද්ධ දෙසිතෙ, සම්‍යක්සම්බුද්ධ දෙශිතවූ; ධම්මෙ, සද්ධර්මයෙහි; නවිරූහන්ති, නොවැඩෙත්.

170 නික්කුහා, කුහකනුවූවෝද; හෙවත් ජනයන් විස්මපත් නොකරන්නෝද; නිල්ලපා, ජනයන් ප්‍රත්‍යයපිණිස නොපොළඹවන්නාහුද; ධීරා, ධෛර්‍ය්‍යඇත්තාහුද; නොහොත් නුවණැත්තාහුද; අත්ථද්ධා, ක්‍රොධයෙන් හා මානයෙන් තදනුවූ සිත්ඇත්තාහුද; සුසමාහිතා, මනාකොට සිතෙහි එකඟබැව් ඇත්තාහුද; (යම්) තෙ, ඔහුතුමූ; වෙ, ඒකාන්තයෙන්; සම්මාසම්බුද්ධදෙසිතෙ, සම්‍යක්සම්බුද්ධ දෙශිතවූ; ධම්මෙ, සද්ධර්මයෙහි; විරූහන්ති, ශීලාදිගුණයෙන් වැඩෙත්.

171 අප්පෙන, ස්වල්පවූද; සුලභෙන ච, සුලභවූද; අනවජ්ජෙන, නිරවද්‍යයෙන්; තුට්ඨස්ස, සතුටුවූවහුගේ; සෙනාසනං, සෙනසුනද; චීවරං, චීවරයද; පානභොජනං, ගිලානප්‍රත්‍යයහා පිණ්ඩපාතයද; ආරබ්භ, අරබයා; චිත්තස්ස, සිතට; නවිඝාතො, පීඩාවෙක් නැත්තේය;(ඔහට) දිසා, දිශාතොමෝ; නපටිහඤ්ඤති, නොනැසෙන්නිය.

172 සාමඤ්ඤස්ස, ශ්‍රමණධර්මයට; අනුලොමිකා, අනුලෝමිකවූ; යෙ ධම්මා, යම් ප්‍රතිපත්තිධර්මකෙනෙක්; අක්ඛාතා, කියනලද්දාහුවෙත්ද; (ඒ සියලු ප්‍රතිපත්ති ධර්මයෝ) තුට්ඨස්ස, සතුටුවූ; අප්පමත්තස්ස,

173 නාරතී සහතී වීරං නාරතී වීර සංහතී,
ධීරොච නාරතිං සහති ධීරො හි අරතිං සහො.

174 සබ්බ කම්ම විජහතං පතුණ්ණං කො නිවාරයෙ,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතු මරහති;
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො,ති.

175 අනභිජ්ඣාලු විහරෙය්‍ය අව්‍යාපන්නෙන චෙතසා,
සතො එකග්ග චිත්තස්ස අජ්ඣත්තං සුසමාහිතො,ති.

176 අබ්‍යාපන්නතා සද්ද සතො අජ්ඣත්තං සුසමාහිතො,
අභිජ්ඣා විනයෙ සික්ඛං අප්පමත්තොති වුච්චතී,ති.

උරුවෙල වග්ගො තතියො.

---

අප්‍රමාදවූ; අසසඞිකවූයො, මේ භික්ෂුවහට; අධිගගිතා, ඇතුලත් වෙති.

173 අරති, අරතිනොමෙහි හෙවත් කලකිරීම. වීරං. වීරපුරුෂයා; නසහති, මැඩනොපවත්වයි; අරති, අරතිනොමෙහි හෙවත් කලකිරීම; න වීරසංහති. වීරපුරුෂයන් මැඩපවත්වන්නේ නොවෙයි; ධීරොච, පණ්ඩිතතෙමේද; අරතිං, උකටලීබව (කලකිරීම); සහති, මැඩපවත්වයි; හි, එහෙයින්; ධීරො, පණ්ඩිතතෙම; අරතිං සහො, උකටලීබව මැඩපවත්වන්නේවේ.

174 සබ්බකම්මවිජහතං, සියලුකර්මය දුරුකොට පිහිටිනලද්දවූ; පදුණ්ණං, කෙලෙසුන් දුරුකොට සිටියාවූ පුද්ගලයා; කො, කවරතම් රාගාදී පාපයෙක්; නිවාරයෙ. වළක්වන්නේද; ජම්බොනදස්ස, ජාම්බොනදයයි කියනලද රත්තසුවර්ණයාගේ; නෙක්ඛංඉව, නික්ෂයකටසදෘශවූ; තං, ඔහුට, කො, කවරෙක්; නින්දිතුං නින්දාකරන්ට; අරහති, සුදුසුවේද; (නොවේමැයි) දෙවාපි. දෙවියෝද; නං, ඔහුට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; බ්‍රහ්මුනාපි, මහා බ්‍රහ්මයා විසින්ද; පසංසිතො. ප්‍රශංසාකරනලද්දේය.

175 අව්‍යාපන්නෙන, ව්‍යාපාදයටනොපැමිණියාවූ(හෙවත් සියලුකාලයෙහි ප්‍රකෘතිස්වභාවය නොහරින්නාවූ); චෙතසා, සිතින්; අනභිජ්ඣාලු, තෘෂ්ණාරහිතවූයේ; විහරෙය්‍ය, වාසයකරන්නේනම්; සතො, සිහියෙන්යුක්තවූයේ; එකග්ගචිත්තස්ස, (අරමුණෙහි) එකඟසිත් ඇතිවන්නේය; අජ්ඣත්තං, ආධ්‍යාත්මයෙහි; සුසමාහිතො, මනාකොට පිහිටිසිත් ඇතිවන්නේය.

176 අබ්‍යාපන්නතා, ව්‍යාපාදරහිතවූයේද; සද්ද, සියලුකල්හි; සතො,

177 පතිරූපෙ වසෙ දෙසෙ අරියවුත්තිකරො සියා,
සම්මාපණිධිසම්පන්නො පුබ්බෙ පුඤ්ඤකතො නරො;
ධඤ්ඤං ධනං යසො කිත්ති සුඛං චෙතං ධිවත්තති.

178 දානං ච පෙය්‍යවජ්ජඤ්ච අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු තත්ථ තත්ථ යථාරහං;
එතෙ ඛො සඞ්ගහා ලොකෙ රථස්සාණීව යායතො.

179 එතෙ ච සඞ්ගහා නාස්සු න මාතා පුත්තකාරණා,
ලභෙථ මානං පූජං වා පිතා වා පුත්තකාරණා.

---

සිහිඇත්තේද; අජ්ඣත්තං, නිජ නාඩ්‍යාත්මයෙහි; සුසමාහිතො, මනාකොට පිහිටුයිත්ඇත්තේද; අභිජ්ඣාවිනයෙය, තෘෂ්ණාවිනයසි කිය නලද ඇතිත්වයෙහි; සික්ඛං, ශික්ෂෙන්නේ; අපසමයනාති, අප්‍රමාද ඇත්තේයසි; වුච්චති. කියනුලැබේ.

177 නරෝ, මිනුෂ්‍යතෙම; පතිරූපෙ දෙසෙ, (සිව්පිරිසෙත් යුක්තවූ) සුදුසුවූ ප්‍රදේශයෙහි; වසෙ, වාසයකෙරේද; අරියවුත්තිකරො සියා, ආර්‍ය්‍යවෘත්තිය පහළකරන්නේද; සම්මාපණිධිසම්පන්නො, සිත මනාකොට පිහිටුවීමෙන් යුක්තවන්නේද; පුබ්බෙපුඤ්ඤකතො, පෙරකරණලද පින් ඇත්තේද; එතං, මේ පුද්ගලයා; ධඤ්ඤං, ශාලිව්‍රීහ්‍යාදි ධාන්‍යයද; ධනං, (මුක්තාමාණික්‍යාදි) ධනයද; යසො. යශසද හෙවත් පිරිවරද: කිත්ති, කීර්තියද; හෙවත් ගුණඝොෂාවද; සුඛංච, සැපයද; අධිවත්තති, වතුරුවයි.

178 ඉධ ලොකෙ, මෙලොවයෙහි; දානංච, දානයද; පෙය්‍යවජ්ජං ච, ප්‍රිය වචනයද; යා අත්ථචරියා ච, යම්බඳුවූ අර්ථචර්‍ය්‍යාවද; නො හොත් වැඩපිළිවෙත්හාවූ සැහීමද; තත්ථතත්ථ ධම්මෙසු, ඒ ඒ ධර්මයන්හි; යථාරහං, සුදුසුපරිද්දෙන්; සමානත්තතා ච, සමානාත්මතාවයද (යන); එතෙ ඛො සඞ්ගහා, මේ සතරසංග්‍රහවස්තූහුද; යායතො, යන්නාවූ; රථස්ස, රථයාගේ; ආණීව, ඇණයමෙන්; (යන්නාවූ රථයට ආණිය සංග්‍රහය සම්පාදද එපරිද්දෙන් මේ සතර සංග්‍රහවස්තූහු ලොවට සංග්‍රහ කෙරෙත්.)

179 එතෙ ච සඞ්ගහා, මේ සංග්‍රහවස්තූහුද; නාස්සු, නොවත් නාහු නම්; මාතා, මව්තොමෝ; පුත්තකාරණා, පුත්‍රයා හේතුකොට ගෙණ; මානංවා, සිතින් බුහුමන් කිරීමක් හෝ; පූජංවා, පිදීමක් හෝ; න ලභෙථ, නොලබන්නීය; පිතා වා, පියා හෝ; පුත්තකාරණා,

180 යස්මා ච සඞ්ගහා එතෙ සමවෙක්ඛන්ති පණ්ඩිතා,
තස්මා මහත්තං පප්පොන්ති පාසංසා ච භවන්ති තෙ,ති.

181 යදා බුද්ධො අභිඤ්ඤාය ධම්මචක්කං පවත්තයි,
සදෙවකස්ස ලොකස්ස සත්ථා අප්පටිපුග්ගලො.

182 සක්කායඤ්ච නිරොධංච සක්කායස්ස ච සම්භවං,
අරියංච ට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං.

183 යෙපි දීඝායුකා දෙවා වණ්ණවන්තො යසස්සිනො,
භීතා සන්තාසමාපාදුං සීහස්සෙවිතරෙ මිගා.

---

පුත්‍රයා හෙතුකොටගෙණ (සියක් මුහුමක් කිරීමක් හෝ පිදීමක් හෝ නොලැබන්නේය).

180 යස්මාච, යම් හෙයකින්; පණ්ඩිතා, පණ්ඩිතයෝ; එතෙ සඞ්ගහා, මේ සංග්‍රහවස්තූන්; සමවෙක්ඛන්ති, මනාකොට බලත්ද; තස්මා, එහෙයින්; මහත්තං, මහත්බවට; පප්පොන්ති, පැමිණෙත්; තෙ, ඒ පණ්ඩිතයෝ; පාසංසාච භවන්ති, ප්‍රශංසාකටයුත්තෝද වෙත්.

181. 182. සදෙවකස්ස, දෙවියන්සහිතවූ; ලොකස්ස, ලොකයාට; සත්ථා, ශාස්තෘවූ; අප්පටිපුග්ගලො, සමානපුද්ගලයෙක් නැත්තාවූ; බුද්ධො, බුදුතෙම; සක්කායඤ්ච, පඤ්චස්කන්ධයද; සක්කායස්ස, පඤ්චස්කන්ධයාගේ; සම්භවංච, පටන්ගැන්මද; නිරොධංච, නිරුද්ධකිරීමද; දුක්ඛූපසමගාමිනං, දුකයන් සංසිඳුවීම පිණිස පවත්නාවූ; අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං, අෂ්ටාඞ්ගිකවූ මාර්ගයද; යදා ධම්මචක්කං, ධර්මචක්‍රය*; අභිඤ්ඤාය, විශිෂ්ටඥානයෙන් දැන; යදා, යම්කලෙක්හි; පවත්තායි, පැවැත්වූසේක්ද.

183 යසස්සිනො, යසපිරිවරඇති; වණ්ණවන්තො, ශරීරවර්ණයෙන් වර්ණවත්වූ; දීඝායුකා, දීර්ඝායුෂ්කවූ; යෙපි දෙවා, යම් දෙවිකෙනෙක් ඇද්ද (ඔහුතුමූ); සීහස්ස, සිංහයාගේ අභිතයාදයට; ඉතරෙ මිගාව, අනික් සිවුපාවුන් මෙන්; භීතා, භයපත්වූවාහු; සන්තාසං, තැතිගැනීමට; ආපාදුං, පැමිණියාහුය.

---

* ප්‍රතිවෙධ ඥානය හා දෙශනා ඥානයයි. බොධිපර්‍යඞ්කයෙහි වැඩහුන්නාවූ සර්වඥයන්වහන්සේ. යම් ඥානයකින් චතුරාර්‍යසත්‍යයන් සොළොස් ආකාරයකින් හා සුමසැටදහසයින් අවබොධකළේද ඒ ප්‍රතිවෙධ ඥානයනම්වේ. යම් ඥානයකින් ත්‍රිපරිවර්තයක් හා මෘදුශනාරයක් ඇති ධම්මචක්‍රය පැවැත්වූ සේක්ද ඒ දෙශනාඥානය නම්වේ, මෙදෙසැඳ දසබලධාරීවූ සර්වඥයන්වහන්සේගේ "උරෙජාත ඥාණ"ය වේ, එදෙක අතුරෙහි ධර්මදෙශනා ඥානය ගතයුතුය, "එවන් භාග්‍යවතුන් වහන්සේ අටලොස් කෙළක් බ්‍රහ්මයන් සමඟ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් නව සම්පත් කොට ධර්මාස්ථලය තුපදී ඒනාක් "පවත්තෙති" කියාද සොවාන්ඵ ලද උපන්කල්හි "පවත්තිතං" කියාද වදාලේයයි දතයුතුයි.

184 අවීතිවත්තා සක්කායං අනිච්චා කිර භො මයං,
සුත්වා අරහතො වාක්‍යං විප්පමුත්තස්ස තාදිනො,ති.

185 අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං,
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.

186 අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ,
අග්ගෙ සංඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

187 අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති,
අග්ගං ආයු ච වණ්ණො ච යසො කිත්ති සුඛං බලං.

188 අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්මසමාහිතො,
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතී,ති.

---

184 තාදිනො, ලාභාලාභාදියෙහි එකසදෘශවූ; විප්පමුත්තස්ස, විශෙෂයෙන් මිදුනාවූ; අරහතො, අර්හත්වූ සර්වඥයන් වහන්සේගේ; වාක්‍යං, වාක්‍යය (ධර්මදෙශනාව) සුත්වා, අසා; භො, පින්වත්නි; මයං කිර, අපිවනාහි; අනිච්චා, අනිත්‍යයෝය; සක්කායං, පඤ්චස්කන්ධය; අවීතිවත්තා, නොඉක්මෙව්වාහුයයි (මෙසේ භයට සන්ත්‍රාසයට පැමිණියාහුය).

185. 186. අග්ගං ධම්මං, රත්නත්‍රයාගේ උතුම්බව විජානතං, දන්නාවූ; අග්ගතො, අග්‍රභාවයෙන්; පසන්නානං, (රත්නත්‍රයෙහි) පැහැදුනාවුන්ට; වෙ, ඒකාන්තයෙන්; (අග්‍රවිපාක ඇත්තේය); දක්ඛිණෙය්‍යෙ, දක්ෂිණාර්හවූ; අනුත්තරෙ, නිරුත්තරවූ; බුද්ධෙ, බුදුන්කෙරෙහි; පසන්නානං, පැහැදුනාවුන්ටද; විරාගූපසමෙ, සියලු රාගය දුරුකිරීමට හා සියලු කෙලෙස් අතිශයින් සන්සිඳුවීමටද හේතුවූ; සුඛෙ,(සසරදුක් නසන බැවින් හා සංස්කාරයන් සංසිඳුවන බැවින්) සැපවූ; අග්ගෙ, අග්‍රවූ; ධම්මෙ, ධර්මයෙහි; පසන්නානං, පැහැදුනාවුන්ටද; අනුත්තරෙ, නිරුත්තරවූ; පුඤ්ඤක්ඛෙත්තෙ, පුණ්‍යක්ෂෙත්‍රවූ; අග්ගෙ සංඝෙ, අග්‍රසංඝයාකෙරෙහි; පසන්නානං, පැහැදුනා වුන්ටද (අග්‍රවිපාකවේ).

187 අග්ගස්මිං, අග්‍රරත්නත්‍රය විෂයෙහි; දානං දදතං, දන්දෙන්නාවුන්ට; අග්ගං පුඤ්ඤං, මහත් උතුම් පින්; පවඩ්ඪති, වැඩෙයි; අග්ගං, අග්‍රවූ; ආයු ච, ආයුෂද; වණ්ණො ච, වර්ණයද; යසො, පිරිවරද; කිත්ති, ස්තුතිඝොෂාවද; සුඛං ච (කායික චෛතසිකවූ) සැපද; බලං, කායබලය හා ඥානබලයද (වැඩේ).

188 අග්ගස්ස දාතා, අග්‍රරත්නත්‍රයට දෙන සුලුවූ නොහොත් අග්‍රදෙය දෙන්නාවූ; මෙධාවී, පණ්ඩිතතෙම; අග්ගධම්මසමාහිතො, අග්‍රප්‍රසාද ධර්මයෙන් හා දානාදි ධර්මයෙන් යුක්තවූයේ; දෙවභූතො, දෙවි

189 යො වෙදී සබ්බ සත්තානං මච්චු පාසා පමොචනං,
හිතං දෙව මනුස්සානං ඤායං ධම්මං පකාසයි;
යං වෙ දිස්වා ච සුත්වා ච පසීදන්ති බහුජ්ජනො.

190 මග්ගා මග්ගස්ස කුසලො කත කිච්චො අනාසවො,
බුද්ධො අන්තිම සාරීරො මහාපඤ්ඤො මහාපුරිසොති වුච්චතී,ති.

191 යෙන දෙවූප පත්‍යස්ස ගන්ධබ්බො වා විහඞ්ගමො,
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං මනුස්සත්තං ච අණ්ඩජෙ;
තෙ මය්හං ආසවා ඛීණා විද්ධස්තා විනළීකතා.

192 පුණ්ඩරීකං යථා වග්ගු තොයෙන නුපලිප්පති,
නූපලිත්තාමී ලොකෙන තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණා,ති.

---

වූහෝ; මනුස්සොවා, මනුෂ්‍යවූහෝ; අග්ගප්පත්තො, ශ්‍රෙෂ්ඨභාවයට (ලොකොත්තර මාර්ගඵලයට) පැමිණියේ; පමොදති, සතුටුවෙයි,

189. 190. යො, යමෙක්තෙම; සබ්බසත්තානං, සියලුසත්වයන්; මච්චුපාසා පමොචනං, මාරපාශයෙන් මිදීම කරන්නාවූ මාර්ගය; වෙදී, දන්නේද; බහුජ්ජනො, බොහෝජනතෙම; යං, යමක්; දිස්වාච, නුවනින් දැකද; සුත්වාච, අසාද; පසීදන්ති, පහදිද්ද; දෙවමනුස්සානං, දෙව්මිනිසුන්ට; හිතං, හිතවූ; ඤායං ධම්මං, (ඒ) විදර්ශනා සහිත මාර්ගධර්මය; පකාසයි, ප්‍රකාශකළසේක්ද; මග්ගාමග්ගස්ස* කුසලො, මාර්ගාමාර්ගදෙක්හි දක්ෂවූ; කතකිච්චො, (චතුර්විධ මාර්ගයෙන් කොට නිමවාලද කෘත්‍යඇති; අනාසවො, කාමාදි ආශ්‍රවරහිතවූ; අන්තිමසාරීරො, පශ්චිම ශරීරය දරුවාවූ, මහාපඤ්ඤො, මහත් ප්‍රඥාඇතී; බුද්ධො; සර්වඥතෙම; මහාපුරිසොති, මහාපුරුෂයයි; වුච්චති, කියනුලැබේ.

191. 192. යෙන, යම් ආශ්‍රවයක් කරණකොටගෙණ; දෙවූපපත්ති අස්ස, දිව්‍යලොකොත්පත්තිය වන්නේද; (දෙවියෙක් වන්නේද) ගන්ධබ්බොවා, ගාන්ධර්වයෙක් හෝ; විහඞ්ගමො, ආකාශචාරීගාන්ධර්වකායික දෙවියෙක් හෝ වන්නේද; යෙන, යම් ආශ්‍රවයක් කරණකොටගෙණ; යක්ඛත්තං, යක්ෂාත්ම භාවයටද; මනුස්සත්තංච, මනුෂ්‍යාත්ම භාවයටද; අණ්ඩජෙ, අණ්ඩජාත්මභාවයන්ටද; ගච්ඡෙය්‍යං, යන්නෙම්ද; මය්හං, මාගේ; තෙ ආසවා, ඒ ආශ්‍රවයෝ; ඛීණා, ක්ෂයවූවාහුය; නොහොත්; මය්හං, මාවිසින්; තෙ ආසවා, ඒ ආශ්‍රවයෝ; ඛීණා, ක්ෂයකරණුලැබූවාහුය; වග්ගු, මනොඥවූ; පුණ්ඩරීකං,

---

* "මග්ගාමග්ගස්ස" යනු ආධාරාජිගෙහි පත්පිසි,

193 සීලෙ පතිට්ඨිතො භික්ඛු ඉන්ද්‍රියෙසු ච සංවුතො,
භොජනම්හි ච මත්තඤ්ඤූ ජාගරියං අනුයුඤ්ජති.

194 එවං විහරමානොපි අහොරත්තමතන්දිතො,
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා.

195 අප්පමාද රතො භික්ඛු පමාදෙ භය දස්සිවා,
අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙව සන්තිකෙ,ති,

196 කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා සහ,
ඉති සච්ච පරාමාසො දිට්ඨිට්ඨානා සමුස්සයා.

197 සබ්බ රාග විරත්තස්ස තණ්හක්ඛය විමුත්තිනො,
එසනා පටි නිස්සට්ඨා දිට්ඨිට්ඨානා සමූහතා.

---

(ජලයෙන් රියනක්පමණ උඩට නැඟ පිල හොබවමින් ... සමූහයා සතුටුකරමින් සිටියාවූ) හෙලපීඹුම්; යථා, යම්සේ; තොයෙන, ජලයෙන්; න උපලිප්පති, උපලිම්පනය නොවේද; (එපරිද්දෙන්) ලොකෙන, සංස්කාර ලොකයෙන්; නඋපලිත්තාමි, තෘෂ්ණාදෘෂ්ටිලෙපයෙන් උපලිම්පනය නොවෙමි; බ්‍රාහමණ, බ්‍රාහ්මණය; තස්මා, එහෙයින්; බුද්ධොස්මි, බුදුවූයෙමි.

193 සීලෙ, ප්‍රාතිමොක්ෂ ශීලයෙහි; පතිට්ඨිතො, පිහිටියාවූ; ඉන්ද්‍රියෙසුච, ඉන්ද්‍රියන්හිද; සංවුතො, සංවෘතවූ; භික්ඛු, භික්ෂුතෙම; භොජනම්හිච, භොජනයෙහිද; මත්තඤ්ඤූ, පමණදන්නේ; ජාගරියං, නිදිවර්ජිතකිරීමෙහි; අනු යුඤ්ජති, යෙදෙයි.

194. 195. එවං, මෙසේ; විහරමානොපි, වාසයකරන්නාවූද; අහොරත්තං, රෑදවල් දෙක්හි; අතන්දිතො, අනලස්ව; යොගක්ඛෙමස්ස, නිර්වාණයාගේ; පත්තියා, පැමිණීම පිණිස; කුසලංධම්මං, කුශලධර්මය; භාවයං, වඩන්නේ; අප්පමාදරතො, අප්‍රමාදයෙහි ඇලුනාවූ; පමාදෙ, ප්‍රමාදයෙහි; භයදස්සීවා, භයදක්නා සුලුවූද; භික්ඛු, (ඒ)මහණතෙම; පරිහානාය, පිරිහීමට; අභබ්බො, අයොග්‍යවේ; නිබ්බාණස්සෙව, නිර්වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහි (හැසිරේ).

196. 197. සබ්බරාගවිරත්තස්ස, සියලුරාගයෙන් වෙන්වූ; තණ්හක්ඛය විමුත්තිනො, තෘෂ්ණාව ක්ෂයකරන්නාවූ; (නිර්වාණයෙහි පැවති අර්හත්ඵල)විමුක්තියෙන් යුක්තවූ වහුගේ; කාමෙසනා, කාමයන් සෙවීමය; භවෙසනා, භවය සෙවීමය; බ්‍රහ්මචරියෙසනා සහ,(ඒ සෙවීම්දෙක) සමග බ්‍රහ්මචර්‍ය්‍යාව සෙවීමය යන, එසනා පටිනිස්සට්ඨා,

198 ස වෙ සන්තො සතො භික්ඛු පස්සද්ධො අපරාජිතො,
මානාභිසමයා බුද්ධො පතිලීනොති වුච්චතී'ති.

199 අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගළං,
මහායඤ්ඤා මහාරම්භා නතෙ හොන්ති මහප්ඵලා.

---

මේ සෙවුම් තෘෂ්ණාද දුරුවූවාහුවෙති; ඉතිසච්චපරාමාසො, මෙසේ සත්‍යය මෙයේසත්‍යයයි ගන්නාවූ පරාමාසයද; සමූහතා, උස්වසිඳි යාවූ; දිට්ඨිට්ඨානා, (දෘෂ්ටියයි කියනලද්දූවූම සම්භාදූවූ) දෘෂ්ටිස්ථාන යෝ සෙවින්ද; දිට්ඨිට්ඨානා සමූහතා, (ඒ සියලු) දෘෂ්ටිස්ථානද නැසූයා හුවෙති.

198 වෙ, එකාන්තයෙන්; සන්තො, (ක්ලෙශයන් සන්සිඳෙව් බැවින්) ශාන්තවූ; සතො, සිහිඇත්තාවූ; සො භික්ඛු, ඒ භික්ෂූතෙම; පස්සද්ධො,(කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙකින්) මැඩපැවතුනේය; අපරාජිතො, සකල ක්ලෙශයන් ජයගෙණසිටිබැවින් කිසිවෙක්හු විසින් නොපැරදවිය හැක්ක; මානාභිසමයා, මාන ප්‍රහාණය කිරීමෙන්; බුද්ධො,චතුස්සත්‍යාවබොධයකෙළේය; පතිලීනොති,සැඟවුනේයයි; හෙවත් එකඟබවට පැමිණියේයයි; වුච්චති, කියනුලැබේ

199 අස්සමෙධං, (අසුන් මැරීම්ඇති) අශ්වමෙධය*; පුරිසමෙධං, (පුරුෂයන් මැරීම්ඇති) පුරුෂමෙධය†; සම්මාපාසං (වියදඬුපෙති බැහිම්ඇති) සම්මාපාසය‡; වාජපෙය්‍යං, (වාජ්පෙයවිය ඇති) වාජපෙය්‍යය||; නිරග්ගලං,(දොරගුළුලෑම් නැති) නිරග්ගලය**; යන

---

* පිරිවරයාග දෙකකින් යාගකටයුතුවූ එක්විසි යාගස්ථම්භයන්ඇති භූමිය හා පුරුෂයන්හැර අවශෙෂ සකල විභව දක්ෂිණාව ඇතියාගයයි.

† පිරිවරයාග සතරකින් යාගකටයුතුවූ භූමිය සමග අශ්වමෙධයෙහි කියනලද විභව දක්ෂිණාව ඇතියාගයයි.

‡ දවසක්පාසා වියදඬුපෙත්ත දමා ඒ වැටුනු අඩිනාගයෙහි වෙදිකාකොට නෙරණයනු ලබන්නාවූ යාගස්ථම්භයෙන් යුක්තව සරස්වතී නදීයෙහි ගිලුනු අවකාශයේ පටන් ප්‍රතිලෝමයට යන්නන් විසින් යාගකටයුතුවූ සිලයාගයයි.

|| පිරිවරයාග එකකින් හා සතලොස් සිව්පාවුන්ගෙන් යාගකටයුතුවූ බිල්වයාගස්ථම්භයක්හා සප්තදශක දක්ෂිණාව ඇත්තාවූ යාගයයි.

** පිරිවරයාග නවයකින් යාගකටයුතුවූ භූමිය හා පුරුෂයන් සමග අශ්වමෙධයෙහි කියනලද විභවදක්ෂිණාවඇති සර්වමෙධපර්‍යාය නම්වූ යාගයයි.

200 අජෙළකා ච ගාවො ච විවිධා යත්ථ හඤ්ඤරෙ,
න තං සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො.

201 යං ච යඤ්ඤං නිරාරම්භං යජන්ති අනුකුලං සදා,
අජෙළකා ච ගාවො ච විවිධා නෙත්ථ හඤ්ඤරෙ;
තං ච සම්මග්ගතා යඤ්ඤං උපයන්ති මහෙසිනො.

202 එතං යජෙථ මෙධාවී එසො යඤ්ඤො මහප්ඵලො,
එතං හි යජමානස්ස සෙය්‍යො හොති න පාපියො;
යඤ්ඤො ච විපුලො හොති පසීදන්ති ච දෙවතා.ති.

203 අභිසඞ්ඛතං නිරාරම්භං යඤ්ඤං කාලෙන සප්පියං,
තාදිසං උපසංයන්ති සඤ්ඤතා බ්‍රහ්මචාරයො.

---

මහායඤ්ඤා, මහායාගයෝ; මහාරම්භා, ප්‍රාණවධාදි මහත් කටයුතු ඇත්තාහ; තෙ, ඒ මහායාගයෝ; නමහප්ඵලා හොන්ති, මහත් ඵල නොවෙති.

200 යත්ථ, යම් තැනෙක්හි; විවිධා, අනෙකප්‍රකාරවූ: අජෙළකාච, එළුවන් හා තිරෙළුවෝද; ගාවොච, ගෙරිද; හඤ්ඤරෙ, නසනුලැබෙත්ද; තංයඤ්ඤං, ඒ යාගයට; සම්මග්ගතා, මනාව පිළිපන්නාවූ; මහෙසිනො, බුඩාදිමහර්ෂිහු; න උපයන්ති, නොඑළඹෙත්.

201 සදා, හැමකල්හි; නිරාරම්භං, ප්‍රාණවධාදි ආරම්භරහිතවූ; අනුකූලං, කුලය අනුව පැවැත්තාවූ; හෙවත් පූර්වපුරුෂයන් විසින් නොකඩව දෙනලද්දාවූ; යංච යඤ්ඤං, යම් යාගයක්; යජන්ති, යාග කෙරෙත්ද; එත්ථ, මේ යාගයෙහි; අජෙළකාච එළුවෝද තිරෙළුවෝද; ගාවොච, ගවයෝද; විවිධා, අනෙකප්‍රකාර ප්‍රාණීහු; නහඤ්ඤරෙ, නොනසනුලැබෙත්ද; තංයඤ්ඤං, ඒ යාගයට; සම්මග්ගතා. මනාව පිළිපන්නාවූ; මහෙසිනො, බුඩාදිමහර්ෂීහු; උපයන්ති, එළඹෙත්.

202 මෙධාවී. (යාගඵලදන්නා) නුවණැති ජනතෙම; එතං, මේ යාගය; යජෙථ, යාගකරන්නේය; එසොයඤ්ඤො, මේ යාගයතෙම; මහප්ඵලො. මහත්ඵලවේ; එතං හි, මේ යාගයවනාහි; යජමානස්ස, යාගකරන්නාහට; සෙය්‍යොහොති, අතිශයින් ප්‍රශස්තවේ හෙවත් ශ්‍රෙෂ්ඨකර්මවේ; න පාපියො, කිසිපාපයෙක් නොවේ; යඤ්ඤොච, යාගයද; විපුලොහොති, මහත්ඵලවේ; දෙවතාච, දෙවියෝද; පසීදන්ති, පහදිත්.

203 කාලෙන, සුදුසුකාලයෙහි; අභිසඞ්ඛතං, රැස්කරණලද;

204 විවත්තච්ඡද්දා යෙ ලොකෙ  වීතිවත්තා කාලංගතිං,
යඤ්ඤමෙතං පසංසන්ති  බුද්ධා පුඤ්ඤස්ස කොවිදා.

205 යඤ්ඤ වා යදි වා සද්ධ  හව්‍යං කත්වා යථාරහං,
පසන්නචිත්තො යජති  සුඛෙත්ත බ්‍රහ්මචාරිසු.

206 සුහුතං සුයිට්ඨං සුප්පත්තං  දක්ඛිණෙය්‍යෙසු යං කතං,
යඤ්ඤො ච විපුලො හොති  පසීදන්ති ච දෙවතා.

207 එවං යජිත්වා මෙධාවී  සද්ධො මුත්තෙන චෙතසා,
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං  පණ්ඩිතො උප පජ්ජති,ති.

"චක්කවග්ගො චතුත්ථො."

---

කප්පියං, කැපවූ; නිරාරම්භං, ප්‍රාණඝාත රහිතවූ; තාදිසං, එබඳුවූ; යඤ්ඤං, (පිදියයුතුබැවින්) යාගයයි කියනලබන්නාවූ දෙය්‍යධර්මය ට; සඤ්ඤතා, (ශීලසංයමයෙන්) සංයතවූ; බ්‍රහ්මචාරයො, බ්‍රහ්මචාරීහු; උපයන්ති, පැමිණෙත්.

204 ලොකෙ, ලොකයෙහි; යෙ, යම්කෙනෙක්; විවත්තච්ඡද්දා, හරණලද; රාගාදිසෙවෙනි ඇත්තාහු; කාලංගතිං, වෘත්තකාලය හා වෘත්තගතීන්; විතිවත්තා, ඉක්මෙව්වාහුද; පුඤ්ඤස්සකොවිදා, චතුර්භූමක කුශලයෙහි දක්‍ෂවූ; බුද්ධා, චතුස්සත්‍යාවබොධය කළාවූ ඒ පණ්ඩිතයෝ; එතංයඤ්ඤං, මේ යාගයට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්.

205 යඤ්ඤං, ප්‍රකෘති දානයෙහිද; යදිවා, නොහොත්; සද්ධං, මතකදානයෙහිද; යථාරහං, සුදුසුපරිද්දෙන්; හව්‍යං කත්වා, පිදියයුතු දානවස්තුව සකස්කොට; සුඛෙත්ත, බ්‍රහ්මචාරිසු; බ්‍රහ්මචාරී සඞ්ඛ්‍යාතවූ මහාක්‍ෂෙත්‍රයෙහි; පසන්නචිත්තො, පැහැදුනාවූ සිත්ඇත්තේ; යජති, යාගකෙරෙයි; හෙවත් පුදයි.

206 දක්ඛිණෙය්‍යෙසු, දක්‍ෂිණාහියන්කෙරෙහි; යං, යම් පරිත්‍යාගයෙක්; කතං,කරණලද්දේද; සුහුතං, ඒ මහාපරිත්‍යාගයෙක්වේ; යඤ්ඤොච,දානසඞ්ඛ්‍යාත යාගයද;විපුලොහොති, මහත්වේ; දෙවතාච, දෙවියෝද; පසීදන්ති, පහදිත්.

207 සද්ධො, (බුද්ධාදි රත්නත්‍රයෙහිගුණ අදහන හෙයින්)ශ්‍රද්ධා ඇති; මෙධාවී, නුවනැත්තාවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; මුත්තෙන

208 සංඛාය ලොකස්මිං පරොපරානි
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාති ජරන්ති බ්‍රූමී,ති.

209 ඒකංස වචනං එකං විභජ්ජ වචනා පරං,
තතියං පටිපුච්ඡෙය්‍ය චතුත්ථං පන ඨාපයෙ.

210 යො ච තෙසං තත්ථ තත්ථ ජානාති අනුධම්මතං,
චතුපඤ්හස්ස කුසලො ආහු භික්ඛුං තථාවිධං.

211 දුරාසදො දුප්පසහො ගම්භීරො දුප්පධංසියො,
අථො අත්ථෙ අනත්ථෙ ච උභයස්ස හොති කොවිදෙ.

212 අනත්ථං පරිවජ්ජෙති අත්ථං ගණ්හාති පණ්ඩිතො
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතො ති පවුච්චති,ති.

---

ඉඤ්ජිතං, තෘෂ්ණාගෙයිතීත; ඒවං, මෙසේ; යජිත්වා, යාගකොට; භෙවත්
පුද; අබ්භානුමොදිං, පිළිගත්තාවූ; සුඛං, සැපඇති; ලොකං, ලොකයට;
උපපජ්ජන්ති, පැමිණෙත්

208. (20 වෙනි අඩතය බලනු.)

209 එකං, එක්කොටසකින් විසඳියයුතුවූ ප්‍රශ්නය; එකංසවච
නං. එකදෙශයකින් කියන්නෙනය; අපරං,(බෙදාවිසඳිය යුතුවූ)අනික්
ප්‍රශ්නය; විභජ්ජවචනං, බෙදීමෙන් කියන්නේය; තතියං (විචාරී
මෙන් විසඳියයුතුවූ)තුන්වෙනි ප්‍රශ්නය; පටිපුච්ඡෙය්‍ය. නැවත විචා
රන්නේය; චතුත්ථංපන, (ස්ථාපනීයවූ) සතරවෙනි ප්‍රශ්නයවනාහී;
ඨාපයෙ, තබන්නේය.

210 යොච, යමෙක්තෙම; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; තෙසං,
ඒ සිව්වැදෑරුම් ප්‍රශ්නයන්ගේ; අනුධම්මතං, විසඳීම්; ජානාති, දැ
නීද; තථාවිධං, එබඳුවූ; භික්ඛුං, භික්ෂුව; චතුපඤ්හස්ස කුසලොයි,
චතුර්විධ ප්‍රශ්නයෙහි දක්ෂයයි; ආහු, කියත්.

211 දුරාසදො, ළංවියනොහැකිවූ; දුප්පසහො, මැඩපැවැත්විය
නොහැකිවූ; ගම්භීරො,(සප්තසී දහසක්මහාසාගරයේ) ගැඹුරුවූ; දුප්ප
ධංසියො, පීඩාකළනොහැකිවූ(ඒ) භික්ෂුතෙම; අත්ථෙ, වැඩත; අනත්ථෙ,
වැඩිමෙහිද; අථඑව, නොවැඩිමෙහිද යන; උභයස්ස, දෙපක්ෂ
යෙහි; කොවිදෙහොත්, දක්ෂවේ.

212 පණ්ඩිතො, පණ්ඩිතතෙම; අනත්ථං, අනර්ථය; පරිවජ්ජෙති,

213 කොධ මක්ඛගරූ භික්ඛූ ලාභ සක්කාර ගාරවා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මා සම්බුද්ධ දෙසිතෙ.

214 යෙ ච සද්ධම්ම ගරුනො විහංසු විහරන්ති ච,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධ දෙසිතෙ,ති.

215 කොධ මක්ඛ ගරූ භික්ඛු ලාභ සක්කාර ගාරවො,
සුඛෙත්තෙ පූති බීජංව සද්ධම්මෙ න විරූහති.

216 යෙ ච සද්ධම්ම ගරුනො විහංසු විහරන්ති ච,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සිනෙහ මන්වාය මිවොසධං ති.

---

දුරු කෙරෙයි; අත්ථං, අර්ථය; ගණ්හාති, ගණියි; අත්ථාභි සමයා, අර්ථාවබොධයෙන්; ධීරො, ධෛර්‍ය්‍යසන් යුක්ත පුද්ගල තෙම; පණ්ඩිතොති, (මේ තෙම) පණ්ඩිතයයි; පවුච්චති, කියනු ලැබේ.

213 කොධ මක්ඛ ගරූ, ක්‍රොධය හා ගුණමකු බව ගරු කොට ඇති; ලාභසක්කාර ගාරවා, ලාභය හා සත්කාරය ගරු කොට ඇති; භික්ඛූ, (යම්) භික්ෂුහු වෙත්ද; තෙ, ඒ භික්ෂූහු තුමූ; සම්මාසම්බුද්ධ දෙසිතෙ, සම්‍යක් සම්බුඩ දෙශිතවූ; ධම්මෙ, ධර්මයෙහි; නවිරූහන්ති, නොවැඩෙත්.

214 යෙච, යම් භික්ෂුහු කෙනෙක්; සද්ධම්මගරුනො, සධර්මය ගරු කොට ඇත්තාහු; විහංසු, වාසය කළාහුද; විහරන්තිච, දැන් වාසය කෙරෙත්ද; තෙ, ඒ භික්ෂූහු; වෙ, එකාන්තයෙන්; සම්මාසම්බුද්ධ දෙසිතෙ, සම්‍යක් සම්බුඩ දෙශිතවූ; ධම්මෙ, ධර්මයෙහි; විරූහන්ති, වැඩෙත් නොහොත් හටගත් මුල් ඇති අචල ශ්‍රද්ධාවෙහි පිහිටත්.

215 කොධමක්ඛගරූ, ක්‍රොධය හා ගුණ මකුබව ගරු කොට ඇති; ලාභසක්කාර ගාරවො, ලාභය හා සත්කාරය ගරු කොට ඇති; භික්ඛු, මහණ තෙම; සුඛෙත්තෙ. මනා ක්ෂෙත්‍රයෙහි; පූතිබීජංව, කුණුවූ බීජයමෙන්; සද්ධම්මෙ. සද්ධර්මයෙහි; නවිරූහති, නොවැඬේ.

216 යෙච, යම් භික්ෂුහු කෙනෙක්; සද්ධම්මගරුනො, සධර්මය ගරු කොට ඇත්තාහු; විහංසු, වාසය කළාහුද; විහරන්තිච, දැන් වාසය කෙරෙත්ද, තෙ, ඒ භික්ෂූහු; වෙ, එකාන්තයෙන්; සිනෙහමන්වායං, සිනෙහ රසය අනුගතවූ; ඔසධං ඉව, ඖෂධයමෙන්; ධම්මෙ, ධර්මයෙහි; විරූහන්ති, වැඩෙත්.

217 ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

218 තස්මා හවෙ ලොකවිදූ සුමෙධො
ලොකන්තගූ වුසිත බ්‍රහ්ම චරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසතී ලොක මිමං පරඤ්චා,ති.

219 ගමනෙන න පත්තබ්බො ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං දුක්ඛා අත්ථි පමොචනං.

220 තස්මා හවෙ ලොකවිදූ සුමෙධො
ලොකන්තගූ වුසිත බ්‍රහ්ම චරියො,
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසති ලොක 'මිමං පරඤ්චා, ති.

221 නභඤ්ච දූරෙ පඨවිච දූරෙ පාරං සමුද්දස්ස තදාහු දූරෙ,
යතො ච වෙරොචනො අබ්භුදෙති පභඞ්කරො යත්ථ ච අත්ථමෙති;
තතො හවෙ දූර තරං වදන්ති සතඤ්ච ධම්මං අසතඤ්ච ධම්මං.

---

217 ගමනෙන, පාදගමනින්; ලොකස්සන්තො, ලොවකෙළවර; කුදාචනං, කිසිකලෙක්හි; න පත්තබ්බො, නොපැමිණිය යුතුය; ලොකන්තං, සංස්කාර ලොකයාගේ කෙළවරට; අප්පත්වා, නොපැමිණ; දුක්ඛා, දුකින්; පමොචනං, මිදීමෙක්; න ච අත්ථි, නොම ඇත්තේය.

218 තස්මා, එහෙයින්; හවෙ, ඒකාන්තයෙන්; ලොකවිදූ, ලොකයදන්නාසුලුවූ; ලොකන්තගූ, ලොව් කෙළවරට පැමිණියාවූ; වුසිතබ්‍රහ්මචරියො, වාසයකොට නිමවනලද; බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති; සමිතාවි, සංසිඳුවනලද පව් ඇති; සුමෙධො, පණ්ඩිතතෙම; ලොකස්ස, ලොකයාගේ; අන්තං, කෙළවර; ඤත්වා, දැන; ඉමං ලොකං, මේ ලොකයද; පරංච, පරලොකයද; නාසිංසති, ප්‍රාර්ථනානොකෙරෙයි.

219. 220. (217. 218. වෙනි අඞ්ක බලනු.)

221 නභංච, අහසද; පඨවිච, පොළොවද; දූරෙ, දුරෙහිය; සමුද්දස්ස, සාගරයාගේ; පාරං, එතරද; (මෙතරද) දූරෙ, දුරෙහිය; යතොච, යම්තැනෙක්හි; පභඞ්කරො, ආලොකකරන්නාවූ; වෙරොචනො, සූර්‍ය්‍යතෙම; අබ්භුදෙති, උදාවේද; යත්ථච, යම් තැනෙක්හි; අත්ථමෙති, අස්තඞ්ගතවේද; තං, ඒද; දූරෙ, දුරෙහියයි; ආහු, කියත්;

222 අබ්භාසිකො හොති සතං සමාගමො
යාවම්පි තිට්ඨෙය්‍ය තථෙව හොති,
ඛිප්පං හි වෙති අසතං සමාගමො
තස්මා සතං ධම්මො අසබ්භි ආරකා,ති.

223 න භාසමානං ජානන්ති මිස්සං බාලෙහි පණ්ඩිතං,
භාසමානඤ්ච ජානන්ති දෙසෙන්තං අමතං පදං.

224 භාසයෙ ජොතයෙ ධම්මං පග්ගණ්හෙ ඉසිනං ධජං,
සුභාසිත ධජා ඉසයො ධම්මො හි ඉසීනං ධජො.

---

සතංච, බුද්ධාදි සත්පුරුෂයන්ගේ; ධම්මං, (සතර සතිපට්ඨානාදි ප්‍රභෙදඇති සප්තතිංශ බොධපාක්‍ෂික) ධර්මයද; අසතංච ධම්මං,(දෙසැට දෘෂ්ටිගත භෙදඇති) අසද්ධර්මයද; තං හො, ඒවවබා; දූරතරං, අතිශයින් දුරු යයි; වදන්ති, (බුද්ධාදි පණ්ඩිතයෝ) කියත්.

222 සතං සමාගමො, (මිත්‍රසන්‍ථව වශයෙන්) පැවති පණ්ඩිත සමාගමය; අබ්භාසිකො හොති, පහනොවන ස්වභාව ඇත්තේය; යාවම්පිතිට්ඨෙය්‍ය, යම්තාක් පවත්නේද (ඒතාක්); තථෙවහොති, එබඳුමවේ; (ප්‍රකෘතිය නොහැරියිසේයි) අසතං සමාගමො, අසත්පුරුෂ සමාගමය; ඛිප්පං හි වෙති, වහා දුරුවෙයි; තස්මා, එහෙයින්; සතං සමාගමො, සත්පුරුෂ සමාගමය තෙම; අසබ්භි, අසත්පුරුෂයන් කෙරෙන්; ආරකා, දුරෙහිවේ.

223 බාලෙහි, බාලයන් හා සමග; මිස්සං, දුශ්චරිත වශයෙන් ගැටෙන කරන්නාවු කායකර්මාදිය; අභාසමානං, නොකියන්නාවු; නොහොත් බාලෙහි, බාලයන්ගෙන්; මිස්සං, මිශ්‍රවූ (හැසිරීම්ඇති); අභාසමානං, කථාය නොකරන්නාවූ; පණ්ඩිතං, පණ්ඩිතයා; නජානන්ති,(පණ්ඩිතයෝ) නොදනිත්; භාසමානංච, කියන්නාවූද; අමතං පදං, නිර්වාණ පදය; දෙසෙන්තං, දෙශනාකරන්නාවූද(පණ්ඩිතයා); ජානන්ති, දනිත්.

224 ධම්මං, ලොකොත්තර ධර්මය; භාසයෙ, බබුලුවන්නේය; ජොතයෙ, දීප්තිමත්කරන්නේය; ඉසිනං, බුද්ධාදිඍෂීන්ගේ; ධජං, (උද්ගතාර්ථයෙන් නවවැදෑරුම් ලොව්තුරු දහම් නම්වූ) ධ්වජය; පග්ගණ්හෙ, දැඩිකොට ගන්නේය නොහොත් උසස්කොට කියන්නේය; ඉසයො, බුද්ධාදි ආර්‍ය්‍යයෝ; සුභාසිතධජා,(නව ලොව්තුරු දහම් දක්වන්නාවූ) මනා දෙසුම් ධජකොට ඇත්තාහු; ධම්මො හි, නවලොව්තුරු දහම්වනාහි; ඉසිනං,බුද්ධාදිආර්‍ය්‍යයන්ගේ; ධජො,ධ්වජයනම්වේ.

225. අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො,
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො.

226. මිච්ඡාදිට්ඨිගතා සත්තා ඛිත්තචිත්තා විසඤ්ඤිනො,
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනො ජනා.

227. සත්තා ගච්ඡන්ති සංසාරං ජාතිමරණගාමිනො,
සදා ච බුද්ධා ලොකස්මිං උප්පජ්ජන්ති පභඞ්කරා.

228. තෙ මං ධම්මං පකාසෙන්ති දුක්ඛූපසමගාමිනං,
තෙසං සුත්වාන සප්පඤ්ඤා සචිත්තං පච්චලත්ථුතෙ.

229. අනිච්චං අනිච්චතද්දක්ඛුං දුක්ඛමද්දක්ඛු දුක්ඛතො,
අනත්තානි අනත්තාති අසුභං අසුභතද්දසුං;
සම්මාදිට්ඨිසමාදානා සබ්බං දුක්ඛං උපච්චගුන්ති.

---

225. 226. අනිච්චෙ, අනිත්‍යයෙහි; නිච්චසඤ්ඤිනො, නිත්‍යයයි සංඥා ඇත්තාවූ; දුක්ඛෙච, දුකෙහිද; සුඛසඤ්ඤිනො, සුවයයි සංඥා ඇත්තාවූ; අනත්තනිච, අනාත්මයෙහිද; අත්තාති, ආත්මයයි (සංඥා ඇත්තාවූ); අසුභෙ, අසුභයෙහි; සුභසඤ්ඤිනො, සුභයයි සංඥා ඇති; (ගුද කාලාව සංඥා ඇත්තාහුම නොව සංඥාවෙස් උපදනාවූ) මිච්ඡාදිට්ඨිගතා සත්තා, මිථ්‍යාදෘෂ්ටිගතවූම; ඛිත්තචිත්තා, (සංඥාදෘෂ්ටිමෙන් උපදනාවූ) වික්ෂිප්ත සිත් ඇති නොහොත් පඤ්චකාමයෙහි ඇළුනාවූ සිත් ඇති; විසඤ්ඤිනො, විපරීත සංඥා ඇත්තාවූ; අයොගක්ඛෙමිනො, යොගක්ෂෙමවූ නිර්වාණයට නොපැමිණියාවූ; තෙජනා, ඒ සත්වයෝ; මාරස්ස, මාරයාගේ; යොගයුත්තා, යෝගයෙහි යෙදුනාහු වෙති.

227. 228. ජාතිමරණගාමිනො, ජාතියට හා මරණයට යනසුලු වූ; සත්තා, සත්වයෝ; සංසාරං, සසරට; ගච්ඡන්ති, යෙත්; සදාච, සම්කාලෙක්හි; පභඞ්කරා, ප්‍රභාකරවූ; බුද්ධා, බුදුවරයෝ; ලොකස්මිං, ලොකයෙහි; උප්පජ්ජන්ති, උපදිත්ද; තෙ, ඒබුදුවරයෝ; දුක්ඛූපසමගාමිනං, දුක්සංසිඳුවීම පිණිස පවත්නාවූ; ඉමං ධම්මං, මේ (චතුරාර්‍ය්‍ය සත්‍ය) ධර්මය; පකාසෙන්ති, ප්‍රකාශකෙරෙත්; සප්පඤ්ඤා, නුවනැත්තාහු; තෙසං, උන්වහන්සේලාගේ; (ධර්මය) සුත්වාන, අසා; සචිත්තං, ස්වකීය සිත; පච්චලත්ථු, ලැබුවෝය; තෙ, ඒ නුවනැත්තාහු (ස්වචිත්තය ලැබ).

229. අනිච්චං, අනිත්‍යය; අනිච්චතද්දක්ඛුං, අනිත්‍ය වශයෙන්

230 රාග දොස පරික්ඛිට්ඨා, එකෙ සමණ බ්‍රාහ්මණා,
අවිජ්ජා නිවුතා පොසා පිය රූපාභි නන්දිනො.

231 සුරං පිවන්ති මෙරයං පටිසෙවන්ති මෙථුනං,
රජතං ජාත රූපඤ්ච සාදියන්ති අවිද්දසු.

232 මිච්ඡා ජීවෙන ජීවන්ති එකෙ සමණ බ්‍රාහ්මණා,
එතෙ උපක්කිලෙසාවුත්තා බුද්ධෙනා දිච්ච බන්ධුනා.

233 යෙහි උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහ්මණා,
න තපන්ති න භාසන්ති අද්ධුවා සරජාපගා.

---

දුටුවාහුය; දුක්ඛං, දුක; දුක්ඛතො, දුක්වශයෙන්; අද්දක්ඛුං, දුටුවාහුය; අනත්තානි, අනාත්මයෙනි; අනත්තාති, අනාත්මයයි (දුටුවාහුය) අසුභං, අසුභය; අසුභතද්දසුං, අසුභවශයෙන් දුටුවාහුය; සම්මාදිට්ඨි සමාදානා, ගන්නාලද සම්‍යක්දශීන ඇත්තාහු; සබ්බං දුක්ඛං, සියලු (සසර) දුක; උපච්චගුං, ඉක්මෙව්වාහුවෙති.

230 රාගදොසපරික්ඛිට්ඨා, රාගද්වෙෂයෙන් කිලුටුවූ; අවිජ්ජා නිවුතා, අවිද්‍යාවෙන් වැසුනාවූ; පොසා, පුරුෂවූ; එකෙසමණ බ්‍රාහ්මණා, ඇතම් මහණබමුණෝ; පියරූපාභි නන්දිනො, ප්‍රිය රූපයට සතුටුවන්නාහුවෙති.

231 අවිද්දසු, අඥබාලජනයෝ; මෙරයං, සිව්වැදෑරුම්වූ මෙරයද; සුරං, පස්වැදෑරුම්වූ සුරාවද; පිවන්ති, පානයකෙරෙත්; මෙථුනං, මෛථුනය; පටිසෙවන්ති, සෙවනයකෙරෙත්; රජතං, රිදීද; ජාතරූපංච, රත්‍රන්ද; සාදියන්ති, ගණිත්.

232. 233. එකෙ සමණ බ්‍රාහ්මණා, ඇතම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ; මිච්ඡා ජීවෙන, මිථ්‍යා ජීවයෙන්; ජීවන්ති, ජීවත්වෙත්; යෙහි උපක්කිලිට්ඨා, යම් කිලුටකින් කෙලෙසුනාවූ; එකෙ සමණ බ්‍රාහ්මණා, ඇතම් මහණ බමුණෝ; අද්ධුවා, අනිස්ථිරවූවාහු; සරජාපගා, රාගරජස් නදිකොට ඇත්තාහු; න තපන්ති, (ගුණප්‍රතාපයෙන්) ප්‍රතාපය නොවෙත්ද; න භාසන්ති, (ගුණභාසයෙන්) නොබබලත්ද; එතෙ උපක්කිලෙසා, මේ උපක්ලෙශයෝ; ආදිච්චබන්ධුනා සූර්‍ය්‍යබන්ධුවූ; බුද්ධෙන, බුදුන්විසින්; වුත්තා, වදාරණලද්දාහුය.

234 අන්ධකාරෙන ඔනද්ධා තණ්හාදුසා සඞ්ගතිකා,
වඩ්ඪෙන්ති කටසිං ඝොරං ආදියන්ති පුනබ්භවං,ති.

**“රොහිණියස්ස වග්ගො පඤ්චමො”**

**පඨමො පණ්ණාසකො.**

—— 0 ——

235 මහොදධිං අපරිමිතං මහාසරං
බහුභෙරවං රතනගණානමාලයං,
නජ්ජො යථා නරගණසංඝසෙවිතා
පුථූ සවන්තී උපයන්ති සාගරං.

236 එවං නරං අන්නදපානවත්ථදං
සෙය්‍යානිසජ්ජත්ථරණස්ස දායකං,
පුඤ්ඤස්සධාරා උපයන්ති පණ්ඩිතං
නජ්ජො යථා වාරිවහාව සාගරං,ති.

237 යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරියකන්තං පසංසිතං.

---

234 අන්ධකාරෙන, මොහාන්ධකාරයෙන්; ඔනද්ධා, වළඳනාලද; තණ්හාදුසා, තෘෂ්ණාවට දූසවූ; සඞ්ගතිකා, තෘෂ්ණානැමති රැහැන් ඇත්තාහු; ඝොරං, දරුණුවූ; කටසිං, ආත්මය; වඩ්ඪෙන්ති, වඩත්; පුනබ්භවං, පුනර්භවය; ආදියන්ති, ගණිත්.

235. 236. මහොදධිං, මහත් ජලය දරන්නාවූ; අපරිමිතං, ප්‍රමාණරහිතවූ; මහාසරං, මහත් ඝොෂා ඇති; බහුභෙරවං, බොහෝභයානක අරමුණුවලින් යුක්තවූ; රතනගණානං, (සත්වැදෑරුම්වූ රත්න සමූහයාට), ආලයං, වාසස්ථානවූ; සාගරං, සාගරයකරා; නරගණසංඝසෙවිතා, නරගණ සමූහයා විසින් සෙව්නාලද; පුථූසවන්ති, බොහෝව බසින්නාවූ; නජ්ජො, නදීහු; යථා, යම්සේ; උපයන්ති, පැමිණෙත්ද, එවං, එම්පරිද්දෙන්; අන්නද, ආහාරදෙන්නාවූද; පාන වත්ථදං, පානවර්ග හා වස්ත්‍රදෙන්නාවූද; සෙය්‍යා, සයනද; නිසජ්ජත්ථරණස්සදායකං, නිසැදෑස්ථාන හා ආස්තරණ දෙන්නාවූද; පණ්ඩිතං, පණ්ඩිතවූ; නරං, මනුෂ්‍යයාකරා; පුඤ්ඤස්සධාරා, කුශලධාරාවෝ; උපයන්ති පැමිණෙත; (කෙසේද) සාගරං, සාගරයකරා; වාරිවහා (ජලය වහණයවන හෙයින්)වාරිවහායයි කියනලද; නජ්ජායථාව, නදීහු යම්සේද එමෙනි.

237. 238. යස්ස, යමෙක්හුගේ; සද්ධා, ශ්‍රද්ධාතොමෝ; තථාගතෙ,

238 සඞ්ඝෙ පසාදෙ යස්සත්ථි උජුභූතං ච දස්සනං,
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

239 තස්මා සද්ධං ච සීලං ච පසාදං ධම්ම දස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනං, යි.

240 උභො ච හොන්ති දුස්සීලා කදරියා පරිභාසකා,
තෙ හොන්ති ජාති පතයො ඡවා සංවාස මාගතා.

241 සාමිකො හොති දුස්සීලො කදරියො පරිභාසකො,
භරියා සීලවතී හොති වදඤ්ඤූ වීතමච්ඡරා;
සාපි දෙවී සංවසති ඡවෙන පතිනා සහ.

---

තථාගතවූබුදුන්කෙරෙහි; අචලා, නිශ්චලවූ; සුප්පතිට්ඨිතා, මනාකොට පිහිටියාද; යස්ස, යමෙකුගේ; කල්‍යාණං, යහපත්වූ; අරියකන්තං, ආර්‍යයන්ට ප්‍රියවූ: පසංසිතං, ප්‍රශංසාකරණ ලද්දවූ; සීලං ච, ශීලය ඇත්තේද; යස්ස, යමක්හුගේ; සංඝෙ, සංඝයාකෙරෙහි: පසාදෙ, පැහැදීම; අත්ථි, ඇත්තේද; උජුභූතං ච දස්සනං, (කායවඞ්කාදිය රහිත හෙයින්) ඍජුදර්ශන ඇත්තේද; තං, ඔහු; අදලිද්දොති, දිළිඳුනොවේයයි; ආහු, කියත්; තස්ස, ඔහුගේ; ජීවිතං, ජීවිතය; අමොඝං, සිස් නොවේ.

239 තස්මා; එහෙයින්; මෙධාවී, පණ්ඩිතතෙම; බුද්ධානසාසනං, බුදුන්ගේ අනුශාසනාව; සරං, සිහිකරන්නේ; සද්ධං ච, ශ්‍රද්ධාවද; සීලං ච, ශීලයද; පසාදං, (බුද්ධාදි රත්නත්‍රයෙහි) පැහැදීමද; ධම්මදස්සනං, චතුරාර්‍යසත්‍යධර්මය දැකීමද; අනුයුඤ්ජෙථ, යොදන්නේය.

240 උභොච, (අඹුසැමි)දෙදෙනද; කදරියා, තදමසුරුවූ; පරිභාසකා, (ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට) ගර්හාකරන්නාවූ; දුස්සීලා හොන්ති, දුස්සීලයෝ වෙද්ද; ඡවා, (ගුණමරණයෙන්) මළබැවින්; මළසිරුරුවූ; තෙජාතිපතයො, ඒ අඹුසැමිදෙදෙන; සංවාසමාගතා, සංවාසයට පැමිණියාහු; හොන්ති, වෙත්.

241 සාමිකො, ස්වාමිතෙම; කදරියො, තදමසුරුවූ; පරිභාසකො, (ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට) ගර්හාකරන්නාවූ; දුස්සීලො හොති, දුස්සීලයෙක් වේද; භරියා, භාර්‍යාතොමෝ; වදඤ්ඤූ, බොහෝදැදෙන්නාවූ; හෙවත් යාචකයන්ගේ වචන දන්නාවූ; වීතමච්ඡරා,

242 සාමිකො සීලවා හොති වදඤ්ඤූ වීත මච්ඡරො,
භරියා හොති දුස්සීලා කදරියා පරිභාසකා;
සාපි ඡවා සංවසති දෙවෙන පතිනා සහ.

243 උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්ම ජීවිනො;
තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

244 අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සමසීලිනං,

245 ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනො,ති.

---

පහවූ මසුරුමලඇති; සීලවා හොති, සිල්වත්වේද; දෙවි, (ගුණයෙන්) දෙවියකු වැනිවූ; සාපි, ඕතොමෙද; ඡවෙන පතිනා සහ, මලසිරුරක්වූ ස්වාමියා සමග; සංවසති, වාසයකරන්නීය.

242 සාමිකො, ස්වාමිතෙම; වදඤ්ඤූ, බොහෝදෑ දෙන්නාවූ; හෙවත් යාචකයන්ගේ වචනාර්ථ දන්නාවූ; වීතමච්ඡරො, පහවූ මසුරුමලඇති; සීලවා හොති, සීලවන්තයෙක්වේද; භරියා, භාර්‍ය්‍යාතොමෝ; කදරියා, තදමසුරුවූ; පරිභාසකා (ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට) ගර්හාකරන්නාවූ; දුස්සීලා හොති, දුඃසීලවේද; සාපිඡවා, මලසිරුරකටබඳුවූ ඕතොමොද; දෙවෙන, දෙව්වූ; පතිනාසහ, ස්වාමියාසමග; සංවසති, වාසයකරන්නීය.

243 උභො, අඹුසැමිදෙදෙනා; සද්ධා, ශ්‍රද්ධාඇත්තාහුද; වදඤ්ඤූ ච, බොහෝදෑ දෙන්නාහුද හෙවත් යාචකයන්ගේ වචනය දන්නාහුද; සඤ්ඤතා, ශීලසංයමයෙන් යුක්තවූවාහුද; ධම්මජීවිනො, දැහැමින් ජීවත්වන්නාහුද; තෙ ජානිපතයො, ඒ අඹුසැමිදෙදෙනා; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට; පියංවදා හොන්ති, ප්‍රියවචන කියන්නාහු වෙත්.

244 සමසීලිනං, සමාන පැවතුම් ඇත්තාවූ; උභින්නං, ඒ දෙදෙනාගේ; අත්ථා, වෘද්ධි සංඛ්‍යාත අර්ථයෝ; සම්පචුරාහොන්ති, බොහෝවෙත්; ඵාසත්ථං, පහසු විහරණය; (ඔවුනොවුන්ට) උපජායති, උපදී; අමිත්තා, සතුරෝ; දුම්මනා හොන්ති, නොසතුටුවෙත්.

245 සමසීලබ්බතා, සමාන ශීලව්‍රතයඇති; උභො, දෙදෙනා; ඉධ, මේලොකයෙහි; ධම්මං චරිත්වාන, කුශලධර්මයෙහි හැසිර; නන්දිනො, සතුටුවන්නාහු; කාමකාමිනො, කාමයන් කැමතිවන්නාහු; දෙවලොකස්මිං, දිව්‍යලොකයෙහි; මොදන්ති, (විපාකයෙන්) සතුටුවෙත්.

246 උභොච හොන්ති දුස්සීලා කදරියා පරිභාසකා,
තෙ හොන්ති ජානි පතයො ඡවා සංවාස මාගතා.

247 සාමිකො හොති දුස්සීලො කදරියො පරිභාසකො,
භරියා සීලවතී හොති වදඤ්ඤූ වීත මච්ඡරා;
සාපි දෙවී සංවසති ඡවෙන පතිනා සහ.

248 සාමිකො සීලවා හොති වදඤ්ඤූ වීත මච්ඡරො,
භරියා හොති දුස්සීලා කදරියා පරි භාසකා;
සාපි ඡවා සංවසති දෙවෙන පතිනා සහ.

249 උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්ම ජීවිනො,
තෙ හොන්ති ජානි පතයො අඤ්ඤමඤ්ඤං පියංවදා.

250 අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උපජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සම සීලිනං.

251 ඉධ ධම්මං චරිත්වාන සමසීලබ්බතා උභො,
නන්දිනො දෙව ලොකස්මිං මොදන්ති කාම කාමිනො,ති.

252 උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්ම ජීවිනො,
තෙ හොන්ති ජානි පතයො අඤ්ඤමඤ්ඤං පියං වදා.

253 අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උප ජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සම සීලිනං.

254 ඉධ ධම්මං චරිත්වාන සම සීලබ්බතා උභො,
නන්දිනො දෙව ලොකස්මිං මොදන්ති කාම කාමිනො,ති.

255 උභො සද්ධා වදඤ්ඤූ ච සඤ්ඤතා ධම්ම ජීවිනො,
තෙ හොන්ති ජානි පතයො අඤ්ඤමඤ්ඤං පියං වදා.

256 අත්ථා සම්පචුරා හොන්ති ඵාසත්ථං උප ජායති,
අමිත්තා දුම්මනා හොන්ති උභින්නං සම සීලිනං.

257 ඉධ ධම්මං චරිත්වාන සම සීලබ්බතා උභො,
නන්දිනො දෙව ලොකස්මිං මොදන්ති කාම කාමිනො,ති.

---

246. සිට 251. (240. සිට 245. වෙනි අඞ්ක බලනු)

252. සිට 257. (243. සිට 245. වෙනි අඞ්ක බලනු)

258 සුසඞ්ඛතං භොජනං යා දදාති
සුචිං පණීතං රසසා උපෙතං,
සා දක්ඛිණා උජ්ජු ගතෙසු දින්නා
චරණොපපන්නෙසු මහග්ගතෙසු.

259 පුඤ්ඤෙන පුඤ්ඤං සංසන්දමානා
මහප්ඵලා ලොකවිදූන වණ්ණිතා,
එතාදිසං යඤ්ඤ මනුස්සරන්තා
යෙ වෙදජාතා විචරන්ති ලොකෙ;
විනෙය්‍ය මච්ඡෙර මලං සමූලං
අනින්දිතා සග්ග මුපෙන්ති ඨානං, ති.

260 යො සඤ්ඤතානං පරදත්ත භොජිනං
කාලෙන සක්කච්ච දදාති භොජනං,
චත්තාරි ඨානානි අනුප්පවෙච්ඡති
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච.

---

258. 259. යා, යම් ස්ත්‍රියක්තොමෝ; රසසාඋපෙතං, රසයෙන් යුක්තවූ; සුචිං, පිරිසිදුවූ; පණීතං, ප්‍රණීතවූ; සුසඞ්ඛතං, මනාකොට පිළියෙළකරණලද; භොජනං, භොජනය; උජ්ජුගතෙසු, (කාය වඞ්කාදිය රහිත හෙයින්) සෘජුභාවයට ගියාවූ; චරණොපපන්නෙසු, පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ; මහග්ගතෙසු, මහත්බවට පැමිණි රහතුන්කෙරෙහි; දදාති, දෙන්නීද; දින්නා, දෙනලද; සා දක්ඛිණා, ඒ දක්ෂිණාතොමෝ; පුඤ්ඤෙන පුඤ්ඤං, පිනෙන්පින; සංසන්දමානා, ගැටෙන්නී; මහප්ඵලා, මහත්ඵලවන්නීය; ලොකවිදූන වණ්ණිතා, තුන්ලෝ දත්තාවූ සර්වඥයන් විසින් වර්ණනාකරණලද්දීය; එතාදිසං, මෙබඳුවූ; යඤ්ඤං, දානය; අනුස්සරන්තා, සිහිකරන්නාවූ; යෙ, යම්කෙනෙක්; වෙදජාතා, සතුටුවූවාහු; ලොකෙ, ලොකයෙහි; විචරන්ති, හැසිරෙත්ද(ඔහුතුමූ); සමූලං, මුල්සහිතවූ; මච්ඡෙරමලං, මසුරුමල; විනෙය්‍ය, දුරුකොට; අනින්දිතා, නින්දිතනොවූ; සග්ගං ඨානං, දිව්‍යලොකයට; උපෙන්ති, පැමිණෙත්.

260 යො, යමෙක්තෙම; සඤ්ඤතානං, කායවාක් සංයමයෙන් යුක්තවූ; පරදත්ත භොජිනං, අනුන් විසින් දෙනලද්දක් අනුභව කොට යැපෙන්නාවුන්ට; කාලෙන, සුදුසුකාලයෙහි; සක්කච්ච, සකස්කොට; භොජනං, භොජනය; දදාති, (ස්වහස්තයෙන්) දේද; (හෙතෙම)ආයුඤ්ච, ආයුෂද; වණ්ණඤ්ච, ශරීර වර්ණයද; සුඛං, සැපයද; බලඤ්ච, බලයද; යන චත්තාරි ඨානානි, කරුණුසතරද අනුප්පවෙච්ඡති, දානයකෙරේ.

261 සො ආයු දසී බල දසී සුඛං වණ්ණං දදො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතී,ති.

262 යො සඤ්ඤතානං පරදත්තභොජිනං
කාලෙන සක්කච්ච දදාති භොජනං,
චත්තාරි ඨානානි අනුප්පවෙච්ඡති
ආයුඤ්ච වණ්ණඤ්ච සුඛං බලඤ්ච.

263 සො ආයු දසී බල දසී සුඛං වණ්ණං දදො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතී,ති.

264 ගිහි සාමීචි පටිපදං පටිපජ්ජන්ති පණ්ඩිතා,
සම්මග්ගතෙ සීලවන්තෙ චීවරෙන උපට්ඨිතා.

265 පිණ්ඩපාතසයනෙන ගිලානපච්චයෙන ච.
තෙසං දිවා ච රත්තො ච සදා පුඤ්ඤං පවඩ්ඪති;
සග්ගඤ්ච කමතිට්ඨානං කම්මං කත්වාන භද්දකං,ති.

"පුඤ්ඤාභිසන්ද වග්ගො පඨමො."

—— 0 ——

---

261 ආයුදසී, ආයුෂ දෙන්නාවූ; බලදසී, බලය දෙන්නාවූ; සුඛං, සැපයහා; වණ්ණං දදො, වර්ණය දෙන්නාවූ; සොනරො, ඒ මනුෂ්‍යතෙම; යත්ථ යත්ථ යම් යම් තැනෙක්හි; උපපජ්ජති, උපදීද; (ඒ ඒ තන්හි) දීඝායු, දීර්ඝායුෂ හා; යසවාහොති, මහත්පිරිවර ඇතිවේ.

262. 263. (260. 261. වෙනි අර්ථ බලනු.)

264 265. පණ්ඩිතා, පණ්ඩිතයෝ; ගිහිසාමීචිපටිපදං, ගෘහස්ථයන්ට නුදුසුසු ප්‍රතිපත්තියෙහි; පටිපජ්ජන්ති, පිළිපදිත්; සම්මග්ගතෙ, මනාකොට පිළිපන්නාවූ; සීලවන්තෙ, සිල්වතුන්ට; චීවරෙන, චීවරයෙන්ද; පිණ්ඩපාතසයනෙන, පිණ්ඩපාතයෙන් හා සෙනසුනෙන්ද; ගිලානපච්චයෙන, ගිලන්පසින්ද; උපට්ඨිතා, උවටැන්කරන්නාහු වෙත්; තෙසං, (යම්කෙනෙක් මෙසේ සිව්පසයෙන් උපස්ථාන කෙරෙත්ද) ඔවුන්ට; දිවාච, දහවල්හිද; රත්තොච, රාත්‍රියෙහිද; සදා, සියලුකල්හි; පුඤ්ඤං, පින්; පවඩ්ඪති, වැඩේ; (එබඳුවූසේ) භද්දකං, සොඳුරුවූ; කම්මං කත්වාන, කර්‍මය කොට; සග්ගංච ඨානං, දෙව්ලොවටද; කමති, පැමිණේ.

266 භුත්තා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසු මෙ,
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථො පඤ්චබලී කතා.

267 උපට්ඨිතා සීලවන්තා සඤ්ඤතා බ්‍රහ්මචාරයො,
යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝරමාවසං.

268 සො මෙ අත්ථො අනුප්පත්තො කතං අනනුතාපියං,
එතං අනුස්සරං මච්චො අරියධම්මෙ ඨිතො නරො;
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදතී"ති.

269 අනවජ්ජසුඛං ඤත්වා අථො අත්ථිසුඛං සරෙ,
භුඤ්ජං භොගසුඛං මච්චො තතො පඤ්ඤා විපස්සති.

---

266 මෙ, මාවිසින්; භොගා, (අනුභවකටයුතුවූ රූපාදිකාම) භොගයෝ; භුත්තා, අනුභවකරණලද්දාහුය; භච්චා, පොෂ්‍යකටයුතු මව්පියාදීහු; භතා, පොෂ්‍යකරණලද්දාහුය; ආපදාසු, විපත්තීහු; විතිණ්ණා, විශෙෂයෙන් දුරලනලද්දාහුය; උද්ධග්ගා, මතුමත්තෙහි විපාක දෙන්නාවූ හෙවත් ස්වර්ගියට හිතවූ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දින්නා, දෙනලද්දීය; අථො, නැවත; පඤ්චබලිකතා, ධාර්මික පඤ්චවිධ බලීහු කරණලද්දාහුය.

267. 268. සඤ්ඤතා, කායාදි සංයමයෙන් යුක්තවූ; බ්‍රහ්මචාරයො, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යා ඇති; සීලවන්තා, සිල්වත්හු; උපට්ඨිතා, (චීවරාදි සිව්පසයෙන්) උපස්ථානකරණලද්දාහුය; ඝරමාවසං, ගිහිගෙයි වාසයකරන්නාවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; යදත්ථං, යම් අර්ථයක් පිණිස; භොගං, අනුභවකටයුතුවූ භොගය; ඉච්ඡෙය්‍ය, කැමතිවන්නේද; මෙ, මාගේ; සො අත්ථො, ඒ අර්ථයතෙම; අනුප්පත්තො, පැමිණියේය; අනනුතාපියං, පසුව තැවියයුතුවූ කුශලකර්මය; කතං, කරණලද්දේය; එතං, මේ කාරණය; (තමාවිසින් කරණලද කුශලය) අනුස්සරං, සිහිකරන්නාවූ; මච්චො, මනුෂ්‍යතෙම; අරියධම්මෙ, ආර්‍ය්‍යධර්මයෙහි; හෙවත් පඤ්චශීලධර්මයෙහි; ඨිතො, පිහිටියේද; නං, ඔහුට; ඉධ චෙව, මේලොකයෙහිද; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; නරො, (එබඳු) මනුෂ්‍යතෙම*; පෙච්ච, පරලොව්හි; සග්ගෙ ච, ස්වර්ගයෙහිද; මොදති, විපාකයෙන් සතුටුවේ.

269. 270. මච්චො, මනුෂ්‍යතෙම; අනවජ්ජසුඛං, නිරවද්‍යවූයෙම්හි උපදනා සැපය; ඤත්වා, දැන; අථො, නැවත; අත්ථිසුඛං, ඇත්තේයයි උපදනා සැපය; සරෙ, සිහිකරන්නේය; භොගං, (අනුභවකටයුතු)

---

* "ශ්‍රොතාපන්න සකෘදාගාමී අනාගාමී"යන සියල්ලන්ටද මේප්‍රසිපදවලැඹෙවිය.

270 විපස්සමානො ජානාති උභො භාගෙ සුමෙධසො,
අනවජ්ජ සුඛස්සෙතං කලං නාග්ඝති සොළසිං,ති.

271 බ්‍රහ්මාති මාතා පිතරො පුබ්බාචරියාති වුච්චරෙ,
ආහුණෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා;
තස්මා හි නෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතො.

272 අන්නෙන අථො පානෙන වත්ථෙන සයනෙන ච,
උච්ඡාදනෙන න්හාපනෙන පාදානං ධොවනෙන ච.

273 තාය නං පාරිචරියාය මාතාපිතුසු පණ්ඩිතා,
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති,ති.

274 පාණාතිපාතො අදින්නාදානං මුසාවාදො ච වුච්චති,
පරදාරගමනං චාපි නප්පසංසන්ති පණ්ඩිතා,ති.

275 යෙ ච රූපෙන පාමිංසු යෙ ච ඝොසෙන අන්වගූ,
ඡන්දරාගවසූපෙතා න තෙ ජානන්ති තං ජනං.

---

භාගය; භුඤ්ජං, අනුභවකරන්නේ, සුඛං, ණයනැත්තෙමියි උපදනා සැපයද සිහිකෙරේ; තතො, නැවත; පඤ්ඤා, ප්‍රඥාවෙන්; විපස්සති, විශේෂයෙන් දකියි; විපස්සමානො, විශේෂයෙන් දක්නාවූ; සුමෙධසො, පණ්ඩිතතෙම; උභොභාගෙ, භාගකොටස්දෙක*; පජානාති, දනී; එතං, මේ තුන්වැදෑරුම් සැපය; අනවජ්ජසුඛස්ස, නිරවද්‍යවූ සුවයාගේ; සොළසිං කලං, සොළොස්වෙනි කලාව; නාග්ඝති, නොඅගනේය.

271. 272 273 (17. 18. 19. වෙනි අඞ්ක බලනු.)

274 පාණාතිපාතො, ප්‍රාණඝාතයයි කියනලද සතුන්මැරීමද; අදින්නාදානං, නොදෙනලද(අනුන් අයිති)දෙය ගැණිම්ද; පරදාරගමනංච, පරදාරසේවනයයිකියනලද අන් අඹුවන් කරායාමද; අපි, නැවත; මුසාවාදොච, බොරුකීමෙක්වේද; මේ සතරකාරණයෙන් යුක්ත සත්වතෙම මරණින්මතු නරකයෙහි උපදීයයි; වුච්චති, කියනු ලැබේ; පණ්ඩිතා, බුධාදී පණ්ඩිතයෝ; නප්පසංසන්ති, (ඔහුට) ප්‍රශංසා නොකෙරෙත්.

275 යෙච, යම් සත්වකෙණෙක්; රූපෙන, (රූපයදැක පැහැදුනාහුද ඒ සත්වයෝ) රූපය කාරණකොටගෙන; පාමිංසු, ප්‍රමාණවූහ†;

---

* යටදැක්වූ තුන්සුවය එක්කොටසෙක, "නිරවද්‍ය"යයි උපදනා සුවය එක් කොටසෙක.

† සියලු සත්වයන් තුන්කොටසක්කොට දෙකොටසෙක් රූපය ප්‍රමාණකොට ඇත්තාහුය, එක්කොටසෙක් රූපප්‍රමාණනොවේ. කොටස් පසක්කොට සතර කොටසෙක් ඝොෂප්‍රමාණවූහ, අනික් කොටස ඝොෂ ප්‍රමාණනොවේ. දසකොටසක් කොට නවකොටසෙක් ලූඛප්‍රමාණකොට ඇත්තු, එක්කොටසෙක් ලූඛ ප්‍රමාණනොවේ, කොටස්ලක්ෂයක් කොට එක්කොටසෙක් ධම්ප්‍රමාණවේ. ඉතිරි කොටස් ධම්ප්‍රමාණ නොවෙති,යි දතයුතු.

276 අජඣතතං ච න ජානාති  බහිදධා ච න පසසති,
සමනතා වරණො බාලො  සවෙ ඝොසෙන වුයහති.

277 අජඣතතං ච න ජානාති  බහිදධා ච විපසසති,
බහිදධා ඵල දසසාවී  සොපි ඝොසෙන වුයහති.

278 අජඣතතං ච පජානාති  බහිදධා ච විපසසති,
එවං විනීවරණ දසසාවී  න සො ඝොසෙන වුයහති,ති.

279 සාරතතා රජනීයෙසු  පියරූපාභිනනදිනො,
මොහෙන අධමා සතතා  බදධා වඩෙඪනති බනධනං.

---

යෙව, යම් සත්වකෙණෙක්; ඝොසෙන අන්වගූ, (ඝොෂාවෙහි ප්‍රමාණය ගෙන පැහැදුනාහුද ඒ සත්වයෝ) ඝොෂාව කරණකොටගෙන පැහැදුනෝද; ඡන්දරාගවසූපෙතා, ඡන්දරාගයන්ගේ වශගයෙන් යුක්තාවූ තෙ, ඒ සත්වයෝ; තංජනං, එම සත්වයා; නජානනති, නොදනිත්.

276 සමනතාවරණො, හාත්පසින් ආවාරිතවූ; නොහොත් හාත්පස වැසීම්ඇති; බාලො, (යම්) අඥනයෙක්තෙම; අජඣතතංච, (ඔහුගේ) නිජකාධ්‍යාත්මයෙහි ගුණය; නජානාති, නොදනිද; බහිදධාච නපසසති, (ඔහුගේ) බාහිර ප්‍රතිපත්තිය නොදක්ද; සො, ඒ අඥනතෙම; වෙ, ඒකානතයෙන්; ඝොසෙන, ඝොෂාවෙන්; වුයහති, පමුණුවනලැබේ; (ගුණයෙන් නොපමුණුවනලැබෙයි සේයි).

277 අජඣතතංච, (ඔහුගේ) අධ්‍යාත්මයෙහි ගුණය; නජානාති, (යමෙක්) නොදනීද; බහිදධාච, (ඔහුගේ) බාහිර ප්‍රතිපත්තිය; විපසසති, දකීද; බහිදධාඵල දසසාවී, (ඔහට අනුන්විසින් කරණලද) බාහිර සත්කාර ඵලය දක්නේද; සොපි, හෙතෙමේද; ඝොසෙන, ඝොෂාවෙන්; වුයහති, පමුණුවනුලැබේ.

278 අජඣතතංච, (යමෙක් තෙම) අධ්‍යාත්මයෙහි ගුණය; පජානාති, දනීද; බහිදධාචවිපසසති, බාහිර ප්‍රතිපත්තිය දකීද; එවං, මෙසේ; විනීවරණ දසසාවී, විවෘතව දක්නාසුලුවූ; සො, හෙතෙම; ඝොසෙන, ඝොෂාවෙන්; නවුයහති, නොපමුණුවනුලැබේ.

279 රජනීයෙසු, ඇලියයුතුවූ රූපාදියකෙරෙහි; සාරතතා, ඇලුනාවූ; පියරූපාභිනනදිනො, ප්‍රියරූපයට අතිශයින් සතුටුවනසුලුවූ; මොහෙන, මොහයෙන්; බදධා, බැඳුනාවූ; අධමාසතතා, ලාමකසත්වයෝ; බනධනං, සංසාරබනධනය; වඩෙඪනති, වඩත් (දියුණුකෙරෙත්)

280 රාගජං ච දොසජං ච මොහජං චාපි විද්දසු,
කරොන්ති අකුසලං කම්මං සවිඝාතං දුක්ඛුද්‍රයං.

281 අවිජ්ජා නිවුතා පොසා අන්ධභූතා අචක්ඛුකා,
යථා ධම්මා තථා සන්තා න තස්සෙවන්ති සමඤ්ඤරෙ,ති.

282 විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහි මෙ,
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හාගොතමකෙහි ච.

283 අපාදකෙහි මෙ මෙත්තං මෙත්තං දිපාදකෙහි මෙ,
චතුප්පදෙහි මෙ මෙත්තං මෙත්තං බහුප්පදෙහි මෙ.

284 මාමං අපාදකො හිංසි මාමං හිංසි දිපාදකො,
මාමං චතුප්පදො හිංසි මාමං හිංසි බහුප්පදො.

---

280 විද්දසු, අඥානයෝ; රාගජංච, රාගයෙන් උපදනාවූද; දොසජංච, ද්වේෂයෙන් උපදනාවූද; මොහජංචාපි, මොහයෙන් උපදනාවූද; සවිඝාතං, දුක්සහිතවූ; දුඛුද්‍රයං, මතු දුක්විපාකදෙන්නාවූ; අකුසලංකම්මං, අකුශලකර්මය; කරොන්ති, කෙරෙත්.

281 අවිජ්ජානිවුතා, අවිද්‍යාවෙන් වැසුනාවූ; පොසා, පුරුෂයෝ; අන්ධභූතා, අන්ධවූවාහුය; අචක්ඛුකා, ප්‍රඥාචක්ෂුෂ නැත්තාහුය; යථාධම්මා, රාගාදි ධර්මයෝ යම්සේ පැවැත්තාහුද; තථාසන්තා, එසේ සභා ඇත්තාහුම; න තස්සෙවන්ති, අපිමෙසේ සභාඇත්තාහුවම්හයි, න සමඤ්ඤරෙ, නොදනිත්.

282 විරූපක්ඛෙහි, විරූපාක්ෂ නාගකුලයන් හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවෙයි; එරාපථෙහි, එරාපථ නාගකුලයන් හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවේ; ඡබ්‍යාපුත්තෙහි, ඡබ්‍යාපුත්‍ර නාගකුලයන්හා; මෙ,මාගේ; මෙත්තං, මෛත්‍රියවේ; කණ්හාගොතමකෙහිච, කණ්හාගොතම නාගකුලයන්හා; මෙ, මාගේ; මෙත්තං,මෛත්‍රියවේ.

283 අපාදකෙහි, අපාදකවූ දීඝජාතීන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවේ; දිපාදකෙහි. දිපාදකවූ මනුෂ්‍යාදීන් හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවේ; චතුප්පදෙහි, චතුෂ්පාදකවූ හස්ති අශ්වාදීන් හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවේ;බහුප්පදෙහි, බොහෝපාඇත්තාවූ සත්වයන්හා; මෙ, මාගේ; මෙත්තං, මෛත්‍රියවේ.

284 අපාදකො,අපාදකසත්වයෙක්; මං,මා;මාහිංසි, නොපෙළාවා; දිපාදකො, දිපාදක සත්වයෙක්; මං, මා; මාහිංසි, නොපෙළාවා;

285 සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා ච කෙවලා,
සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාප මාගමා.

286 අප්පමාණො බුද්ධො අප්පමාණො
ධම්මො අප්පමාණො සංඝො,
පමාණවන්තානි සිරිංසපානි
අහි විච්ඡිකා සතපදී උණ්ණනාභී.

287 සරබූ මූසිකා කතා මෙ රක්ඛා
කතා මෙ පරිත්තා පටික්කමන්තු භූතානි,
සො හං නමො භගවතො
නමො සත්තන්නං සම්මාසම්බුද්ධානන්ති.

288 ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙළුං ඵලං නළං,
සක්කාරො කාපුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා,ති.

---

චතුප්පදෙ, චතුෂ්පාද සත්වයෙක්; මං, මා; මාහිංසි, නොපෙළාවා; බහුප්පදෙ, බොහෝපාඇති සත්වයෙක්; මං, මා; මාහිංසි, නොපෙළාවා,

285 සබ්බසත්තා, සියලුසත්වයෝද; සබ්බපාණා, සියලුප්‍රාණීහුද; සබ්බභූතාච කෙවලා, කෙවලවූ සියලු භූතයෝද යන; සබ්බ, සියලුසත්වයෝ; භද්‍රානි, සොඳුරු අරමුණු; පස්සන්තු, දකිත්වා; කඤ්චි, කිසි සත්වයකුකරා; පාපං, පාපයෙක්; මාආගමා, නොපැමිණේවා.

286. 287. බුද්ධො, සර්වඥතෙම; අප්පමාණො, (අභිඥාදිගුණයෙන්) අප්‍රමාණය; ධම්මො, ධර්මයතෙම; අප්පමාණො, (ස්වාක්ඛාතාදි ගුණයෙන්) අප්‍රමාණය; සංඝො, සංඝයාතෙම; අප්පමාණො, (සුප්‍රතිපන්නතාදි ගුණයෙන්) අප්‍රමාණය; සිරිංසපානි, දීඝජාතීහු; පමාණවන්තානි, ප්‍රමාණවත්හුය හෙවත් ගුණප්‍රමාණයෙන් යුක්තයහ; අහිවිච්ඡිකා, සර්පයන් හා ගෝනුස්සෝද; සතපදී, සතපදීහුද; උණ්ණනාභී, ලොමසකමකුළුවෝද; සරබූ, සිකනල්ලුද; මූසිකා, මීයෝද; යන මොහු; මෙ, මා විසින්; රක්ඛා කතා, ආරක්ෂාකරණලද්දහුය; මෙ, මා විසින්; (මෙතෙක් දනාට): පරිත්තාකතා, පරිත්‍රාණයකරණලද්දේය; භූතානි, (මා විසින් කරණලද පරිත්‍රාණ ඇති) සත්වයෝ; පටික්කමන්තු, ඉක්මෙත්වා; (මා වෙහෙසනොකෙරත්වා); සො අහං, ඒ මම; භගවතො, භාග්‍යවතුන් වහන්සේහට; නමො, නමස්කාරකෙරෙමි; සත්තන්නං සම්මාසම්බුද්ධානං, (අතීතවූ විපස්සිආදි) සත්බුදුවරයන්ට; නමො, නමස්කාරකෙරෙමි.

288 ඵලං, ඵලයතෙම; කදලිං, කෙසෙල්ගස; හන්ති, නසයි; ඵලං, ඵලයතෙම; වෙළුං, උණගය නසයි; ඵලං, ඵලයතෙම; නළං, බටගස

289 සංවරො ච පහාණඤ්ච භාවනා අනුරක්ඛණා,
එතෙ පධානා චත්තාරො දෙසිතා දිච්ච බන්ධුනා;
යෙහි භික්ඛු ඉධා තාපී ඛයං දුක්ඛස්ස පාපුණෙ,ති.

290 ගුන්නං චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හං ගතෙ සති.

291 එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා;
සබ්බං රට්ඨං දුඛං සෙති රාජා චෙ හොති අධම්මිකො.

292 ගුන්නං චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා උජු ගච්ඡන්ති නෙත්තෙ උජු ගතෙ සති.

---

නසයි; සක්කාරො, සත්කාරයතෙම; කාපුරිසං, නින්දිත පුරුෂයා; හනති, නසයි;(කෙසේද) ගබ්භො, ගර්භයතෙම; අස්සතරිංයථා, (කුස යෙහි කොටඑවකු ඉපදීම ඇති)වෙළඹමෙනි*.

289. (141. වෙනි අඞ්කය බලනු.)

290 තරමානානං, එතරවන්නාවූ; ගුන්නං, ගවයන් අතුරෙන්; පුඞ්ගවො, වෘෂභතෙම; චෙ, එකාන්තයෙන්; ජිම්හංගච්ඡති, වක්ව යේද, නෙත්තෙ, පමුණුවන්නා; ජිම්හංගතෙසති, වක්වගියකල්හි; තාසබ්බා, ඒ සියලු දෙන්නු; ජිම්හංගච්ඡන්ති, වක්වයෙත්ද.

291 එවමෙව, එපරිද්දෙන්ම; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; සෙට්ඨසම්මතො, ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ; යොහොති, යමෙක්වේද; සො, හෙතෙම; චෙ, ඉදින්; අධම්මං, අධර්මයෙහි; චරති, හැසිරේද; ඉතරාපජා, අනික් ප්‍රජාතොමෝ, පගෙව, කියනුමකිම; චෙ, ඉදින්; රාජා, රජතෙම; අධම්මිකො හොති, (පුරාණ කාලයෙහි රජදරුවන් විසින් පිහිටුවතලද දශභාග බලීද අපරාධයට සුදුසුවූ දඩුයම්ද නොගෙණ අධිකබලිහා අධික දඩුයම්ද ගැණීමෙන්) අධර්මයෙහි පිහිටියේවේද; සබ්බං රට්ඨං, සියලුරටවැසියා; දුඛංසෙති, දුකසේ සයනයකෙරෙයි. (දුකටපැමිණියේවෙයි)

292 තරමානානං, එතරවන්නාවූ; ගුන්නං, ගවයන්; අතුරෙන්; පුඞ්ගවො, වෘෂභතෙම; චෙ, එකාන්තයෙන්; උජුංගච්ඡති, සෘජුව යේද; නෙත්තෙ, පමුණුවන්නා; උජුගතෙසති, සෘජුවගියකල්හි; තාසබ්බා, ඒ සියලුදෙන්නු; උජුගච්ඡන්ති, සෘජුවයෙත්ද.

---

* කොටඑගැබ ඇති වෙළඹ වනාහි ගැබ මේරුකල්හි වදන්ට නොහැකිවන්නී පාදයෙන් භූමියට ගසමින් සිටින්නීය, එකල්හි ඇගේ පාසතර කණුසතරකබැද කුසපලා පැටවා මැත්කරගණිත්, වෙළඹ එහිම නසියි.

293 එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨ සම්මතො,
සො චෙව ධම්මං චරති පගෙව අතරා පජා;
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකො,ති.

"පත්තකම්ම වග්ගො දුතියො."

—o—

# චතුක්කනිපාතො සමත්තො.

294 යථා පි චන්දො විමලො ගච්ඡං ආකාස ධාතුයා,
සබ්බෙ තාරාගණෙ ලොකෙ ආභාය අති රොචති.

295 තථෙව සීල සම්පන්නො සද්ධො පුරිස පුග්ගලො,
සබ්බෙ මච්ඡරිනො ලොකෙ චාගෙන අති රොචති.

296 යථා පි මෙඝො ථනයං විජ්ජුමාලී සතක්කකු,
ථලං නින්නං ච පූරෙති අභි වස්සං වසුන්ධරං.

---

293 එවමෙව, එපරිද්දෙන්ම; මනුස්සෙසු, මනුෂ්‍යයන් අතුරෙහි; සෙට්ඨසම්මතො, ශ්‍රෙෂ්ඨයයි සම්මතවූ; යොහොති, යමෙක්වේද; සොචෙව, හෙතෙමේම; ධම්මං, ධර්මයෙහි; චරති, හැසිරේද; ඉතරා පජා, අනික් ප්‍රජාතොමෝ; පගෙව, කියතුමකිම; චෙ, ඉදින්; රාජා, රජතෙම; ධම්මිකොහොති, ධාර්මිකවේද; සබ්බං රට්ඨං, සියලු රටවැසියා;සුඛංසෙති,සැපසේසයනයකෙරෙයි.(සැපයටපැමිණියේවෙයි)

294. 295. ආකාසධාතුයා, අහසින්; ගච්ඡං, යන්නාවූ; විමලො, නිර්මලවූ; චන්දො,චන්ද්‍රතෙම; ලොකෙ,ලොකයෙහි;සබ්බෙතාරාගණෙ, සියලු තාරකාසමූහයන්;(මැඩ) ආභාය, ආලොකයෙන්; යථාපි, යම්සේ; අතිරොචති, අතිශයින් බබලාද; තථෙව, එපරිද්දෙන්ම; සීල සම්පන්නො, ශීලයෙන් යුක්තවූ; සද්ධො, ශ්‍රද්ධාඇති; හෙවත් රත්න ත්‍රයෙහි ගුණ අදහන්නාවූ; පුරිසපුග්ගලො, පුරුෂතෙම; ලොකෙ, ලොකයෙහි; සබ්බෙමච්ඡරිනො, සියලු මසුරු පුද්ගලයන්; (මැඩ) චාගෙන, ත්‍යාගයෙන්; අතිරොචති, අතිශයින් බබලයි.

296. 297. 298. ථනයං, ගර්ජනාකරන්නාවූ; විජ්ජුමාලී, (මාලා වත්සේ මෙඝමුඛයෙහි හැසිරෙන්නාවූ)විද්‍යුල්ලතාඇති; සතක්කකු,

297 එවං දස්සන සම්පන්නො සම්මා සම්බුද්ධ සාවකො,
මච්ඡරිං අධි ගණ්හාති පඤ්චඨානෙහි පණ්ඩිතො.

298 ආයුනා යසසා චෙව වණ්ණෙන ච සුඛෙන ච,
ස වෙ භොග පරිබ්බූළ්හො පෙච්ච සග්ගෙ ච මොදතී,ති.

299 අග්ගතො වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං,
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.

300 අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සුඛෙ,
අග්ගෙ සංඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

301 අග්ගස්මිං දානං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති,
අග්ගං ආයු ච වණ්ණො ච යසො කිත්ති සුඛං බලං.

302 අග්ගස්ස දාතා මෙධාවී අග්ග ධම්ම සමාහිතො,
දෙවභූතො මනුස්සො වා අග්ගප්පත්තො පමොදතී,ති.

303 සො තං හරති සබ්බදා නිච්චං ආතාපි උස්සුක්කො,
සබ්බ කාමහරං පොසං භත්තාරං නාති මඤ්ඤති.

---

(ඔබිමොබ නැංගාවූ) වලාකුල් සියගණනින් යුක්තවූ; මෙඝො, මෙ සඝහාම; වසුන්ධරං, පොළවට; අභිවස්සං, වසින්නේ; ථලං, ස්ථලස්ථානද; නින්නානිච, නිම්නස්ථානද; යථාපි, යම්සේ; පූරෙති, පුරවාද; එවං, එපරිද්දෙන්; දස්සනසම්පන්නො, ඥානදර්ශනයෙන් යුක්තවූ; හෙවත් සෝවාන්වූ; සම්මාසම්බුද්ධසාවකො, සර්වඥ ශ්‍රාවකවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; ආයුනා, ආයුෂින්ද; යසසාචෙව, යශසින්ද; වණ්ණෙනච, වර්ණයෙන්ද; සුඛෙනච, සුවයෙන්ද; (අධිපතිභාවයෙන්ද යන); පඤ්චඨානෙහි, කාරණාපසින්; මච්ඡරිං, මසුරු පුද්ගලයා; අධිගණ්හාති, මැඩපවත්වාගණීසි; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; භොගපරිබ්බූළ්හො, දානවශයෙන් ගෙනයනුලබන්නාවූ; භොගසැමති මහවතුරෙන් පාකරණලද්දේ (හෙවත් දෙව්ලොවට) පමුණුවනලද්දේ; පෙච්ච, පරලොව්හි; සග්ගෙච, ස්වර්ගයෙහිද; මොදති, සතුටුවේ.

299. සිට 302: (185. සිට 188. වෙනි අඞ්ක බලනු.)

303 යො, යම් පුරුෂයෙක්තෙම; සබ්බදා, සියලුකල්හි; නිච්චං, නිතර; ආතාපී; තැවිම් ඇත්තේ; උස්සුක්කො, උත්සාහවත්වූයේ; (යම් ස්ත්‍රියක්) හරති, පොෂණයකෙරේද; (ඕතොමෝ) සබ්බකාමහරං, සියලුකැමතිදෙය දෙන්නාවූ භත්තාරං, ස්වාමිවූ; තංපොසං, ඒ පුරුෂයා; නාතිමඤ්ඤති, ඉක්මවා නොසිතන්නීය.

304 න චාපි සොත්ථි භත්තාරං ඉච්ඡාචාරෙන රොසයෙ,
භත්තු ච ගරුනො සබ්බෙ පටීපූජෙති පණ්ඩිතා.

305 උට්ඨාහිකා අනලසා සඞ්ගහිත පරිජ්ජනා,
භත්තු මනාපා චරති සම්භතං අනුරක්ඛති.

306 යා එවං වත්තතී නාරී භත්තු ඡන්දවසානුගා,
මනාපා නාම තෙ දෙවා යත්ථ සා උපපජ්ජති,ති.

307 දදං පියො හොති භජන්ති නං බහූ
කිත්තිඤ්ච පප්පොති යසො පි වඩ්ඪති,
අමංකුභූතො පරිසං විගාහති
විසාරදො හොති නරො අමච්ඡරී.

---

304 සුභූෂී, යහපත් ස්ත්‍රීතොමෝ; භත්තාරං, ස්වාමිපුරුෂයා; ඉච්ඡාචාරෙන, කැමැත්තෙන් හැසිරීම කරණකොටගෙණ; නචාපි රොසයෙ, කොපදනොකරන්නීය; භත්තුච, ස්වාමියාගේද; ගරුනො, ගුරුවූ; (හෙවත් මව්පියාදිවූ) සබ්බෙ, (පිදියයුතු) සියල්ලන්ට; පණ්ඩිතා, පණ්ඩිතවූ ස්ත්‍රීතොමෝ; පටිපූජෙති, පුදන්නීය.

305 උට්ඨාහිකා, නැගිසිටි වීර්‍යය ඇති; අනලසා, අලසනූවූ; සඞ්ගහිතපරිජ්ජනා, සංග්‍රහකරණලද පිරිවර ජනයා ඇති ස්ත්‍රීතොමෝ; භත්තුමනාපා, ස්වාමියාගේ මනවඩන්නී; චරති, හැසිරෙන්නීය; සම්භතං, (ස්වාමිහු විසින්) උපයනලද දෙය; අනුරක්ඛති, රක්ෂාකරන්නීය.

306 භත්තුඡන්දවසානුගා, ස්වාමියාගේ කැමැත්ත අනුවගියාවූ; යානාරී, යම් ස්ත්‍රියක්තොමෝ; එවංවත්තති, මෙසේ (වත්පුරා) පවතින්නීද; සා, ඕතොමෝ; මනාපානාම, මනාපනම්වූ; තෙදෙවා, ඒ දෙවියෝ; යත්ථ, යම් තැනෙක්හිද (ඒ නිම්මාණරතී දිව්‍යලොකයෙහි) උපපජ්ජති, උපදින්නීය.

307 දදං, දෙන්නාවූපුද්ගලතෙම; පියොහොති, (බොහෝදෙනාට) ප්‍රියවේ; බහූ, බොහෝදෙනා; නං, ඔහු; භජන්ති, භජනයකෙරෙත්; කිත්තිංච, කීර්තියටද; පප්පොති, පැමිණේ; යසොපි, යශසද; වඩ්ඪති, වැඩේ; අමංකුභූතො, නොහැකුළුණේ; හෙවත් තෙජස්ඇත්තේ; පරිසං, පිරිස, විගාහති, විශෙෂයෙන් මැඩගණී; අමච්ඡරී, නොමසුරුවූ; නරො, මනුෂ්‍යතෙම; විසාරදොහොති, ඥානසොම්නසට පැමිණියේවේ.

308 තස්මා හි දානානි දදන්ති පණ්ඩිතා
විනෙය්‍ය මච්ඡෙර මලං සුමෙධසො,
තෙ දීඝරත්තං තිදිවෙ පතිට්ඨිතා
දෙවානං සහව්‍යතං ගතා රමන්ති.

309 කතා වාසා කත කුසලා ඉතො චුතා සයංපභා අනුවිචරන්ති නන්දනෙ,
තෙ තත්‍ථ නන්දන්ති රමන්ති මොදරෙ සමප්පිතා කාමගුණෙ හි පඤ්චහි;
කත්වාන වාක්‍යං අසිතස්ස තාදිනො රමන්ති සග්ගෙ සුගතස්ස සාවකා'ති.

310 දදමානො පියො හොති සතං ධම්මං අනුක්කමං,
සන්තා භජන්ති සප්පුරිසා සඤ්ඤතා බ්‍රහ්ම චාරයො.

---

308 තස්මාහි, එහෙයින් වනාහි; සුමෙධසො, සැපසොයන්නා වූ; පණ්ඩිතා, පණ්ඩිතයෝ; මච්ඡෙරමලං, මසුරුමල; විනෙය්‍ය, දුරු කොට; දානානි දදන්ති, දන්දෙත්; තෙ, ඔව්හු; තිදිවෙ, දිව්‍යලෝකයෙහි; පතිට්ඨිතා පිහිටියාහු; දෙවානං, දෙවියන්ගේ; සහව්‍යතං, සහභාවයට; ගතා, ගියාහු; දීඝරත්තං, බොහෝකාලයක් මුලුල්ලෙහි; රමන්ති, ඇලෙත්.

309 කතාවාසා, කරණලද ආවාසඇති; හෙවත් දිව්‍යවිමාන පහළවීම්ඇති (කර්‍මයකළාවූ); කතකුසලා, (එහෙයින්ම) කරණලද කුශල් ඇති සත්ත්වයෝ; ඉතොචුතා, මෙයින් චුතව; සයංපභා, ස්වයංප්‍රභාවෙන් යුක්තවූවාහු; නන්දනෙ, නන්දනොද්‍යානයෙහි; අනුවිචරන්ති, හැසිරෙත්; පඤ්චහිකාමගුණෙහි, පඤ්චකාමගුණයෙන්; සමප්පිතා, මනාව තෘප්තියට පැමිණියාවූ; තෙ, ඔව්හු; තත්‍ථ, එහි; නන්දන්ති, සතුටුවෙත්; රමන්ති, ඇලෙත්; මොදරෙ, සතුටුවෙත්; තාදිනො, තාදිලක්ෂණයට පැමිණියාවූ; අසිතස්ස, තෘෂ්ණාශ්‍රය රහිතවූ තථාගතයන් වහන්සේගේ; වාක්‍යං, වාක්‍යය; කත්වාන, කොට; සුගතස්සසාවකා, සර්‍වඥශ්‍රාවකයෝ; සග්ගෙ, ස්වර්ගයෙහි; රමන්ති, ඇලෙත්.

310 දදමානො, දෙන්නාවූ පුද්ගලතෙම; පියොහොති, (බොහෝ දෙනාට) ප්‍රියවේ; සතං, සත්පුරුෂයන්ගේ; ධම්මං, ධර්මය; අනුක්කමං, නොයික්මවන්නේවිද; සන්තා, ශාන්තවූ; සඤ්ඤතා, හික්මුණාවූ; බ්‍රහ්මචාරයො, බ්‍රහ්මචාරීවූ; සප්පුරිසා, බුද්ධාදිසත්පුරුෂයෝ; භජන්ති, (ඔහු) භජනයකෙරෙත්.

311 තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බ දුක්ඛාපනුදනං,
යං සො ධම්මං ඉධඤ්ඤාය පරිනිබ්බාති අනාසවො,ති.

312 කාලෙ දදන්ති සප්පඤ්ඤා, වදඤ්ඤූ වීත මච්ඡරා,
කාලෙන දින්නං අරියෙසු උජුභූතෙසු තාදිසු;
විප්පසන්නමනා තස්ස විපුලා හොති දක්ඛිණා.

313 යෙ තත්ථ අනුමොදන්ති වෙය්‍යාවච්චං කරොන්ති වා,
න තෙන දක්ඛිණා ඌනා තෙ පි පුඤ්ඤස්ස භාගිනො.

314 තස්මා දදෙ අප්පටිවාන චිත්තො යත්ථ දින්නං මහප්ඵලං,
පුඤ්ඤානි පර ලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.

---

311 සො, හෙතෙම; ඉධ, මේලොකයෙහි; යං ධම්මං, යම් ධර්මයක්; අඤ්ඤාය, දැන; අනාසවො, ආශ්‍රවරහිතවූයේ; පරිනිබ්බාති, පිරිනිවිමටයේද; සබ්බදුක්ඛාපනුදනං, සියලු දුක් දුරුකරන්නාවූ; ධම්මං, (ඒ නිර්වාණ) ධර්මය; තස්ස, ඔහුට; තෙ, ඒ සත්පුරුෂයෝ; දෙසෙන්ති, දේශනාකෙරෙත්.

312 වදඤ්ඤූ, ප්‍රතිග්‍රාහකයන්ගේ තෙපුල්දන්නාවූ; වීතමච්ඡරා, පහවූ මසුරුමල ඇති; සප්පඤ්ඤා, මනානුවණැත්තාහු; කාලෙ, සුදුසු කාලයෙහි; දදන්ති, දෙත්; තාදිසු, තාදිගුණවලින් යුක්තවූ; උජුභූතෙසු, කායවඞ්කාදිය රහිතහෙයින් ඍජුවූ; අරියෙසු, ආර්‍ය්‍යයන් කෙරෙහි; කාලෙන, සුදුසුකාලයෙහි; විප්පසන්නමනා, විශේෂයෙන් ප්‍රසන්නවූ සිතින්; දින්නං, (යමකුවිසින) දෙනලද්දේද; තස්ස, ඔහුගේ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; විපුලා හොති, මහත්වන්නීය.

313 යෙ, යම්කෙනෙක්; තත්ථ, එහි; අනුමොදන්ති, (එකත්පසෙක සිට) අනුමෝදන්වෙත්ද; වෙය්‍යාවච්චංවා, (කයින්) උපාවත් හෝ; කරොන්ති, කෙරෙත්ද; තෙන, ඒ කරණකොටගෙණ; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; න ඌනා, අඩුනොවන්නීය; තෙපි, ඔව්හුද; පුඤ්ඤස්ස, කුශලයට; භාගිනො, කොටස්කාරයෝ වෙත්.

314 යත්ථ, යම්තැනෙක්හි; දින්නං, දෙනලද්දේ; මහප්ඵලං, මහත්ඵලවේද; තස්මා, එහෙයින්; අප්පටිවානචිත්තො, නොකලකිරුණු සිත්ඇත්තේ; හෙවත් නොනවත්නා සිත්ඇත්තේ; දදෙ, දෙන්නේය; පුඤ්ඤානි, කුශල්; පාණිනං, සත්වයන්ට; පරලොකස්මිං, පරලෙව්හි; පතිට්ඨා හොන්ති, පිහිටවෙත්.

315 ආයුදෙ බලදෙ ධීරො වණ්ණදෙ පටිභාණදෙ,
සුඛස්ස දාතා මෙධාවී සුඛං සො අධිගච්ඡති.

316 ආයුං දත්වා බලං වණ්ණං සුඛඤ්ච පටිභාණකං,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතී,ති.

317 සාඛා පත්ත ඵලූපෙතො ඛන්ධිමා ච මහා දුමො,
මූලවා බල සම්පන්නො* පතිට්ඨා හොති පක්ඛිනං.

318 මනොරමෙ ආයතනෙ සෙවන්ති නං විහඞ්ගමා,
ඡායං ඡායත්ථිකා යන්ති ඵලත්ථා ඵල භොජිනො.

319 තථෙව සීල සම්පන්නං සද්ධං පුරිස පුග්ගලං,
නිවාත වුත්තිං අත්ථද්ධං සොරතං සඛිලං මුදුං.

320 වීත රාගා වීත දොසා වීත මොහා අනාසවා,
පුඤ්ඤක්ඛෙත්තානි ලොකස්මිං සෙවන්ති තාදිසං නරං.

---

315 ධීරො, ප්‍රාඥතෙම; ආයුදෙ, ආයුෂ දෙන්නේය; බලදෙ, බලය දෙන්නේය; වණ්ණදෙ, ශරීරවර්ණය දෙන්නේය; පටිභාණදෙ, ප්‍රඥාව දෙන්නේය; සුඛස්සදාතා, සැප දෙන්නාවූ; මෙධාවී, නුවණැත්තාවූ; සො, හෙතෙම; සුඛං, සුවයට; අධිගච්ඡති, පැමිණේ.

316 ආයුං, ආයුෂද; බලං, (ශරීර) බලයද; වණ්ණං, (ශරීර) වර්ණයද; සුඛඤ්ච, (කායික චෛතසිකවූ) සුවයද; පටිභාණකං, නුවණද; දත්වා, දී; යත්ථයත්ථ, ගම්යම් තැනෙක්හි; උපපජ්ජති, උපදීද; (ඒ ඒ තැන්හි) දීඝායු යසවා හොති, දීර්ඝායුෂ හා යශස් ඇතිවේ.

317. 318. සාඛාපත්ත ඵලූපෙතො, ශාඛා පත්‍ර ඵල යන මෙයින් යුක්තවූ; මූලවා, මුල් ඇති; බලසම්පන්නො, බලයෙන් සම්පූර්ණවූ; ඛන්ධිමාචමහාදුමො, කඳින්යුක්ත මහාවෘක්ෂයතෙම; පක්ඛිනං, පක්ෂීන්ට; පතිට්ඨාහොති, පිහිටවේද; මනොරමෙ, සිත්කළුවූ; ආයතනෙ, රැස්වන ස්ථානයෙහි; නං, ඒ වෘක්ෂය; විහඞ්ගමා, පක්ෂීහු; සෙවන්ති, සේවනයකෙරෙත්ද; ඡායත්ථිකා, සෙවණින් ප්‍රයොජන ඇත්තාහු; ඡායං, සෙවණට; යන්ති, යෙත්ද; ඵලත්ථා, ඵල ප්‍රයොජන ඇත්තාහු; ඵලභොජිනො, ඵල අනුභවකෙරෙත්ද.

319. 320. තථෙව, එපරිද්දෙන්ම; සීලසම්පන්නං, ශීලයෙන් යුක්තවූ; නිවාතවුත්තිං, යටත්පැවතුම්ඇති; අත්ථද්ධං, (ක්‍රොධමානාදීයෙන්)

---

* "ඵල සම්පන්නො" ති පි දිස්සති.

321 තෙ තසස ධමමං දෙසෙනති සබබ දුකඛා පනූදනං,
යං සො ධමමං ඉධඤඤාය පරිනිබබාති අනාසවො.ති.

322 පඤච ඨානානි සමපසසං පුතතං ඉචඡනති පණඩිතා,
භතො වා නො භරිසසති කමමං වා නො කරිසසති.

323 කුල වංසො චිරං ඨසසති දායජජං පටිපජජති,
අථ වා පන පෙතානං දකඛිණං අනුප දසසති.

324 ඨානා නෙතානි සමපසසං පුතතං ඉචඡනති පණඩිතා,
තසමා සනෙතා සපපුරිසා කතඤඤු කත වෙදිනො.

325 භරනති මාතා පිතරො පුබෙබ කත මනුසසරං,
කරොනති තෙසං කිචචානි යථා තං පුබබ කාරිනං.

---

නාදනුවූ; සොරතා, සුරතභාවයෙන් හෙවත් ශුඩශීලයෙන් යුක්තවූ; මුදුං, මෘදුවූ; සඛිලං, සිලුවූ තෙපුල් කියන්නාවූ; සද්ධං; ශ්‍රද්ධාඇති; පුරිසපුගගලං, පුරුෂපුද්ගලවූ; තාදිසං නරං, එබඳු මනුෂ්‍යයා; ලොකසමිං, ලොකයෙහි; පුඤඤකඛෙතතානි, පුණ්‍යක්ෂෙත්‍රයයි කියනලද්දාවූ; වීතරාගා, පහකරණලද රාගයඇති; වීතදෙසා, පහකරණලද ද්වෙෂයඇති; වීතමොහා, පහකරණලද මොහයඇති; අනාසවා, නිකෙලශීහු; සෙවනති, ස්වනයකෙරෙත්.

321. (311. වෙනි අඩකය බලනු)

322. 323. පණඩිතා, පණ්ඩිතයෝ; පඤචඨානානි, කාරණාපසක්; සමපසසං, දක්නාහු; පුතතං, පුත්‍රයා; ඉචඡනති, කැමතිවෙත්; (කවරකාරණා පසෙක්දයත්) භතොවා, (අපවිසින් කිරිපෙවීම් අතපය මැඩීමාදියෙන්) පොෂ්‍යකරණලද්දේ හෝ; නො, අප; භරිසසති, (මහළුකාලයෙහි අතපයසේදවීම් නෑවීම් කැදබත් දීමාදියෙන්) පොෂ්‍යකරන්නේය; නො, අපගේ; කිචචංවා, කෘත්‍යහෝ; කරිසසති කරන්නේය; කුලවංසො, කුලවංශයතෙම, චිරං, බොහෝකාලයක් මුලුල්ලෙහි; ඨසසති.(පුත්‍රයාකෙරෙහි) සිටින්නේය; දායජජං, දායාදය; පටිපජජති, පිළිපදින්නේය; අථවාපන, නැවතදවනාහි; පෙතානං, පරලොව ගියාවුන් උදෙසා; දකඛිණං අනුපදසසති, (ප්‍රාපතිදනය කොට තුන්වෙනි දිනය පටන්) දක්ෂිණාව දෙන්නේය.

324. 325. එතානිඨානානි, මේ කරුණුපස; සමපසසං, මනාවදක්නාවූ; පණඩිතා, පණ්ඩිතයෝ; පුතතං පුත්‍රයා; ඉචඡනති, කැමැතිවෙත්; තසමා, එහෙයින්; කතඤඤු, කෘතඥවූ; කතවෙදිනො, කෘතොපකාර දන්නාවූ; සපපුරිසා, සත්පුරුෂයෝ තුමූ; පුබෙබකතං,

326 ඔවාද කාරී භතපොසී කුලවංසං අහාපයං,
සද්ධෝ සීලෙන සම්පන්නො පුත්තො හොති පසංසියො,ති.

327 යථා ච පබ්බතො සෙලො අරඤ්ඤස්මිං බ්‍රහාවනෙ,
තං රුක්ඛා උපනිස්සාය වඩ්ඪන්තෙ තෙ වනප්පතී.

328 තථෙව සීලසම්පන්නං සද්ධං කුලපතිං ඉධ,
උපනිස්සාය වඩ්ඪන්ති පුත්තදාරා ච බන්ධවා;
අමච්චා ඤාති සඞ්ඝා ච යෙ චස්ස අනුජීවිනො.

329 ත්‍යාස්ස සීලවතො සීලං චාගං සුචරිතානි ච,
පස්සමානානුකුබ්බන්ති යෙ භවන්ති විචක්ඛණා.

330 ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගති ගාමිනං,
නන්දිනො දෙව ලොකස්මිං මොදන්ති කාම කාමිනො,ති.

"සුමනා වග්ගො චතුත්ථො."

—o—

331 භුත්තා භොගා භතා භච්චා විතිණ්ණා ආපදාසු මෙ,
උද්ධග්ගා දක්ඛිණා දින්නා අථො පඤ්ච බලීකතා.

332 උපට්ඨිතා සීලවන්තො සඤ්ඤතා බ්‍රහ්ම චාරයො,
යදත්ථං භොගං ඉච්ඡෙය්‍ය පණ්ඩිතො ඝර මාවසං.

333 සො මෙ අත්ථො අනුප්පත්තො කතං අනනුතාපියං,
එතං අනුස්සරං මච්චො අරිය ධම්මෙ ඨිතො නරො;
ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති,ති.

---

පූර්වයෙහි කරන්නලද ගුණය; අනුස්සරං, සිහිකරන්නාහු; මාතාපිතරො, මව්පියන්; භරන්ති, පොෂ්‍යකෙරෙත්; තෙසං, ඔවුන්ගේ; කිච්චානි, කෘත්‍යයන්; කරොන්ති, කෙරෙත්; පුබ්බකාරිනං, පූර්වොපකාරීන්ට; යථාතං, යම්සේද එමෙනි.

326 ඔවාදකාරී,(මව්පියන්විසින් දෙනලද)අවවාදයකරන්නසුලුවූ; භතපොසී, (යම්කෙනෙකුන් විසින්) පොෂ්‍යකරණලද්දේද ඔවුන් පොෂ්‍යකරණ සුලුවූ; කුලවංසං, කුලවංශය; අහාපයං,නොපිරිහෙලන්නාවූ; සද්ධො, ශ්‍රද්ධාඇති; සීලෙන සම්පන්නො,ශීලයෙන්යුක්තවූ; පුත්තො, පුත්‍රතෙම; පසංසියොහොති, (මහජනයා විසින් ඉහාත්මයෙහිම) ප්‍රශංසා කටයුතුවේ.

327. සිට 330. (49. සිට 52. වෙනි අඞ්ක බලනු.)

331. 332. 333. (266. 267. 268. වෙනි අඞ්ක බලනු.)

K

334 ඨිතො බහුන්නං පටිපජ්ජ භොගෙ
තං දෙවතා රක්ඛති ධම්ම ගුත්තං,
බහුස්සුතං සීල වතූපපන්නං
ධම්මෙ ඨිතං න විජහාති කිත්ති.

335 ධම්මට්ඨං සීල සම්පන්නං සච්ච වාදිං හිරීමනං,
නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතු මරහති;
දෙවා පි නං පසංසන්ති බ්‍රහ්මුනා පි පසංසිතො,ති.

336 ආයුං වණ්ණං යසං කිත්තිං සග්ගං උච්චා කුලීනතං,
රතියො පත්ථයන්තෙන උළාරා අපරාපරා.

337 අප්පමාදං පසංසන්ති පුඤ්ඤකිරියාසු පණ්ඩිතා,
අප්පමත්තො උභො අත්ථෙ අධිග්ගණ්හාති පණ්ඩිතො.

338 දිට්ඨෙ ච ධම්මෙ යො අත්ථො යො චත්ථො සම්පරායිකො,
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතො ති පවුච්චති,ති.

---

334 භොගෙ, උපභොග පරිභොගවස්තූන්; පටිපජ්ජ, පිළිපැද; බහුන්නං, බොහෝදෙනාට; ඨිතො, සිටියාවූයේද; ධම්මගුත්තං, දහැමින් ගොපනයවූ; තං, ඔහු; දෙවතා, දෙවතාතොමෝ; රක්ඛති, රකීයි; බහුස්සුතං, බහුසෑතවූ; සීලවතූපපන්නං, ශීලව්‍රතයෙන් යුක්තවූ; ධම්මෙඨිතං, දශකුශලධර්මයෙහි පිහිටියාවූ (ඒ) සත්පුරුෂයා; කිත්ති, කීර්තිතොමෝ; නවිජහාති, නොහරින්නීය.

335 ධම්මට්ඨං, කුශලධර්මයෙහි පිහිටියාවූ; සීලසම්පන්නං, ශීලයෙන් යුක්තවූ; සච්චවාදිං, සත්‍යවචන කියන්නාවූ; හිරිමනං, ලජ්ජාස්වභාවඇති; තං, ඔහුට; ජම්බොනදස්ස, රක්තස්වර්ණයාගේ; නෙක්ඛං ඉව, නිෂ්කයක්මෙන්; කො, කවරෙක්තෙම; නින්දිතුං, නින්දාකරන්ට; අරහති, සුදුසුවේද; දෙවාපි, දෙවියෝද; නං, ඕහට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; බ්‍රහ්මුනාපි, බ්‍රහ්මයාවිසින්ද; පසංසිතො, ප්‍රශංසාකරණ ලද්දේය.

336. 337. 338. ආයුං, ආයුෂද; වණ්ණං, වර්ණයද; යසං, යශසද; කිත්තිං, කීර්තියද; සග්ගං, ස්වර්ගයද; උච්චාකුලීනතං, උසස්කුල ඇතිබවද; උළාරා, මහත්වූ; අපරාපරා රතියො, අතික් අතික් ඇලීම්ද; පත්ථයන්තෙන, ප්‍රාර්ථනාකරන්නහු විසින්; (අප්‍රමාදයෙහි පිළිපැදිය යුතුය) පණ්ඩිතා, පණ්ඩිතයෝතුමූ; පුඤ්ඤකිරියාසු; පුණ්‍යක්‍රියාවන් අතුරෙහි; අප්පමාදං, අප්‍රමාදයට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්මයෙහිවූ; යො අත්ථො, යම් අර්ථයෙක්වේද;

339 මනාපදායී ලභතෙ මනාපං යො උජ්ජුභූතෙසු දදාති ඡන්දසා,
අච්ඡාදනං සයනමථන්නපානං නානප්පකාරානි ච පච්චයානි.

340 චත්තඤ්ච මුත්තඤ්ච අනග්ගහීතං ඛෙත්තූපමෙ අරහන්තෙ විදිත්වා,
සො දුච්චජං සප්පුරිසො චජිත්වා මනාපදායී ලභතෙ මනාපන්ති.

341 මනාපදායී ලභතෙ මනාපං අග්ගස්ස දාතා ලභතෙ පුනග්ගං,
වරස්ස දාතා වරලාභී හොති සෙට්ඨං දදො සෙට්ඨමුපෙති ඨානං.

342 යො අග්ගදායී වරදායී සෙට්ඨදායී ච යො නරො,
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජතීති.

---

සම්පරායිකො, පරලොව්හිවූ; යොච අත්ථො, යම් අර්ථයෙක් වේද; උභො අත්ථෙ (ඒ) අර්ථ දෙකට; අප්පමත්තො, අප්‍රමාදවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අධිගණ්හාති, පැමිණේයි; අත්ථාභිසමයා, අර්ථප්‍රතිලාභය හෙතුකොටගෙණ; ධීරො, නුවණැත්තේ; පණ්ඩිතොති, පණ්ඩිතයයි; පවුච්චති, කියනුලැබේ.

339, 340. මනාපදායී, මනවඩන්නක් දෙන්නාවූ පුද්ගලතෙම; මනාපං, මනවඩන්නක්; ලභතෙ, ලබයි; යො, යමෙක්තෙම; උජ්ජුභූතෙසු, (කායවාක්චිත්තයෙන්) ඍජුවූවන් කෙරෙහි; අච්ඡාදනං, වස්ත්‍රද; සයනං, සයනද; අථ, නැවත; අන්නපානං, ආහාරපානද; නානප්පකාරානි, නොයෙක් වැදැරුම්වූ; පච්චයානිච, ප්‍රත්‍යයන්ද; ඡන්දසා, ප්‍රෙමයෙන්; දදාති, දේද; ඛෙත්තූපමෙ, ක්ෂෙත්‍රයට බඳුවූ; අරහන්තෙ, රහතුන්; විදිත්වා, දැන; චත්තඤ්ච, පරිත්‍යාගකරණ ලද්දේද; මුත්තඤ්ච, ත්‍යාගවශයෙන් මුදනලද්දේද; අනග්ගහීතං, (අපෙක්ෂාරහිතවූ සිත් ඇතිබැවින්) නොගන්නාලද්දේද; මනාපදායී, මනාපයේ දෙනසුලුවූ; සො සප්පුරිසො, ඒ සත්පුරුෂතෙම; දුච්චජං, දුකසේ පරිත්‍යාගකිරීම; චජිත්වා, පරිත්‍යාගකොට; මනාපං, මනවඩන්නක්; ලභතෙ, ලබයි.

341 මනාපදායී, මනාපයේ දෙනසුලුවූයේ; මනාපං ලභතෙ, මනාපදෙය ලබයි; අග්ගස්සදාතා, අග්‍රදෙය දෙන්නේ; පුන, නැවත; අග්ගං, අග්‍රයක්; ලභතෙ, ලබයි; වරස්සදාතා, උතුම්දෙය දෙන්නේ; වරලාභීහොති, උතුම්දේ ලබනසුලුවේ; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨදෙය; දදො, දෙන්නේ; සෙට්ඨමුපෙතිඨානං, ශ්‍රෙෂ්ඨස්ථානයට; උපෙති, පැමිණේ.

342 යොනරො, යම් මනුෂ්‍යයෙක්තෙම; අග්ගදායී, අග්‍රදෙය දෙන්නේද; වරදායී, උතුම්දෙය දෙන්නේද; සෙට්ඨදායීච, ශ්‍රෙෂ්ඨදෙයදෙන්නේද; (ඒ මනුෂ්‍යතෙම) යත්ථයත්ථ, යම්යම් තැනෙකත්හි; උපපජ්ජති, උපදීද; දීඝායු යසවාහොති, (ඒ ඒ තැන්හි) දීර්ඝායුෂනා යශස් ඇත්තේවේ.

343 මහොදධිං අපරිමිතං මහාසරං
බහු භෙරවං රතන ගණාන මාලයං,
නජ්ජො යථා නර ගණ සඞ්ඝ සෙවිතා
පුථූ සවන්ති උපයන්ති සාගරං.

344 එවං නරං අන්නද පාන වත්‍ථදං
සෙය්‍යා නිසජ්ජත්‍ථ රණස්ස දායකං,
පුඤ්ඤස්ස ධාරා උපයන්ති පණ්ඩිතං
නජ්ජො යථා වාරිවහා ව සාගරන්ති.

345 යස්ස සද්ධා තථාගතෙ අචලා සුප්පතිට්ඨිතා,
සීලඤ්ච යස්ස කල්‍යාණං අරිය කන්තං පසංසිතං.

346 සඞ්ඝෙ පසාදො යස්සත්‍ථි උජුභූතං ච දස්සනං,
අදලිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

347 තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්ම දස්සනං,
අනු යුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

348 න සොචනාය පරිදෙවනාය
අත්‍ථො අලබ්භා අපි අප්පකොපි,
සොචන්ත මෙනං දුඛිතං විදිත්වා
පච්චත්‍ථිකා අත්තමනා භවන්ති.

349 යතො ච ඛො පණ්ඩිතො ආපදාසු
න වෙධතී අත්‍ථ විනිච්ඡයඤ්ඤූ,
පච්චත්‍ථි කාස්ස දුඛිතා භවන්ති
දිස්වා මුඛං අවිකාරං පුරාණං.

---

343. සිට 347. (235. සිට 239. වෙනි අඞ්ක බලනු.)

348 සොචනාය, ශොකකිරීමෙන්ද; පරිදෙවනාය, විලාපකියා හැඬීමෙන්ද; අප්පකොපි, ස්වල්පවූද; අත්‍ථො අර්‍ථයෙක්; න අලබ්භා, ලැබියනොහැකිවේ; අපි, නැවත; සොචන්තං, ශොකකරන්නාවූ; දුඛිතං, දුකටපැමිණියාවූ; එතං, මොහු; විදිත්වා, දැන; පච්චත්‍ථිකා, සතුරෝ; අත්තමනා භවන්ති, සතුටුවෙත්.

349 යතොචඛො, යම්කාලයෙක්හි වනාහි; ආපදාසු, උපද්‍රවයන්හි; අත්‍ථවිනිච්ඡයඤ්ඤූ, කාරණාර්‍ථ විනිශ්චයෙහිදක්ෂවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම්; න වෙධති, කම්පානොවේද; (එකල්හි) අවිකාරං, විකාර රහිතවූ; පුරාණං, පුරාණ පැවැත්තාවූ; මුඛං, මුහුණ; දිස්වා, දැක; අස්ස, මොහුගේ; පච්චත්‍ථිකා, සතුරෝ; දුඛිතාභවන්ති, දුක් ඇත්තාහුවෙත්.

350 ජප්පෙන මන්තෙන සුභාසිතෙන අනුප්පදානෙන පවෙණියාවා,
යථා යථා යත්ථ ලභෙථ අත්ථං තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

351 සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො
මයාව අඤ්ඤෙන වා එස අත්ථො,
අසොචමානො අධිවාසයෙය්‍ය
කම්මං දළ්හං කින්ති කරොමි දානි,ති.

352 න සොචනාය පරිදෙවනාය
අත්ථො අලබ්භො අපි අප්පකොපි,
සොචන්තමෙනං දුඛිතං විදිත්වා
පච්චත්ථිකා අත්තමනා භවන්ති.

353 යතො ච ඛො පණ්ඩිතො ආපදාසු
න වෙධති අත්ථවිනිච්ඡයඤ්ඤූ,
පච්චත්ථිකාස්ස දුඛිතා භවන්ති
දිස්වා මුඛං අවිකාරං පුරාණං.

354 ජප්පෙන මන්තෙන සුභාසිතෙන
අනුප්පදානෙන පවෙණියාවා,
යථා යථා යත්ථ ලභෙථ අත්ථං
තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

---

350 ජප්පෙන, ගුණකීමෙන්ද; මන්තෙන, (මහත් අනුභාවඇති) මන්ත්‍ර පරිවර්තනයෙන්ද; සුභාසිතෙන, මනාතෙපුල් කීමෙන්ද; අනුප්පදානෙන, සියදහස්ගණන් දීමෙන්ද; පවෙණියාවා, (අපගේ ප්‍රවෙණියෙහි මෙය ආචීර්ණයමෙය අනාචීර්ණයයි මෙසේ)ප්‍රවේණිය දැක්වීමෙන්හෝ; යථා යථා, යම් යම් පරිද්දකින්; යත්ථ, යම් තැනෙක්හි; අත්ථං, (ජරාධර්මාදීන්ගේ නොදිරීමාදි) අර්ථය; ලභෙථ, ලබන්නේද; තථා තථා, ඒ ඒ පරිද්දෙන්; තත්ථ, ඒ ඒ තන්හි; පරක්කමෙය්‍ය, උත්සාහකරන්නේය.

351 මයාවා, මාවිසින් හෝ; අඤ්ඤෙනවා, අනිකකුවිසින් හෝ; එසො අත්ථො, මේ අර්ථයතෙම; අලබ්භනෙය්‍යො, නොලැබියයුතුයයි; සචෙ පජානෙය්‍ය, ඉදින් දන්නේනම්; කම්මං, (සංසාරගාමි) කර්මය; දළ්හං, දැඩිය හෙවත් මාවිසින් සජ්ජ කොට රැස්කරණලද්දේය; ඉදානි, දැන්; කින්තිකරොමීති, කුමක්කෙරෙම්දැයි (මෙසේ ප්‍රත්‍යවෙක්ෂා කොට) අසොචමානො, ශොකනොකරන්නේ; අධිවාසයෙය්‍ය, ඉවසන්නේය.

355 සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො
මයාවා අඤ්ඤෙනවා එස අත්‍ථො,
අසොචමානො අධිවාසයෙය්‍ය
කම්මං දළ්හං කින්ති කරොමි දානී,ති.

"මුණ්ඩරාජ වග්ගො පඤ්චමො"

—0—

"පඨමො පණ්ණාසකො".

—0—

356: සල්ලපෙ අසි හත්‍ථෙන, පිසාචෙනාපි සල්ලපෙ,
ආසීවිසම්පි ආසීදෙ යෙන දට්ඨො න ජීවති.

357. නත්වෙව එකො එකාය මාතුගාමෙන සල්ලපෙ,
මුට්ඨස්සතිං තා බන්ධන්ති පෙක්ඛිතෙන සිතෙන ච.

358, අථොපි දුන්නිවත්‍ථෙන මඤ්ජුනා භණිතෙන ච,
නෙසො ජනො ස්වාසීදෙ අපි උග්ඝාතිතො මතො.

---

352. සිට 355. (348. සිට 351. වෙනි අඩක බලනු);

356. 357. අසිහත්‍ථෙන, (හිසකැපීමපිණිස) කඩුව ගෙණආවක් හුසම්ග; සල්ලපෙ, කථාකරන්නේද; පිසාචෙනාපි, පාංශු පිසාචයක්හු හෙවත් කනට ආඑාවූ යක්ෂයා සමග; සල්ලපෙ, කථාකරන්නේද; යෙන, යම් සර්පයකු විසින්; දට්ඨො, දෂ්ටකරණලද්දේ; න ජීවති, ජීවත්නොවේද; (එබඳුවූ) ආසිවිසම්පි, සර්පයාද; ආසීදෙ, වැලඳගන්නේද; හෙවත් ගැටීමකරන්නේද; එකො, හුදකලාව; එකායමාතුගාමෙන, හුදකලාවූ මාගම සමග; නත්වෙව සල්ලපෙ, කථා නොකරන්නේමය; තා, ඔහුතුමූ; පෙක්ඛිතෙන, බැලීමෙන්ද; සිතෙනච, මඳ සිනහවෙන්ද; මුට්ඨස්සතිං, සිහිමුලාවූ පුරුෂයා; බන්ධන්ති, බඳිත්.

358: අථොපි, නැවතද; දුන්නිවත්‍ථෙන, නපුරුකොට හැඳීමෙන්ද; මඤ්ජුනාභණිතෙනච, කිහුනලද මෘදුවචනයෙන්ද; (බැඳගණීත්) සචෙ, ඉදින්; එසොජනො, මේ ජනතෙම; තා, ඔවුන්; ආසීදෙ, වැලඳගන්නේනම්; උග්ඝාතිතොඅපි, ඉදිමුණේද; මතො, මළේදවේ.

359 පඤ්ච කාමගුණා එතෙ  ඉත්ථි රූපස්මිං දිස්සරෙ,
රූපා සද්දා රසා ගන්ධා  ඵොට්ඨබ්බා ච මනොරමා.

360 තෙසං කාමොඝවූළ්හානං  කාමෙ අපරිජානතං,
කාලං ගතිං භවා භවං  සංසාරස්මිං පුරක්ඛතා.

361 යෙ ච කාමෙ පරිඤ්ඤාය  චරන්ති අකුතොභයා,
තෙ වෙ පාරගතා ලොකෙ  යෙ පත්තා ආසවක්ඛයන්ති.

362 ව්‍යාධි ධම්මා ජරා ධම්මා  අථො මරණ ධම්මිනො,
යථා ධම්මා තථා සන්තා  ජිගුච්ඡන්ති පුථුජ්ජනා.

363 අහඤ්චෙතං ජිගුච්ඡෙය්‍යං  එවං ධම්මෙසු පාණිසු,
න මෙතං පතිරූපස්ස  මම එවං විහාරිනො.

364 සොහං එවං විහරන්තො  ඤත්වා ධම්මං නිරූපධිං,
ආරොග්‍යෙ යොබ්බනස්මිං ච  ජීවිතස්මිං ච යෙ මදා.

365 සබ්බෙ මදෙ අභිභොස්මි  නෙක්ඛම්මං දට්ඨු ඛෙමතං,
තස්ස මෙ අහු උස්සාහො  නිබ්බාණං අභිපස්සතො.

366 නාහං භබ්බො එතරහි  කාමානි පටිසෙවිතුං,
අනිවත්ති භවිස්සාමි  බ්‍රහ්මචරිය පරායනො,ති.

---

359 මනොරමා, සිත්කළුවූ; රූපා, රූපයෝද; සද්දා, ශබ්දයෝද; රසා, රසයෝද; ගන්ධා, ගන්ධයෝද; ඵොට්ඨබ්බාච, ස්පර්ශයෝද; යන එතෙපඤ්චකාමගුණා, මේ පඤ්චකාමගුණයෝ; ඉත්ථිරූපස්මිං; ස්ත්‍රීරූපයෙහි; දිස්සරෙ, දක්නාලැබෙත්.

360 කාමෙ, කාමයන්; අපරිජානතං, නොදන්නාවූ; කාමොඝවූළ්හානං, කාමොඝයෙන් අදනාලද්දාවූ; තෙසං, ඔවුන්ගේ; කාලං, කාලයද; ගතිං, ගතියද; භවාභවං, නැවත නැවත භවයද; (යන මොහු)සංසාරස්මිං, සංසාරයෙහි; පුරක්ඛතා,පෙරටුකරණලද්දාහුය.

361 යෙච, යම්පණ්ඩිතකෙනෙක්; කාමෙ, වස්තුකාම ක්ලේශකාමයන්; පරිඤ්ඤාය, (ඥාතතීරණ ප්‍රහාණයයි කියනලද ත්‍රිවිධපරිඥායෙන්) දැන; අකුතොභයා,(ක්ෂීණාශ්‍රවයන්ට කිසිතැනෙකින් බියෙක් නම් නැත්තේද එහෙයින් ඒක්ෂීණාශ්‍රවයෝ)නිර්භයව; චරන්ති, හැසිරෙත්ද; යෙ, (ඒ) යම් පණ්ඩිත කෙනෙක්; ආසවක්ඛයං, ආශ්‍රවක්ෂයට හෙවත් අර්හත්වයට; පත්තා,පැමිණියාහුද; තෙ,ඔහුතුමූ; වෙ, ඒකාන්තයෙන්; ලොකෙ, ලෝකයෙහි; පාරගතා, පරතෙරම ගියාහු; හෙවත් නිවණට පැමිණියාහු(වෙත්.)

362. සිට 366. (37, සිට 41. වෙනි අඞ්ක බලනු.)

367 මාතාපිතු කිච්චකරො පුත්තදාර හිතො සදා,
අන්තො ජනස්ස අත්ථාය යෙ චස්ස උපජීවිනො*.

368 උභින්නං යෙව අත්ථාය වදඤ්ඤූ හොති සීලවා,
ඤාතීනං පුබ්බපෙතානං දිට්ඨෙ ධම්මෙ ච ජීවිනං.

369 සමණානං බ්‍රාහ්මණානං දෙවතානඤ්ච පණ්ඩිතො,
විත්ති සඤ්ජනනො හොති ධම්මෙන ඝරමාවසං.

370 සො කරිත්වාන කල්‍යාණං පුජ්ජො හොති පසංසියො.
ඉධ චෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති,ති.

"නීවරණ වග්ගො පඨමො."

---

367. 368. 369. සදා, හැමකල්හි; මාතාපිතුකිච්චකරො, මව්පියන්ගේ කටයුතුකරන්නේද; පුත්තදාරහිතො, අඹුදරුවන්ට හිතවූයේද; අස්ස, මොහු; උපජීවිනො, ඇසුරුකොට ජීවත්වන්නාවූ; යෙච, සම්කෙනෙක්ඇද්ද: (ඔවුන්ගේද) අන්තොජනස්ස, ඇතුලත්ජනයාගේද; අත්ථාය, අර්ථයපිණිස; (පිළිපන්නේද) පුබ්බපෙතානං, පරලොවගියාවූ; ඤාතීනං, නෑයන්ගේද; දිට්ඨධම්මෙච ජීවිනං, ඉහාත්මයෙහි ජීවත්වන්නාවූ නෑයන්ගේද; යන උභින්නංයෙව, දෙපක්ෂයටම; අත්ථාය, අර්ථය පිණිස; (පිළිපන්නේද) වදඤ්ඤූ, ප්‍රතිග්‍රාහකයන්ගේ කෙතපුල් දන්නේද; සීලවාහොති, ශීලවන්තයේද; ධම්මෙන, දැහැමින්; ඝරමාවසං, ගෘහයෙහි වසන්නාවූ; පණ්ඩිතො, (ඒ) පණ්ඩිතතෙම; සමණානං, ශ්‍රමණයන්ටද; බ්‍රාහ්මණානං, බ්‍රාහ්මණයන්ටද, දෙවතානඤ්ච, දෙවියන්ටද; විත්තිසඤ්ජනනොහොති, සතුටු එළවන්නේවේ.

370 සො, හෙතෙම; කල්‍යාණං, කුශලකර්මය; කරිත්වාන, කොට; පුජ්ජොහොති, පිදියයුත්තෙක්වේ; පසංසියො, ප්‍රශංසා කටයුත්තෙක්වේ; ඉධචෙව, මේලොකයෙහිම; නං, ඔහුට; පසංසන්ති, ප්‍රශංසා කෙරෙත්; පෙච්ච, පරලෙව්හි; සග්ගෙච, ස්වර්ගයෙහිද; මොදති, සතුටුවේ.

---

* "අනුජීවිනො" තිපි පාඨො.

371 සද්ධාය සීලෙන ච යො ධ වඩ්ඪති
පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං,
සො තාදිසො සප්පුරිසො විචක්ඛණො
ආදීයති සාරමිධෙ ච අත්තනො,ති.

372 සද්ධාය සීලෙන ච යා ධ වඩ්ඪති
පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං,
සා තාදිසී සීලවතී උපාසිකා
ආදීයති සාර මිධෙ ච අත්තනො,ති.

**“සද්ධ වග්ගො දුතියො.”**

---0---

“දුතියො පණ්ණාසකො”.

---0---

373 යො පාණ මති පාතෙති මුසාවාදඤ්ච භාසති,
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති.

374 සුරාමෙරය පානඤ්ච යො නරො අනුයුඤ්ජති,
අප්පහාය පඤ්ච වෙරානි දුස්සීලො ඉති වුච්චති;
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජති.

---

371 ඉධ, මේලෝකයෙහි; යො, යමෙක්තෙම; සද්ධාය, ශ්‍රද්ධාවෙන්ද; සීලෙනච, ශීලයෙන්ද; පඤ්ඤාය, ප්‍රඥාවෙන්ද; චාගෙන, ත්‍යාගයෙන්ද; සුතෙනච, ශ්‍රැතයෙන්ද; (යනමේ වැඩීම් පසින්) වඩ්ඪති, වැඩේද; විචක්ඛණො, පණ්ඩිතවූ; තාදිසො, එබඳුවූ; සො සප්පුරිසො, ඒ සත්පුරුෂතෙම; ඉධෙව, මේලෝකයෙහිම; අත්තනො, තමන්ගේ; උභයං සාරං, උභය සාරය; ආදීයති, ගණී.

372 ඉධ, මේලෝකයෙහි; යා, යම්ස්ත්‍රියක්තොමෝ; සද්ධාය, ශ්‍රද්ධාවෙන්ද; සීලෙනච, ශීලයෙන්ද; පඤ්ඤාය, ප්‍රඥාවෙන්ද; චාගෙන, ත්‍යාගයෙන්ද; සුතෙනච, ශ්‍රැතයෙන්ද; (යනමේ වැඩීම්පසින්) වඩ්ඪති, වැඩේද; සීලවතී, සිල්වත්වූ; තාදිසී, එබඳුවූ; සා උපාසිකා, ඒ උපාසිකාතොමෝ; ඉධෙව, මේලෝකයෙහිම; අත්තනො, තමන්ගේ; උභයං සාරං, උභයසාරය; ආදීයති, ගන්නීය.

373: 374. යො, යමෙක්තෙම; පාණං අතිපාතෙති, ප්‍රාණඝාතකෙරේද; මුසාවාදඤ්ච, මෘෂාවාදය; භාසති, කියාද; ලොකෙ, ලොකයෙහි; අදින්නං, (අනුන් අයිති) නුදුන්දෙය; ආදියති, ගණීද; පරදා

375 සො පාණං නාතිපාතෙති මුසාවාදං න භාසති,
ලොකෙ අදින්නං නාදියති පරදාරං න ගච්ඡති.

376 සුරාමෙරය පානඤ්ච යො නරො නානුයුඤ්ජති,
පහාය පඤ්ච වෙරානි සීලවා ඉති වුච්චති;
කායස්ස භෙදා සප්පඤ්ඤො සුගතිං සො උපපජ්ජති,ති.

377 නිරයෙසු භයං දිස්වා පාපානි පරිවජ්ජයෙ,
අරිය ධම්මං සමාදාය පණ්ඩිතො පරිවජ්ජයෙ.

378 න හිංසෙ පාණභූතානි විජ්ජමානෙ පරක්කමෙ,
මුසා ච න භණෙ ජානං අදින්නං න පරාමසෙ.

---

රඤ්ච, පරදාරාව කරා; ගච්ඡති, යේද; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; සුරාමෙරය පානඤ්ච, රහමෙර පානයකිරීමෙහි; අනුයුඤ්ජති, යෙදේද; පඤ්චවෙරානි, (කියනලද මේ) අකුසල් පස; අප්පහාය, පහනොකොට; (සිව්ගේ) දුස්සීලො ඉති, දුස්සීලයයි; වුච්චති, කියනුලැබේද; සොදුප්පඤ්ඤො, ඒ අඥානතෙම; කායස්සභෙදා, කායබිඳීමෙන්; (මරණින්මත්තෙහි) නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදී.

375. 376. යො, යමෙක්තෙම; පාණං නාතිපාතෙති, ප්‍රාණඝාත නොකෙරේද; මුසාවාදං, මුසාවාදය; නභාසති, නොකියාද; ලොකෙ, ලොකයෙහි; අදින්නං, (අනුන් අයිති) නුදුන්දෙය; නාදියති, නොගණීද; පරදාරං, පරදාරාවකරා; නගච්ඡති, නොයේද; යො නරො, යම් මනුෂ්‍යයෙක්තෙම; සුරාමෙරයපානඤ්ච, රහමෙරපානයකිරීමෙහි; නඅනුයුඤ්ජති, නොයෙදේද; පඤ්චවෙරානි,යනමේ අකුසල්පස; පහාය, දුරුකොට(සිව්ගේ) සීලවාඉති, ශීලයෙන් යුක්තයයි; වුච්චති, කියනුලැබේද; සොසප්පඤ්ඤො, ඒ පණ්ඩිතතෙම; කායස්සභෙදා, කායබිඳීමෙන්; (මරණින්මත්තෙහි) සුගතිං, දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදී.

377 නිරයෙසු, නරකයන්හි; භයංදිස්වා, භයදැක; පාපානි, පාපයන්; පරිවජ්ජයෙ, දුරුකරන්නේය; පණ්ඩිතො, පණ්ඩිතතෙම; අරියධම්මං, ආර්‍ය්‍යධර්‍මය; (පඤ්චශීලය) සමාදාය, සමාදන්ව; පාපානි, පාපයන්; පරිවජ්ජයෙ, දුරුකරන්නේය.

378 පරක්කමෙ, උත්සාහය; විජ්ජමානෙ, විද්‍යමානකල්හි; පාණභූතානි, ප්‍රාණීභූතයන්; නහිංසෙ, නොනසන්නේය; ජානං,දන්නේ නොහොත්දැන; මුසාච, බොරුබසද; නභණෙ, නොකියන්නේය; අදින්නං,(අනුන්අයිති) නුදුන්දෙය; නපරාමසෙ, නොගන්නේය.

379 සෙහි දාරෙහි සන්තුට්ඨො පරදාරඤ්ච නාරමෙ,
මෙරයං වාරුණිං ජන්තු න පිවෙ චිත්ත මොහනිං.

380 අනුස්සරෙය්‍ය සම්බුද්ධං ධම්මඤ්චානුවිතක්කයෙ,
අව්‍යාපජ්ඣං හිතං චිත්තං දෙවලොකාය භාවයෙ.

381 උපට්ඨිතෙ දෙය්‍යධම්මෙ පුඤ්ඤත්ථස්ස ජිගිංසතො,
සන්තෙසු පඨමං දින්නා විපුලා හොති දක්ඛිණා;
සන්තෙ හවෙ පවක්ඛාමි සාරිපුත්ත සුණොහි මෙ.

382 ඉති කණ්හාසු සෙතාසු රොහිණීසු හරීසු වා,
කම්මාසාසු සරූපාසු ගොසු පාරෙවතාසු වා.

383 යාසු කාසු ච එතාසු දන්තො ජායති පුඞ්ගවො,
ධොරය්හො බලසම්පන්නො කල්‍යාණජවනික්කමො.

384 තමෙව භාරෙ යුඤ්ජන්ති නාස්ස වණ්ණං පරික්ඛරෙ,
එවමෙව මනුස්සෙසු යස්මිං කස්මිඤ්චි ජාතියෙ.

385 ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ,
යාසු කාසු ච එතාසු දන්තො ජායති සුබ්බතො.

---

379 සෙහිදාරෙහි, ස්වකීය දාරාවන් සමග; සන්තුට්ඨො, සතුටුවූයේ; පරදාරඤ්ච, පරදාරාවකෙරෙහිද; නාරමෙ, නොඇලෙන්නේය; ජන්තු, සත්වතෙම; චිත්තමොහනිං, සිත මුළාකරන්නාවූ; මෙරයං, (සිව්වැදෑරුම්වූ) මෙරයද; වාරුණිං, (පස්වැදෑරුම්වූ) සුරාවද; නපිවෙ, පානය නොකරන්නේය.

380 සම්බුද්ධං, බුදුන්; අනුස්සරෙය්‍ය, සිහිකරන්නේය; ධම්මඤ්ච, නවලොකොත්තර ධර්මයද; අනුවිතක්කයෙ, සිහිකිරීම්වශයෙන් විතර්කනය කරන්නේය; අව්‍යාපජ්ඣං, දුක් නැත්තාවූ; හිතං, (බ්‍රහ්මවිහරණයෙන් යුක්ත හෙයින්) හිතවූ; චිත්තං, සිත; දෙවලොකාය, බ්‍රහ්මලොකොත්පත්තිය පිණිස; භාවයෙ, වඩන්නේය.

381 දෙය්‍යධම්මෙ, දානවස්තුව; උපට්ඨිතෙ, එළඹසිටිකල්හි; පුඤ්ඤත්ථස්ස, පිනෙන් ප්‍රයොජනය ඇති; ජිගිංසතො, කුසල් සොයන්නහු විසින්; පඨමං, පළමුකොට; සන්තෙසු, බුද්ධාදී සත්පුරුෂයන් කෙරෙහි තොහොත් සත්පුරුෂයන්ට; දක්ඛිණා, දක්ෂිණාතොමෝ; දින්නා, දෙනලද්දීද; විපුලා හොති, (ඒ දක්ෂිණාව) මහත්වන්නීය; (මෙසේ දෙනලද දානය මහත්ඵලවෙයි සේයි) සාරිපුත්ත, සාරිපුත්‍රය; සන්තෙ, ශාන්තයන්; පවක්ඛාමි, කියන්නෙමි; මෙ, මාගේ වචනය; සුණොහි, අසව.

386 ධම්මට්ඨො සීලසම්පන්නො සච්චවාදී හිරීමනො,
පහීණ ජාති මරණො බ්‍රහ්මචරියස්ස කෙවලී.

387 පන්නභාරො විසංයුත්තො කතකිච්චො අනාසවො,
පාරගූ සබ්බ ධම්මානං අනුපාදාය නිබ්බුතො.

388 තස්මිඤ්ච විරජෙ ඛෙත්තෙ විපුලා හොති දක්ඛිණා,
බාලා ච අවිජානන්තා දුම්මෙධා අස්සුතාවිනො.

389 බහිද්ධා දදන්ති දානානි නහි සන්තෙ උපාසරෙ,
යෙ ච සන්තෙ උපාසන්ති සප්පඤ්ඤෙ ධීර සම්මතෙ.

390 සද්ධා ච නෙසං සුගතෙ මූල ජාතා පතිට්ඨිතා,
දෙවලොකඤ්ච තෙ යන්ති කුලෙ වා ඉධ ජායරෙ;
අනුපුබ්බෙන නිබ්බාණං අධිගච්ඡන්ති පණ්ඩිතා,ති.

"උපාසක වග්ගො තතියො" "අරඤ්ඤ වග්ගො චතුත්ථො"

—0—

391 පදුමං යථා කොකනදං සුගන්ධං
පාතො සියා ඵුල්ල මවීත ගන්ධං,
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්ත මාදිච්ච මිවන්තලික්ඛෙ,ති.

"බ්‍රාහ්මණ වග්ගො පඤ්චමො" "චතුත්ථො පණ්ණාසකො".

—0—

# පඤ්චක නිපාතො සමත්තො.

382. සිට 390. (58. සිට 66. වෙනි අඞ්ක බලනු.)

391 ඵුල්ලං, පොත්ඵුල්ලවූ; අවීතගන්ධං, පහනුවූ සුවඳඇති; සුගන්ධං,මනාසුවඳින් යුක්තවූ; කොකනදං පදුමං,රක්තපද්මය; පාතො, සූර්‍ය්‍යොද්ගමන කාලයෙහි; යථාසියා, යම්සේ වන්නේද; අන්තලික්ඛෙ, (දෙදහස් දිවයින්-පිරිවරඇති චාතුර්මහාද්වීපයන්හි) අවකාශයෙහි; තපන්තං, (ආලොකකිරීම් වශයෙන්)දිලිසෙන්නාවූ; ආදිච්චං ඉව, සූර්‍ය්‍යයාමෙන්; විරොචමානං, බබලන්නාවූ; අඞ්ගීරසං, (ශරීරයෙහි අවයවයක්පාසා රසම් පැතිරෙනහෙයින් අඞ්ගීරසයයි කියනු ලබන්නාවූ) සම්බුද්ධයා; පස්ස, බලව.

392 යො පපඤ්ච මනුයුත්තො පපඤ්චාභිරතො මගො,
විරාධයී සො නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරං.

393 යො ච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපදෙ රතො,
ආරාධයී සො නිබ්බාණං යොගක්ඛෙමං අනුත්තරන්ති.

394. 395. යො පපඤ්ච මනුයුත්තො =පෙ= යොගක්ඛෙමං අනුත්තරන්ති.

**"සාරාණීය වග්ගො දුතියො."**

—0—

396 භයං දුක්ඛඤ්ච රොගො ච (ගණ්ඩො) සඞ්ගො පඞ්කො චූභයං,
එතෙ කාමා පවුච්චන්ති යත්ථ සත්තො පුථුජ්ජනො.

397 උපාදානෙ භයං දිස්වා ජාති මරණ සම්භවෙ,
අනුපාදා විමුච්චන්ති ජාති මරණ සඞ්ඛයෙ.

398 තෙ ඛෙමප්පත්තා සුඛිනො දිට්ඨ ධම්මාභිනිබ්බුතා,
සබ්බ වෙර භයාතීතා සබ්බං දුක්ඛං උපච්චගුන්ති.

---

392 යො, යමෙක්තෙම; පපඤ්චං, (තෘෂ්ණාදෘෂ්ටි මාන විශයෙන් පැවැත්තාවූ නොහොත් මත්වීම් ආකාරයෙන්සිටි) ක්ලෙශප්‍රපඤ්චයෙහි; අනුයුත්තො, යෙදුනේද; මගො, මෘගයකුසේ; පපඤ්චාභිරතො, ක්ලෙශප්‍රපඤ්චයෙහි ඇලුනේද; සො, හෙතෙම; යොගක්ඛෙමං, යොගක්ෂෙමවූ; අනුත්තරං, නිරුත්තරවූ; නිබ්බාණං, නිර්වාණය; විරාධයී, සම්පාදනය නොකළේය, (නොපිරුයේය)

393 යොච, යමෙක්තෙම; පපඤ්චං, ක්ලෙශප්‍රපඤ්චය; හිත්වාන, හැර; නිප්පපඤ්චපදෙ, නිර්වාණපදයෙහි; රතො, ඇලුනේද; සො, හෙතෙම; යොගක්ඛෙමං, යොගක්ෂෙමවූ; අනුත්තරං, නිරුත්තරවූ; නිබ්බාණං, නිර්වාණය; ආරාධයී, සම්පාදනයකෙළේය.

394. 395. (392. 393. වෙනි අඞ්ක බලනු.)

396 භයං, සිත් තැතිගැන්මී බියද; දුක්ඛඤ්ච, (ජාත්‍යාදි) දුඃඛයද; රොගොච, රොගයද; [ගණ්ඩො, ගණ්ඩයද;] පුථුජ්ජනො, පෘථග්ජන තෙම; යත්ථ, යම් රාගසඞ්ග කාමපඞ්කයන්හි; සත්තො, ඇලුනේද; (එබඳුවූ) සඞ්ගො, සඞ්ගයද; පඞ්කොච, පඞ්කයද යන; උභයං, දෙකද; එතෙ, මොහු; කාමා, කාමයෝයයි; පවුච්චන්ති, කියනුලැබෙත්.

397, (31. වෙනි අඞ්කය බලනු.)

398 ඛෙමප්පත්තා, ක්ෂෙමභාවයට පැමිණියාවූ; සුඛිනො, (ලොවිතුරු සුවයෙන්) සුවයඇති; =(32. වෙනි අඞ්කය බලනු.)

399 යෙ දස්සන වරං ලද්ධා සවණඤ්ච අනුත්තරං,
ලාභා නුත්තරියං ලද්ධා සික්ඛා නුත්තරියෙ රතා.

400 උපට්ඨිතා පාරිචරියෙ භාවයන්ති අනුස්සතිං,
විවෙක පටිසංයුත්තං ඛෙමං අමත ගාමිනිං.

401 අප්පමාදෙ පමුදිතා නිපකා සීල සංවුතා,
තෙ වෙ කාලෙන පච්චෙන්ති* යත්ථ දුක්ඛං නිරුජ්ඣති,ති.

"අනුත්තරිය වග්ගො තතියො."

— o —

402 සත්ථු ගරු ධම්ම ගරු සඞ්ඝෙ ච තිබ්බ ගාරවො,
අප්පමාද ගරු භික්ඛු පටිසන්ථාර ගාරවො;
අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙව සන්තිකෙ,ති.

---

399. 400. 401. යෙ, යම්කෙනෙක්; දස්සනවරං, උතුම්දැකීම; ලද්ධා, ලද්දාහුද; අනුත්තරං, නිරුත්තරවූ; සවණඤ්ච, ශ්‍රවණයලද්දාහුද; ලාභානුත්තරියං, නිරුත්තරවූලැබීම; ලද්ධා, ලද්දාහුද; සික්ඛානුත්තරියෙ, නිරුත්තරශික්ෂාවෙහි; රතා, ඇලුණාහුද; පාරිචරියෙ, පාරිචර්‍ය්‍යාවට; උපට්ඨිතා එළඹසිටියාහුද; ඛෙමං නිරුපද්‍රවූ; අමතගාමිනිං, නිර්වාණගාමිවූ; අනුස්සතිං, (නිරුත්තරවූ) අනුස්මෘතිය (ආර්‍ය්‍යමාර්ගය) විවෙකපටිසංයුත්තං, නිවන්ඇසුරුකොට; භාවයන්ති, වඩත්ද; අප්පමාදෙ, (ස්මෘති අවිප්‍රවාසයයි කියනලද) අප්‍රමාදයෙහි; පමුදිතා, ප්‍රමුදිතවූ; නිපකා, නිපකභාවයෙන් යුක්තවූ; සීලසංවුතා, ශීලයෙන් සංවෘතවූ; මැනවින් වැසුනාවූ; තෙ, ඒ භික්ෂූහු; වෙ, ඒකාන්තයෙන්; කාලෙන, සුදුසුකාලයෙහි; යත්ථ, යම්තැනෙක්හි; දුක්ඛං, (සියලුසසර) දුක; නිරුජ්ඣති, නිරුද්ධවේද; (ඒ අමෘතමහානිර්වාණය) පච්චෙන්ති, දනිත්.

402 භික්ඛු භික්ෂුතෙම; සත්ථුගරු, ශාස්තෘන්වහන්සේ ගරුකොට ඇත්තේද; ධම්මගරු, නවලෝකෝත්තර ධර්මය ගරුකොට ඇත්තේද; සඞ්ඝෙච, සංඝයාකෙරෙහිද; (ශික්ෂාවකෙරෙහිද) තිබ්බගාරවො, තියුණුවූ ගෞරවය ඇත්තේද; අප්පමාදගරු, අප්‍රමාදයගරුකොට ඇත්තේද; පටිසන්ථාරගාරවො, ධර්මාමිෂ වශයෙන් දෙවැදෑරුම් පිළිසඳරෙහි ගෞරවය ඇත්තේද; (ඒ භික්ෂුතෙම) පරිහානාය, පිරිහීමට; අභබ්බො, අයොග්‍යවේ; නිබ්බාණස්සෙව, නිර්වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහිවේ.

---

* "පච්චෙන්ති" ති පි දිස්සති.

403 සත්ථු ගරු ධම්ම ගරු සඞ්ඝෙ ච තිබ්බ ගාරවො,
හිරි ඔත්තප්ප සම්පන්නො සප්පතිස්සො ස ගාරවො;
අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙව සන්තිකෙ.ති.

404 පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා.

405 වීත රාගා වීත දොසා වීත මොහා අනාසවා,
ඛෙත්තං යඤ්ඤස්ස සම්පන්නං සඤ්ඤතා බ්‍රහ්මචාරයො*,

406 සයං ආචමයිත්වාන දත්වා සකෙහි පාණිහි,
අත්තතො පරතො චෙසො යඤ්ඤො හොති මහප්ඵලො.

407 එවං යජිත්වා මෙධාවී සද්ධො මුත්තෙන චෙතසා,
අබ්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජතී,ති,

"දෙවතා වග්ගො චතුත්ථො."

---0---

403 සත්ථුගරු, ශාස්තෘන්වහන්සේ ගරුකොට ඇත්තේද; ධම්මගරු, ධර්මය ගරුකොට ඇත්තේද; සඞ්ඝෙච, සංඝයාකෙරෙහිද; (ශික්ෂාවෙහිද) තිබ්බගාරවො, තියුණුවූ ගෞරවය ඇත්තේද; හිරිඔත්තප්පසම්පන්නො, (පාපයෙහි) ලජ්ජාවෙන්ද භයින් යුක්තවූයේද; සප්පතිස්සො, ජ්‍යෙෂ්ඨාසහිතවූ හෙවත් ගුරුආශ්‍රය ඇති; සගාරවො, (ගරුතන්හි තැබියයුතු අනිකක්හු කෙරෙහි) ගෞරවසහිතවූ; (ඒභික්ෂුතෙම) පරිහානාය, පිරිහීමට; අභබ්බො, අයොග්‍යවේ; නිබ්බාණස්සෙව, නිර්වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහිවේ.

404 දානා, දීමෙන්; පුබ්බෙව, පූර්වයෙහිම; සුමනො, සතුටුසිත් ඇත්තේද; දදං, දෙන්නේ; චිත්තං, සිත; පසාදයෙ, පහදවන්නේද; දත්වා, දී; අත්තමනොහොති, සතුටුසිත්ඇතිවේද; එසා, මේතොමේ; යඤ්ඤස්ස, යාගසඞ්ඛ්‍යාත දානයාගේ; සම්පදා, පරිපූර්ණතාවන්නීය.

405 වීතරාගා, පහවූ රාගය ඇති; වීතදොසා, පහවූ ද්වේෂය ඇති; වීතමොහා, පහවූ මෝහය ඇති; අනාසවා, ආශ්‍රවරහිතවූ; සඤ්ඤතා, ශීලයෙන් සංයතවූ; බ්‍රහ්මචාරයො, බ්‍රහ්මචාරීහු; යඤ්ඤස්ස, යාගසඞ්ඛ්‍යාත දානයට; සම්පන්නං, සම්පූර්ණවූ; ඛෙත්තං, ක්ෂෙත්‍රයවෙත්.

406, 407 එසො යඤ්ඤො, පිදියයුතු හෙයින් යාගයයි කියනලද මේපරිත්‍යාගයතෙම; අත්තතො, තමාකෙරෙන්ද; පරතොච, අනුන් (හෙවත් ප්‍රතිග්‍රාහකයන්) කෙරෙන්ද; මහප්ඵලොහොති,

* 'බ්‍රහ්මචාරිනො' ති පි පාඨො.

408 මනුස්ස භූතං සම්බුද්ධං අත්ත දන්තං සමාහිතං,
ඉරියමානං බ්‍රහ්මපථෙ චිත්තස්සූප සමෙ රතං.
409 යං මනුස්සා නමස්සන්ති සබ්බ ධම්මාන පාරගුං,
දෙවාපි නං නමස්සන්ති ඉති මෙ අරහතො සුතං.
410 සබ්බ සඤ්ඤොජනාතීතං වනා නිබ්බන මාගතං,
කාමෙහි නෙක්ඛම්ම රතං මුත්තං සෙලාව කඤ්චනං.
411 සබ්බෙ අච්චරුචි නාගො හිමවා වඤ්ඤෙ* සිලුච්චයෙ,
සබ්බෙසං නාග නාමානං සච්ච නාමො අනුත්තරො.

---

මහත්ඵලවෙයි; (එහෙයින්) සයං, තමාවිසින්ම; ආචමයිත්වාන, (දක්ෂිණාර්හයන්ගේ හස්තපාදයන්) ධොවනයකොට; දත්වා, (තෙමේ මුඛොදකය) දී; සකෙහි පාණිහි, ස්වහස්තයෙන් (පිදියයුතුවේ) එවං, මෙසේ; මෙධාවී, ධාරණ ප්‍රඥාඇත්; සද්ධො, රත්නත්‍රයෙහි ගුණඅදහන්නාවූ; පණ්ඩිතො, පණ්ඩිතතෙම; මුත්තෙන චෙතසා, ලාභමානසක්ත්‍යාදියෙන් මිදුනුසිතින්; යජිත්වා, පුදා; අව්‍යාපජ්ඣං, නිදුක්වූ; සුඛං ලොකං, මහත් සැපසොම්නස් ඇති දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදින්නේය.

408. 409. 410. අත්තදන්තං, තමාවිසින් දමුනාවූ; සමාහිතං, (ද්වි ප්‍රකාර සමාධියෙන්) එකඟවූ; බ්‍රහ්මපථෙ, ශ්‍රෙෂ්ඨපථයෙහි; හෙවත් නිර්වාණමාර්ගයෙහි; ඉරියමානං, වාසයකරන්නාවූ; චිත්තස්සූපසමෙ රතං, (ප්‍රථමධ්‍යානාදියෙන්) චිත්තයාගේ සංසිඳීමෙහි ඇලුනාවූ; මනුස්සභූතං, (දෙවාදීභාවයට නොපැමිණ) මනුෂ්‍යමවූ; සබ්බධම්මාන පාරගුං, (ස්කන්ධාදි) සමස්ත ධර්මයන්ගේ පරතෙරට ගියාවූ; සම්බුද්ධං, සම්‍යක් සම්බුද්ධවූ; යං, යමකුට; මනුස්සා, මනුෂ්‍යයෝ; නමස්සන්ති, නමස්කාර කෙරෙත්ද; සබ්බසංයොජනාතීතං, සියලු සංයොජනයන් ඉක්මෙව්වාවූ; වනා, ක්ලෙශවනයෙන් නික්ම; නිබ්බනං, ක්ලෙශවන රහිතවූනිර්වාණයට; ආගතං, පැමිණියාවූ; කාමෙහි, කාමයන්කෙරෙන්; නෙක්ඛම්මරතං, නික්මීමෙහි ඇලුනාවූ; (හෙවත් ප්‍රව්‍රජ්‍යා අෂ්ටසමාපත්ත්‍යාදියෙහි ඇලුනාවූ) සෙලා, ශෛලධාතුවෙන්; (මහමෙරු පර්වතයෙන්) මුත්තං, මිදුනාවූ; කඤ්චනංව, ස්වර්ණයට බඳු පැහැඇති; නං, උන්වහන්සේට; දෙවාපි, දෙවියෝද; නමස්සන්ති, නමස්කාර කෙරෙත්යයි; ඉති; මෙසේ; අරහතො, අර්හත්වූ නුඹවහන්සේ සමීපයෙහි; මෙ, මා විසින්; සුතං, අසනලද්දේය.

411 නාගො, බුද්ධනාගතෙම; අඤ්ඤෙ, අන්‍යවූ; සිලුච්චයෙ, පර්වතයන් (මැඩ බබලන්නාවූ); හිමවාව, හිමාලපර්වතරාජයාසේ; සබ්බෙ,

---

* "මඤ්ඤෙ" ති පී පාඨො,

412 නාගං වො කිත්තයිස්සාමි නහි ආගුං කරොති සො,
සොරච්චං අවිහිංසා ච පාදා නාගස්ස තෙ දුවෙ.

413 තපො ච බ්‍රහ්මචරියඤ්ච චරණා නාගස්ස ත්‍යාපරෙ,
සද්ධා හත්ථො මහා නාගො උපෙක්ඛා සෙත දන්තවා.

414 සති ගීවා සිරො පඤ්ඤා වීමංසා ධම්ම චින්තනා,
ධම්මකුච්ඡි සමාවාපො විවෙකො තස්ස වාලධි.

---

සියලු සත්වයන්; අඩවරුචි ඉක්මවා බබලනසුලුය; නාගනාමානං, නාගනම්ඇති; සබ්බසං, සියල්ලවුන් අතුරෙහි; අනුත්තරො, නිරුත්තරවූ; සච්චනාමො, සත්‍යනම් ඇත්තේය.

412 වො, තොපට; නාගං, බුඩනාගයා; කිත්තයිස්සාමි, ප්‍රකාශකරන්නෙමි; සො, ඒ බුඩනාගතෙම; ආගුං, පාපය; නහිකරොති, නොකරණසේක; (එහෙයින්ම සත්‍යනම්ඇත්තේය) නාගස්ස, බුඩනාගයාගේ; සොරච්චං, ශුඩ ශීලයද; අවිහිංසාච, කරුණාව හා එම පූර්වභාගයද; තෙදුවෙ, ඒ දෙක; පාදා,(ඉදිරියෙහි)පාදයෝවෙත්.

413 තපොච, ධුතාඞ්ගසමාදානයද; බ්‍රහ්මචරියඤ්ච, ආයඝීමාගීශීලයද; තෙ, ඒ දෙක; නාගස්ස, බුඩනාගයාගේ; අපරෙචරණා, අනික්(පශ්චිම)පාදයෝවෙත්; මහානාගො,(ඒ)මහොත්තමතෙම; සද්ධාහත්ථො, ශ්‍රද්ධාමයවූසොඬින් යුක්තය; උපෙක්ඛාසෙතදන්තවා, ෂඩඞ්ගුපෙක්ෂාමයවූ ශ්වෙත දංෂ්ට්‍රායෙන් යුක්තවේ.

414 සතිගීවා (හස්තිනාගයාගේ අඞ්ගප්‍රත්‍යඞ්ග ශීර්ෂාදීන්ට ග්‍රීවය යම්සේ ආධාරද එමෙන් බුඩනාගයාගේසුරතභාවාදිධර්මයන්ටසමෘති ප්‍රතිෂ්ඨාහෙයින්) සමෘතිතොමෝග්‍රීවයවන්නීය; සිරොපඤ්ඤා, (හස්තිනාගයාගේ ශීර්ෂයමෙන් බුඩනාගයාගේ සර්වධර්මයන් දැනවදුරන්නාවූ) සර්වඥතාඥානශීර්ෂය ඇත්තේය; වීමංසාධම්මචින්තනා, (හස්තිනාගයාගේ විමසිමකරන්නාවූ අගසොඬසේ බුඩනාගයාගේ දහම්කොටස් පිරිසිඳ දැනගන්නාවූ ඥානයයි කියනලදා) දහම් සිතිවිලි විමසිම වන්නීය; ධම්මකුච්ඡිසමාවාපො, (චතුර්ධ්‍යාන සමාධියෙහි පිහිටියාහුගේ සාඛිපිධාදි ඒ ඒ ධර්මයෝ සමුඞ්වෙත්ද එහෙයින්) එම ධ්‍යානසමාධිය කුක්ෂිසමාවාපකොට ඇත්තේය; තස්ස, ඒ බුඩ නාගයාගේ; වාලධි, (හස්ති නාගයාගේ මැස්සන් වළක්වන්නාවූ වාලධියමෙන් ශුභසත ප්‍රවර්ජනයන් වළක්වන හෙයින්) වාලධියයි කියනලදද; විවෙකො, (කාය චිත්ත උපධි) විවෙකය ඇත්තේය.

415 සො ඣායී අස්සාසරතො අජ්ඣත්තං සුසමාහිතො,
ගච්ඡං සමාහිතො නාගො ඨිතො නාගො සමාහිතො.

416 සයං සමාහිතො නාගො නිසින්නොපි සමාහිතො,
සබ්බත්ථ සංවුතො නාගො ඒසා නාගස්ස සම්පදා.

417 භුඤ්ජති අනවජ්ජානි සාවජ්ජානි න භුඤ්ජති,
ඝාස මච්ඡාදනං ලද්ධා සන්නිධිං පරිවජ්ජයෙ.

418 සඤ්ඤොජනං අණුං ථූලං සබ්බං ඡෙත්වාන බන්ධනං,
යෙන යෙනෙව ගච්ඡති අනපෙක්ඛොව ගච්ඡති.

---

415 සො, ඒ බුද්ධනාගතෙම; ඣායී,(ද්විප්‍රකාර ධ්‍යානයෙන්) ධ්‍යාන ඇත්තේය; අස්සාසරතො,(හස්තිනාගයාගේ ආශ්වාසප්‍රාශ්වාස මෙන් බුද්ධනාගයාගේ) ඵලසමාපත්තියෙහි ඇලීම ඇත්තේය; (ආශ්වාස ප්‍රාශ්වාසයෙන් වෙන්ව නොපවත්නාසේ ඵලසමාපත්තියෙන් වෙන්ව, නොපවත්නේය) අජ්ඣත්තං, නිජකාධ්‍යාත්මයෙහි; සුසමාහිතො, මනාව පිහිටුසිත් ඇත්තේය; නාගො, බුද්ධනාගතෙම; ගච්ඡං, වඩින්නේද; සමාහිතො, එකඟවූයේය; නාගො, බුද්ධනාගතෙම; ඨිතො, වැඩසිටියේද; සමාහිතො, එකඟවූයේය.

416 නාගො, බුද්ධනාගතෙම; සයං, සැතපෙන්නේද; සමාහිතො, එකඟවූයේය; නිසින්නොපි, වැඩඋන්නේද; සමාහිතො, එකඟවූයේය; නාගො, බුද්ධනාගතෙම; සබ්බත්ථ, සියලු වාරයන්හි; සංවුතො, මනාව වැසීම්ඇත්තේය; නාගස්ස, බුද්ධනාගයාගේ; ඒසා, මේතොමෝ; සම්පදා, පරිපූර්ණතාවන්නිය.

417 අනවජ්ජානි, (සම්‍යක් ආජීවයෙන් උපන්නාවූ)නිරවද්‍යභොජනයන්; භුඤ්ජති, වළඳනසේක; සාවජ්ජානි, (කුහනලපනාදි පඤ්චවිධ මිථ්‍යාජීවයෙන් උපන්නාවූ)සාවද්‍යභොජනයන්; නභුඤ්ජති, නොවළඳනසේක; ඝාසමච්ඡාදනං, ඝාසච්ඡාදනය; හෙවත් චීවර පිණ්ඩපාතය; ලද්ධා, ලැබ; සන්නිධිං, එකතුකොට තැබීම; පරිවජ්ජයෙ, දුරුකරන්නේය.

418 අණුංථූලං, කුඩාවූද මහත්වූද; සඤ්ඤොජනං, සංයොජනය යි කියනලද; සබ්බං බන්ධනං, සියලු සංසාරබන්ධනය; ඡෙත්වාන සිඳ; යෙන යෙනෙව, යම් යම් දිශාභාගයෙක්හි; ගච්ඡති, වඩිනසේක්ද; අනපෙක්ඛොව, අපෙක්ෂාරහිතවූයේම; ගච්ඡති, වඩිනසේක.

419 යථා පි උදකෙ ජාතං පුණ්ඩරීකං පවඩ්ඪති,
න වුපලිප්පති තොයෙන සුචිගන්ධං මනොරමං.

420 තථෙව ච ලොකෙ සුජාතො බුද්ධො ලොකෙ විරජ්ජති,
න වුපලිප්පති ලොකෙන තොයෙන පදුමං යථා.

421 මහග්ගිනි පජ්ජලිතො අනාහාරූ ප සම්මති,
සඞ්ඛාරෙසු ප සන්තෙසු නිබ්බුතො ති පවුච්චති.

422 අත්ථස්සායං විඤ්ඤාපනී උපමා විඤ්ඤූහි දෙසිතා,
විඤ්ඤස්සන්ති මහා නාගා නාගං නාගෙන දෙසිතං.

423 වීත රාගො වීත දොසො වීත මොහො අනාසවො,
සරීරං විජහං නාගො පරිනිබ්බිස්සති නාසවො, ති.

---

419. 420 යථාපි, යම්සේ; උදකෙ, ජලයෙහි; ජාතං, හටගත් නාවූ; සුචිගන්ධං, පිරිසිදු සුවඳ ඇති; මනොරමං, සිත්කලුවූ; පුණ්ඩරීකං, පුණ්ඩරීකය; (හෙලපියුම්) පවඩ්ඪති, වැඩේද; තොයෙන, ජලයෙන්; නවුපලිප්පයි, ආලෙප නොවේද; තථෙව, එපරිද්දෙන්ම; ලොකෙ, මේලොකයෙහි; සුජාතො, මනාව උපන්නාවූ; බුද්ධො, (සකල ඥෙය්‍යමණ්ඩලය අවබොධකලාවූ) සර්වඥනෙම; ලොකෙ, (ලුජ්ජති පලුජ්ජතීතියෙන් ලොකයයි කියනලද) සත්වයාකෙරෙහි; විරජ්ජති, නොඇලෙයි; ලොකෙන, ලොකයා හා සමග තෘෂ්ණා දෘෂ්ටි ලෙප යෙන්; නවුපලිප්පති, ආලෙපනොවේ; (කෙසේද) තොයෙන, ජලයෙන්; පදුමං යථා, පද්මයමෙනි.

421 පජ්ජලිතො, ප්‍රජ්වලිතවූ; මහග්ගිනි, මහාවග්නිස්කන්ධය; අනාහාරො, උපාදාන රහිතවූයේ; උපසම්මති, සංසිඳේද; සඞ්ඛාරෙසු, සංස්කාරයන්; උපසන්තෙසු, සංසිඳුනුකල්හි; නිබ්බුතොති, නිවූනේයයි; පවුච්චති, කියනුලැබේ.

422 අත්ථස්ස විඤ්ඤාපනී, අර්ථ අඟවන්නාවූ; අයං උපමා, මේ උපමාතොමෝ; විඤ්ඤූහි, නුවණැත්තාවූ ප්‍රතිසම්භිදා ප්‍රාප්ත නාගදායි ස්ථවිරයන් විසින්; දෙසිතා, දෙශනාකරණලද්දීය; නාගෙන, නාගදායිස්ථවිරොත්තමයන් විසින්; දෙසිතං, දෙශනාකරණලද; නාගං, බුද්ධනාගයා; මහානාගා, (අවශෙෂක්ෂීණාශ්‍රව)මහොත්තමයෝ; විඤ්ඤස්සන්ති, විශෙෂයෙන් දැනගන්නාහුය.

423 වීතරාගො, පහවූ රාගයඇති; වීතදොසො, පහවූද්වෙෂයඇති; වීතමොහො, පහවූමොහයඇති; අනාසවො, ආශ්‍රවරහිතවූ; නාගො;

424 දළිද්දියං දුක්ඛං ලොකෙ ඉණාදානඤ්ච වුච්චති,
දළිද්දො ඉණමාදාය භුඤ්ජමානො විහඤ්ඤති.

425 තතො අනුචරන්ති නං බන්ධනම්පි නිගච්ඡති,
එතං හි බන්ධනං දුක්ඛං කාමලාභාභිජප්පිනං.

426 තථෙව අරියෙ විනයෙ සද්ධා යස්ස න විජ්ජති,
අහිරිකො අනොත්තාපී පාපකම්මා විනිච්ඡයො.

427 කායදුච්චරිතං කත්වා වචීදුච්චරිතානි ච,
මනොදුච්චරිතං කත්වා මා මං ජඤ්ඤාති ඉච්ඡති.

428 සො සංසප්පති කායෙන වාචාය උද චෙතසා,
පාපකම්මං පවඩ්ඪෙන්තො තහිං තහිං පුනප්පුනං.

---

බුද්ධනාගතෙම; සරීරං, ශ්‍රීශරීරය; විජහං, දුරුකරන්නේ; අනාසවො, ආශ්‍රවරහිතව; පරිනිබ්බිස්සති, (බොධිපර්‍ය්‍යඞ්කයෙහි ක්ලෙශපරිනිර්වාණයෙන් පරිනිර්වෘතහෙයින්, කුසිනාරානුවර යමකශාල වෘක්ෂයන් මධ්‍යයෙහි නිරුපාදිශෙෂ නිර්වාණධාතුවෙන්) පරිනිර්වාණය කර වදාරණ සේක.

424 ලොකෙ, මෙලොකයෙහි; දළිද්දියං, (ධනයෙන්)දිළිඳුබවද; ඉණාදානඤ්ච, ණයගැණීමද; දුක්ඛං, දුක්යයි; වුච්චති, කියනුලැබේ; දළිද්දො, දිළිඳුවූයේ; ඉණං ආදාය, ණයගෙන; භුඤ්ජමානො, චොදනා කරණුලබන්නේහෙවත් ඉල්ලනුලබන්නේ; විහඤ්ඤති, නස්නේය.

425 තතො, එහෙයින්; නං, ඔහු; අනුචරන්ති, (පිරිස්මැදද අවිවෙහි සිටුවීම් පස්ඳුසීම් ආදියෙන් විප්‍රකාරයට පමුණුවමින්) පසුපස්සෙහි ලුහුබදිත්; බන්ධනම්පි, (හෙතෙම)බන්ධනයටද; නිගච්ඡති, පැමිණේ; කාමලාභාභිජප්පිනං, කාමලාභය ප්‍රාර්ථනාකරන්නාවූන්ගේ; එතංහි බන්ධනං, මේබන්ධනයදවනාහි; දුක්ඛං, දුක්යයි(කියනුලැබේ.)

426. 427. 428. තථෙව, එපරිද්දෙන්ම; අරියෙ විනයෙ, ආර්‍ය්‍යවිනයෙහි; යස්ස, යමකුගේ සද්ධා, ශ්‍රද්ධාතොමෝ; නවිජ්ජති, නැත්තේද; අහිරිකො, (යමෙක්තෙම) පාපයට ලජ්ජානැත්තේද; අනොත්තාපී, පාපයට භයනොවන සුලුද; පාපකම්මා විනිච්ඡයො, පාපකර්මයෙහි විභාගයෙක් නැත්තේද; හෙවත් පාපකර්මය වඩන්නේද; කායදුච්චරිතං, කායදුශ්චරිතය; කත්වා, කොට; වචීදුච්චරිතානිච, වාග්දුශ්චරිතයන්ද; (කොට) මනොදුච්චරිතං, මනොදුශ්චරිතය; කත්වා, කොට; මා මං ජඤ්ඤාති, මා නොදනීවයි; ඉච්ඡති, කැමති වේද;

429 සො පාපකම්මො දුම්මෙධො ජානං දුක්කත මත්තනො,
දලිද්දො ඉණ මාදාය භුඤ්ජ මානො විහඤ්ඤති.

430 තතො අනුචරන්ති නං සංකප්ප මානසා දුඛා,
ගාමෙ වා යදි වා රඤ්ඤෙ යස්ස විප්පටි සාරජා.

431 සො පාපකම්මො දුම්මෙධො ජානං දුක්කත මත්තනො,
යොනි මඤ්ඤතරං ගන්ත්වා නිරයෙ වා පි බජ්ඣති.

432 එතං හි බන්ධනං දුක්ඛං යම්හා ධීරා පමුච්චති,
ධම්ම ලද්ධෙහි භොගෙහි දදං චිත්තං පසාදයං.

---

සො, හෙතෙම; තහිං තහිං, ඒ ඒ තන්හි; පුනප්පුනං, නැවත නැවත; කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද; උදචෙතසා, නැවත සිතින්ද; පාපකම්මං, පාපකර්මය; පවඩ්ඪෙන්තො, ප්‍රකාරයෙන් වඩන්නේ; සංසප්පති, කම්පාවේ.

429 පාපකම්මො, පාපකර්මඇති; සොදුම්මෙධො, ඒ අඥානතෙම; අත්තනො, තමන්ගේ දුක්කතං, දුශ්චරිතය; ජානං, දන්නේ; දලිද්දො, (කුසල් රහිත බැවින්) දළිඳුවූයේ; ඉණං, (පෙර කළාවූ අකුසල් නමැති) ණය; ආදාය, ගෙන; භුඤ්ජමානො, චොදනාකරණය ලබන්නේ; විහඤ්ඤති, (කුශල ක්ෂයවීමහේතුකොටගෙණ) විශෙෂයෙන් නස්නේය.

430 තතො, එහෙයින්; ගාමෙවා, ගමෙහිහෝ; යදිවා, නොහොත්; අරඤ්ඤෙ, වනයෙහි හෝ; යස්ස, මොහු ගේ; විප්පටිසාරජා, විපිළිසරවශයෙන් උපන්නාවූ; දුඛා, දුක්වූ; යෙ සංකප්ප මානසා, සම්බන්ධවූ කල්පනා සිත් නමැතිනයහිම්හු; නං, ඔහු; අනුචරන්ති, පසුපස්සෙහි ලුහුබඳිත්.

431 පාපකම්මො, පාපකර්මඇති; සොදුම්මෙධො, ඒ අඥානතෙම; අත්තනො, තමන්ගේ; දුක්කතං දුශ්චරිතය; ජානං, දන්නේ; අඤ්ඤතරං යොනිං, එක්තරා (තිරිසන්) යොනියකට; ගන්ත්වා, ගොස්; බජ්ඣති, බැඳෙයි; අපි, නැවත; නිරයෙවා, නරකයෙහිහෝ බැඳෙයි.

432 යම්හා, යම්හෙයකින්; එතං හි බන්ධනං, මේ (නිරය) බන්ධනය වනාහි; දුක්ඛනයි, දුක්යයි; පමුච්චති, කියනුලැබේද; (එහෙයින්) ධීරො, (නුවණැත්තාවූ) පණ්ඩිතතෙම; ධම්මලද්ධෙහි, දැහැමින් ලද්දාවූ; භොගෙහි, භොගයන්; දදං, දෙන්නේ; චිත්තං, සිත; පසාදයං, පහදවන්නේය.

433 උභයත්ථ කටග්ගාහො සද්ධස්ස ඝරමෙසිනො,
දිට්ඨ ධම්ම හිතත්ථාය සම්පරාය සුඛාය ච.

434 එවං එතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪති;
තථෙව අරියෙ විනයෙ සද්ධා යස්ස පතිට්ඨිතා.

435 හිරී මනො ච ඔත්තාපී පඤ්ඤවා සීල සංවුතො,
එසො ඛො අරියෙ විනයෙ සුඛ ජීවති වුච්චති.

436 නිරාමිසං සුඛං ලද්ධා උපෙඛං අධිතිට්ඨති,
පඤ්ච නීවරණෙ හිත්වා නිච්ච මාරද්ධ වීරියො.

437 ඣානානි උපසම්පජ්ජ එකොදි නිපකො සතො,
එවං ඤත්වා යථා භූතං සබ්බ සංයොජනක්ඛයෙ.

438 සබ්බසො අනුපාදාය සම්මා චිත්තං විමුච්චති,
තස්ස සම්මා විමුත්තස්ස ඤාණං වෙ හොති තාදිනො.

---

433. ඝරමෙසිනො, ගෘහවාසයෙහි වසන්නාවූ; සද්ධස්ස, ශ්‍රද්ධාවන්තයාගේ; දිට්ඨධම්මහිතත්ථාය, ඉහාත්මයෙහි හිතපිණිසද; සම්පරාය සුඛායච, පරලොව සැපපිණිසද; උභයත්ථ, දෙලොවෙහි; කටග්ගාහො, ජයග්‍රහණය (හෙවත් දොස්නැත්තාවූ ගැණීම) වේ.

434. 435. එවං, මෙසේ; ගහට්ඨානං, ගෘහස්ථයන්ගේ; චාගො, ත්‍යාගයයි සංඛ්‍යාවට ගියාවූ; එතං පුඤ්ඤං, මේ පින; පවඩ්ඪති, වැඩේද; තථෙව, එපරිද්දෙන්ම; යස්ස, යමෙකුගේ; සද්ධා, ශ්‍රද්ධාතොමෝ; අරියස්සවිනයෙ, ආර්‍යවිනයෙහි; පතිට්ඨිතා, පිහිටියාද; හිරිමනොච, ලජ්ජාවෙන් යුක්ත සිත්ඇත්තේද; ඔත්තාපී, පාපයකෙරෙහි බිය සුලුවූද; පඤ්ඤවා, ප්‍රඥාවෙන් යුක්තවූද; සීලසංවුතො, ශීලයෙන් සංවෘතවූද; එසොඛො, ඒ මෙතෙම වනාහි; අරියෙ විනයෙ, ආර්‍යවිනයෙහි; සුඛ ජීවති, සුවයෙන් ජීවත්වන සුලුයයි; වුච්චති, කියනුලැබේ.

436. 437. 438. නිච්චං, නිරන්තරයෙන්; ආරද්ධවීරියො, සම්පූර්ණ (කායික චෛතසික) වීර්‍යය ඇති; පඤ්චනීවරණෙ, කාමච්ඡන්දාදි පඤ්චනීවරණයන්; හිත්වා, හැර; නිරාමිසංසුඛං, දහන්ධ්‍යාන ආශ්‍රයකොට උපදනා සුවය; ලද්ධා, ලැබ; උපෙඛං, චතුර්ථධ්‍යානය පිළිබඳ උපෙක්ෂාවෙහි; අධිතිට්ඨති, සිටීද; ඣානානි, සිව්දහන්; උපසම්පජ්ජ, පැමිණ; එකොදි, එකඟසිත් ඇත්තේද; නිපකොසතො, ඥානස්මෘති දෙකින් යුක්තවූයේද; එවං, මෙසේ; යථාභූතං, තත්වූපරිද්දෙන්;

439 අකුප්පා මෙ විමුත්තී ති  භව සංයොජනක්ඛයෙ,
එතං ඛො පරමං ඤාණං  එතං සුඛ මනුත්තරං;
අසොකං විරජං ඛෙමං  එතං ආණණ්‍ය මුත්තමන්ති.

440 න උස්සෙසු න ඔමෙසු  සමත්තෙ නො පනීයරෙ,
ඛීණා සඤ්ජාති වුසිතං  බ්‍රහ්මචරියං චරන්ති සඤ්ඤොජන
විප්පමුත්තා,ති.

---

ඤත්වා,(මෙතෙක් කරුණු) දැන; සබ්බසංයොජනක්ඛයෙ, සියලු සංයොජනයන් ක්‍ෂයකරන්නාවූ නිර්වාණයෙහි; සබ්බසො, සර්වාකාරයෙන්; අනුපාදාය,(තෘෂ්ණා දෘෂ්ටිවශයෙන්) නොගෙන; චිත්තං, (යමකුගෙ)මාර්ගචිත්තය; සම්මා, මනාකොට; විමුච්චති, මිදේද; තස්ස සම්මා විමුත්තස්ස, ඒ මනාකොට මිදුනාවූ (සිත් ඇති) තාදිනො, ක්‍ෂීණාශ්‍රව හුගේ; වෙ, ඒකාන්තයෙන්; ඤාණංහොති, (ප්‍රත්‍යවෙක්‍ෂා) ඥානය ඇතිවේ.

439 මෙ, මාගේ; භවසංයොජනක්ඛයෙ, භවසංයොජනයන් ක්‍ෂයකිරීම් සඞ්ඛ්‍යාතනිර්වාණයෙහි; විමුත්ති, මිදීම; හෙවත් මාර්ගවිමුක්තිය හා ඵලවිමුක්තිය; අකුප්පාති, (කෙලෙස්සතුරන් විසින් කොප්‍යකලනොහැකි අරමුණුඇතිබැවින් හා කොප්‍යකරන්නාවූ රාගාදි ක්ලෙශරහිත බැවින්) අකොප්‍යයයි; (මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා ඥානය ඇතිවේ) එතංඛො, මේ මාර්ගඵල ඥානයවනාහි; පරමංඤාණං,(භවසංයොජනයන් ක්‍ෂයවීම් කෙළවරෙහි උපන්බැවින්) උත්තමඥානය වේ; එතං, මේතෙම; අනුත්තරං සුඛං, නිරුත්තරවූ සුවයවේ; එතං, මේතෙම; අසොකං, ශොකරහිතවූ; විරජං, රාගරජස්රහිතවූ; ඛෙමං, නිරුපද්‍රවූ; උත්තමං, උතුම්වූ; ආණණ්‍යං, රාගාදි ක්ලෙශණය නැතිබවවේ; (අර්හත්ඵලයයි යස්සි).

440 උස්සෙසු, ශ්‍රේෂ්ඨපුද්ගලයන් කෙරෙහි; නඋපනීයරෙ, (කී කෙලශිහු මානයෙන්) නොඑළඹෙත්; ඔමෙසු, හීනපුද්ගලයන් කෙරෙහිද; න,(මානයෙන්) නොඑළඹෙත්; සමත්තෙ, සමානපුද්ගලයා කෙරෙහිද; න,(මානයෙන්) නොඑළඹෙත්; ඛීණාසඤ්ජාති,(ඒක්‍ෂීණාශ්‍රවයන්ගේ අර්හත්මාර්ගයෙන්) ක්‍ෂයවූ ජාතිඇත්තීය; වුසිතං, වැසනිමවනලද; බ්‍රහ්මචරියං,මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවෙහි; සබ්බසඤ්ඤොජනවිප්පමුත්තා, සියලු සංයොජනයන් කෙරෙන් විශෙෂයෙන් මිදුනාහු; චරන්ති, හැසිරෙත්ය.

441 සුනෙත්තො මූග පක්ඛො ච   අරනෙමි ච බ්‍රාහ්මණො,
කුද්දාලකො අහු සත්ථා   හත්ථිපාලො ච මාණවො.

442 ජොතිපාලො ච ගොවින්දො   අහු සත්ත පුරොහිතො,
අහිංසෙ තො අතීතංසෙ   ඡ සත්ථාරො යසස්සිනො.

443 නිරාම ගන්ධා කරුණෙ ධිමුත්තා   කාම සංයොජනාතිගා,
කාම රාගං විරාජෙත්වා   බ්‍රහ්ම ලොකූපගා අහූ.

444 අහෙසුං සාවකා තෙසං   අනෙකානි සතානි පි,
නිරාම ගන්ධා කරුණෙ ධිමුත්තා   කාමසං යොජනාතිගා;
කාම රාගං විරාජෙත්වා   බ්‍රහ්ම ලොකූපගා අහූ.

---

**441. 442.** සුනෙත්තො, සුනෙත්‍ර නම් ශාස්තෘද; මූගපක්ඛොච, මූගපක්ෂ නම් ශාස්තෘද; බ්‍රාහ්මණො,(බ්‍රාහ්මණ වංශයෙහි උපන් ගෙසින් නොහොත් බැහැරකරණලද පව්ඇතිබැවින්)බ්‍රාහ්මණවූ; අරනෙමිච,අරනෙමිනම්ශාස්තෘද, කුද්දාලකොඅහු.(යමෙක්)කුද්දාලක පණ්ඩිතවූයේද; සත්ථා.(ඒ)ශාස්තෘද; මාණවො, මාණවකවූ; හත්ථිපාලොච, හස්තිපාල නම් ශාස්තෘද; සත්තපුරොහිතො, රේණුආදිවූ සත් රජුන්ට (ඓහලෞකික පාරලෞකික අර්ථයන් පිරියයුතු බැවින්ද) පුරොහිතවූ; ගොවින්දො, මහා ගොවින්දයයි කියනලද; අහු, (යමෙක්) වූයේද; ජොතිපාලොච, (ඒ) ජොතිපාල නම් ශාස්තෘද යන; යසස්සිනො, මහපිරිවරඇති; එතෙ ඡසත්ථාරො, මේශාස්තෘසදෙන; අතීතංසෙ, අතීතකාලයෙහි; අහිංසා, හිංසා නොකටයුත්තාහු වූහ.

443 නිරාමගන්ධා. ක්‍රොධනමැති ආමගන්ධ රහිතවූ; හෙවත් ක්‍රොධයයි කියනලද දුගඳින් තොරවූ; කරුණෙධිමුත්තා, කරුණාධ්‍යාශයෙහි හා කරුණා පූර්වභාගයෙහි පිහිටියාවූ; කාමසංයොජනාතිගා කාමසංයොජනයන් ඉක්මෙව්වාවූ; (ඒ ශාස්තෘහු තුමූ) කාමරාගං, කාමරාගය; විරාජෙත්වා, දුරුකොට; බ්‍රහ්මලොකූපගා, බ්‍රහ්මලොකයට ගියාහු; අහූ, වූහ.

44 තෙසං, ඒ ශාස්තෘවරයන්ගේ; අනෙකානි සතානිපි, නොයෙක් සියගණන්ද; සාවකා, ශ්‍රාවකයෝ; අහෙසුං, වූහ; නිරාමගන්ධා, ක්‍රොධාමගන්ධරහිතවූ; කරුණෙධිමුත්තා, කරුණාධ්‍යාශයෙහි හා කරුණාපූර්වභාගයෙහි පිහිටියාවූ; කාමසංයොජනාතිගා, කාමසංයොජනයන් ඉක්මෙව්වාවූ; (ඒ ශ්‍රාවකයෝද) කාමරාගං, කාමරාගය; විරාජෙත්වා, දුරුකොට; බ්‍රහ්මලොකූපගා, බ්‍රහ්මලොකයට ගියාහු; අහූ, වූහ.

445 යෙ තෙ ඉසී බාහිරකෙ වීත රාගෙ සමාහිතෙ,
පදුට්ඨ මන සඞ්කප්පො යො නරො පරිභාසති;
බහුඤ්ච සො පසවති අපුඤ්ඤං තාදිසො නරො.

446 යඤ්චෙතං දිට්ඨි සම්පන්නං භික්ඛුං බුද්ධස්ස සාවකං,
පදුට්ඨ මන සඞ්කප්පො යො නරො පරිභාසති.

447 අයං තතො බහුතරං අපුඤ්ඤං පසවෙ නරො,
න සාධු රූපං ආසීදෙ දිට්ඨිට්ඨානප්පහායිනං.

448 සත්තමො පුග්ගලො එසො අරිය සඞ්ඝස්ස වුච්චති,
අවීතරාගො කාමෙසු යස්ස පඤ්චින්ද්‍රියා මුදූ.

449 සද්ධා සති විරියඤ්ච සමථො ච විපස්සනා,
තාදිසං භික්ඛුං ආසජ්ජ පුබ්බෙව උපහඤ්ඤති;
අත්තානං උපහන්ත්වා සො පච්ඡා අඤ්ඤං විහිංසති.

---

445 බාහිරකෙ, (ශාසනයෙන් පිටත් හෙයින්) බාහිරවූ; වීතරාගෙ. (විෂ්කම්භනවශයෙන්) පහකරණලද රාගයඇති; සමාහිතෙ, එකඟසිත්ඇති; එතෙ ඉසී, මහර්ෂීන්ට; යොනරො, යම් මනුෂ්‍යයෙක්තෙම; පදුට්ඨමනසඞ්කප්පො, දුෂ්ටචිත්තසංකල්පනා ඇත්තේ; පරිභාසති, පරිභවකෙරේද; තාදිසො, එබඳුවූ; සොනරො, ඒමනුෂ්‍යතෙම; බහුඤ්ච අපුඤ්ඤං, බොහෝ අකුසල්ද; පසවති, රැස්කෙරේ.

**446. 447.** බුද්ධස්සසාවකං, සර්වඥශ්‍රාවකවූ; දිට්ඨිසම්පන්නං, සෝවාන්වූ; යං එතං භික්ඛුං, යම් එක් භික්ෂුවකට; යොනරො, යම්මනුෂ්‍යයෙක්තෙම; පදුට්ඨමනසංකප්පො, දුෂ්ටචිත්ත සංකල්පනා ඇත්තේ; පරිභාසතිච, පරිභවකෙරේද; අයංනරො, මේමනුෂ්‍යතෙම; තතො, ඊටවඩා; බහුතරං, අතිශයින් බොහෝවූ; අපුඤ්ඤං, අකුසල්; පසවෙ, රැස්කෙරේ; සාධුරූපං, සාධුස්වභාවයඇති; දිට්ඨිට්ඨානප්පහායිනං, (දෙසැට) දෘෂ්ටිස්ථානප්‍රහාණකිරීමද; නආසීදෙ, වැලඳගෙනා ගන්නේය.

**448. 449.** යස්ස, යමකුගේ; සද්ධා, ශ්‍රද්ධාවද; සති, ස්මෘතියද; විරියඤ්ච, වීර්‍ය්‍යයද; සමථොච, ශමථයද; (සංසිඳීමද) විපස්සනා, සංස්කාර පරිග්‍රහඥානයද;(යන) පඤ්චින්ද්‍රියා, පඤ්චෙන්ද්‍රියයෝ; මුදූ, මෘදු

450 සො ච රකඛති අතතානං රකඛිතො තසස බාහිරො,
තසමා රකෙඛය්‍ය අතතානං අකඛතො පණ්ඩිතො සදා,ති.

“ධම්මික වගගො පඤචමො.”
පඨමො පණණාසකො.

—— 0 ——

451 නෙකඛමමං අධිමුතතසස පවිවෙකඤච චෙතසො,
අබ්‍යාපජ්ඣාධිමුතතසස උපාදානකඛයසස ච.

452 තණහකඛයාධිමුතතසස අසමෙමාහඤච චෙතසො,
දිසවා ආයතනුපපාදං සමමා චිතතං විමුච්චති.

---

වෙත්ද*; කාමෙසු, කාමයන්හි; අවීතරාගො, අවිගතරාග ඇත්තේද×; සො, ඒ පුද්ගලතෙම; අරියසඞඝසස, ආර්‍ය්‍යසඞ්ඝයා පිළිබඳව; සතතමො පුගගලො, සත්වන පුද්ගලයෙක්; තාදිසො, එබඳුවූ; භිකඛුං, භික්ෂුවක්හට; ආසජජ, එළඹ, හොහොත් තාදිසං භිකඛුං, එබඳු භික්ෂුවකට; ආසජජ, කොපව; උපහඤඤති, පීඩා කෙරේද; සො, ඒ පුරුෂතෙම; පුබබෙව, පළමුකොටම; අතතානං, තමන්ට; උපහනතවා, පීඩාකොට; පචඡා, පසුව; අඤඤං, අනිකකුහු; විහිංසති, හිංසාකෙරෙයි.

450 සොච, සමෙක්තෙමේද; අතතානං, ආත්මය; රකඛති, රකීද; තසස, ඔහුගේ; බාහිරො, බාහිරය; රකඛිතො, රක්නාලදී; තසමා, එහෙයින්; පණඩිතො, පණ්ඩිතතෙම; සදා, හැමකල්හි; අකඛතො, ගුණ නැසීමෙන් නොනැසුනේ; අතතානං, ආත්මය; රකෙඛය්‍ය, රක්නේය.

451, 452. නෙකඛමමං, (සකල කෙලශයන්ගෙන් නික්මුණු හෙයින් අර්හත් සඞ්ඛ්‍යාත) නෛෂ්ක්‍රම්‍යයද; චෙතසො, චිත්තයාගේ; පවිවෙකඤච, (එම කෙලෙසුන් කෙරෙන්) ප්‍රකාරයෙන් වෙන්වීම ඇතිබවද; අධිමුතතසස, අවබොධකොට සිටියාවූද; අබ්‍යාපජ්ඣං, නිදුක්බවද; උපාදානකඛයසස † ච, උපාදානයාගේ ක්ෂයකිරීම ඇතිබවද; අධිමුතතසස, අවබොධකොට සිටියාවූද; තණහකඛයං, තෘෂ්ණා ක්ෂයකිරීමද; චෙතසො, චිත්තයාගේ; අසමෙමාහඤච,

---

* සෙදගැම්බව සඳහා පඤ්චෙන්ද්‍රියයෝ මෘදුවෙත්,
× මෙයින් අනාගාමි භාවය ප්‍රතික්ෂෙප කෙරෙයි.
† “උපාදනක්ඛයස්ස,, යනු උපයොගාර්ථයෙහි සාමිවිභක්තියි,

453 තස්ස සම්මා විමුත්තස්ස සන්ත චිත්තස්ස භික්ඛුනො,
කතස්ස පටිචයො නත්ථි කරණීයං න විජ්ජති.

454 සෙලො යථා එකඝනො වාතෙන න සමීරති,
එවං රූපා රසා සද්දා ගන්ධා ඵස්සා ච කෙවලා.

455 ඉට්ඨා ධම්මා අනිට්ඨා ච නප්පවෙධෙන්ති තාදිනො,
ඨිතං චිත්තං විප්පමුත්තං වයඤ්චස්සානුපස්සති, ති.

456 යො උභන්තෙ විදිත්වාන මජ්ඣෙ මන්තා න ලිම්පති,
තං බ්‍රෑමි මහා පුරිසොති සො ධ සිබ්බනි මච්චගා, ති.

457 සොඋභන්තෙන විදිත්වාන=පෙ=සොධ සිබ්බනි මච්චගා, ති.

---

මුලානොවිම්ද; අධිමුත්තස්ස, අවබොධකොට සිටියාවූද; (යම් ක්ෂීණාශ්‍රවයකුගේ) ආයතනුප්පාදං, ආයතනයන්ගේ ඉපදීමහාවිනාශය; දිස්වා, දැක; චිත්තං, සිත; සම්මා, මනාකොට; විමුච්චති, (මේ විදර්ශනා ප්‍රතිපත්තිය ඇරඹිවූ ඵලසමාපත්ති වශයෙන්) විශෙෂයෙන් මිදේද; (නොහොත් ක්ෂයකරණලද ආශ්‍රව ඇත්තාහුගේ ආයතනයන්ගේ ඉපදීමදැක මේ විදර්ශනාවෙන් අධිගතආර්‍ය්‍යමාර්ගානුභාවයෙන් සියලු කෙලෙසුන් කෙරෙන් මනාව සිතමිදේසි.)

453 සම්මා විමුත්තස්ස, මෙසේ මනාකොට මිදුනාවූ; සන්ත චිත්තස්ස, නිවුනාවූ සිත් ඇති; තස්ස භික්ඛුනො, ඒ භික්ෂුහු විසින්; කතස්ස, කරණලද්දක්හුගේ; පටිචයො, නැවත නැවත වැඩීමෙක්; නත්ථි, නැත්තේය; කරණීයං, කටයුත්තෙක්; නත්ථි, නැත්තේය.

454. 455. එකඝනො, එකඝනවූ; සෙලො, පර්වතය; වාතෙන, (සතරදිගින් හමන්නාවූ) වාතයෙන්; නසමීරති, (යම්සේ) කම්පා නොවේද; එවං, මෙපරිද්දෙන්; රූපා, රූපාලම්බනයෙන්ද; රසා, රසාලම්බනයෙන්ද; සද්දා, ශබ්දාලම්බනයෙන්ද; ගන්ධා, ගන්ධාලම්බනයෙන්ද; ඵස්සාච, ස්පර්ශාලම්බනයෙන්ද; කෙවලා, හුදකලාව; ඉට්ඨාධම්මා, ප්‍රියකාරණයකින්ද; අනිට්ඨාච, අප්‍රියකාරණයකින්ද; තාදිනො, (ලාභාලාභාදියෙහි අකම්ප්‍ය හෙයින්) තාදීවූ; (ක්ෂීණාශ්‍රවයෝ) නප්පවෙධෙන්ති, කම්පානොවෙති; චිත්තං, සිත; විප්පමුත්තං, (රාගාදිකෙලශයන්කෙරෙන්) විශෙෂයෙන්මිදුනේද; ඨිතං, පිහිටියේනම්වේ; අස්ස, ඒචිත්තයාගේ; වයඤ්ච, (ඉපදීමහා) නැසීමද; අනුපස්සති, (ක්ෂීණාශ්‍රවතෙම) නැවත නැවත දකියි.

456. 457. යො, යමෙක්තෙම; උභොඅන්තෙ, (මේ ආත්මභා

458 සංකප්පරාගො පුරිසස්ස කාමො
නෙ තෙ කාමා යානි චිත්‍රානි ලොකෙ,
(සංකප්පරාගො පුරිසස්ස කාමො)
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන්ති.
"ද්‍රිහා වග්ගො ඡට්ඨො,,

## ඡක්ක නිපාතො සමත්තො.

459 සද්ධා බලං විරිය බලං හිරි ඔත්තප්පියං බලං,
සති බලං සමාධි ච පඤ්ඤා, චෙ සත්තමං බලං;
එතෙහි බලවා භික්ඛු සුඛං ජීවති පණ්ඩිතො,

---

වය අනාගතාත්මභාවය යන) නොතනවය; මතානා, නුවනින්; විදිත්වා, දැන; මජ්ඣෙ, (මධ්‍යයයි කියනලද) නිර්වාණයෙහි පිළිමපති, තෘෂ්ණාලෙපයෙන් ආලෙපනෙනෙවේද, සො, හෙතෙම; ඉධ, මේශාසනයෙහි; සබ්බන්තං, සබ්බනීසබ්බාතතෘෂ්ණාව; අච්චගා, ඉක්මවූයේවෙයි; තං, ඔහු; මාහාපුරිසොති, මහාපුරුෂයයි; බ්‍රෑමි, කියමි.

458. පුරිසස්ස, පුරුෂයාගේ; සංකප්පරාගො, සංකල්පනාවශයෙන් උපන්නාවූ රාගය තෙම; කාමො, (කාමය දුරුකිරීම පිණිස පිළිපන්නාවුන් විසින් පහකළයුතු බැවින් හා සමතාජීයෙන්ද) කාමනම්වේ; ලොකෙ, ලොකයෙහි; යානිචිත්‍රානි, යම්විසිතුරු අරමුණු ඇද්ද; එතෙ, මොහු; නකාමා, කාමයෝනොවෙති; ලොකෙ, ලොකයෙහි; තථෙව, එසේම; චිත්‍රානි, විසිතුරු අරමුණු; තිට්ඨන්ති, විද්‍යමානවෙත්; අථ, එසේදැවත්; එත්ථ, මෙලොකයෙහි; ධීරා, බුද්ධිමත්පණ්ඩිතයෝ; ඡන්දං, කාමච්ඡන්දය; විනයන්ති, හික්මවත් (දුරුකෙරෙත්).

459 සද්ධාබලං, (අශ්‍රද්ධියෙන් නොසෙල්විය හැකිවූ) ශ්‍රද්ධාබලයද; විරියබලං, (කුසීතභාවයෙන් නොසෙල්විය හැකිවූ) වීර්‍ය්‍යබලයද; හිරිඔත්තප්පියං බලං, (කායදුශ්චරිතාදි පාපයෙහි නිර්ලජ්ජාවෙන් නොසෙල්විය හැකිවූ) හිරිබලයහා (පාපයට බියසුලුනාවීමෙන් නොසෙල්විය හැකිවූ) ඔත්තප්පබලයද; සතිබලං, (සිහිමුළා බැවින්

---

මේ ( ) ලකුණ තුළ තිබෙන පදය ගාථාවේ මුලපදය බැවින් ගාථාවටමේ පදය ලෙඛකයන්ගේ වශයෙන් වැඩිවූවක්සේද හැගේ, එසේද උවත් දක්නාලද පොත්වල පස්පෙළක්ම තිබුණු බැවින් මෙහිද යෙදුයෙමි අර්ථකළෙමයි.

460 යොනිසො විචිනෙ ධම්මං පඤ්ඤායත්ථං විපස්සති,
පජ්ජොතස්සෙව නිබ්බානං විමොක්ඛො හොති චෙතසො,ති.

461, 462 සද්ධාබලං විරියබලං =පෙ= විමොක්ඛො හොති චෙතසො,ති

463 සද්ධා ධනං සීල ධනං හිරිඔත්තප්පියං ධනං,
සුත ධනඤ්ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

464 යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා,
අදළිද්දොති තං ආහු අමොඝං තස්ස ජීවිතං.

---

නොසෙල්විය හැකිවූ) ස්මෘතිබලයද; සමාධිච, (නොසන් සුන් සිතින් නොසෙල්විය හැකිවූ) සමාධිබලයද; පඤ්ඤා, (අවිද්‍යාවෙන් නොසෙල්විය හැකිවූ) ප්‍රඥාබලය; වෙ, ඒකාන්තයෙන්; සත්තමං බලං, සත්වනබලයවේ; එතෙහි, මේ සප්තවිධබලයෙන්; බලවා, බලවත්වූ; පණ්ඩිතොහිසාධු, පණ්ඩිතාභියුක්තතෙම; සුඛං, සැපසේ; ජීවති, ජීවත්වේ.

460 යොනිසො, උපායෙන්; ධම්මං, (චතුරාර්‍ය්‍යසත්‍ය)ධර්මය, විචිනෙ, සොයාද; පඤ්ඤාය, (විදර්ශනා සහිතමාර්ග) ප්‍රඥාවෙන්; අත්ථං, චතුරාර්‍ය්‍යසත්‍යධර්මය;විපස්සති,විශෙෂයෙන්දකීද;(එබඳුවූභික්ෂුවගේ) පජ්ජොතස්ස, ප්‍රදීපයාගේ; නිබ්බාණංව, නිවීමමෙන්; චෙතසො, (පශ්චිම)චිත්තයාගේ; විමොක්ඛොහොති,(වස්තුඅරමුණින්)මිදීමවේ. (ශියතැන නොපැමිණෙයි)

461. 462. (459. 460. වෙනි අඩක බලනු)

463 සද්ධාධනං, (රත්නත්‍රයෙහි සම්ප්‍රසාදලක්ෂණ) ශ්‍රද්ධාධනයද; සීලධනං, (පඤ්චශීලඅෂ්ටාඞ්ගශීලාදී) ශීලධනයද; හිරිඔත්තප්පියං ධනං, (ලජ්ජාවියයුතු කායදුශ්චරිතාදියෙන් පිළිකුල්කරන්නාවූ) හිරිධනයද (භයවියයුතු කාය දුශ්චරිතාදී පාපයට බියසුලු බැව් ඇති) ඔත්තප්පධනයද; සුතධනඤ්ච, (ආගමාධිගමයයි කියනලද) ශ්‍රැතධනයද; චාගොච, (පසුවූ මසුරුමල ඇති සිතින් දුන වස්තුපරිත්‍යාගකර්මයයි කියනලද) ත්‍යාගධනයද; පඤ්ඤා, (මාර්ගඵල ප්‍රතිසම්භිදාදිය ප්‍රකාරයෙන් දැනීම්ලක්ෂණඇති) ප්‍රඥාධනය; වෙ, ඒකාන්තයෙන්; සත්තමංධනං, සත්වනධනයවේ.

464 යස්ස, යම්බඳුවූ; ඉත්ථියා වා, ස්ත්‍රියකටහෝ; පුරිසස්ස වා, පුරුෂයකුටහෝ; එතෙ ධනා, මේ සප්තාර්‍ය්‍යධනයෝ; අත්ථි, ඇත්තාහු

465 තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්මදස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

466. 467. 468. සද්ධාධනං සීලධනං =පෙ= සරං බුද්ධාන
සාසනන්ති.

469 සද්ධා ධනං සීල ධනං හිරි ඔත්තප්පියං ධනං,
සුතධනඤ්ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං.

470 යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා,
ස වෙ මහද්ධනො ලොකෙ අජෙය්‍යො දෙවමානුසෙ.

471 තස්මා සද්ධඤ්ච සීලඤ්ච පසාදං ධම්ම දස්සනං,
අනුයුඤ්ජෙථ මෙධාවී සරං බුද්ධාන සාසනන්ති.

"ධන වග්ගො සත්තමො"

"අනුසය වග්ගො දුතියො"

—0—

---

හුද; තං, ඔහු; අදළිද්දොති, දිළිඳු නොවේයයි; ආහු, කියත්; තස්ස, ඔහුගේ; ජීවිතං, ජීවිතවෘත්තිය; අමොඝං, සිස්නොවේ.

465 තස්මා, එහෙයින්; මෙධාවී, පණ්ඩිත තෙම; බුද්ධානසාසනං, බුදුන්ගේ අනුශාසනාව; සරං, සිහිකරන්නේ; සද්ධඤ්ච, ශ්‍රද්ධාවද; සීලඤ්ච, සීලයද; පසාදං, පැහැදීමද; ධම්මදස්සනං, ධර්ම දැකීමද; අනුයුඤ්ජෙථ, යොදන්නේය.

466. 467. 468. (463. 464. 465. වෙනි අඞ්ක බලනු)

469. (463. වෙනි අඞ්කය බලනු)

470 යස්ස, යම්බඳුවූ; ඉත්ථියා, ස්ත්‍රියකටහෝ; පුරිසස්සවා, පුරුෂයකුටහෝ; එතෙධනා, මේසප්තාර්‍ය්‍යධනයෝ; අත්ථි; ඇත්තාහුද; ලොකෙ, මේලොකයෙහි; සො, හෙතෙම; වෙ, ඒකාන්තයෙන්; මහද්ධනො, මහත්ධන ඇත්තෙක්වේ; දෙවමානුසෙ, දිව්‍යමනුෂ්‍ය සත්වකාරෙහි; අජෙය්‍යො, නොපැරදවියහැක්කේවී.

471. (465. වෙනි අඞ්කය බලනු)

472 දස්සනං භාවිතත්තානං යො හාපෙති උපාසකො,
සවණඤ්චාරිය ධම්මානං අධිසීලෙ න සික්ඛති.

473 අප්පසාදො ච භික්ඛූසු භීයො භීයො පවඩ්ඪති,
සඋපාරම්භ චිත්තො ච සද්ධම්මං සොතු මිච්ඡති.

474 ඉතො ච බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං ගවෙසති,
තත්ථෙව ච පුබ්බකාරං යො කරොති උපාසකො.

475 එතෙ ඛො පරිහානීයෙ සත්ත ධම්මෙ සුදෙසිතෙ,
උපාසකො සෙවමානො සද්ධම්මා පරිහායති.

476 දස්සනං භාවිතත්තානං යො න හාපෙති උපාසකො,
සවණඤ්චාරිය ධම්මානං අධිසීලෙ ච සික්ඛති.

477 පසාදො චස්ස භික්ඛූසු භීයො භීයො පවඩ්ඪති,
අනුපාරම්භ චිත්තො ච සද්ධම්මං සොතු මිච්ඡති.

478 න ඉතො බහිද්ධා අඤ්ඤං දක්ඛිණෙය්‍යං ගවෙසති,
ඉධෙව ච පුබ්බකාරං යො කරොති උපාසකො.

479 එතෙ ඛො අපරි හානියෙ සත්ත ධම්මෙ සුදෙසිතෙ,
උපාසකො සෙවමානො සද්ධම්මා න පරිහායතී,ති.

---

472. 473. 474. 475. යො උපාසකො, යම් උපාසකයෙක් තෙම; භාවිතත්තානං, වඩනලද සිත් ඇත්තාවූන්ගේ; භෙවත් භික්ෂූන්ගේ; දස්සනං, දැකීම පිණිස යාමද; අරියධම්මානං, ආය්‍යීධර්මයන්ගේ; සවණඤ්ච, ඇසීම පිණිස යාමද; හාපෙති, වලක්වාද; අධිසීලෙ, (පඤ්චශීල දශශීල සඞ්ඛ්‍යාත) උත්තම්ශීලයෙහි; නසික්ඛති, නොහික්මේද, භික්ඛූසු, භික්ෂූන්කෙරෙහි; අප්පසාදොච, නොපැහැදීමද; භීයො භීයො, වඩවඩා; පවඩ්ඪති, වැඩේද; සඋපාරම්භ චිත්තොච, ගර්හාකරණ සිත් ඇත්තේ; සද්ධම්මං, සද්ධර්මය; සොතුං, අසන්ට; ඉච්ඡති; කැමත්තේද. ඉතොච බහිද්ධා, මේශාසනයෙන් පිටද, අඤ්ඤංදක්ඛිණෙය්‍යං, අන්‍යදක්ෂිණාහීයන්හු; ගවෙසති, සොයාද; තත්ථෙවචපුබ්බකාරං, ඒ බාහිරතීර්ථකයන්ටදී පසුව භික්ෂූන්ටදීම; කරොති, කෙරේද; සුදෙසිතෙ, මනාකොට දෙශනාකරණලද; එතෙඛො සත්තපරිහානියෙධම්මෙ, මේ සප්තපරිහානීය ධර්මයන්; සෙවමානො, සෙවනය කරන්නාවූ; උපාසකො, උපාසකතෙම; සද්ධම්මා, සද්ධර්මයෙන්; පරිහායති, පිරිහෙයි.

476. 477. 478. 479. යොඋපාසකො, යම්උපාසකයෙක්තෙම; භාවිතත්තානං, භික්ෂූන්ගේ; දස්සනං, දැකීමටයාමද, අරියධම්මානං,

480. සිට. 483. දසසතං භාවිතත්තානං=පෙ=සද්ධම්මා
පරිහායන්.

484. සිට. 487. දසසතං භාවිතත්තානං=පෙ=සද්ධම්මා
න පරිහායන්ති, ති.

"වජ්ජිසත්තක වග්ගො තතියො,,

488 සත්ථු ගරු ධම්ම ගරු සඞ්ඝෙ ච තිබ්බ ගාරවො,
සමාධි ගරු ආතාපී සික්ඛාය තිබ්බ ගාරවො.

489 අප්පමාද ගරු භික්ඛු පටි සන්ථාර ගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙව සන්තිකෙ, ති.

---

ආර්‍ය්‍යධර්‍මියන්ගේ; සවණ්ණදුව, ඇසීමටයාමද; න හාපෙන්ති, නොවළක්වාද; අධිසීලෙව, (පඤ්චශීල අෂ්ටාඞ්ගශීල සඞ්ඛ්‍යාත) උත්තම ශීලයෙහි; සික්ඛන්ති, හික්මෙද්ද; භික්ඛුසු, භික්ෂූන්කෙරෙහි; අස්ස, මොහුගේ; පසාදෙව, පැහැදීමද; භීයොභීයො, වඩවඩා; පවඩ්ඪන්ති, වැඩේද; අනුප්‍රයාරමහවිතෙනාව, දෙශශරාපණිය ගෙහාකරණසින් ඇත්තේ; සද්ධම්මං, සධර්‍මය; සොතුං, අසන්ට; ඉච්ඡති, කැමතිවේද; යො උපාසකො, යම් උපාසකයෙක්තෙම; ඉතොචබහිද්ධා, මේ ශාසනයෙන්පිටද; අඤ්ඤංදක්ඛිණෙය්‍යං, අන්‍යදක්ෂිණාභියන්නු; න ගවෙසති, නොසොයාද; ඉධචව, මේශාසනයෙහි(දක්ෂිණාභියන්ට) පුබ්බකාරං, පූර්වසත්කාරය;(දීම)කරොති, කෙරේද; සුදෙසිතො, මනාකොට දෙශනා කරණලද; එතෙ ඛො සත්ත අපරිහානීයෙ ධම්මෙ, මේ සප්තාපරිහානියධර්‍මයන්, සෙවමානො,සෙවනයකරන්නාවූ; උපාසකො, (ඒ) උපාසකතෙම; සද්ධම්මා, සධර්‍මයෙන්; න පරිහායති,නොපිරිහෙයි.

480. සිට. 487. (472. සිට. 479. වෙනි අඞ්ක බලනු)

488. 489. ආතාපී, කෙලෙස්තවන සුලුවූ භික්ෂුතෙම; සත්ථුගරු, ශාස්තෘන්වහන්සේ ගරුකොට ඇත්තේද; ධම්මගරු, ධර්‍මයගරුකොට ඇත්තේද; සඞ්ඝෙච, සංඝයාකෙරෙහිද; තිබ්බගාරවො, තියුණුවූගෞරවයඇත්තේද; සික්ඛාය, ශික්ෂාවෙහි; තිබ්බගාරවො, තියුණුවූගෞරවය ඇත්තේද; අප්පමාදගරු, අප්‍රමාදයගරුකොට ඇත්තේද; පටිසන්ථාරගාරවො, (ධර්‍මාමිසවශයෙන් ද්විප්‍රකාරවූ) පිළිසඳරෙහි ගෞරවඇත්තේද; භික්ඛු, (එබඳු) භික්ෂුතෙම; පරිහානාය, පිරිහීමට; අභබ්බො; අයොග්‍යවේ; නිබ්බාණස්සෙව, නිර්‍වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහිවේ.

490 සත්‍ථු ගරු ධම්ම ගරු=පෙ=සික්ඛාය තිබ්බ ගාරවො.

491 හිරි ඔත්තප්ප සම්පන්නො සප්පතිස්සො ස ගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ,ති.

492 සත්‍ථු ගරු ධම්ම ගරු=පෙ=සික්ඛාය තිබ්බ ගාරවො,

493 කල්‍යාණ මිත්තො සුවචො සප්පතිස්සො ස ගාරවො,
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ,ති,

494 දුද්දදං දදාති මිත්තො දුක්කරං වාපි කුබ්බති,
අථොපිස්ස දුරුත්තානි ඛමති දුක්ඛමානිපි,

495 ගුය්හඤ්ච තස්ස අක්ඛාති ගුය්හස්ස පරිගුය්හති,
ආපදාසු න ජහාති ඛීණෙන නාතිමඤ්ඤති.

496 යම්හි එතානි ඨානානි සංවිජ්ජන්තීධ පුග්ගලෙ,
සො මිත්තො මිත්තකාමෙන භජිතබ්බො තථාවිධො,ති.

---

490. (488. වෙනි අඞ්කය බලනු) 491. හිරිඔත්තප්ප සම්පන්නො, පාපයෙහි ලජ්ජාභයදෙකින් යුක්තවූ; සප්පතිස්සො, ජ්‍යෙෂ්ඨයාසහිතවූ; හෙවත් ගුරුආශ්‍රයඇති; සගාරවො, (ගරුතන්හිතැබියයුතු අනිකක්හු කෙරෙහි) ගෞරවසහිතවූ; (භික්ෂුතෙම) පරිහානාය, පිරිහීමට; අභබ්බො, අයොග්‍යවේ; නිබ්බානස්සෙව, නිර්වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහිවේ.

492 (488 වෙනි අඞ්කය බලනු) 493. කල්‍යාණමිත්තො, කල්‍යාණමිත්‍රයන් ඇත්තාවූ; සුවචො, සුවචවූ; සප්පතිස්සො, ජ්‍යෙෂ්ඨයාසහිතවූ; හෙවත් ගුරුආශ්‍රයඇති; සගාරවො, (ගරුතන්හිතැබියයුතු අතිකක්හු කෙරෙහි) ගෞරවසහිතවූ; (භික්ෂුතෙම) පරිහානාය, පිරිහීමට; අභබ්බො, අයොග්‍යවේ; නිබ්බානස්සෙව, නිර්වාණයාගේම; සන්තිකෙ, සමීපයෙහිවේ.

494. 495. 496. මිත්තො, (සම්)මිත්‍රයෙක්තෙම; දුද්දදං, දුකසේ පරිත්‍යාගකලහැකිවූ මාහැඟිවඩු; දදාති, දේද; දුක්කරංවාපි, කිරීමට අපහසුකම්ය; කුබ්බති, කෙරේද; අථොපි, නැවතද; අස්ස, ඔහුගේ; දුක්ඛමානිපි, ඉවසියහොහැකිවූද; දුරුත්තානි, නපුරුතෙපුල්; ඛමති, ඉවසාද; ගුය්හඤ්ච, (තමාගේ) රහසද; තස්ස, ඔහට; අක්ඛාති, කියාද; අස්ස, ඔහුගේ; ගුය්හං, රහස; පරිගුය්හති, සඟවාද; හෙවත් අනුන්ට නොකියාද; ආපදාසු, විපත්තිඇතිකල්හි; නජහාති, නොහරීද;

497 පියො ච ගරු භාවනීයො වත්තා ච වචනක්ඛමො,
ගම්භීරඤ්ච කථං කත්තා නොචට්ඨානෙ නියොජයෙ.

498 යස්මිං එතානි ඨානානි සංවිජ්ජන්ති ධ පුග්ගලෙ,
සො මිත්තො මිත්තකාමෙන අත්ථකාමානුකම්පකො;
අපි නාසිය මානෙන භජිතබ්බො තථාවිධො,ති.

"දෙවතා වග්ගො චතුත්ථො,, "මහා යඤ්ඤ වග්ගො පඤ්චමො,,
"පඨමො පණ්ණාසකො;,

—— 0 ——

499 පස්ස පුඤ්ඤානං විපාකං කුසලානං සුඛෙසිනො,
මෙත්තං චිත්තං විභාවෙත්වා සත්ත වස්සානි භික්ඛවො.

500 සත්ත සංවට්ට විවට්ටකප්පෙ න ඉමං ලොකං පුනාගමිං,
සංවට්ට මානෙ ලොකම්හි හොමි ආභස්සරූපගො.

---

ඛීණෙන, (ඔහුගේ භොගයන්) ක්ෂයවීමකරණකොටගෙන; න අති මඤ්ඤති, ගර්හානොකරේද; හෙවත් පහත්කොට නොසිතාද; ඉධ, මේලොකයෙහි; යස්මිංපුග්ගලෙ, යම්පුද්ගලයක්හු කෙරෙහි; එතානි ඨානානි, මේකරුණුසත; සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්ද; තථා විධො, එබඳුවූ; සොමිත්තො, ඒ මිත්‍රතෙම; මිත්තකාමෙන, මිත්‍රයන් කැමැත්තහු විසින්; භජිතබ්බො, භජනයකට යුතුවේ.

497. 498. පියොච, ස්වකීයශීලයෙන් ප්‍රියඇත්තේද; ගරු, (එහෙයින්ම) ගරුවූයේද; භාවනීයො, සම්භාවනාකටයුතුද; හෙවත් සිත්හිලා වැඩියයුත්තේද; වත්තාච, කීමෙහිදක්‍ෂවේද; වචනක්ඛමො, (පිළිවිස) තෙපුල් ඉවසන්නේද; ගම්භීරඤ්චකථං, (ධ්‍යාන විදර්ශනා මාර්ගඵලාදිය ඇසුරුකළාවූ) ගැඹුරුකථාව; කත්තා, කරන්නේද; අට්ඨානෙ, අස්ථානයෙහි; නොච නියොජයෙ, නොයොදන්නේදයන; එතානිඨානානි, මේ කරුණුසත; ඉධ, මේලොකයෙහි; යස්මිංපුග්ගලෙ, යම් පුද්ගලයක්හු කෙරෙහි; සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්ද; අත්ථකාමො, ස්වාර්ථ පරාර්ථ කැමැතිවූ; අනුකම්පකො, අනුකම්පාකරන්නාවූ; තථාවිධො,එබඳුවූ; සොමිත්තො,ඒමිත්‍රතෙම;මිත්තකාමෙන,මිත්‍රයන්කැමැත්තහුවිසින්; නාසියමානොඅපි,ලිඹගනා සනයෙන් නසනු ලබන්නේද; භජිතබ්බො, භජනයකට යුතුවේ.

499. 500. සුඛෙසිනො, සැප සොයන්නාවූ සත්වයෙනි; කුස

501\. විවට්ට මානෙ ලොකම්හි සුඤ්ඤං බ්‍රහ්මූපගො අහං,
සත්තක්ඛත්තුං මහා බ්‍රහ්මා වසවත්තී තදා අහුං.

502\. ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
චක්කවත්තී අහුං රාජා ජම්බුසණ්ඩස්ස ඉස්සරො.

503\. මුද්ධාභිසිත්තො ඛත්තියො මනුස්සාධිපතී අහුං,
අදණ්ඩෙන අසත්ථෙන විජෙය්‍ය පඨවිං ඉමං.

504\. අසාහසෙන ධම්මෙන සමෙන මනුසාසයිං,
ධම්මෙන රජ්ජං කාරෙත්වා අස්මිං පුථුවිමණ්ඩලෙ,

505\. මහද්ධනෙ මහාභොගෙ අඩ්ඪෙ ආජායි සංකුලෙ,
සබ්බකාමෙහි සම්පන්නෙ රතනෙහි ච සත්තහි.

---

ලානං, දක්‍ෂයන්ගේ; පුඤ්ඤානං විපාකං, කුසල විපාකය; පස්ස*, බලව; භික්ඛවෙ, මහණෙනි; සත්තවස්සානි, සත් අවුරුදු මුලුල්ලෙහි; මෙත්තං චිත්තං, මෛත්‍රී චිත්තය; භාවෙත්වා, වඩා; සත්ත සංවට්ට විවට්ටකප්පෙ, මහාකල්පසතක් මුලුල්ලෙහි; ඉමං ලොකං, මේලෝකයට; නපුනාගමං, පුනාගමනය නොකෙළෙමි; ලොකම්හි, ලොකය; සංවට්ටමානෙ, විනාශවන කාලයෙහි; ආභස්සරූපගොහොමි, ආභස්සර බ්‍රහ්මලොකයට ගියේවෙමි.

501\. 502. අහං, (ඒ) මම; ලොකම්හි, ලොකය; විවට්ටමානෙ, වැඩෙනකල්හි; සුඤ්ඤං, ශූන්‍යවූ; බ්‍රහ්මූපගො, බ්‍රහ්මලොකයටගියේ (වෙමි) තදා, (යම්කලෙක්හි බ්‍රහ්මලොකයට ගියෙම්ද) එකල්හි; සත්තක්ඛත්තුං, සත්වාරයක්; වසවත්ති, අනුන්වශගයෙහි පවත්වන්නාවූ; මහාබ්‍රහ්මාඅහුං, මහාබ්‍රහ්මවූයෙමි; ඡත්තිංසක්ඛත්තුං, සතිස්වාරයක්; දෙවින්දො, දෙවේන්ද්‍රවූයේ; දෙවරජ්ජං, දිව්‍යරාජ්‍යය; අකාරයිං, කරවූයෙමි; ජම්බුසණ්ඩස්ස ඉස්සරො, ජම්බුද්වීපයට නායකවූ; චක්කවත්තී රාජාඅහුං, (නොයෙක් සියගණන් වාරයෙහි) සක්විති රජ වූයෙමි.

503\. 504, 505. මුද්ධාභිසිත්තො, රාජ්‍යාභිෂෙකයට පැමිණියාවූ; ඛත්තියො, ක්‍ෂත්‍රියවූ; මනුස්සාධිපතී, නරශ්‍රෙෂ්ඨයෙක්; අහුං වූයෙම්ද; (ඒ මම) ඉමං පඨවිං, (සාගරය අවසන්කොට ඇති) මේ පෘථිවිය; අදණ්ඩෙන, (ධනදණ්ඩාදි) දඬුවමින්වෙන්ව; අසත්ථෙන,

---

* "පස්සථ,, යයි කියයුතු මෙහි "පස්ස,, යනු ව්‍යත්‍යයොග වශයෙනි.

506 බුද්ධා සඞ්ගාහකා ලොකෙ තෙහි එතං සුදෙසිතං,
එස හෙතු මහන්තස්ස පථබ්‍යා යෙන වුච්චති.

507 පහූත විත්තූපකරණො රාජා හොමි පතාපවා,
ඉද්ධිමා යසවා හොමි ජම්බු සණ්ඩස්ස ඉස්සරො;
කො සුත්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභි ජාතියො.

508 තස්මා හි අත්ථ කාමෙන මහත්ත මභිකංඛතා,
සද්ධම්මො ගරුකාතබ්බො සරං බුද්ධාන සාසනං.

---

(අනුස්ට වෙහෙස කරන්නාවූ එක් පසකින් මුවහත් ඇති) ශස්ත්‍රාදි යෙන් වෙන්ව; විජෙය්‍ය, ජයගෙන; අසාහසෙන, සාහසිකනොවම; ධම්මෙන, (ප්‍රාණඝාත නොකටයුතුය යනාදී ආදී) දැහැමින්; සමෙන, සෙමින්; අනුසාසිං, අනුශාසනාකෙළෙමි; ඉමං පුථුවි මණ්ඩලෙ, මේ පෘථිවිමණ්ඩලයෙහි; ධම්මෙන, දැහැමින්; රජ්ජං, රාජ්‍යය; කාරෙත්වා, කරවා; මහද්ධනෙ, මහාධන ඇති; මහාභොගෙ, මහත් (උපභොග පරිභොග) සම්පත් ඇති; අඩ්ඪෙ, (ධන යෙන්) ආඪ්‍යවූ; සබ්බකාමෙහි, සියලුකාමයන්ගෙන් හා සපනාගිර තමනගීව, සත්රුවිනින්ද; සමප්පෙනෙන, යුක්තවූ; සංකුලෙ, පූජ්‍යකුල යෙහි; ආජායිං, උපන්නෙමි.

506, 507. ලොකෙ, ලොකයෙහි; බුද්ධා, බුදුවරයෝ; සඞ්ගාහකා, සංග්‍රහකරන්නාහුවෙත්; තෙහි, (ලොකසංග්‍රාහකවූ මහාකරුණා ඇති) ඒ බුදුවරයන් විසින්; එතං, මේ කරුණ; සුදෙසිතං, මනාකොට දෙශනාකරණ ලද්දේය; යෙන, යම්හෙයකින්; පථබ්‍යා, පෘථිවීශ්වරයැයි, වුච්චති, කියනුලැබේද; (එහෙයින්) එසො, මේතෙම; මහන්තස්ස, මහත්බවට; හෙතු, හෙතුවෙක; පහූතවිත්තූපකරණො, බොහෝවස්තු උපකරණ ඇති; පතාපවා, තෙජසින් යුක්තවූ; රාජාහොමි, රජවෙමි, ජම්බුසණ්ඩස්ස ඉස්සරො, ජම්බුද්වීපයට අධිපතිවූයේ; ඉද්ධිමා, මහත් සෘද්ධි ඇති; යසවාහොමි, යශස් ඇතිවෙමි (මෙසේ යම්හෙයකින් කියනලැබේද එහෙයින්) කණ්හාභිජාතියො අපි, හීනජාති ඇත්තේනමුදු; කොසුත්වා, කවරෙක් (මේකරුණ) අසා, නප්පසීදෙය්‍ය, නොපහදින්නේද; පහදින්නේමය.

508. (154. වෙනි ගාථාව බලනු)

509 පදුට්ඨ චිත්තා අහිතානුකම්පිනී
අඤ්ඤෙසු රත්තා අති මඤ්ඤතෙ පතිං,
ධනෙන කීතස්ස වධාය උස්සුකා
යා එවරූපා පුරිසස්ස භරියා
වධකා ච භරියා ති ච සා පවුච්චති.

510 යං ඉත්ථියා වින්දති සාමිකො ධනං
සිප්පං වණිජ්ජඤ්ච කසිං අධිට්ඨහං,
අප්පම්පි තස්මා අපහාතු මිච්ඡති
යා එවරූපා පුරිසස්ස භරියා
චොරී ච භරියා ති ච සා පවුච්චති.

511 අකම්ම කාමා අලසා මහග්ඝසා
ඵරුසා ච චණ්ඩී ච දුරුත්ත වාදිනී,
උට්ඨායකානං අභිභුය්‍ය වත්තති
යා එවරූපා පුරිසස්ස භරියා
අය්‍යා ච භරියා ති ච සා පවුච්චති.

---

509 පුරිසස්ස, පුරුෂයාගේ; යාභරියා, යම්භාර්‍ය්‍යාවක්තොමෝ; පදුට්ඨචිත්තා, ප්‍රකාරයෙන් දූෂිත සිත්ඇත්තීද; අහිතානුකම්පිනී, (ස්වාමියාකෙරෙහි) හිතානුකම්පා නැත්තීද; අඤ්ඤෙසු, පරපුරුෂයන්කෙරෙහි; රත්තා, ඇලුනී; පතිං, ස්වාමියා; අතිමඤ්ඤතෙ, (අවමන් කිරීම් වශයෙන්හා අධිකමානයෙන් ඉක්මවා) අතික්‍රමු සිතන්නීද; ධනෙන, ධනයෙන්; කීතාඅස්ස, විකාටගන්නාලද්දී යක් වන්නීද; වධායඋස්සුකා, (ස්වාමියාහට) වධපිණිස උත්සාහ කරන්නීද; එවරූපා, මෙබඳුවූ; සා, ඒ භාර්‍ය්‍යාතොමෝ; වධකාච භරියාතිච, වධක භාර්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

510 ඉත්ථියා, ස්ත්‍රියගේ; සාමිකො, ස්වාමිපුරුෂතෙම; සිප්පං, ශිල්පයද; වණිජ්ජඤ්ච, වෙළඳාමද; කසිං, සීසෑමද; අධිට්ඨහං, පිහිටුවමින්; යංධනං, යම්ධනයක්; වින්දති, ලබාද; තස්මා, ඒ ධනයෙන්; අප්පම්පි, ස්වල්පයක්දු; අපහාතුං, වෙන්කරගන්ට; පුරිසස්ස පුරුෂයාගේ; යාභරියා, යම්භාර්‍ය්‍යාවක්තොමෝ; ඉච්ඡති, කැමති වන්නීද; එවරූපා, මෙබඳුවූ; සා, ඒ භාර්‍ය්‍යාතොමෝ; චොරීචභරියාතිච, චොරභාර්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

511 පුරිසස්ස. පුරුෂයාගේ; යාභරියා, යම් භාර්‍ය්‍යාවක්තො

512. සා සබ්බදා හොති හිතානුකම්පිනී
මාතා ච පුත්තං අනුරක්ඛතෙ පතිං,
තතො ධනං සම්භතමස්ස රක්ඛති
සා එවරූපා පුරිසස්ස භරියා
මාතා ච භරියා ති ච සා පවුච්චති.

513. යථා පි ජෙට්ඨා භගිනී කනිට්ඨා
සගාරවා හොති සකම්හි සාමිකෙ,
හිරීමනා භත්තු වසානුවත්තිනී
සා එව රූපා පුරිසස්ස භරියා
භගිනී ච භරියා ති ච සා පවුච්චති,

---

මෝ; අකම්මකාමා, කටයුතු කර්මාන්ත නොකරණු කැමැත්තීද; අලසා, මැලිසිත් ඇත්තීද; මහග්ඝසා, බොහෝ කොට අනුභව කරන්නීද; ඵරුසාච, කෲරද; චණ්ඩීච, අත්‍යන්තයෙන් කිපෙනසුලුද; දුරුත්තවාදිනී, නපුරුවචන කියන්නීද; උට්ඨායකානං, නැගීසිටි වීය්‍ය්‍ය ඇති ස්වාමියාගේ (ඒ වීය්‍ය්‍යසම්පත්තිය) අභිභුය්‍ය, මැඩ; හෙවත් යටපත්කොට; වත්තති, පවතීද; එවරූපා, මෙබඳුවූ; සා, ඒ භාය්‍ය්‍යාතොමෝ; අය්‍යාච භරියා තිච, ස්වාමිභාය්‍ය්‍යායයිද; පවුච්චති; කියනු ලැබේ;

512 සා, යම් ස්ත්‍රියක්තොමෝ; සබ්බදා, හැමකල්හි; හිතානුකම්පිනී හොති; ස්වාමියාකෙරෙහි හිතානුකම්පා ඇත්තීද; පුත්තං, පුත්‍රයා (රක්නාවූ) මාතාව, මව්මෙන්; පතිං, ස්වාමියා; අනුරක්ඛතෙ, රකීද; තතො, එහෙයින්; අස්ස, මොහුවිසින්; සම්භතං, රැස්කරණ ලද; ධනං, ධනය; රක්ඛති, රකීද; පුරිසස්ස, පුරුෂයාගේ; එවරූපා, මෙබඳුවූ; යා භරියා, යම් භාය්‍ය්‍යාවක් වන්නීද; සා, ඕතොමෝ; මාතා ච භරියා තිච, මාතෘභාය්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

513. කනිට්ඨා භගිනී, බාලසහෝදරී තොමෝ; ජෙට්ඨා, වැඩුම හලු සහෝදරයා කෙරෙහි; යථාපි, යම්සේ; සගාරවා හොති, ගෞරව සහිත වන්නීද; (එමෙන්) සකම්හි සාමිකෙ, ස්වකීය ස්වාමියා කෙරෙහි; හිරීමනා, ලජ්ජාසිත් ඇත්තී; භත්තුවසානුවත්තිනී, ස්වාමියාගේ වශයෙහි පවත්නීද; පුරිසස්ස, පුරුෂයාගේ; එවරූපා, මෙබඳුවූ; යා භරියා, යම් භාය්‍ය්‍යාවක් වන්නීද; සා, ඕතොමෝ; භගිනීච භරියාතිච, භගිනිභාය්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

514 යාචීධ දිස්වාන පතිං පමොදති
සඛී සඛාරං ව චිරස්ස මාගතං,
කොලෙය්‍යකා සීලවතී පතිබ්බතා
යා එවරූපා පුරිසස්ස භරියා
සඛී ච භරියා ති ච සා පවුච්චති.

515 අක්කුද්ධ සන්තා වධ දණ්ඩ තජ්ජිතා
අදුට්ඨ චිත්තා පතිනො තිතික්ඛති,
අකොධනා භත්තුවසානු වත්තිනී
යා එවරූපා පුරිසස්ස භරියා
දාසී ච භරියා ති ච සා පවුච්චති.

516 යාචීධ භරියා වධකා ති වුච්චති
චොරී ච අය්‍යා තිච යා පවුච්චති,
දුස්සීල රූපා ඵරුසා අනාදරා
කායස්සභෙදා නිරයං වජන්ති තා.

---

514 ඉධ, මේලෝකයෙහි; යා, යම්ස්ත්‍රියක්තොමෝ; පතිං, ස්වාමියා; දිස්වාන, දැක; චිරස්සං, බොහෝකලකින්; ආගතං, ආවාවූ; සඛාරං, යහලුවකුට; සඛීව, යහලුතැනැත්තියක්සේ; පමොදති, සතුටුවන්නීද; කොලෙය්‍යකා, කුලසම්පන්නාවූ; සීලවතී, ශීලයෙන් යුක්තාවූ; පතිබ්බතා, ස්වාමිහු දෙවිකොට ඇත්තීද; පුරිසස්ස පුරුෂයාගේ; එවරූපා, මෙබඳුවූ; යා භරියා, යම් භාර්‍ය්‍යාවක්වන්නීද; සා, ඕතොමෝ; සඛීච භරියාතිච, මිත්‍රභාර්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

515 වධදණ්ඩතජ්ජිතා, (ස්වාමිහු විසින්) දණ්ඩක්ගෙන තීන සත්තෙම්සී වධයෙන්තර්ජනයකරණලද්දී; අක්කුද්ධසන්තා, නොකිපුණාවූම; අදුට්ඨචිත්තා, (ස්වාමියාකෙරෙහි) දුෂ්‍යනුවූ සිත්ඇත්තී; පතිනො. ස්වාමිහුගේ; තිතික්ඛති, (වරද) ඉවසාද; පුරිසස්ස, පුරුෂයාගේ; එවරූපා, මෙබඳුවූ; යා භරියා, යම් භාර්‍ය්‍යාවක්තොමෝ; අකොධනා, (මෙසේ) ක්‍රොධනොකරන්නී; භත්තුවසානුවත්තිනී, ස්වාමිහුගේ වශගයෙහි පවත්නීද; සා, ඒභාර්‍ය්‍යාතොමෝ; දාසීචභරියාතිච, දාසීභාර්‍ය්‍යායයිද; පවුච්චති, කියනුලැබේ.

516 ඉධ, මෙලොකයෙහි: යාභරියා, යම්භාර්‍ය්‍යාවක් තොමෝ; වධකාති, වධකභාර්‍ය්‍යායයි; වුච්චති, කියනුලබන්නීද; චොරීච (යම් භාර්‍ය්‍යාවක්) චෞරී භාර්‍ය්‍යායයි කියනුලබන්නීද; යා, යම් භාර්‍ය්‍යාවක්; අය්‍යාතිච පවුච්චති, ස්වාමිභාර්‍ය්‍යායයි කියනු ලබන්නීද; දුස්සීලරූපා, දුස්සීල ස්වභාඇති; ඵරුසා, කෲරවූ; අනාදරා, ආදර

517 යා චීධ මාතා භගිනී සඛී ච
දාසී ච භරියා ති ච යා පවුච්චති,
සීලෙ ඨිතත්තා චිරරත්ත සංවුතා
කායස්ස භෙදා සුගතිං වජන්ති තා, ති.

518 කොධනො දුබ්බණ්ණො හොති අථො දුක්ඛම්පි සෙති සො,
අථො අත්ථං ගහෙත්වාන අනත්ථමධි පජ්ජති.

519 තතො කායෙන වාචාය වධං කත්වාන කොධනො,
කොධාභිභූතො පුරිසො ධනජානිං නිගච්ඡති.

520 කොධ සම්මද සම්මත්තො ආයසක්‍යං නිගච්ඡති,
ඤාති මිත්තා සුහජ්ජා තං පරිවජ්ජන්ති කොධනං.

---

නැත්තාවූ; තා, ඒභාය්‍යාවෝ(තිදෙනා,) කායස්සභෙදා, කයබිඳීමෙන් මරණින් මත්තෙහි; නිරයං, නරකයට; වජන්ති, යෙත්.

517 ඉධ, මේලොකයෙහි; නොහොත් මොවුන් අතුරෙහි; යාචමාතා, යම්මාතෘභාය්‍යාවක් වන්නීද, භගිනීච, (යම්) භගිනීභාය්‍යාවක් වන්නීද; සඛී, (යම්) මිත්‍රභාය්‍යාවක් වන්නීද; යා, යම්ස්ත්‍රියක් තොමෝ; දාසීචභරියාතිච, දාසීභාය්‍යායයිද; පවුච්චති, කියනුලබන්නීද; සීලෙඨිතත්තා, ශීලයෙහි පිහිටි බැවින්; චිරරත්තසංවුතා, බොහෝකාලයක් සංවෘතාවූ; තා, ඒභාය්‍යාවෝ (සිව්දෙන;) කායස්ස භෙදා, කයබිඳීමෙන් මරණින් මත්තෙහි; සුගතිං, සුගතියට; වජන්ති, යෙත්.

518 කොධනො, ක්‍රොධශීලි පුද්ගලතෙම; දුබ්බණ්ණොහොති, දුර්වර්ණ ඇත්තේවේ; අථො, නැවත; සො, හෙතෙම; දුක්ඛම්පි සෙති, දුකසේශයනයකෙරෙයි; අථො, නැවත; අත්ථං, අර්ථය; හෙවත් වැඩිම; ගහෙත්වාන, ගෙන; අනත්ථං, අනර්ථය; අධිපජ්ජති, (මා විසින් ගන්නාලද්දේයයි) සලකයි.

519 කොධාභිභූතො, ක්‍රොධයෙන් මැඩුනාවූ; පුරිසො, පුරුෂතෙම; කායෙන, කයින්ද; වාචාය, වචනයෙන්ද; වධංකත්වාන, ප්‍රාණඝාතකර්මයකොට: තතො, නැවත; කොධනො, ක්‍රොධශීලිවූයේ; ධනජානිං, ධනහානියට; නිගච්ඡති, පැමිණෙයි.

520 කොධසම්මදසම්මත්තො, ක්‍රොධමදයෙන්මත්වූයේ; ආයසක්‍යං, අයසබවට; නිගච්ඡති, පැමිණෙයි; කොධනං, ක්‍රොධශීලිවූ; තං, ඔහු; ඤාතිමිත්තා සුහජ්ජා, ඤාතිමිත්‍රයන්හා සගලුවෝ; පරිවජ්ජන්ති, දුරුකෙරෙත්.

521 අනත්ථ ජනනො කොධො කොධො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

522 කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං කොධො සහතෙ නරං.

523 යං කුද්ධො උපරොධෙති සුකරංවිය දුක්කරං,
පච්ඡා සො විගතෙ කොධෙ අග්ගිදඩ්ඪොව තප්පති.

524 දුම්මඞ්කුයං පදස්සෙති ධූමග්ගිමිව පාවකො,
යතො පතායති කොධො යෙන කුජ්ඣන්ති මානවා.

525 නාස්ස හිරි න ඔත්තප්පං න වාචො හොති ගාරවො,
කොධෙන අභිභූතස්ස න දීපං හොති කිඤ්චනං.

---

521 කොධො, ක්‍රොධය තෙම; අනත්ථ ජනනො, අනර්ථ උපදවන්නේය; කොධො, ක්‍රොධයතෙම; චිත්තං, සිත; පකොපනො, කොපකරන්නේය; අන්තරතො, ඇතුලත(හෙවත්)තමාසිත්හි; ජාතං, හටගත්තාවූ; තං, ඒ ක්‍රොධය; භයං, (අනර්ථජනනාදි) භයට හෙතුයයි; ජනො, ජනතෙම; නාවබුජ්ඣති, (නුවණැස් නැති හෙයින්) නොදන්නේය.

522 කුද්ධො, කිපුණුපුහුල් තෙම; අත්ථං, අර්ථය; (වැඩීම) නජානාති, නොදනියි; කුද්ධො, කිපුණුපුහුල්තෙම; ධම්මං, (ශමථවිදර්ශනා) ධර්මය; න පස්සති, නොදක්නේය; කොධො, ක්‍රොධයතෙම; යං, යම්කාලයෙක්හි; නරං, මනුෂ්‍යයා; (නොහොත්) යං නරං, යම්මනුෂ්‍යයෙක්හු; සහතෙ, මඩීද; තදා, එකල්හි; අන්ධං තමං හොති, (ඕහට) ඝනාන්ධකාරයවේ.

523 කුද්ධො, කිපුණු පුහුල්තෙම; යං දුක්කරං, දුෂ්කරවූයමක්; සුකරංවිය, පහසුවක්මෙන්; උපරොධෙති, සම්පාදනය කෙරේද; සො, හෙතෙම; පච්ඡා, පසුව; කොධෙ විගතෙ, ක්‍රොධය පහවූකල්හි; අග්ගිදඩ්ඪොව, ගින්නෙන් දනලද්දක්හු මෙන්; තප්පති, තැවේ.

524. 525. කොධො, ක්‍රොධයතෙම, යතො, යම්කලෙක; උපතායති, උපදීද; (එකල්හි) ධූමග්ගි, දුම්නගනහෙයින් ධූමාග්නියයි කියනලද; පාවකොඉව, වහ්නියමෙන්; දුම්මඞ්කුයං, නිසෙතජබවය;

526 තපනීයානි කම්මානි යානි ධම්මෙහි ආරකා,
තානි ආරොචයිස්සාමි තං සුණාථ යථා තථං.

527 කුද්ධො හි පිතරං හන්ති කුද්ධො හන්ති සමාතරං,
කුද්ධො හි බ්‍රාහ්මණං හන්ති හන්ති කුද්ධො පුථුජ්ජනං,

528 යාය මාතු භතො පොසො ඉමං ලොකං අවෙක්ඛති,
තම්පි පාණදදිං සන්තිං හන්ති කුද්ධො පුථුජ්ජනො.

529 අත්තූපමා හි තෙ සත්තා අත්තා හි පරමො පියො,
හන්ති කුද්ධො පුථුත්තානං නානා රූපෙසු මුච්ඡිතො.

---

හෙවත් දුර්මුඛය ඇත්තාව; පදසෙසති, ප්‍රකාරයෙන් දක්වත් නේය; යෙන, යම්හෙයකින්; මාණවා, මනුෂ්‍යයෝ; කුජ්ඣනති, කිපෙත්ද; (එහෙයින්ඔවුන්ට) හිරි, පාපයෙහිලජ්ජාවෙක්; න අසස, නොවන්නේය; නඔත්තප්පං, (පාපයෙහි) බියෙක් නොවන්නේය; වාචො, වචනයාගේද; ගාරවො, ගරුත්වයෙක්; නහොති, නොවන්නේය; කොධෙන, ක්‍රොධයෙන්; අභිභූතස්ස, මැඩුනු පුද්ගල හට; කිඤ්චනංදීපං, කිසිපිහිටෙක්; නහොති, නොවේ,

526 ධම්මෙහි, ශමථවිදර්ශනාධර්මයන්ගෙන්; ආරකා, දුරුවූ; තපනීයානි, තාපජනකවූ; යානිකම්මානි, යම්කර්මයෝවෙත්ද; තානි, ඒ කර්මයන්; ආරොචයිස්සාමි, කියන්නෙමි; තං, එය; යථාතථං, තත්වූ පරිද්දෙන්; සුණාථ, අසව්,

527 කුද්ධොහි, කිපුණුතැනැත්තේ වනාහි; පිතරං, පියා; හන්ති, නසයි; කුද්ධො, කිපුණු තැනැත්තේ; සමාතරං, සියමව; හන්ති, නසයි; කුද්ධො, කිපුණුතැනැත්තේවනාහි; බ්‍රාහ්මණං, (ක්ෂීණාශ්‍රව) බ්‍රාහ්මණයා; හන්ති, නසයි; කුද්ධො, කිපුණු තැනැත්තේ; පුථුජ්ජනං, පෘථක්ජනයා; හන්ති, නසයි.

528. 529. යායමාතු, යම්මවක්විසින්; භතො, පොෂ්‍යකරණලද්දේ; පොසො, පුරුෂතෙම; ඉමං ලොකං, මේලොකය; අවෙක්ඛති, දකීද; පාණදදිං, සන්තිං, ජීවිතයදුන් සාධුමව; තම්පි, ඒමවද; හන්ති, නසයි; කුද්ධො, කිපුණුපුද්ගලතෙම; පුථුජනො, (යම්)බොහෝජනයන්; (නසන්නේද;) තෙසත්තාහි, (නසනු ලබන්නාවූ) ඒ සත්වයෝ වනාහි; අත්තූපමා, තමාවැනිවූ උපමා ඇත්තාහ; අත්තාහි, ආත්මයවනාහි;

530 අසිනා හනති අතතානං විසං ඛාදනති මුච්ඡිතා,
රජ්ජුයා බජ්ඣ මීයනති පබබතා මපි කඤ්දරෙ.

531 භූත හච්චානි කම්මානි අතත මාරණියානි ච,
කරොනතා නා ව බුජ්ඣනති කොධ ජාතො පරාභවො.

532 ඉතා යං කොධරූපෙන මච්චු පාසො ගුහාසයො,
තං දමෙන සමුච්ඡින්දෙ පඤ්ඤා, විරියෙන දිට්ඨියා.

533 එක මෙතං අකුසලං සමුච්ඡින්දෙථ පණ්ඩිතො,
තථෙ ව ධම්මෙ සික්ඛෙථ මානො දුම්මඞ්කුයං අහු.

---

පරමං පියො, අතිශයින් ප්‍රියවේ; කුද්ධො, කිපුණු පුද්ගලතෙම; නානා රූපෙසු, නොයෙක් අරමුණුවල; මුච්ජිතො, මූලාවූයේ; පුථු, බොහෝ කාරණයන් හේතු කොට ගෙණ; අතතානං, ආත්මය; හනති, නසයි.

530 අසිනා, කඩුවෙන්; අතතානං; ආත්මය; හනති, (කිපුණු පුහුල්තෙම) නසයි; මුච්ජිතා, මූලාවූවාහු; විසංඛාදනති, විෂඅනුභව කෙරෙත්; රජ්ජුයා; රැහැනින්; බජ්ඣ, බැඳ; මීයනති, මැරෙත්; පබබතාමපිකඤ්දරෙ, පර්වතයෙන්හා කඳුරැලියෙහිද; (පැනමැරෙත්).

531 භූතහච්චානි, හැසුනාවූ; වැසීම් ඇති අතතමාරණියානිච, තමන් මරණයට පමුණුවන්නාවූද; කම්මානි, කර්මයන්; කරොනතා, කරන්නාහු; කොධජාතො, හටගත් ක්‍රොධ ඇත්තේ; පරාභවො, පිරිහෙන්නේයයි; නාවබුජ්ඣනති; (මූලාවූහෙයින්) නොදනිත්.

532 ඉති, මෙසේ; අයං, මේතෙමෙ; කොධරූපෙන, ක්‍රොධස්වරූපයෙන්; මච්චුපාසො, මරුහුගේ පාශයෙක; ගුහාසයො, සත්නමැති ගුහාවෙහි (හෙවත්) හෘදය රූපය නිසා පවත්නේය; තං, ඒ ක්‍රොධය; දමෙන, දමනයෙන්; සමුච්ඡින්දෙ, මනාකොට සිඳින්නේය; (කවරදමනයකින්දයත්) පඤ්ඤාය, (විදර්ශනා) ප්‍රඥාවෙන්ද; විරියෙන, (විදර්ශනාවෙන් යුක්ත කායික චෛතසික) වීර්‍ය්‍යයෙන්ද; දිට්ඨියා, (මාර්ගසම්‍යක්) දෘෂ්ටියෙන්ද; (යන මේ දමනයෙන්, මනාකොට සිඳින්නේය.)

533 පණ්ඩිතො, පණ්ඩිතතෙම; එකං අකුසලං, එක් අකුශලයක්වූ; එතං, මේ ක්‍රොධය; සමුච්ඡින්දෙථ, සිඳින්නේය; තථෙව, (එමෙසේ අකුශලධර්මය සිඳින්නේද) එපරිද්දෙන්ම; නො, අපට

534 විත කොධා අනායාසා විත ලොභා අනුස්සුකා,
දන්තා මොහං පහන්ත්වාන පරිනිබ්බිස්සරු නාසවා,ති.

"අව්‍යාකත වග්ගො ඡට්ඨො,,

—— o ——

535 සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා,
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා.
536 ඉති බුද්ධා අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං,
දුක්ඛස්සන්තංකරො සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො,ති.

"මහා වග්ගො සත්තමො,,

—— o ——

# සත්තක නිපාතො සමත්තො.

537 යො ච මෙත්තං භාවයති අප්පමාණං පතිස්සතො,
තනු සංයොජනා හොන්ති පස්සතො උපධික්ඛයං.

---

දුම්මඛ්කුයං, දුර්මුඛභාවය; (හෙවත්) නොසතුටුමුහුණැතිබව; මා අනු, නොමෙව්සි; ධම්මෙ, (ශමථ විදර්ශනා) ධර්මයෙහි; සික්ඛථ, හික්මෙන්නේය.

534 විතකොධා, පහකරණලද ක්‍රොධයඇති; අනායාසා, උපායාස රහිතවූ; හෙවත් දුඩිවෙහෙස නැත්තාවූ; විතලොභා, පහකරණලද ලොභයඇති; අනුස්සුකා, කිසිතැනෙකැහි උත්සාහයට නො පැමිණියාහු; දන්තා, දැමුනාහු; මොහං, මොහය; පහන්ත්වාන, නසා; අනාසවා, ආශ්‍රව රහිතවූවාහු; පරිනිබ්බිස්සරු, පිරිනිවන්පාන්නාහුය.

535. 536. (107. 108. වෙනි අඩක බලනු)

537 යොච, යමෙක් තෙම; අප්පමාණං, (පැතිරීම් වශයෙන්) ප්‍රමාණරහිතවූ; මෙත්තං, මෛත්‍රිය; පතිස්සතො, සිහියෙන් යුක්තවූයේ; භාවයති, වඩාද; පස්සතො උපධික්ඛයං, (මෛත්‍රියට ආසන්නකාරණයවූ; විදර්ශනාවෙන් පිළිවෙළින් උපධික්ෂය කරීමයයිත්‍ය තලද අභිඥාවට පැමිණියාහුගේ; සංයොජනා, දශසංයොජනයෝ තනුහොන්ති, (සුවසේම) ප්‍රහීණවෙත්; හොන්ති, උපධික්ඛයං, (කෙලෙශොපධීන්ගේ) ක්ෂයකිරීම්සඞ්ඛ්‍යාත මෛත්‍රිය; පස්සතො, (අධිගමවශයෙන්) දක්නාහුගේ; සංයොජනා, ප්‍රත්‍යයභා ප්‍රතිසම්ප්‍රයුක්ත සංයොජනයෝ; තනුහොන්ති, තුනීවෙත්.

538. ඒකම්පි චෙ පාණමදුට්ඨචිත්තො මෙත්තායති කුසලී තෙන හොති,
සබ්බෙ ච පාණෙ මනසානුකම්පං පහූතමරියො පකරොති පුඤ්ඤං.

539 යෙ සත්තසණ්ඩං පඨවිං විජෙත්වා රාජීසයො යජමානා අනුපරියගා,
අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාචපෙය්‍යං නිරග්ගළං;
මෙත්තස්ස චිත්තස්ස සුභාවිතස්ස කලම්පි තෙ නානුභවන්ති
සොළසිං=චන්දප්පභා තාරගණාව සබ්බෙ.

---

538 චෙ, ඉදින්; ඒකම්පි පාණං, එකද සත්ත්වයකුට; අදුට්ඨචිත්තො, දුෂ්‍ය නුවූ සිත් ඇත්තේ; මෙත්තායති, මෛත්‍රී කරේද, තෙන, ඒ කාරණා කොටගෙණ; කුසලී හොති, කුසල් ඇත්තේ වෙයි; සබ්බෙ ච පාණෙ, සියලු ප්‍රාණීන් කෙරෙහිම; මනසානුකම්පං, සිතින් අනුකම්පා කරන්නාවූ; අරියො, ආය්‍ය්‍යතෙම; පහූතං පුඤ්ඤං, බොහෝ පින්, පකරොති, ප්‍රකාරයෙන් කෙරෙයි.

539 යෙ, යම් සත්වකෙණෙක්; සත්තසණ්ඩං, සත්වයන් හෙත් පිරුණාවූ; පඨවිං, පෘථිවිය; විජෙත්වා, (දිනැමින්) ජයගෙන; රාජීසයො, තාපසයන් මෙන් ධාර්මික නරශ්‍රෙෂ්ඨවූවාහු; යජමානා, දන් දෙමින්; අනුපරියගා, හැසුරුණාහුද; අස්සමෙධං, අශ්වමෙධය; පුරිසමෙධං, පුරුෂමෙධය; සම්මාපාසං, සම්මාපාසය; වාචපෙය්‍යං, වාචපෙය්‍යය; නිරග්ගළං, නිරග්ගළයයි; (යම් යාගපසක් වෙත්ද) තෙත, ඒ මහායාගයෝද*; සුභාවිතස්ස, මනාකොට වඩන ලද; මෙත්තස්ස චිත්තස්ස,

---

* පෞරාණික නරශ්‍රෙෂ්ඨයන් කාලයෙහි "අශ්වමෙධය, පුරුෂමෙධය, සම්මාපාසය, වාචපෙය්‍යය, යි යම් සිව් සඟරාවතකින් ධාර්මික නරපතීහු ලොවට සංග්‍රහ කළෝද එයි "ශස්‍යමෙධය,, නම් ළපත් ශස්‍යයෙන් දසවන කොටස ගැනීමයි. මහා යොධයන්ට සමසතට වයසියදම් දීම "පුරුෂමෙධ,, නම්වේ. දිළිඳු මිනිසුන් අතින් ලියුම් ගෙන තුන් අවුරුද්දක් පොලී නැතිව දහස දෙදහස පමණ ධනය දීම "සම්මාපාස,, නම්වෙයි. තාත මාතුල යනමේ ආදී ක්‍රමයෙන් ප්‍රියවචන කීම "වාචපෙය,, නම්වේ, මෙසේ සිව් සඟරාවතින් සංග්‍රහිත රාෂ්ට්‍රය සමෘද්ධිවේ සම්පූර්ණ ආහාරපාන ඇතිව නිර්භයව නිරුපද්‍රවව පවතියි, මනුෂ්‍යයෝ සතුටින් සතුටුවන්නාහු නොවසාලද ගෘහ ඇතිව වාසය කෙරෙත්, ගේ දොර අගුලු ලෑම් නැතිබැවින් "නිරග්ගල,, නම්වේ. ඉක්ෂ්වාකු නරශ්‍රෙෂ්ඨයන්ගේ කාලයෙහි බමුණෝ මේ සිව් සඟරාවතහා රාෂ්ට්‍රසම්පත්තියද පෙරළා "අශ්වමෙධය,, ආදී කොට ඇති යාග පසක් කළෝය, (එහි විස්තරය 199 වෙනි අධිකාරයෙහි දැක්වූ නයින් දතයුතු).

540 යො න හනති න ඝාතෙති න ජිනාති න ජාපයෙ,
මෙත්තංසො සබ්බභූතානං වෙරං තස්ස න කෙනචී,ති.

541 ලාභො අලාභො අයසො යසො ච නින්දා පසංසා ච
සුඛඤ්ච දුක්ඛං,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා අසස්සතා විප්පරිණාමධම්මා.

542 එතෙ ච ඤත්වා සතිමා සුමෙධො අවෙක්ඛති විප්පරි
ණාම ධම්මෙ,
ඉට්ඨස්ස ධම්මා න මථෙන්ති චිත්තං අනිට්ඨතො
නො පටිඝාතමෙති.

---

මෛත්‍රී චිත්තයාගේ; සොළසිං කලමපි, සොළොස්වන කලාවටද; නානුභවන්ති. (විෂ්කම්භනාත්මය හෙතුකොටගෙන) නොපැමිණෙත්; චන්දප්පභා, චන්ද්‍රයාගේ රශ්මියට; සබ්බෙ තාරගණාඉව, සියලු තාරුරුසමෙනි.

540 යො, යමෙක්තෙම; සබ්බභූතානං, සියලුසත්වයන්කෙරෙහි; මෙත්තංසො, පවත්වනලබන්නාවූ මෙත්සිත්කොටස් ඇත්තේ; න හනති, (ප්‍රාණීන්) නොනසාද; න ඝාතෙති, අනුන්ලවා නොමරවත්තේද; න ජිනාති, (අනිකකුගේ) අපිහානිය නොකෙරේද; න ජාපයෙ, (අනිකකුලවා අනිකක්හුගේ) අපිහානියනොකරවාද; තස්ස, ඔහුගේ; කෙනචි, කිසිවකුසමග; න වෙරං, අකුශල වෛරයෙක් හෝ පුද්ගලවෛරයෙක් නැත්තේය.

541 ලාභො, ලාභයද; අලාභො, අලාභයද; අයසො, අපකීර්තියද; යසොච, යශසද; නින්දා, නින්දාවද; පසංසාච, ප්‍රසංශාවද; සුඛඤ්ච සැපයද; දුක්ඛං, දුකද; එතෙ, මේඅෂ්ටලොකධර්මයෝ; මනුජෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; අනිච්චා, අනිත්‍යයෝය; අසස්සතා, සදාකාලික නුවූයෝය; විප්පරිණාම ධම්මා, පෙරළෙන සවභාව ඇත්තාහුය.

542 සතිමා, සමෘතිඇත්තාවූ; සුමෙධො, පණ්ඩිතතෙම; එතෙ ච, මේ අෂ්ටලොකධර්මයන්ද; ඤත්වා, දැන; විප්පරිණාමධම්මෙ, (මේ ධර්මයන් මෙසේ) පෙරළෙන සවභාවයයි; අවෙක්ඛති, දක්නේය; අස්ස, මොහුගේ; චිත්තං, සිත; ඉට්ඨාධම්මා, ඉෂ්ටධර්මයෝ; න මථෙන්ති, නොඅලලත්; අනිට්ඨතො, අනිෂ්ටධර්මයන්කෙරෙන්; (චිත්තයතෙම) පටිඝාතං, පීඩාවට; නොඑති, නොපැමිණේයි.

543 තස්සානුරොධා අථවා විරොධා විධූපිතා අත්ථගතානසන්ති,
පදඤ්ච ඤත්වා විරජං අසොකං සම්මප්පජානාති
භවස්ස පාරගූ,ති.

544, 545, 546. ලාභො අලාභො=පෙ=භවස්ස පාරගූ,ති.

547 සංවාසා යං විජානාථ පාපිච්ඡො කොධනො ඉති,
මක්ඛී ථම්භී පලාසී ච ඉස්සුකී මච්ඡරී සඨො.

548 සන්තවාචො ජනවති සමණො විය භාසති,
රහො කරොති කටනං පාපදිට්ඨී අනාදරො.

549 සංසප්පී ච මුසාවාදී තං විදිත්වා යථා තථං,
සබ්බෙ සමග්ගා හුත්වාන අභිනිබ්බජ්ජයාථ නං.

550 කාරණ්ඩවං නිද්ධමථ කසම්බුඤ්චාපකස්සථ,
තතො පලාපෙ වාහෙථ අස්සමණෙ සමණමානිනෙ.

---

543 තස්ස, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ; අනුරොධා, අනුකූලභාවයෝද; (භවත්) සතුටුබැව්ද; අථවා, නොහොත්; විරොධා, විරුද්ධ ස්වභාවයෝද; (නොසතුටු බැව්ද) විධූපිතා, නැසුනාහු; අත්ථගතා, අස්තඞ්ගතවූහ; නසන්ති, නැත්තාහ; භවස්සපාරගූ, භවයාගේ; පරතෙරටගියාවූ; ආර්‍ය්‍යශ්‍රාවකතෙම; අසොකං, ශොකරහිතවූ; විරජං, පහවූ රාගරජස් ඇති; පදඤ්ච, නිර්වාණපදයද; ඤත්වා, දැන; සම්මප්පජානාති, (භවයාගේ එතරටගියබව) මනාකොටදන්නේය.

544. 545. 546. (541. 542· 543. වෙනි අඞ්ක බලනු.)

547. 548. අයං, මේපුද්ගල තෙම; පාපිච්ඡො, ලාමක අදහස් ඇත්තේය; කොධනො, කිපෙනසුලුය; මක්ඛී, ගුණමකුබැව්ඇත්තේය; ථම්භී, දැඩිසිත්ඇත්තේය; පලාසීච, යුගග්‍රාහදඇත්තේය; ඉස්සුකී, ඊර්ෂ්‍යා ඇත්තේය; මච්ඡරී, මසුරු සිත් ඇත්තේය; සඨො, (අවිද්‍යමානගුණ ප්‍රකාශකරණ හෙයින්) කෛරාටිකය; ජනවති, ජනයන් මධ්‍යයෙහි; සන්තවාචො, සිලුටුවචනඇත්තේය; සමණො විය, ශ්‍රමණයකුසෙ; භාසති, කථා කෙරෙයි; පාපදිට්ඨී, ලාමක දෘෂ්ටිඇත්තේය; අනාදරො, ආදරනැත්තේ; රහො, වැසීම්ඇතිව; කටනං, පාපකර්මය; කරොති, කෙරෙයි; ඉති, මෙසේ; සංවාසා, එකතුව විසීමෙන්; විජානාථ, දැනගන්නේය.

549. 550. මුසාවාදී, බොරුකියන්නාවූ පුද්ගල තෙම; සංසප්පී ච, කමපාවනසුලුදවේ; තං, ඒ කාරණයද; යථාතථං, තත්වූපරිද්

551 නිද්ධමිත්වාන පාපිච්ඡෙ පාපාචාරගොචරෙ,
සුද්ධා සුද්ධෙහි සංවාසං කප්පයෙව්හො පතිස්සතා;
තතො සමග්ගා නිපකා දුක්ඛස්සන්තං කරිස්සථ, ති.

“මෙත්තා වග්ගො පඨමො,,

—0—

552 අසජ්ඣාය මලා මන්තා අනුට්ඨාන මලා ඝරා,
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං.

---

දෙත්; විදිත්වා, දැන; සබ්බෙ, සියල්ලෝ, සමග්ගාභුත්වාන, සමගිව; නං, ඒ අධිකරණය; අභිනිබ්බජ්ජයාථ, විනිශ්චය කරන්නාහුය; (නොහොත්;) නං, ඒ කරුණු; අභිනිබ්බජ්ජය, මනාව විභාගකොට; අථ, නැවත; කාරණ්ඩවං, (මහණවෙස් දැරූහෙයින් ශ්‍රමණකචවරයයි කියනලද) කාරණ්ඩවය; නිද්ධමථ, පහකරන්නාහුය; කසම්බුජාතං, (ශීලවිපත්තියට පැමිණි බැවින්) කසළයට බඳුවූ පුද්ගලයාද; අපකස්සථ, ඉවත්කරන්නාහුය; තතො, එහෙයින්; සමණමානිනෙ, වෙසමාත්‍රයෙන් ශ්‍රමණමානිවූ; පලාපෙ, (ඇතුළතසිස්බැවින්) බොල්වලට බඳුවූ; අස්සමණෙ, අශ්‍රමණයන්; වාහෙථ, පිඹහරින්නාහුය (හෙවත් දුරුකරන්නාහුය.)

551 පාපාචාරගොචරෙ, ලාමකහැසිරීම් ඇසුරුකොට ඇති; පාපිච්ඡෙ, ලාමකඅදහස් ඇත්තාවූන්; නිද්ධමිත්වාන, පහකොට; පතිස්සතා, සිහිනුවණින්යුක්තවූවාහු; සුද්ධා, පිරිසිදුවූවාහු; සුද්ධෙහි, පිරිසිදුවූවන් සමග; සංවාසං, විසීම; කප්පයෙව්හො, කරන්නාහුය; තතො, නැවත; සමග්ගා, සමගිව; නිපකා, සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූවාහු; දුක්ඛස්සන්තං, දුක් කෙළවර කිරීම; කරිස්සථ, කරන්නාහුය.

552 මන්තා, හදාරණලදශාස්ත්‍රයෝ; අසජ්ඣායමලා, නොපිරවීම මලකොටඇත්තාහ; ඝරා, ගෘහයෝ; අනුට්ඨානමලා, පුරුෂවීර්‍ය නොකිරීම මලකොට ඇත්තාහ; නොහොත්. ඝරා, ගෘහවාසීහු; අනුට්ඨානමලා, කෘෂිවණික් ආදියෙහි වීර්‍යනොකිරීමමලකොටඇත්තාහ; වණ්ණස්ස, ශරීරවර්ණයට; කොසජ්ජං, මැලිබව; මලං, මලකොට ඇත්තේය; රක්ඛතො, කෙත්වත්ආදියමක්රක්නාහට; පමාදො, ප්‍රමාදවීම; මලං, මලකොටඇත්තේය,

553 මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං,
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච;
තතො මලා මලතරං අවිජ්ජා පරමං මලන්ති.

554 යො වෙ න වෙධති පත්වා පරිසං උග්ගවාදිනිං,
න ච හාපෙති වචනං නච්ඡාදෙති සාසනං.

555 අසන්දිද්ධඤ්ච භණති පුච්ඡිතො න ච කුප්පති,
ස වෙ තාදිසකො භික්ඛු දූතෙය්‍යං ගන්තු මරහති,ති.

“මහා වග්ගො දුතියො,,

—o—

556 මනුස්සලාභං ලද්ධාන සද්ධම්මෙ සුප්පවෙදිතෙ,
යෙ එලං නාධිගච්ඡන්ති අති නාමෙන්ති තෙ ඛණං.

---

552 ඉත්ථියා, ස්ත්‍රියට; දුච්චරිතං, දුශ්චරිතය; (ධූතීවීම) මලං, මලය; දදතො, දෙන්නාහට; මච්ඡෙරං, මසුරුකම; මලං, මලය; පාපකාධම්මා, අකුශලධර්මයෝ; අස්මිංලොකෙ, මේ ලොකයෙහිද; පරම්හිච, පරලෙව්හිද; වෙ, එකාන්තයෙන්; මලා, මලයෝයි; තතොමලා, ඒ සියලු මලයටවඩා; මලතරං, අධිකමලයනම්; අවිජ්ජා, (දුඃඛාදි අටතන්හි පැවැත්තාවූ අඥානයයි කියනලද) අවිද්‍යාතොමෝ; පරමංමලං, අතිශයින් කිලිටෙක.

554. 555. යො, යමෙක්තෙම; උග්ගවාදිනිං, තියුණුවාදඇති; පරිසං, පිරිසක්කරා; පත්වා, පැමිණ; වෙ, එකාන්තයෙන්; නවෙධති, කම්පානොවේද; වචනං, වචනය; නචහාපෙති, නොනසාද; සාසනං ශාසනය; නචඡාදෙති, නොවසාද; අසන්දිද්ධඤ්චභණති, නිසැකව කථාකෙරේද; පුච්ඡිතො, ප්‍රශ්නවිචාරණලද්දේ; නකුප්පතිච, නොකිපේද; තාදිසකො, එබඳුවූ; සොභික්ඛු, ඒ භික්ෂුතෙම; වෙ, එකාන්තයෙන්; දූතෙය්‍යංගන්තුං, දූතකර්මයයි කියනලද ශාසනය ගෙනයාමට; අරහති, සුදුසුවේ.

556 යෙ, යම්සත්වකෙණෙක්; මනුස්සලාභං, මනුෂ්‍යාත්මලාභය; ලද්ධාන, ලැබ; සුප්පවෙදිතෙ, මනාකොට වදාරණලද; සද්ධම්මෙ, සද්ධර්මයෙහි; එලං, ඵලයට; නාධිගච්ඡන්ති; නොපැමිණෙත්ද; තෙ, ඔව්හු; ඛණං, ක්ෂණසම්පත්තිය; අතිනාමෙන්ති, ඉක්මවත්.

557 බහූහි අකඛණා වුතතා පුගගලසස නතරායිකා,
කදාචි කරහචි ලොකෙ උපපජ්ජනති තථාගතා.

558 තයිදං සමමුඛිභූතං යං ලොකසම්ං සුදුලලහං,
මනුසස පටිලාභො ච සදධමමසස ච දෙසනා;
අලං වායමිතුං තත්ථ අතථකාමෙන ජනතුනා.

559 කථං විජකඛඤ්ඤ සදධමමං ඛණො වෙ මාඋපචචගා,
ඛණාතීතා හි සොචනති නිරයමහි සමපපිතා.

560 ඉධ චෙව නං විරාධෙති සදධමමසස නියාමිතං,
වාණිජොව අතීතතෙො චිරතතං අනුතපෙසසති.

---

557 පුගගලසස, පුද්ගලයාහට; අනතරායිකා, අනතරායකරවූ; බහූහිඅකඛණා, බොහෝඅක්‍ෂණයෝවියාහි; වුතතා, කියනලද්දහු ය; තථාගතා, බුදුවරයෝ; ලොකෙ, මේලොකයෙහි; කදාචිකරහචි, කිසිකලෙක්හි; උපපජ්ජනති, උපදිත්.

558 ලොකසම්ං, ලොකයෙහි; සුදුලලභං, අතිශයින් දුලීභවූ; තයිදංයං, ඒ මේ යම්ක්‍ෂණයෙක්; සමමුඛිභූතං, සමමුඛවූයේද; මනුසසපටිලාභොච, මනුෂ්‍යාත්මප්‍රතිලාභය (යම්තැනෙක්හි)ද; සදධමම සසාචදෙසනා, සඬම්දෙශනාව (යම්තැනෙක්හි)ද; තත්ථ, එහි; අතථ කාමෙනජනතුනා, ආත්මාර්ථය කැමති සත්‍වයා විසින්; වායමිතුං, උත්සාහකරන්ට; අලං, සුදුසුමය.

559, 560. ඛණො, මේ පැමිණි ක්‍ෂණය; මාඋපචචගා, නොයිත් මේවා; ඛණාතීතාහි, ක්‍ෂණය ඉක්මෙව්වාහු; වෙ, එකාන්තයෙන්; සොචනති, ශොකකෙරෙත්; නිරයමහි, නරකයෙහි; සමපපිතා, දුකින් අර්පිතවූවාහු; කථං, කෙසේ; සදධමමං, සඬම්ය; විජකඛඤ්ඤ, දන්නාහුද; ඉධචෙව, මෙලොකයෙහිම; සඬමමසස, සඬම්යසම්බ න්ධවූ; නංනියාමිතං, ඒ නියමබව හෙවත් ආයම්මාග්ය; විරාධෙත්, (ප්‍රමාදවූහැසිර්මි ඈතික්යියවක්) සිඩනොකෙරේද; අතීතතෙො, ගෙවී නාවූධනයඇති; වාණිජොව, වෙළඳකුමෙන්; (ඒ පුරුෂතෙම) චිර තතං, බොහෝකාලයක්; අනුතපෙසසති, තැවෙන්නේය; (කෙසේ ද? අසවල්තන්හි බඩුසම්ලියයි අසා යම්කිසි වෙළඳෙක් එහි නො යත්තේ නම් අවශෙෂ වෙළඳජනයෝගොස් ගත්තාහුනම් ඔවුන්ට ඒබඩුඅමහුණක්ද දශගුණයක්ද වන්නේය, එහි නොගියාවූවෙළඳ

561 අවිජ්ජා නිවුතො පොසො සද්ධම්මං අපරාධිකො,
ජාති මරණ සංසාරං චිරං පච්චනු හොස්සති.

562 යෙ ච ලද්ධා මනුස්සත්තං සද්ධම්මෙ සුප්පවෙදිතෙ,
අකංසු සත්ථු වචනං කරිස්සන්ති කරොන්ති වා.

563 ඛණං පච්චවිදුං ලොකෙ බ්‍රහ්මචරියං අනුත්තරං,
යෙ මග්ගං පටිපජ්ජිංසු තථාගතප්පවෙදිතං.

564 යෙ සංවරා චක්ඛුමතා දෙසිතා ආදිච්චබන්ධුනා,
තෙසු ගුත්තා සදා සතො විහරෙථ අනවස්සුතො.

---

තෙම මාගේ අර්ථය ඉක්මුනේයයි තැවෙන්නේ සම්සේද එපරිද්දෙන් යමෙක් මේලොකයෙහි ක්ෂණසම්පත්ති ලැබ පිළිනොපදින්නේ නම් එසේ තැවෙන්නේය.)

561 අවිජ්ජානිවුතො, අවිද්‍යාවෙන් වැසුනාවූ; සද්ධම්මං, බුද්ධාදිසත්පුරුෂයන්ගේ ධර්මය; අපරාධිකො, සිඳිනාලාවූ හෙවත් ඉක්මෙව්වාවූ; පොසො, පුරුෂතෙම; ජාතිමරණසංසාර, ඉපදීම් මැරීම් සංඛ්‍යාත සංසාරය; චිරං, බොහෝ කාලයක්; පච්චනුභොස්සති, අනුභවකරන්නේය.

562, 563 යෙ ච, යම්සත්වකෙනෙක්; සුප්පවෙදිතෙ, මනාකොට වදාරණලද; සද්ධම්මෙ, සද්ධර්මය ඇතිකල්හි; මනුස්සත්තං, මනුෂ්‍යත්මය; ලද්ධා, ලැබ; සත්ථුවචනං, බුද්ධවචනය; අකංසු, කළාහුද; කරිස්සන්ති, කරන්නාහුද; වා, හෝ නොහොත්; කරොන්ති, කෙරෙත්ද; ලොකෙ, මේලෝකයෙහි; යෙ, යම්සත්වකෙනෙක්; තථාගතප්පවෙදිතං, සර්වඥදෙශිතවූ; අනුත්තරං, නිරුත්තරවූ; බ්‍රහ්මචරියං, බ්‍රහ්මචර්‍ය්‍යාවය කියනලද; මග්ගං, මාර්ගයෙහි; පටිපජ්ජිංසු, පිළිපන්නාහුද; (ඒ සත්වයෝ) ඛණං, ක්ෂණසම්පත්තිය; පච්චවිදුං, අවබොධ කළාහුවෙත්.

564 චක්ඛුමතා, ඇස්ඇත්තාවූ; ආදිච්චබන්ධුනා, සූර්‍ය්‍යබන්ධුවූ සර්වඥයාවිසින්; යෙ සංවරා, යම්ශීලසංවරකෙනෙක්; දෙසිතා, දෙශනාකරණලද්දාහුද; තෙසු, ඒශීලසංවරයන්හි; ගුත්තා, පිහිටීමෙන් ගුප්තවූයේ; නොහොත්, තෙ, ඒ ශීලසංවරයන්; සුගුප්තනා, මනාකොටරක්නේ; සදා, සියලුකල්හි; සතො, සිහිඇත්තේ; අනවස්සුතො, රාගයෙන් තෙත්නූවූයේ; විහරෙථ, වාසයකරන්නේය,

565 සබ්බෙ අනුසයෙ ඡෙත්වා මාරධෙය්‍ය සරානුගෙ,
තෙ වෙ පාරගතා ලොකෙ යෙ පත්තා ආසවක්ඛයන්ති.

566 මම සඞ්කප්ප මඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො,
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි.

567 යදා මෙ අහු සඞ්කප්පො තතො උත්තරි දෙසයි,
නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චමදෙසයි.

568 තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනන්ති.

“ගහපති වග්ගො නිට්ඨිතො,,

—0—

---

565 මාරධෙය්‍යසරානුගෙ, මාරධෙය්‍යසඞ්ඛ්‍යාතසංසාරය අනුව ගියාවූ; සබ්බෙ අනුසයෙ, සියලු කාමරාග භවරාගානුසයන්; ඡෙත්වා, සිඳ; යෙ, යම්සත්වකෙණෙක්; ආසවක්ඛයං, කාමාදි ආශ්‍රවයන් ක්ෂය කිරීමට; පත්තා, පැමිණියාහුද; ලොකෙ, මේ ලොකයෙහි; තෙ, ඒ සත්වයෝ; වෙ, ඒකාන්තයෙන්; පාරගතා, නිර්වාණයට පැමිණියාහු වෙති.

566 ලොකෙ, ලොකයෙහි; අනුත්තරො, නිරුත්තරවූ; සත්ථා ශාස්තෘතෙම; මම, මාගේ; සඞ්කප්පං, විතර්කය; අඤ්ඤාය, දැන; මනොමයෙන කායෙන, මනොමය ශරීරයෙන් යුක්තව; ඉද්ධියා, ඍද්ධියෙන්; උපසඞ්කමි, (මා)සමීපයට වැඩිසේක.

567 යදා, යම්කලෙක්හි; මෙ, මාගේ; සඞ්කප්පො, විතර්කයෙක්; අහු, වූයේද; තතොඋත්තරි; ඉන්මත්තෙහි; දෙසයි, අෂ්ටමහාපුරුෂ විතර්කයන් දක්වමින් වදාළේය; නිප්පපඤ්චරතො, තෘෂ්ණා දෘෂ්ටිමානරහිත හෙයින් නිෂ්ප්‍රපඤ්ච යයි කියනලද නිර්වාණයෙහි ඇලුනාවූ; බුද්ධො, සර්වඥතෙම; නිප්පපඤ්චං, නිර්වාණපදය; අදෙසයි, දෙශනාකළසේක.

568 අහං, මම; තස්ස, උන්වහන්සේගේ; ධම්මං, ධර්මය; අඤ්ඤාය, දැන; සාසනෙරතො, සස්නෙහි ඇලුනේ; විහාසිං, වාසයකෙළෙමි; තිස්සොවිජ්ජා, ත්‍රිවිද්‍යාවට; අනුප්පත්තා, පැමිණියෙමි; බුද්ධස්ස, සර්වඥයන්වහන්සෙගේ; සාසනං, ශාසනය; කතං, කරණලද්දේය.

569 සද්ධා හිරියං කුසලඤ්ච දානං ධම්මා එතෙ සප්පුරිසානුයාතා,
එතංහිමග්ගංදිවියංවදන්ති එතෙනහිගච්ඡතිදෙවලොකන්ති.

570 යථා පි ඛෙත්තෙ සම්පන්නෙ පවුත්තා බීජ සම්පදා,
දෙවෙ සම්පාදයන්තම්හි හොති ධඤ්ඤස්ස සම්පදා,

571 අනීති සම්පදා හොති විරූළ්හි භවති සම්පදා,
වෙ පුල්ල සම්පදාහොති ඵලං වෙ හොති සම්පදා,

572 එවං සම්පන්න සීලෙසු දින්නා භොජන සම්පදා;
සම්පදං උපනෙන්ති සම්පන්නං හිස්ස තං කතං,

573 තස්මා සම්පද මාකඞ්ඛී සම්පන්නත්ථොධ පුග්ගලො,
සම්පන්න පඤ්ඤෙ සෙවෙථ එවං ඉජ්ඣන්ති සම්පදා.

---

569 සද්ධා, (යම් ශ්‍රද්ධාවකින් දන්දේද ඒ) ශ්‍රද්ධාවද; හිරියං, (යම් ලජ්ජාවකින් දන්දේද ඒ) ලජ්ජාවද; කුසලඤ්ච දානං, නිරවද්‍යදානයදයන; එතෙ ධම්මා, මේ ධර්මයෝ; සප්පුරිසානුයාතා, සත්පුරුෂයන් විසින් අනුදන්නාලද්දහුය; එතංහි මග්ගං, මේ මාර්ගයවනාහි; දිවියන්ති, දිව්‍යලොකයපිළිබඳමාර්ගයයි; වදන්ති, (බුද්ධාදිසත්පුරුෂයෝ) කියත්; හි, එසේ හෙයින්; එතෙන, මේ මාර්ගය කාරණකොටගෙණ; දෙවලොකං, දිව්‍යලොකයට; ගච්ඡන්ති, යෙයි.

570. 571. සම්පන්නෙ, පරිපූර්ණවූහෙවත්සම්පත්තියෙන් යුක්තවූ; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; පවුත්ත බීජසම්පදා, සම්පත්තියෙන්යුත් බීජයෙක්රොපණයකරණලද්දේද; දෙවෙ, වර්ෂාව; සම්පාදයන්තම්හි, මනාකොට වස්නාකල්හි; ධඤ්ඤස්ස, ධාන්‍යයාගේ; සම්පදා, සම්පත්තිය; යථාපිහොති, යම්සේවේද; අනීති, කීටකෘමිආදී ප්‍රාණීන්ගේ; උපද්‍රවයක් නැතිබව; සම්පදාහොති, (එක්) සම්පත්තියක්වේ; විරූළ්හි, වැඞීම; සම්පදාභවති, (දෙවෙනි)සම්පත්තියවේ; වෙපුල්ලං, විපුලත්වය; සම්පදාහොති, (තුන්වන) සම්පත්තියවේ; ඵලං, ඵලය; වෙ, ඒකාන්තයෙන්; සම්පදාහොති, (විතන)සම්පත්තියවේ.

572. 573. එවං, මෙසේ; සම්පන්නසීලෙසු, සම්පූර්ණසිල්වතුන්කෙරෙහි; දින්නා, දෙනලද; භොජනසම්පදා, මධුර භොජනයය; සම්පදං, ත්‍රිවිධකුශලසම්පත්තිය; උපනෙන්ති, එළඹෙයි; (කවරහෙයක්නිසාද) තං කතං, ඒ කරණලදකර්මය; හි, යම්හෙයකින්; සම්පන්නං අස්ස, සම්පූර්ණවන්නේද; තස්මා, එහෙයින්; සම්පදං, සම්ප

574 විජ්ජාචරණ සම්පන්නා ලද්ධා චිත්තස්ස සම්පදං,
කරොන්ති කම්ම සම්පදං ලභන්ති ච අත්ථ සම්පදං.

575 ලොකං ඤත්වා යථාභූතං පප්පුය්‍ය දිට්ඨි සම්පදං,
මග්ග සම්පද මාගම්ම යාති සම්පන්න මානසො.

576 ඔධුනිත්වා මලං සබ්බං පත්වා නිබ්බාණ සම්පදං,
මුච්චන්ති සබ්බ දුක්ඛෙහි සා හොති සබ්බ සම්පදා,ති.

577 සුචිං පණීතං කාලෙන කප්පියං පාන භොජනං,
අභිණ්හං දදන්ති අන්නානි සුඤ්ඤබෙතා බ්‍රහ්මචාරිසු.

578 නච විප්පටිසාරිස්ස ඛජ්ජිත්වා ආමිසං බහුං,
එවං දින්නානි දානානි වණ්ණයන්ති විපස්සිනො.

---

නනීය; ආකඞ්ඛී, කැමතිවූ; පුග්ගලො, පුද්ගලතෙම; ඉධ, මේ ලොකයෙහි; සම්පන්නමෙත්ථ, සම්පූර්ණ අර්ථ ඇත්තේ; සම්පන්නපඤ්ඤ, සම්පූර්ණ ප්‍රාඥයන්; සෙවෙථ, සෙවනයකරන්නේය; සම්පදා, කුශල සම්පත්තීනු; එවං, මෙසේ; ඉච්ඡන්ති, සිද්ධකෙරෙත්.

574 විජ්ජාචරණසම්පන්නා, ත්‍රිවිද්‍යාවෙන්හා පසළොස් චරණ ධර්මයන්ගෙන්යුක්තවූයේ, චිත්තස්සසම්පදං, (අවිකෘතවූ) චිත්තසම්පත්තිය; ලද්ධා, ලැබ; කම්මසම්පදං, සම්පූර්ණ කර්මය; කරොති; කෙරෙයි; අත්ථසම්පදඤ්ච, අර්ථසම්පත්තියද, (සම්පූර්ණකොට;) ලභති ලබන්නේය.

575 ලොකං, (ස්කන්ධායතන ධාතු සඞ්ඛ්‍යාත) ලොකය; යථාභූතං, තත්වූපරිද්දෙන්; ඤත්වා, දැන; දිට්ඨිසම්පදං, විදර්ශනාඥානදෘෂ්ටිය; පප්පුය්‍ය, පැමිණ; මග්ගසම්පදං, ශ්‍රොතාපත්තිමාර්ගයට; ආගම්ම, අවුත්; සම්පන්නමානසො, පිරුණුසිත් ඇත්තේ; යාති, අර්හත්වයටපැමිණේ.

576 සබ්බංමලං, රාගාදිසියලුමලය; ඔධුනිත්වා, නසා; නිබ්බාණසම්පදං, නිර්වාණ සම්පත්තියට; පත්වා, පැමිණ; සබ්බදුක්ඛෙහි; සියලු දුකින්; මුච්චන්ති, මිදෙන්නුලැබී; සා, ඒ දුකින්මිදීම; සබ්බසම්පදා හොති, සියලු සම්පත්ති නම් වන්නීය.

577. 578, පානභොජනං, පැන්හා බොජුන්; සුචිං, පිරිසිදුව දෙන්නේද; පණීතං, රසයෙන්යුක්තව දෙන්නේද; කාලෙන, සුදුසු කාලයෙහි දෙන්නේද, කප්පියං, කැපහොන්නය දෙන්නේද; සුඤ්ඤබෙතා, මනාකොටහුනුයෙහි; බ්‍රහ්මචාරිසු, ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාව ඇත්තාවූන්ට

579 එවං සජ්ඣා මෙධාවී සද්ධා මුත්තෙන චෙතසා,
අව්‍යාපජ්ඣං සුඛං ලොකං පණ්ඩිතො උපපජ්ජති,ති.

580 බහූනං වත අත්ථාය සප්පඤ්ඤො ඝරමාවසං,
මාතරං පිතරං පුබ්බෙ රත්තින්දිවමතන්දිතො.

581 පූජෙති සහධම්මෙන පුබ්බෙ කත මනුස්සරං,
අනාගාරෙ පබ්බජිතෙ අපචෙ බ්‍රහ්මචාරයො.

582 නිවිට්ඨ සද්ධො පූජෙති ඤත්වා ධම්මෙ ච පෙසලෙ,
රඤ්ඤො හිතො දෙවහිතො ඤාතීනං සඛිනං හිතො.

583 සබ්බසං ස හිතො හොති සද්ධම්මෙ සුප්පතිට්ඨිතො,
විනෙය්‍ය මච්ඡෙර මලං ස ලොකං භජතෙ සිවනති.

“දූත වග්ගො චතුත්ථො,,

—— 0 ——

---

අභිංසං, නිතර; දූතානි, (මේ සඳොතකා) දූතයන්; දදන්ති, දෙත්තේද; බහු ආමිසං, බොහෝ ආහාරය; චජ්ජාච, දී; නවිප්පටිසාරී අස්ස, විපිළිසර නොවන්නේද; එවං, මෙසේ; දින්නානි, දෙනලද; දූතානි, දූතයන්; විපස්සිනො, විශෙෂයෙන්දක්නානු; වණ්ණයන්ති, වණ්නා කෙරෙත්.

579. (207. වෙනි අඞකය බලනු)

580. 581. සප්පඤ්ඤො, පණ්ඩිතතෙම; ඝරං, ගෘහයෙහි; ආවසං, වාසයකරන්නේ; බහූනං, බොහෝදෙනාට; වත, එකාන්තයෙන්; අත්ථාය, ප්‍රයොජනය පිණිසම; පුබ්බෙ, පළමුකොට; මාතරං, මව්ද; පිතරං, පියාද; රත්තිංදිවං, රෑදවල් දෙක්හි; පුබ්බෙකතං, පෙරකරණලද උපකාරය; අනුස්සරං, සිහිකරමින්; සහධම්මෙන, කරුණුසහිතව; ගෙවත් වස්ත්‍රාභරණාදිය දීමෙන්; පූජෙති, පුදයි; අනාගාරෙ, ශාසනයෙහි; පබ්බජිතෙ, පැවිදිවූ, බ්‍රහ්මචාරයො, ශ්‍රෙෂ්ඨවූහැසිරීම්ඇත්තාවූන්ට; අපචෙ, යටත්පැවතුම් ඇතිබවට පැමිණෙන්.

582. 583 ඉධ, මේශාසනයෙහි; ධම්මං, ධර්මය; ඤත්වා, දැන; නිවිට්ඨසද්ධො, පිහිටුශ්‍රද්ධාඇත්තේ; පෙසලෙ, ප්‍රියශීලි පුද්ගලයන්; පූජෙති, පුදයි; රඤ්ඤො, රජහට; හිතො, හිතවේ; දෙවහිතො, දෙවියන්ට හිතවේ; ඤාතීනං, නෑයන්ටද; සඛිනං, මිත්‍රයන්ටද; හිතො, හිතවේ; සද්ධම්මෙ, සධර්මයෙහි; සුප්පතිට්ඨිතො, මනාකොට පිහිටියාවූ; සො, ඒ සත්පුරුෂතෙම; සබ්බසං, සියලුදෙනාට; හිතොහොති, හිතවේ; සො, හෙතෙම; මච්ඡෙරමලං, මසුරුමල; විනෙය්‍ය, දුරුකොට; සිවංලොකං, දිව්‍යලොකය; භජතෙ, භජනයකෙරේ.

584 පාණං න හානෙ න චදින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාල භොජනං.

585 මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායඤ්ච සයෙථ සන්ථතෙ,
එතංහි අට්ඨංගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං.

586 චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා,
තමොනුදා තෙ පන අන්තලික්ඛගා
නභෙ පභාසෙන්ති දිසා විරොචනා.

587 එතස්මිං යං විජ්ජති අන්තරෙ ධනං
මුත්තා මණි වෙළුරියඤ්ච භද්දකං,
සිංගී සුවණ්ණං අථවාපි කඤ්චනං
යං ජාතරූපං හටකන්ති වුච්චති.

588 අට්ඨංගුපෙතස්ස උපොසථස්ස
කලම්පි තෙ නානුභවන්ති සොළසිං,
චන්දප්පභා තාරගණා ච සබ්බෙ
තස්මා හි නාරී ච නරො ච සීලවා.

589 අට්ඨංගුපෙතං උපවස්සුපොසථං,
පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි;
අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.

590. සිට 595 පාණං න හානෙ=පෙ=සග්ගමුපෙන්ති ඨානන්ති.

596. සිට 601. පාණං න හානෙ=පෙ=සග්ගමුපෙන්ති ඨානන්ති.

602 යො තං භරති සබ්බදා නිච්චං ආතාපි උස්සුකො,
(තං) සබ්බකාමහරං පොසං භත්තාරං නාතිමඤ්ඤති.

603 නචාපි සොත්ථී භත්තාරං ඉස්සාචාරෙන රොසයෙ,
භත්තුච ගරුනො සබ්බෙ පටිපූජෙති පණ්ඩිතා.

---

584. සිට 601. (82. සිට 87 වෙනි අඞ්ක බලනු.)

604 උට්ඨායිකා අනලසා සඞ්ගහිත පරිජ්ජනා,
භත්තු මනාපා චරති සම්භතං අනුරක්ඛති.

605 යා එවං වත්තති නාරී භත්තු ඡන්ද වසානුගා,
මනාපා නාම තෙ දෙවා යත්ථ සා උපපජ්ජති,ති.

606. සිට. 609. යො තං භරති සබ්බදා=පෙ=නා උපපජ්ජති,ති.
610. සිට. 613. යො තං භරති=පෙ=යත්ථ සා උපපජ්ජති,ති.

614 සුසංවිහිත කම්මන්තා සඞ්ගහිත පරිජ්ජනා,
භත්තු මනාපා චරති සම්භතං අනුරක්ඛති.

615 සද්ධා සීලෙන සම්පන්නා වදඤ්ඤූ වීත මච්ඡරා,
නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

616 ඉච්චෙ තෙ අට්ඨ ධම්මා යස්සා විජ්ජන්ති නාරියා,
තම්පි සීලවතිං ආහු ධම්මට්ඨං සච්ච වාදිනිං.

617 සොළසාකාර සම්පන්නා අට්ඨඞ්ග සුසමාගතා,
සාතාදිසී සීලවතී උපාසිකා උපපජ්ජති දෙවලොකං මනාපං.ති.

---

602. සිට. 613. (303. සිට. 306. වෙනි අඩකාවලත)

614. 615. 616. සුසංවිහිතකම්මන්තා, මනාකොට කරණලද කර්මාන්ත ඇත්තීද; සඞ්ගහිත පරිජ්ජනා, සංග්‍රහකරණලද පිරිවරජනයා ඇත්තීද; භත්තුමනාපා, ස්වාමියාගේ මනවඩන්නී; චරති, හැසිරෙන්නීද; සම්භතං, (ස්වාමියාවිසින්) රැස්කරණලද්දක්; අනුරක්ඛති, අනුකූලව රක්ෂාකරන්නීද; සද්ධාසීලෙන සම්පන්නා, ශ්‍රද්ධාවෙන්හා ශීලයෙන්යුක්තවීද; වදඤ්ඤූ, (යාචකයන්ගේ)වචනදන්නීද; වීතමච්ඡරා; පහවූමසුරුමල ඇත්තීද; සොත්ථානං, සැපවූ; සම්පරායිකං, පරලොවටහිතවූ; මග්ගං, මාර්ගය; නිච්චං, නිරන්තරයෙන්; විසොධෙති, පිරිසිදුකරන්නීද; ඉති, මෙසේ; එතෙ අට්ඨධම්මා, මේඅටකාරණයෝ; යස්සා නාරියා, යම් ස්ත්‍රියකුට; විජ්ජන්ති, විද්‍යමානවෙත්ද ධම්මට්ඨං, කුශලධර්මයෙහි පිහිටියාවූ; සච්චවාදිනිං, සත්‍යවචන කියන්නාවූ; තම්පි, ඒස්ත්‍රීද; සීලවතිං, ශීලවතයෙන්යුක්තායයි; ආහු, කියත්.

617 සොළසාකාර සම්පන්නා, (සූත්‍රයෙහි කියනලද අෂ්ටාකාරයෙන්හා අට්ඨකථාවෙහි කියනලද අෂ්ටාකාරයෙන් දෙකින) සොළොස් ආකාරයෙන්යුක්තාවූ*; අට්ඨඞ්ගසුසමාගතා, අෂ්ටගුණාඞ්ගයන් යුක්ත

---

* ඒ සූත්‍රපිළිබඳ යම් අෂ්ටාඞ්ගයකෙණෙක් වෙත්ද ඒ අෂ්ටාඞ්ගයන්ම අනුන්ද සමාදන් කරවන්නීය මෙසේද සොළසාකාරයෙන් යුක්තාවිය. R

618. සිට 621. සුසංවිහිතකම්මන්තා=පෙ=දෙවලොකං වතාපනති.

"උපොසථ වග්ගො පඤ්චමො,,

"පඨමො පණ්ණාසකො,,

—— 0 ——

622 උට්ඨාතා කම්මධෙය්‍යසු අප්පමත්තො විධානවා,
සමං කප්පෙති ජීවිකං සම්භතං අනුරක්ඛති.

623 සද්ධො සීලෙන සම්පන්නො වදඤ්ඤූ වීත මච්ඡරො,
නිච්චං මග්ගං විසොධෙති සොත්ථානං සම්පරායිකං.

624 ඉච්චෙ තෙ අට්ඨ ධම්මා සද්ධස්ස ඝර මෙසිනො,
අක්ඛාතා සච්චනාමෙන උභයත්ථ සුඛාවහා.

625 දිට්ඨ ධම්ම හිතත්ථාය සම්පරාය සුඛාය ච,
එවං මෙතං ගහට්ඨානං චාගො පුඤ්ඤං පවඩ්ඪතී,ති.

---

වූ; තාදිසී, එබඳුවූ; සීලවතී, ශීල්වත්වූ; සාඋපාසිකා, ඒඋපාසිකාතොමෝ; මනාපං, මනාපනම්වූ; දෙවලොකං,(නිර්මාණරති) දිව්‍යලොකයෙහි; උපපජ්ජති, උපදින්නීය.

618. සිට. 621, (614, සිට. 617, වෙනි අඩක බලනු)

622. 623. 624. අප්පමත්තො,(සමෘතිඅවිප්‍රවාසයයිකියනලද) අප්‍රමාදඇත්තේ; කම්මධෙය්‍යසු, කර්මාන්තකරණතන්හි; උට්ඨාතා, උට්ඨානවීර්‍ය්‍යයෙන් යුක්තවූයේද; විධානවා,(ඒ ඒ) කර්මාන්තවිධානකිරීමෙන් යුක්තවූයේද; ජීවිකං, ජීවිකාවෘත්තිය; සමං කප්පෙති, සම කොටකෙරේද; සම්භතං, රැස්කරණලද්දක්; අනුරක්ඛති, රක්‍ෂාකෙරේද; සද්ධො, ශ්‍රද්ධාඇත්තේද; සීලෙනසම්පන්නො, ශීලයෙන්යුක්ත වූයේද; වදඤ්ඤූ, (යාචකයන්ගේ) වචනදන්නේද; වීතමච්ඡරො, පහවූ මසුරුමලඇත්තේද; සම්පරායිකං, පරලොවිහි විපාකදීම්ඇති; සොත්ථානං,(මහත්) සුවයටහෙතුවූ; මග්ගං, මාර්ගය; නිච්චං, නිතර; විසොධෙති, පිරිසිදුකෙරේද; ඉති, මෙසේ; එතෙඅට්ඨධම්මා, මේ අටකාරණයෝ; ඝරමෙසිනො, ගෘහවාසයෙන් යුක්තවූ; සද්ධස්ස, ශ්‍රද්ධාවන්තයාහට; උභයත්ථ, දෙලොවෙහි; සුඛාවහා, සැපඑලවන්නාහුයයි; සච්චනාමෙන, සත්‍යනම්ඇති සර්වඥයාවිසින්; අක්ඛාතා, වදාරණලද්දාහුය.

625. එවං, මෙසේ; ගහට්ඨානං, ගෘහස්ථයන්ට; චාගො, ත්‍යාගය

626. සිට. 629. උට්ඨාතා කම්මධෙය්‍යෙසු=පෙ=පුඤ්ඤං පවඩ්ඪතී,ති,

630 භයං දුක්ඛඤ්ච රොගො ච(ගණ්ඩො)සඞ්ගා පඞ්කා චූභයං,
එතෙ කාමා පවුච්චන්ති යත්ථ සත්තො පුථුජ්ජනො.

631 ඔතිණ්ණො සාතරූපෙන පුන ගබ්භාය ගච්ඡති,
යතො ච භික්ඛු ආතාපී සම්පජඤ්ඤං න රිඤ්චති.

632 සො ඉමං පලිපං දුග්ගං අතික්කම්ම තථාවිධො,
පජං ජාතිජරූපෙතං ඵන්දමානං අවෙක්ඛතී;ති.

633 චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො.

634 යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතං ඔපධිකං පුඤ්ඤං සඞ්ඝෙ දින්නං මහප්ඵලන්ති.

---

තෙමෙද; දිට්ඨධම්මහිතත්ථාය. ඉහාත්මයෙහි සැපපිණිසද; සම්පරායසුඛාය ච. පරලොව සැපපිණිසදපවතියි; එතංපුඤ්ඤං, මෙම පින ද; පවඩ්ඪති, ප්‍රකාරයෙන් වැඩෙයි.

626. සිට. 629. (622. සිට. 625. වෙනි අඞ්ක බලනු).

630. (396. වෙනි අඞ්කය බලනු).

631. 632. සාතරූපෙන, පස්කම්සුවයෙන්; ඔතිණ්ණො, බැසුවූයේ; පුනගබ්භාය, නැවත භවයෙහි ඉපදීම පිණිස; ගච්ඡති, යෙයි; භික්ඛු, මහණතෙම; යතොච, යම්කාලයෙක්හි; ආතාපී, කෙලෙස් තවන වීර්‍ය්‍යඇත්තේ; සම්පජඤ්ඤං,සම්‍යක්ප්‍රඥාව; නරිඤ්චති, නොහැරද; තථාවිධො, එබඳුවූ; සො, ඒ මහණතෙම; දුග්ගං, යාමනාහැකිවූ; ඉමංපලිපං, මේ (කාම)පලිපය; අතික්කම්ම, ඉක්මවා; ජාතිජරූපෙතං, ජාතිජරාවන්ගෙන්යුක්තවූ;ඵන්දමානං,(භවත්‍රයෙහි)කම්පාවන්නාවූ; පජං, ප්‍රජාව; අවෙක්ඛති, බලයි.

633 පටිපන්නා, (සෝවාන්ඵලය ආදිකොට ඇති සතරඵලය සාක්ෂාත් කිරීමපිණිස) පිළිපන්නාවූ; චත්තාරොච, සතරදෙනද; ඵලෙඨිතා, ඵලයෙහිපිහිටියාවූ; චත්තාරොච, සතරදෙනද, එසොසඞ්ඝො, මේ (අෂ්ටාර්‍ය්‍යපුද්ගල) සඞ්ඝතෙම; උජුභූතො, (කායවඞ්කාදිය රහිත හෙයින්) ඍජුවූයේය; පඤ්ඤාසීලසමාහිතො, (ආර්‍ය්‍ය)ප්‍රඥාවෙන්ද ශීලයෙන් යුක්තය.

634 යජමානානං, දන්දෙන්නාවූ; පුඤ්ඤපෙක්ඛාන පාණිනං,

635 චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
එස සඞ්ඝො සමුක්කට්ඨො සත්තානං අට්ඨ පුග්ගලා.

636 යජමානානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතං ඔපධිකං පුඤ්ඤං එත්ථ දින්නං මහප්ඵලං.

"ලොකම්හි වග්ගො ඡට්ඨො,,

——0——

637 තුලමතුලඤ්ච සම්භවං භවසඞ්ඛාර මවස්සජි මුනි,
අජ්ඣත්ත රතො සමාහිතො අභින්ද කවච මිවත්ත සම්භවං.

"චාපාල වග්ගො සත්තමො,,

——0——

---

පින් කැමැති ප්‍රාණීන්ට; ඔපධිකං, උපධිවිපාක දෙන්නාවූ; පුඤ්ඤං, කුසල්; කරොතං, කරන්නාවූ; මනුස්සානං, මිනිසුන්ට; සඞ්ඝෙ, (මේ)සඞ්ඝයා කෙරෙහි; දින්නං, දෙනලද දෙය; මහප්ඵලං, මහත්ඵලවේ.

635 පටිපන්නා, පිළිපන්නාවූ; චත්තාරොච, සතරදෙනද; ඵලෙ ඨිතා, ඵලයෙහි පිහිටියාවූ; චත්තාරොච, සතර දෙනදයන; අට්ඨපුග්ගලා, අෂ්ටාර්‍ය පුද්ගලයෝකෙණෙක් වෙත්ද; එසො සඞ්ඝො, මේ සංඝතෙම; සත්තානං, සත්ත්වයන්ට; සමුක්කට්ඨො, (අතිශයින්) උත්කෘෂ්ටවේ.

636. (634. වෙනි අධ්‍යාය බලනු).

637 මුනි, සර්වඥතෙම; තුලං, පමණකරණලද්ද හෙයින් නොහොත් සුළුවිපාකහෙයින් තුලයයි කියනලද කාමාවචර කර්ම්‍යහා රූපාවචරයද; අතුලඤ්ච, ඊට අසමාන හෙයින් හෝ මහත්විපාක ඇතිහෙයින් අතුලයයි කියනලද අරූපාවචරයද; සම්භවං, අතිශයින් උපදිම්ටහේතුවූ; භවසඞ්ඛාරං (නැවත නැවත) භවය රැස්කරන්නාවූ භවගාමිකර්මය; අවස්සජි, විශේෂයෙන් හැරියේය; නොහොත්, අතුලඤ්ච නිර්වාණයද; සම්භවං, භවයද; තුලං, තීරණයකරන්නාවූ; නොහොත් පඤ්චස්කන්ධයෝ අනිත්‍යයෝය, පඤ්චස්කන්ධයන්ගේ නිරොධයයි කියනලද නිර්වාණය නිත්‍යය, යනමේ ආදික්‍රමයෙන්ද තීරණය කරන්නාවූ; මුනි, සර්වඥතෙම; භවසඞ්ඛාරං, (පඤ්චස්කන්ධයන්ට මුල්වූ) භවසංස්කාරයයි කියනලද භවගාමිකර්මය; අවස්සජි, භවයෙහි ආදීනවයද නිර්වාණයෙහි ආනිසංසයද දැක "කම්මං කම්මක්ඛයාය සංවත්තති,, යයි වදාළාවූ කර්මක්ෂයකරවූ ආර්‍යමාර්ගයෙන් හැරියේය; කෙසේද? අජ්ඣත්තරතො, (විදර්ශනාවශයෙන්) අධ්‍යාත්මයෙහි ඇලුනේ; සමාහිතො, (ශමථවශයෙන්) එකඟවූයේ; කවචම්ව, (සංග්‍රාමශීර්ෂයෙහි මහායොධයකු සවාත්මභාවය වැළඳගතයිසි) සන්නා

638. සිට. 641. උට්ඨාතාකම්මධෙය්‍යපදං=පෙ=පුරසැරූපවිසන්තීති,
642. සිට. 645. උට්ඨාතාකම්මධෙය්‍යපදං=පෙ=පුරසැරූපවිසන්තීති,
"යමක වග්ගො අට්ඨමො,,

—— 0 ——

646. යං සමණෙන පත්තබ්බං, බ්‍රාහ්මණෙන වුසීමතා,
යං වෙදගුනා පත්තබ්බං, භිසක්කෙන අනුත්තරං.

647. යං නිම්මලෙන පත්තබ්බං, විමලෙන සුචීමතා,
යං ඤාණියා පත්තබ්බං, විමුත්තෙන අනුත්තරං.

648. සොහං විජිත සඞ්ගාමො, මුත්තො මොචෙමි බන්ධනා,
නාගොම්හි පරමං දන්තො, අසෙඛො පරිනිබ්බුතොති.

"සති වග්ගො නවමො,,

—— 0 ——

# අට්ඨක නිපාතො සමත්තො.

---

හයක්සේ; අත්තසම්භවං, (ආත්මයෙහි කෙරෙහි හටගත් හෙයින්) ආත්මසම්භවයයි කියනලද සියලු ක්ලේශසමූහය; අභිද, (පුවීගගයෙහි පමණ් ශමර්ථ විදශීන්නා බලයෙක්) බිඳහැරියේක; (මෙසේ ක්ලේශප්‍රහාණයෙන් නමින් හැරියේය, ප්‍රහීණකරණලද කෙලෙස් ඇති සම්බුද්ධයාගේ කිසිවකුට බියෙක් නම් නැත්තේය, එහෙයින් නිර්භීතව පිරිනිවන්පාන්ට තුන්මසකට පෙර ආයුසංස්කාරය හැර වදාළේය, ඒ නිර්භීතභාවය ප්‍රකාශකරණ පිණිස "තුලමතුලඤ්ච,, යනාදීවූ ප්‍රීති වාක්‍යය පහළකළේයයි දතයුතු).

638. සිට. 643. (622. සිට. 625. වෙනි අඞ්ක බලනු).

646. 647. 648. සමණෙන, ශ්‍රමණයයි කියනලබන්නාවූ තථාගතයන්විසින්; පත්තබ්බං, පැමිණියයුතුවූ; යං, යම්ගුණයෙක්ඇද්ද; වුසීමතා, වැසනිමවනලද මාර්ග බ්‍රහ්මචර්යාව ඇති; බ්‍රාහ්මණෙන, බ්‍රාහ්මණයයි කියනලබන්නාවූ තථාගතයන් විසින්; (පැමිණියයුතුයම් ගුණයෙක් ඇද්ද) වෙදගුනා, වේදගූයයි කියනලබන්නාවූ තථාගතයන්විසින්; පත්තබ්බං, පැමිණියයුතුවූ; යං, යම්ගුණයෙක් ඇද්ද, භිසක්කෙන, භිෂක්යයි කියනලබන්නාවූ තථාගතයන්විසින්; අනුත්තරං, (පැමිණියයුතු යම්) නිරුත්තරගුණයෙක් ඇද්ද; නිම්මලෙන,

649 සම්බාධෙ වත ඔකාසං අවිදා භූරිමෙධසො,
යො ඣානමබුජ්ඣි බුද්ධො පටිලීනනිසභො මුනී,ති.

"නවක නිපාතො සමත්තො,,

—— o ——

650 කාමච්ඡන්දො ච ව්‍යාපාදො ථීනමිද්ධඤ්ච භික්ඛුනො,
උද්ධච්චං විචිකිච්ඡා ච සබ්බසො ව න විජ්ජති,

651 අසෙඛෙන ච සීලෙන අසෙඛෙන සමාධිනා.
විමුත්තියා ච සම්පන්නො ඤාණෙන ච තථාවිධො,

---

නිම්මලයයි කියනුලබන්නාවූ තථාගතයන් විසින්; පත්තබ්බං, පැමිණියයුතුවූ; යං, යම්ගුණයෙක් ඇද්ද; සුචිමතා, පිරිසිදු සිත්ඇති; විමලෙන, විමලයයි කියනු ලබන්නාවූ තථාගතයන්විසින්; (පැමිණිය යුතු යම්ගුණයෙක් ඇද්ද) ඤාණිනා, ඤාණීයයි කියනු ලබන්නාවූ තථාගතයන්විසින්; පත්තබ්බං, පැමිණියයුතුවූ; යං, යම්ගුණයෙක්ඇද්ද; විමුත්තෙන, විමුක්තයයි කියනුලබන්නාවූ තථාගතයන් විසින්; අනුත්තරං, (පැමිණියයුතුයම්)නිරුත්තර ගුණයෙක්ඇද්ද; සොඅහං, ඒමම; විජිතසඞ්ගාමො, දිනනලද ක්ලේශසංග්‍රාමඇත්තේ; මුත්තො, (සියලුබන්ධනයෙන්) මිදුනෙම්; බන්ධනා, (මහජනයාදරාගාදි) බන්ධනයෙන්; මොචෙමි, මුදවමි; පරමදන්තො, උතුම්කොටදමුනේ, (නොහොත් පරොපදෙශරහිතව ස්වයම්භුඥානයෙන් ප්‍රතිවෙධකොට)පාරමාත්මදමනයෙන් දමනයවූයේ; අසෙඛො, අශෛක්ෂවූයේ; පරිනිබ්බුතො, (ක්ලේශපරිනිර්වාණයෙන්) පිරිනිවිමට පැමිණියෙමි.

649 යොබුද්ධො, යම්සර්වඥයෙක්තෙම; භූරිමෙධසො, මහත්ප්‍රඥාඇත්තේ; ඣානං, (යම්) ධ්‍යානයක්; අබුජ්ඣි, අවබොධකළයේද්ද; තමෙව ඔකාසං, ඔකාසාධිගමයයි කියනලද ඒධ්‍යානය; සම්බාධෙව, (තෘෂ්ණා සංක්ලේශාදීයෙන්) පෙළීම්ඇතිකල්හිම; අවිදා, දැනවදාළේය; මුනී, ඒසර්වඥතෙම;පතිලීනනිසභො,(ඒකාග්‍රබැවිවශයෙන්;)පතිලීනයයිද උත්තමාර්ථයෙන් නිසභය*සිදකියනුලැබේ; නොහොත් ප්‍රහීණමානය ඇත්තවුන් අතුරෙන් ශ්‍රේෂ්ඨවී.

650. 651. 652. භික්ඛුනො, භික්ෂුහට; කාමච්ඡන්දව, කාමච්ඡ

---

* ගවයන් සියයකට ශ්‍රෙෂ්ඨවූයේ "උසභය,, ගවයන් දහසකට ශ්‍රෙෂ්ඨවූයේ "වසභය, නොහොත් ගාල්සියයකට ශ්‍රෙෂ්ඨවූයේ "උසභය,, ගාල්දහසකට ශ්‍රෙෂ්ඨවූයේ "වෘෂභය,, සියලුගවයන්ට ශ්‍රෙෂ්ඨවූ සියලුඋපද්‍රවසහනයකරන්නාවූ සර්වශ්වේතවූ පැහැදීම්ඵලවත්නාවූ මහත්බර ඉසිලීමෙහි සමර්ථවූ අසනිශබ්දයිසගර්ජනද කම්පාකළනොහැකිවූයේ "නිසභ,, නම්වෙ.

652 සවෙ පඤ්චඞ්ග සම්පන්නො පඤ්ච අඞ්ග විවජ්ජයං,
ස වෙ ඉමස්මිං ධම්ම විනයෙ කෙවලී ඉති වුච්චතී,ති.

"නාථකරණ වග්ගො දුතියො,,

———o———

653 අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පිය සාත රූපං,
එකො හං ඣායං සුඛ මනුබොධිං
තස්මා ජනෙන න කරොමි සක්ඛිං
සක්ඛි න සම්පජ්ජති කෙනචි මෙ,ති.

654 අත්ථස්සපත්තිං හදයස්සසන්තිං — පෙ — නසම්පජ්ජතිකෙනචිමෙති.

"ඛෙමා වග්ගො තතියො,,

———o———

---

ඡන්දයද; ව්‍යාපාදෙ, ව්‍යාපාදයද; ථීනමිද්ධඤ්ච, ථීනමිද්ධයද; උද්ධච්චං, ඖද්ධත්‍යයද; විචිකිච්ඡාච, විචිකිත්සාවද; (යන මේ නීවරණපස) සබ්බසොච, සර්වප්‍රකාරයෙන්ම; නවිජ්ජන්ති, නැත්තේද; අසෙඛෙන ච සීලෙන, අශෛක්‍ෂ (ධර්මයන්ට අනාගාමී ලොකොත්තර) ශීලයෙන්ද; අසෙඛෙනසමාධිනා, අශෛක්‍ෂසමාධියෙන්ද; විමුත්තියාච, ඵලවිමුක්තියෙන්ද; සම්පන්නො, යුක්තාවේ; ඤාණෙනච, විමුක්තිඥානදර්ශනයෙන්ද; තාථාවිධො, එබඳුවේ; සවෙ, ඉදින්; පඤ්චඅඞ්ගවිවජ්ජයං, කාමච්ඡන්දාදි පඤ්චාඞ්ගය දුරුකරන්නේ; පඤ්චඞ්ගසම්පන්නො, විතර්කාදි පඤ්චාඞ්ගයෙන් යුක්තවූයේද; සො, ඒ භික්‍ෂුතෙම; වෙ, එකාන්තයෙන්; ඉමස්මිංධම්මවිනයෙ, මේධර්මවිනයෙහි; කෙවලී ඉති, සමස්තගුණයෙන්යුක්තයයි; වුච්චති, කියනුලැබේ.

653. 654. පියසාතරූපං, (ප්‍රියසුඛස්වරූප ඇත්තාවූ වස්තූන් කෙරෙහිඋපදනාහෙයින්) ප්‍රියසාතරූප නම්වූ; සෙනං, (රාගාදිකෙලශ) සෙනාව; ජෙත්වාන, ජයගෙන; අහං, මම; එකො, හුදකලාව; අත්ථස්ස, පත්තිං, අර්ථසිද්ධියතලද අභිමතයපැමිණීමද; හදයස්සසන්තිං, චිත්තයාගේශාන්තියද හෙවත් චෙතොශමථයද; ඣායං, ධ්‍යානකරන්නේ; හෙවත් වඩන්නේ; සුඛං, (ලොකොත්තරවූ) සුවය; අනුබොධිං, අවබොධකෙළෙමි; තස්මා, එහෙයින්; ජනෙන, කිසිසත්වයකුකරණකොටගෙණ; සක්ඛිං, ධර්මශාක්‍ෂියක්; නකරොමි, නොකරමි; මෙ, මට; කෙනචි, කිසිසත්වයකුසමග; සක්ඛි මිත්‍රධර්මයෙක්; නසම්පජ්ජති, නැත්තේය.

655 ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො,
වග්ගරතො අධම්මට්ඨො යොගක්ඛෙමා පධංසති;
සඞ්ඝං සමග්ගං භෙත්වාන කප්පං නිරයම්හි පච්චති.ති.

656 සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානඤ්චනුග්ගහො,
සමග්ගරතො ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසති;
සඞ්ඝං සමග්ගං කත්වාන කප්පං සග්ගම්හි මොදතී.ති.

“උපාලි වග්ගො චතුත්ථො,, “අක්කොස වග්ගො පඤ්චමො,,
පඨමො පණ්ණාසකො.

—0—

657 ධනෙන ධඤ්ඤෙන ච යො'ධ වඩ්ඪති
පුත්තෙහි දාරෙහි චතුප්පදෙහි,
ස භොගවා හොති යසස්සි පූජිතො
ඤාතීහි මිත්තෙහි අථො පි රාජුභි.

658 සද්ධාය සීලෙන ච යො'ධ වඩ්ඪති
පඤ්ඤාය චාගෙන සුතෙන චූභයං,
සො තාදිසො සප්පුරිසො විචක්ඛණො
දිට්ඨෙව ධම්මෙ උභයෙන වඩ්ඪතී,ති.
“වුඩ්ඪි වග්ගො තතියො,,

---

655 වග්ගරතො, භෙදකිරීමෙහිඇලුණාවූ; අධම්මට්ඨො, අධර්මයෙහි පිහිටියාවූ; සඞ්ඝභෙදකො, සඞ්ඝභෙදකපුද්ගලතෙම; ආපායිකො, අපායට යායුතුවේ; නෙරයිකො, නිරයෙහි උපදනේ; කප්පට්ඨො, කල්පයක් සිටීවි; යොගක්ඛෙමා, යොගක්ෂෙමයයි කියනලද අර්හත්වයෙන්; පධංසති, පහවෙයි; සමග්ගං සඞ්ඝං, සමගිසඞ්ඝයා; භෙත්වාන, භෙදකොට; කප්පං, ආයුෂ්කල්පය මුළුල්ලෙහි; නිරයම්හි, නරකයෙහි; පච්චති, පැසෙනුලැබේ

656 සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; සාමග්ගී, සාමග්‍රීභාවයි; සුඛා, සැපවතනීය; සමග්ගානඤ්ච, සමගිවූවන්ගේද; අසමගිවූවන්ගේද (හැලපීමම) අනුග්ගහො, අනුග්‍රහ කරන්නේ; සමග්ගරතො, සමගියෙහිඇලුණේ; ධම්මට්ඨො, කුශලධර්මයෙහි පිහිටියේ; යොගක්ඛෙමා, අර්හත්වයෙන්; නධංසති, නහෙනාවන්නේය; සඞ්ඝං, සඞ්ඝයා; සමග්ගං කත්වාන, සමගිකොට; කප්පං, ආයුෂ්කල්පය මුළුල්ලෙහි; සග්ගෙ, ස්වර්ගයෙහි; මොදති, සතුටුවෙයි.

657. 658. යො, යමෙක්තෙම; ඉධ, මේලොකයෙහි; ධනෙන,

659 පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

660 යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

661 අප්පමත්තකො අයං කලි යො අක්ඛෙසු ධනපරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි
යො සුගතෙසු මනං පදොසයෙ.

662 සතං සහස්සානං නිරබ්බුදානං ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී නිරයමුපෙති වාචං මනඤ්ච පණිධාය පාපකං.

663 සිට 666. පුරිසස්සහි ජාතස්ස-පෙ-මනඤ්ච පණිධාය පාපකන්ති.

"ථෙර වග්ගො චතුත්ථො,, "උපාසක වග්ගො පඤ්චමො,,
දුතියො පණ්ණාසකො.

---

(මුක්තා මාණික්‍යාදි) ධනයෙන්ද; ධඤ්ඤෙනච, (ශාලිව්‍රීහ්‍යාදි) ධාන්‍යයෙන්ද; පුත්තෙහි, පුත්‍රයන්ගෙන්ද; දාරෙහි, දාරාවන්ගෙන්ද; චතුප්පදෙහි, (ඇත් අස් ආදී) සිව්පාවුන්ගෙන්ද; (යන මේ සියල්ලෙන්) වඩ්ඪති, වැඩේද; භොගවා, උපභොග පරිභොගයන්ගෙන් යුක්තවූ; යසස්සී, පිරිවරඇති; සො, හෙතෙම; ඤාතීහි, නෑයන් විසින්ද; මිත්තෙහි, මිත්‍රයන් විසින්ද; අථොපි, නැවතද; රාජූහි, රජුන් විසින්ද; පූජිතොහොති, පුදනලද්දේවේ; ඉධ, මේ ලොකයෙහි; යො, යමෙක්තෙම; සද්ධො, ශ්‍රද්ධාවෙන්ද; සීලෙනච, ශීලයෙන්ද; පඤ්ඤාය, ප්‍රඥාවෙන්ද; චාගෙන, ත්‍යාගයෙන්ද; සුතෙනච, ශ්‍රැතයෙන්ද; (යන) උභයං, දෙකොටසින්; වඩ්ඪති, වැඩේද; විචක්ඛණො, නුවණැත්තාවූ; තාදිසො, එබඳුවූ; සොසප්පුරිසො, ඒසත්පුරුෂතෙම; දිට්ඨෙවධම්මෙ, ඉහාත්මයෙහිම; උභයෙන, උභයසම්පත්තියෙන්; වඩ්ඪති, වැඩේ.

659. දුබ්භාසිතං භණං, නපුරුතෙපුල් කියන්නාවූ; බාලො, අඥානතෙම; යාය, යම්රළුබස් නමැතිකෙටේරියෙන්; අත්තානං, ආත්මය; ඡින්දති, සිඳීද; ජාතස්ස, උපන්නාවූ; පුරිසස්ස, පුරුෂයාගේ; මුඛෙ, මුඛයෙහි; කුඨාරී, එබඳුරළුබස් නමැතිකෙටේරිය; ජායතෙ, උපදින්නේය.

660. සිට. 666. (659. සහ 110. 111. 112. වෙනි අඩක බලනු.)

667 අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

668 යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

669 කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.

670 තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

---

667. මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; යෙජනා, යම් සත්ත්වකෙණෙක්; පාරගාමිනො, පාරයයි කියනලද නිර්වාණයට යන සුලුවෙත්ද; තෙ, ඒ සත්ත්වයෝ; අප්පකා, ස්වල්පයහ; අථ, නැවත; ඉතරා;(ඔවුන් කෙරෙන්)අන්‍යවූ; අයංපජා, මේ සත්ත්වසමූහයා; තීරමෙව, සක්කායතීරයටම; හෙවත් මෙතරටම; අනුධාවති, දිවන්නේය.

668. යෙචඛො, යම් පණ්ඩිත කෙනෙක්වනාහු; සම්මදක්ඛාතෙ, මනාකොට දෙශනා කරනලද; ධම්මෙ, (ත්‍රිවිධවූ ලොකොත්තර)ධර්මයෙහි; ධම්මානුවත්තිනො, (ඒධර්මය අසා ඊටඅනුරූපවූ ප්‍රතිපදාව පූරණය කොට මාර්ගඵල සාක්ෂාත් කිරීමෙන්) ධර්මය අනුව පවත්නාහුවෙත්ද; තෙජනා, ඒසත්ත්වයෝතුමු; සුදුත්තරං, අතිශයින්එතරවීය නොහැකිවූ; මච්චුධෙය්‍යං, (ක්ලෙශමාරයාට වාසස්ථානවූ හෙයින්) මච්චුධෙය්‍ය යයි කියනලද ත්‍රෛභූමක වෘත්තයඉක්මවා; පාරං, නිර්වාණයට; එස්සන්ති, පැමිණෙන්නාහුය.

669. 670. පණ්ඩිතො, පණ්ඩිතතෙම; කණ්හං ධම්මං, (කායදුශ්චරිතාදි භෙද ඇති) අකුශල ධර්මය; විප්පහාය, දුරුකොට; ඔකා, ආලයෙන්; (හෙවත් ගිහිගෙන් නික්ම) අනොකං ආගම්ම, ආලය රහිත ප්‍රව්‍රජ්‍යාවට පැමිණ; (නොහොත් නිරාලයයි කියනලද නිර්වාණය පිණිස)සුක්කං, (කායසුචරිතාදි භෙදඇති) කුශලධර්මය; භාවෙථ,(අභිනිෂ්ක්‍රමණයෙහිපටන් අර්හත්මාර්ගයදක්වා)වඩන්නේය; යත්ථවිවෙකෙ, (කායචිත්තඋපධිවිවෙකඇති)යම් නිර්වාණයෙක්හි; දූරමං, (මේ සත්ත්වයා විසින්) ඇලීය නොහැකිවන්නේද; තත්‍ර, ඒ නිර්වාණයෙහි; අභිරතිං, ඇලීම; ඉච්ඡෙය්‍ය, කැමැතිවන්නේය; පණ්ඩිතො, පණ්ඩිතතෙම; කාමෙ, (වස්තුකාම ක්ලෙශ)කාමයන්; හිත්වා, හැර; අකිඤ්චනො, පළිබොධරහිතවූයේ; චිත්තක්ලෙසෙහි, සිතකිලුටු කරන්නාවූ පස්වනි

671. යෙසං සම්බොධි යඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං,
ආදාන පටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා;
ඛීණාසවා ජුතීමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා,ති.

672. සිට 676. අප්පකා තෙ මනුස්සෙසු–පෙ–තෙ ලොකෙ පරිනිබ්බුතා,ති.

"පච්චොරොහණී වග්ගො දුතියො,,

---o---

677. සිට 681. අප්පකා තෙ මනුස්සෙසු–පෙ–තෙ ලොකෙ පරිනිබ්බුතා,ති.

682. සිට 686. අප්පකා තෙ මනුස්සෙසු–පෙ–තෙ ලොකෙ පරිනිබ්බුතා,ති.

"ජාණුස්සොණි වග්ගො සත්තමො,,

---o---

# දසක නිපාතො සමත්තො.

---

මරණ ධර්මයන්ගෙන්; අත්තානං, ආත්මය; (තමාගේ සිත) පරියොදපෙය්‍ය, පිරිසිදු කරන්නේය.

671. යෙසං, යම් ක්ෂීණාශ්‍රවයන්ගේ; චිත්තං, සිත; සම්බොධියඞ්ගෙසු, සම්බොධ්‍යාඞ්ගයන් විෂයෙහි; සම්මා, සම්‍යක් හෙතුවෙන්; සුභාවිතං, මනාකොට වඩනාලද්දේද; ආදානපටිනිස්සග්ගෙ, (මමය මාගේය යි තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ගැණීමක් නැතිහෙයින්) ග්‍රහණ රහිතයයි කියනලද නිර්වාණයෙහි; අනුපාදාය, උපාදාන රහිතව; (හෙවත් කාමොපාදානාදී චතුරුපාදානයන් අතුරෙන් කිසි උපාදානයක් නොගෙන) යෙ, යම් ක්ෂීණාශ්‍රවකෙණෙක්; රතා, ඇලුනාහුද; ජුතීමන්තො, ශොභාමත්වූ හෙවත් අග්‍රමාර්ගඥානානුභාවයෙන් දීප්තිමත්වූ; තෙ ඛීණාසවා, ඒ ක්ෂීණාශ්‍රවයෝ; ලොකෙ, මේ ලොකයෙහි; පරිනිබ්බුතා,(අග්‍රත්‍වයටපැමිණ් මෙහිපටන් කෙලශවෘත්තාය ක්ෂය කලබැවින් "සඋපාදිසෙස,, වශයෙන්ද චරිමචිත්තනිරොධයෙන් ස්කන්ධවෘත්තය ක්ෂයකල බැවින්. "අනුපාදිසෙස,, වශයෙන්ද යන පරිනිර්වාණයෙන්) පිරිනිවීමට ගියාහුවෙත්.

672. සිට. 686. (667. සිට 671. වෙනි අඞ්ක බලනු)

687 නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ නාභිජානාම යම්පි නිස්සාය ඣායසී,ති.

688 නමො තෙ පුරිසාජඤ්ඤ=පෙ=යම්පි නිස්සාය ඣායසී,ති.

689 නමො තෙ පුරිසාජඤ්ඤ=පෙ=යම්පි නිස්සාය ඣායසී,ති.

690 ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො සො සෙට්ඨො දෙවමානුසෙ,ති.

691 ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං=පෙ=සො සෙට්ඨො
දෙවමානුසෙ,ති.

"නිස්සය වග්ගො පඨමො,,

———0———

# ඒකාදසකනිපාතො සමත්තො.

## අඞ්ගුත්තරනිකාය සුත්තගාථා නිට්ඨිතා.

———0———

687. 688. 689. යම්පි නිස්සාය, (දිට්ඨසුතමුතාදිවූ) යමක් ඇසුරු කොට; ඣායසි, සිතත් නෙහිද; යස්ස තෙ, යම්බඳු ඔබවහන්සේගේ, (එබඳු සිතීමක්) නාභිජානාම, නොදනුමහ; (එහෙයින්) පුරිසාජඤ්ඤ; පුරුෂශ්‍රෙෂ්ඨය; තෙ, නුබවහන්සේට; නමො, නමස්කාරවේවා. පුරිසුත්තම, පුරුෂොත්තමය; තෙ, නුබවහන්සේට; නමො, නමස්කාරවේවා.

690. 691. යෙ, යම්ජනකෙනෙක්; ගොත්තපටිසාරිනො, "අහං ගොතමො," "අහං කස්සපො,, යනාදි වශයෙන් ගොත්‍රයසිහිකෙරේත්ද, එහෙයින් දන් ගොත්‍රයුලුවත්ද; ජනෙතස්මිං, (ඒගොත්‍ර දන්නාසුලුවූ) ජනසමූහයාඅතුරෙහි; ඛත්තියො, ක්ෂත්‍රියතෙම; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨවේ; විජ්ජාචරණසම්පන්නො, අෂ්ටවිද්‍යාවන්හා පසළොස්වරණ ධර්මයන්ගෙන් යුක්තවූ; යො, ඒසම්බුද්ධතෙම; දෙවමානුසෙ, දෙවිමිනිසුන් අතුරෙහි; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨවෙයි.

අඞ්ගුත්තරනිකාය ගාථා සන්නය නිමි.

1 වීසඤ්ඤුහි සඞ්ඛීත යසො සමුග්ගතො
වෙදඞ්ගීත්තො මුම්ම නිකාය නායකො,
ථෙරාසභො ශ්‍රී දී සුමඞ්ගලව්හයො
යො රක්ඛි ලඞ්කාය මුනින්ද සාසනං.

2 තස්සාසි දූජ්ජා චිරං සසු පනාහිකො
ඝො සො යසො සොභිත සඤ්ඤද සංයමී,
සජ්ජාගමස්මිං විධිනා සුසික්ඛිතො
ථෙරස්ස තස්සා චරියස්ස ධීමතො.

3 සිස්සෙන බාලාවගමාය සාධුනං
ධම්මාදි නන්දෙන මුනින්ද සූනුනා,
ගාථාන මඞ්ගුත්තරිකාන යා මයා
ව්‍යාඛ්‍යා කතා සාසන සඞ්ගහත්ථිනා.

4 නිබ්බාණතො ලොකහිතස්ස සත්ථුනො
සංවච්ඡරෙ "පාණි සරන්ත චඤ්ඤුකෙ,"
මුද්දාපිතා සා පළුදය සාධුනං
සංවත්තනත්ථං සතතං ජිනාගි වුඩ්ඪියා.

5 යෙජ්ජත්ථ මය්හං ගරහන්ති සූයකා
තෙ ඡෙබා පමාණා නිහලං ච පණ්ඩිතා,
තස්මා හි මෙ යං ඛලිතං පමාදජං
සොධෙන්තු තං සන්තමනා විචක්ඛණා.

6 ව්‍යාඛ්‍යාසි මිස්සා රචනෙන සඤ්චිතං
සම්පුඤ්ඤද මග්ගං සිව සාධනං ලයා,
තෙන ඨිතෙනුගගත පුඤ්ඤසම්පදා
සබ්බෙපි සත්තා සුඛිනා භවන්තු තෙ, ති.

---

සිද්ධිරත්ථු.

# ශුද්ධිපත්‍රය.

---o---

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 17 | වචාස, වචනයෙන්ද | වාචාය, වචනයෙන්ද |
| 2 | 26 | දෙකින් | දෙකකින් |
| 3 | 9 | කර්‍ය | කාර්‍ය |
| 4 | 28 | අරම්භයද | ආරම්භයද |
| 5 | 13 | කලෙවර | කොළවර** |
| ,, | 6-20 | පාරිචරියාය | පරිචරියාය |
| ,, | 23 | ප්‍රසංශා | ප්‍රශංසා |
| 6 | 27 | පබැුම් | පබැඳුම් |
| 7 | 11 | උපන්නාවූද | උපදනාවූද** |
| ,, | 20 | ඒ කාන්තයෙන් | ඒකාන්තයෙන්** |
| ,, | 23 | රූපාදි | රූපාදිවූ |
| 8 | 18 | මුලුල්ලෙහි | මුළුල්ලෙහි** |
| 9 | 1 | නොබාපපමත්තාසුඛිනා† | |
| ,, | 21 | පක්ඛන්දව*, ප්‍රාතිහාර්‍ය පක්ෂයෙහිද | පක්ඛන්දව, ප්‍රාතිහාර්‍ය පක්ෂයෙහිද* |
| ,, | 26 | වසතුල | වසතුරු** |
| 10 | 9 | පුථුැජ්ජනා | පුථුජ්ජනා |
| ,, | 11 | සවභා | සවභාව** |
| ,, | 18 | පිළිකුල් කරමින් | පිළිකුල් නොකරමින්යොනිසො මනසිකාරයෙන් |
| 11 | 15 | {කල්‍යාණං. දහපත; සකාඛි, සාක්ෂිවේ; | {සක්ඛි, සාක්ෂිය; කල්‍යාණං, සොඳුරුය; |
| ,, | 18 | සගවන්නෙහිද | (මාගේසිතද නොදනිවයි, මෙසේ ඒ පාපය) සඟවන් නොහිද |
| ,, | 20 | බාලයා | ඒබාලජනයා |
| ,, | 26 | හැසිරෙන්නෙහිද | හැසිරෙන්නේය |
| 12 | 2 | වූවචති | වුවචනි,ති |
| ,, | 3 | සංකදද කමා | සඞකදදමො |
| 14 | 5 | යත නිහරති | යනනීහරයි |
| 15 | 23 | (යත) | (යනුයි) |

** මෙබඳු වෙනත් තන්හිද මෙසේ මැයි,

† 398 වෙනි ගාථාවේ ජේත "නොබෙමිපපයාතා සුඛිතා,, යනු ඉමහිත් ගැලපේයයි හැගේ, එහි දැක්වූ අර්ථය මෙහිද යොදුගැන්ම පහසුවේ,

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 16 | 1 | හිරීමතො | හිරිමතො. |
| ,, | 5 | තසම්සෙසැව. | තසම්සඳව. |
| ,, | 10 | හිරීමතො | හිරිමතො. |
| ,, | ,, | ලජ්ජා ඇත්තේද | ලජ්ජා වෙත්ප්‍රයුක්තවූ සිත් ඇත්තේද |
| ,, | 20 | තසම්සෙසැව | තසම්සඳව |
| 17 | 3 | පණ්ඩිතා | පණ්ඩිතා. |
| 18 | 3 | බ්‍රහමණො. | බ්‍රාහ්මණො |
| 19 | 19 | වීකබලිතං. | විකඛලිතං |
| ,, | 24 | කථකරනු | කථාකරනු |
| 20 | 17 | අනුමොදයෙ | අනුමොදෙය්‍ය |
| 22 | 7 | ඨානනි | ඨානානි |
| ,, | 24 | චන්ද්‍රරසම්යට | චන්ද්‍රරශ්මියට |
| 23 | 2 | පවා,ති | පවාති,ති |
| ,, | 28 | අධිශීලං. | අධිසීලං. |
| 24 | 13 | පලමත් | පලමුත් |
| 25 | 9 | මොනයෘ | මොනෙය්‍ය |
| 26 | 12 | නොහොත් | හෙවත් |
| ,, | 19 | ශ්‍රොතයෙහි | ශ්‍රොත්‍රයෙහි. |
| ,, | 25 | ඉඳුල්කරණලද්දවූ. | (රාගනිශ්‍රිත විතර්කසංඛ්‍යාත මැස්සන්විසින්)ඉඳුල් කරණ ලද්දවූ |
| 27 | 7 | සවුටසීතං | සුවුටසිතං. |
| ,, | 14 | මැස්සන් විසින්. | (ක්ලෙශ නමැති) මැස්සන් විසින්. |
| 28 | 9 | පරිනිබබුතො | පරිනිබ්බුතො,ති |
| ,, | 15 | ලබනති | ලභනයි |
| 29 | 2 | සුඛං. | සුඛනයි |
| ,, | 15 | අනවාගතං. | අනාගතං. |
| 31 | 15 | මොදනති | මොදති. |
| 32 | 24 | දෙකින් | දෙකොට සිත් |
| 33 | 9 | සොභනොති | සොභනො |
| 35 | 15 | අසැසැඨාභවං. | අසැසැඨාභාවං. |
| 36 | 8 | මුතනාමං. | මුතනාමං. |
| 37 | 3 | ඝති | ගති |

| පිට | පේළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 38 | 12 | මැඩ ැත්තුවාවූ | මැඩ ැවැත්තුවාවූ |
| 39 | 12 | ඇත්වුන් | ඇත්තවුන් |
| ,, | 22 | සං ඥ | සඤ්ඤ |
| 40 | 11 | ජානතානි | ජානතා |
| 41 | 28 | මතුදවාසයකරන්නානුය | වාසයකරන්නානුය |
| 42 | 30 | අසවානං | ආසවානං |
| 43 | 18 | ශ්පශී | සපශී |
| 45 | 8 | පටී | පටි |
| ,, | 19 | අජෙඣාසිතං | අජ්ඣාසිතං |
| ,, | 24 | නිවණතුල | නිවණතුල* |
| ,, | 31 | ශෑසතා | ශාසතෘ |
| 46 | 10 | විසම්පත් | විසම්යපත්* |
| 49 | 25 | පවත්නේනි | පවත්නානි |
| 50 | 28 | අගගසමි | අගගසම්ං |
| ,, | ,, | විශශෙයති | විශ්ශෙයති |
| 51 | 25 | ගාන්ධබ්බි | ගන්ධබ්බි |
| 52 | 18 | ඉන්ද්‍රියන්ති | ඉන්ද්‍රියන්ති |
| 53 | 21 | සාගසතමහා | සාගසතමහා* |
| 55 | 11 | දෙයධම්මටට | දෙගධම්මටට |
| ,, | 13 | උපස නානි | උපසංසනානි |
| 56 | 21 | (ස්ථාපණීයවූ) | (ස්ථාපනීයවූ) |
| 62 | 27 | නිසලසථාන | නිශ්ශලසථාන |
| 63 | 24 | මල බැවින් මලසිරුරුවූ | මලබැවින්මලසිරුරුවූ |
| 68 | 33 | ශ්‍රොතාපනන | ශ්‍රොතආපනන |
| 70 | 10 | සොභාව | සතුති සොභාව |
| 75 | 13 | උසසුගතා | උසසුගතා* |
| ,, | 24 | ගෙණයතුලබන්නාවූ | පමුණුවතුලබන්නාවූ |
| 82 | 17 | බහුසෑතවූ | බහුශ්‍රැතවූ |
| ,, | 19 | කිති | කිතති* |
| 86 | 2 | අසැසැදනව්‍ා | අසෙසැනවා |
| 92 | 20 | සොන්පුලලවූ | විකසිතවූ |
| 94 | 28 | ධම්මිස | ධම්මිෂ* |
| 96 | 34 | හිමාල | හිමාලය |
| 97 | 22 | ප්‍රතිශා | ප්‍රතිෂ්ඨා |


* මෙබඳු වෙනත් තැන්හිද මෙසේ මැයි.

| පිට | පේළ | අශුඩ | ශුඩ |
|---|---|---|---|
| 97 | 28 | සඹුඕ | සම්බුඩ* |
| ,, | 30 | ග්‍රහසත | ගෘහසථ |
| 98 | 4 | ඵාස | ඵසා |
| 99 | 16 | ශෙදය | ශෛදය |
| 106 | 9 | අවිගතරාය | අවිගතරාගය |
| 107 | 27 | (ක්ෂීණාශ්‍රාවශයා) | (ක්ෂීණ ශ්‍රවයෝ) |
| 108 | 18 | මාහාපුරිශෝති | මහාපුරිශෝති |
| 110 | 9 | ධම්මදසසන | ධම්මදස්සනං |
| 114 | 17 | කැමැතාගු | කැමැත්තගු |
| 115 | 27 | රාජාභිශෙසක | රාජාභිෂෙක |
| ,, | 31 | භිත්තයොග | භිෂො යොග |
| 116 | 19 | ලොනසංග්‍රාකවු | ලොකසංග්‍රහකවූ |
| 119 | 16 | බෝ-හෝකලකින් | බොහෝ කලකින් |
| 120 | 32 | සඟලූවෝ | මහාසිඟ් ඇතිගහලූවෝ |
| 121 | 13 | ඇතුලන | ඇතුලත* |
| ,, | 17 | කිපු ණු | කිපුනු* |
| 122 | 25 | පොෂ්‍යයකරණලද්දේ | පොෂ්‍යයකරණලද්දවූ |
| 123 | 7 | පණ්ඩිතා | පණ්ඩිතො |
| ,, | 21 | මෛතාම | මෛතම |
| 125 | 17 | පැවුවිය | පැපිවිය |
| 128 | 14 | වෙසමාත්‍ර | වෙශමාත්‍ර |
| ,, | 18 | ඇතනවුත් | ඇත්තවුත්* |
| ,, | 24 | නොපිරවිම | නොපිරිවිම |
| 130 | 28 | බෝහෝකාලයක් | බොහෝකාලයක් |
| 131 | 14 | සංසාර | සංසාරං |
| ,, | 31 | වාඝයකරත්තෝය | වාසයකරත්තෝය |
| 132 | 27 | පැමිණියෙම් | පැමිණියෙමි |
| 133 | 19 | බීජසපම්දු | බීජසම්පදු |
| 134 | 7 | පාණි | පාන |
| ,, | 14 | සිඩකෙරෙත් | සිඩවෙත් |
| ,, | 22 | ස්‍රොතාපතති | ශ්‍රොත ආපතති |
| 136 | 12 | පහාසෙහනි | පහාසනයි |

තවත් අක්ෂරයෙහි හුණු දිඝ මූර්ධජදන්තජාදිය ඇතිවිය හැකිනම්, අර්ථය දැන ගැනීමට ඒ බාධාතොවන හෙයින් මෙහි ඇතුලත් නොකලබව දතයුතු.

* මෙබදු වෙනත් තැන්හිද මෙසේ මැයි,

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු